# විසි වසරක මායාව

## ශ්‍රී ලංකාවේ පරීක්ෂණ කොමිසන් සභා

AMNESTY INTERNATIONAL

ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් මිලියන 2.2 සාමාජිකත්වයක් සහිත 150 කට ආසන්න රටවල් හා භූගෝලීය කලාපයන් හි ක්‍රියාත්මක බරපතළ මානව හිමිකම් උල්ලංඝණයන් අවසන් කිරීම පිණිස කටයුතු කරන ගෝලීය මානව හිමිකම් ව්‍යාපාරයකි.
අපගේ දර්ශනය වන්නේ විශ්ව මානව හිමිකම් ප්‍රකාශනයේ හා වෙනත් ජාත්‍යයන්තර මානව හිමිකම් ප්‍රකාශනයන් හි අඩංගු ප්‍රමිතීන් ලොව පුරා වාසය කරන සෑම පුද්ගලයෙකු විසින් ම භුක්ති විඳිනු දකින්නට ලැබීමයි. අප, සියළු රාජ්‍යයන් ගෙන්, දේශපාලන මතවාදයන් ගෙන්, ආර්ථික හෝ ආගමික උවමනාවන් ගෙන් ස්වාධීන වූ සහ අප සාමාජිකත්වය හා මහජනතාව විසින් සපයා  කරන අරමුදල් මත ක්‍රියා කරන සංවිධානයකි.

AMNESTY
INTERNATIONAL

ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය 2009
**Amnesty International Publications**
**International Secretariat**
**Peter Benenson House**
**1 Easton Street**
**London WC1X 0DW**
**United Kingdom**
**www.amnesty.org**

© ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් ප්‍රකාශන 2009

සංකේත අංකය: **ASA 37/005/2009**
මුල් පිටපත ඉංග්‍රිසි බසින් ප්‍රකාශිතයි
මුද්‍රණය මහා බ්‍රිතාන්‍යයේ ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් ලේකම් කාර්යංශය විසින් සිදු කරන ලදි.

සියළු හිමිකම් ඇහිරිණ. එහෙත් මෙම ප්‍රකාශනයේ අඩංගු කරුණු නොමිලේ සිදු කරන මානව හිමිකම් උද්දේශනය, ප්‍රචාරණය හා අධ්‍යාපනික අරමුණු පිණිස අවසරයකින් තොරව උපුටා දැක්විය හැකි අතර  එබඳු අවස්ථාවන් අප වෙත දැනුම් දීම මෙම ප්‍රකාශනයේ බලපෑම පිළිබඳව තක්සේරු කිරීමට උපකාර වනු ඇත. මේ හැර වෙනත් ප්‍රකාශනයන් හි උපුටා දැක්වීම පිණිස, පරිවර්තනය හා අනුවර්තනය සඳහා ප්‍රකාශයන් ගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු අතර ඒ සඳහා අය කිරීමක් ද කරන බව සලකන්න.

# ශ්‍රී ලංකාවේ පරීක්ෂණ කොමිසන් සභා විසි වසරක මායාව

පටුන


| | | |
|---|---|---|
| 01.00 | හැඳින්වීම | 01 |
| 02.00 | නිර්දේශ | 09 |
| 03.00 | පරීක්ෂණ කොමිසන් සභා සහ දඬුවමින් නිදහස් කිරීම | 11 |
| 03.01 | නෛතික පසුබිම හා ඉතිහාසය | 11 |
| 03.02 | නැවත වරක් කල් මැරීම-පරීක්ෂණ කොමිසන් සභා වලට ඇතුල් වීම | 14 |
| 03.02 | පරීක්ෂණ කොමිසන් සභා පිළිබඳ විශ්ලේෂණයක් | 16 |
| 03.03 | මන්දගාමී ප්‍රගතිය හා සිද්ධීන් ප්‍රමුඛ ගත කිරීම | 16 |
| 03.04 | සිද්ධීන් සවිස්තරාත්මකව | 18 |
| 03.05 | වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම | 34 |
| 03.06 | වීඩියෝ සම්මන්ත්‍රණ පිළිබඳ ගැටලු | 42 |
| 03.06 | කොමසාරිස්වරු මත පීඩනය | 43 |
| 03.07 | රාජ්‍ය ආයතන මගින් සහයෝගයක් නොමැති වීම | 44 |
| 03.08 | නීතිපතිවරයා | 44 |
| 03.09 | පරීක්ෂණ කොමිසන් සභා සැසිවාර හා නීතිපතිවරයා භූමිකාව | 45 |
| 03.10 | සිවිල් සමාජයේ ප්‍රතිචාරයන් | 47 |
| 04.00 | අන්තර් ජාතික ස්වාධීන විද්වත් කණ්ඩායම-ප්‍රගතියක් නොලද්දෝ | 48 |
| 05.00 | නිගමන හා නිර්දේශ | 52 |
| 05.01 | නිගමන | 52 |
| 05.02 | නිර්දේශ | 53 |
| 06.00 | උප ග්‍රන්ථය | 57 |


## 1. හැඳින්වීම:

**පොන්නතුරෙයි යෝගරාජා හට 2006 දී සිය පුතුන් දෙදෙනා ම අහිමි වුයේය.**

සිය බාල පුතු හේමචන්ද්‍රන්, 2006 ජනවාරි 2 දින ත්‍රිකුණාමල මුහුදු වෙරළේ දී ශ්‍රී ලංකික ආරක්ෂ හමුද විසින් ඝාතනය කරන ලද සිසුන් පස් දෙනා ගෙන් එක් අයෙක් විය. ඔහු ගේ වැඩි මහල් පුතු, කොඩේශ්වරන්, එම වසරේ ම අගෝස්තු මස මුතූර් හි දී සමුල ඝාතනය කරන ලද ආධාර සේවකයන් දහත් දෙනා ගෙන් එක් අයෙක් වුයේය. 2008 මාර්තු මස දී, පොන්නතුරෙයි යෝගරාජා, ත්‍රිකුණාමල ඝාතනය ඇතුළු බරපතළ මානව

හිමිකම් උල්ලංඝනය කිරීම් විභාග කිරිම පිණිස පත් කරන ලද ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභාව ඉදිරියට වාචික සාක්ෂිකරුවෙක් ලෙස කැඳවන ලද අතර, ඔහු සිය ඇසින් දුටු සාක්ෂිය ශ්‍රී ලංකාවෙන් බැහැර, රහසිගත ස්ථානයක සිට විඩියෝ තාක්ෂණය භාවිතා කරමින් ඉදිරිපත් කළේය[1]. සිය බාල පුතු ඝාතනය වූ දින රාත්‍රියේ, පුතු සොයමින් දැඩි කම්පාවෙන් ගිය ගමනත්, ඉන් පැයකට පමණ පසු, පුතු ගේ මළ කඳ ඇස ගැටුන සැටිත් හෙතෙම සිය සාක්ෂියේ දි විස්තර කළේය. එහි දි නිලධාරීන් ගේ විෂමාචාර, පොලිසියෙන් එල්ල වන තර්ජන හා සිය පුතුන් අහිමි විමේ වේදනාව ද ඔහු කියා සිටියේය.

පොන්නතුරෙයි යෝගරාජා ගේ වැඩි මහල් පුතු ගේ කාර්යාලයට සිය බාල සොහොයුරා ගේ මරණයෙන් පසු තර්ජනාත්මක දුර කථන පණිවුඩ ලැබෙන්නට විය. ' ඇක්ෂන් එගෙන්ස්ට් හන්ගර් හි සේවය කළ මගේ වැඩි මහල් පුතාට, විශේෂ කාර්ය බලකාය විසින් දුර කථන ඇමතුම් කිහිපයක් ම දිලා තිබුනා. තමන් ගේ ජීවිතයට අනතුරක් වෙයි කියලා බයක් එයාට තිබුනා. උසාවියේ දි කට පියා ගෙන හිටියේ නැත්නම් එයාලා අපිවත් මරා දමාවි කියලා පුතා මට කිව්වා.' සය මසකට පසු කොඩේෂ්වරන් ද ඝාතනය විය.

සිය පුතුන් දෙදෙනා ගේ මරණින් පසු පොන්නතුරෙයි යෝගරාජාට ශ්‍රී ලංකාවෙන් පලා යාමට සිදු විය.

*'මං උපන් රටේ මට ස්වාධීන ප්‍රකාශයක් කරන්න බැහ. මාව බය කරනවා. මගේ ළමයින් ට බයයි මාවත් මරයි කියලා. ඒ නිසා මට නිදහසේ ප්‍රකාශයක් කරන්න බැහ. මම අද ප්‍රකාශ කළ දෙයම එදත් මට කරන්න උවමනාව තිබුනා. ඒත් මගේ දරුවන් එකට ඉඩ දුන්නේ නැහ, මගේ ජීවිතයට අනතුරක් වෙයි කියන බයට.'*

**මාර්තු 2008- පොන්නතුරෙයි යෝගරාජා**

මාස දෙකකට පසු 2008 මැයි මස ශ්‍රී ලංකා රජය කොමිසන් සභාවේ කටයුතු පිණිස විඩියෝ තාක්ෂණය භාවිතා කිරිම අවසන් කරන මෙන් නියෝග කළේය.[2]

**දඬුවමින් නිදහස් කිරිම**

දඬුවමින් නිදහස් කිරිම යනු මානව අයිතිවාසිකම් උල්ලංඝනය කරන අපරාධකරුවන් යුක්තිය ඉදිරියට පැමිණවිමට අසමත් විමයි. එමගින් වින්දිතයින් හට යුක්තිය සහ ප්‍රතිකර්ම පිණිස ඇති අයිතිය ප්‍රතික්ෂේප වෙයි. තව ද ඔවුහු කිසිදු වරදකට හසු කර ගැනිම සිදු නොවන බැවින් අපරාධ, සිවිල්, පරිපාලන හෝ විනයානුකූල පරීක්ෂණ වලට පමණක් නොව වෙනත් ඕනෑම පරීක්ෂණයකට යටත් නොවන බැවින් සැක කිරිම, අත් අඩංගුවට ගැනිම, නඩු පැවරිම, වරදකරු වුවහොත් සුදුසු දඬුවම් දිම යනාදි කිසිවක් සිදු නොවන බව පමණක් නොව වින්දිතයින් හට වන්දි ලබා දිමක් සිදු නොවන බවද එයින් අදහස් කෙරේ.

දඬුවමින් නිදහස් කිරිම පැන නගින්නේ රාජ්‍ය, නිති කඩ කිරිම් විභාග කිරිමේ සිය වගකිම පැහැර හැරිම, අපරාධ පිළිබඳ වගකිව යුත්තන් අභි-චෝදනා ඉදිරිපත් නොකිරිම; අධිකරණයට ඉදිරිපත් කොට සාධාරණ දඬුවම් ලබා නොදිම; වින්දිතයින් ට ඔවුන් ලබා තිබෙන තුවාල හා පීඩාවට සරිලන පරිදි වන්දි ලබා නොදිම; මෙබඳු උල්ලංඝනයන් නැවත සිදු නොවන බවට වග බලා නොගැනිම යන තත්වයන් තුලය. එක්සත් ජාතීන් ගේ සංවිධානයේ වධහිංසා පිළිබඳ විශේෂ වාර්තාකරු ' අපරාධ හා මානව අයිතිවාසිකම් උල්ලංඝනයත් වධහිංසා පැමිණ විමත් නොකඩවාම වාර්තා විම සඳහා තුඩු දෙන මූලික හේතුව දඬුවමින් නිදහස් කිරිම අඛණ්ඩව පවත්වා ගැනිම යැයි සඳහන් කරයි'. ( UN DOC A/54/426,1 ඔක්තෝබර් 1999 48 වන ජේදය

1 වීඩියෝ තාක්ෂණය මානව හිමිකම් විභාගයක් පිණිස ශ්‍රී ලංකාවේ යොදා ගත් ප්‍රථම අවස්ථාව මෙය විය. මෙම පරීක්ෂණයේ දි විඩියෝ තාක්ෂණය භාවිතා කිරිම පිණිස පහසුකම් සපයන ලද්දේ මෙම කොමිසන් සභාවේ වැඩ කටයුතු නිරීක්ෂණය පිණිස ජනාධිපතිතුමා විසින් ආරාධනය කරන ලද ජාත්‍යන්තර ස්වාධීන විද්වතුන් ගේ කණ්ඩායම විසිනි.

2 2008 නොවැම්බර් මැද භාගයේ දි පළ වූ මාධ්‍ය වාර්තා වලට අනුව ශ්‍රී ලංකා රජය නැවත වරක් විඩියෝ තාක්ෂණය භාවිතා කිරිමට කැමැත්ත පළ කළ බව වාර්තා කළේය. 'පරීක්ෂණ කොමසන් සභා විඩියෝ තාක්ෂණය පහසුව යලි ලැබෙයි' ඩේලි මිරර් 11 නොවැම්බර් 2008

**අණ දීමේ වගකීම**

ජාත්‍යයන්තර නීතියෙහි මූලධර්මයක් වන අණදීම පිළිබඳ වගකීම මගින් යම්කිසි ධුරාවලියක පහළ නිලධාරීන් විසින් සිදුකරන යුද්ධ අපරාධ, මානව සංහතියට එරෙහි අපරාධ සහ ජාත්‍යයන්තර නීතියෙහි අඩංගු අනෙකුත් නීතී උල්ලංඝනයන් එම අපරාධ පමණක් නොව එම උල්ලංනයන් විමර්ශනය කිරීමට හා දඬුවම් කිරීමට අසමත් වීම සම්බන්ධයෙන් උසස් නිලධාරීන් වගකිව යුතුය යන්න අදහස් කරයි. මෙම වගකීම හමුදමය නොවන උසස් නිලධාරීන් සඳහා ද අදාළය.

නෛතික මූලධර්මයක් වශයෙන් ජාත්‍යයන්තර නීතීය යටතේ අපරාධයක් සිදු කරන තැනැත්තෙක් ධුරාවලියේ සිය පහළ නිලධාරීන්ට නීතියානුකූල නොවන නියෝග නිකුත් කිරීම පිළිබඳ වගකීමෙන් නිදහස් විය නොහැකිය.

( බලන්නඃ 1949 ජිනිවා සම්මුතියට අදල 1977 අතිරේක ප්‍රඥප්තිය 1 වගන්ති 28සිට 33 ජාත්‍යයන්තර අපරාධ අධිකරණ පිලිබඳ රෝම ආඥාව)

ඇතැම් සුවිශේෂ මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ විශේෂ විමර්ශනයන් සඳහා එක්සත් ජාතීන් ගේ අධිකරණ බාහ්‍ය කේවලාත්මක හා නඩු විභාගයකින් තොරව සිදු කරනු ලබන ඝාතන පිළිබඳ විමර්ශනය හා වැළැක්වීමේ මූලධර්ම (ආර්ථික කවුන්සිලය [ECOSOC] එක්සත් ජාතීන් ගේ යෝජනාව 1989/65 1989 මැයි 24 )

"අධිකරණ බාහ්‍ය, කේවලාත්මක හෝ නඩු ඇසීමකින් තොරව සිදු කරන ඝාතන කිරීමට හෝ අනුමත කිරීමට කිසියම් උසස් නිලධාරියකු හෝ රාජ්‍ය බලධාරියකු සිය තනතුරු බලය පාවිච්චි නොකළ යුතුය. සිය ධුරාවලියේ පහළ නිලධාරීන් විසින් සිදු කරන සපරාධී ක්‍රියාවක් වැළැක්වීමට සාධාරණ අවස්ථාවක් යම් උසස් නිලධාරියෙකුට තිබුනේ ද ඔහු හෝ ඇය සිය පහළ නිලධාරියා ගේ සපරාධී ක්‍රියාව සම්බන්ධයෙන් වගකිව යුතු වේ. කිසිම අවස්ථාවක එනම් යුද්ධයක්, ජාතික හදිසි අවස්ථාවන්, වටලෑම් යන කිසිම අවස්ථාවක රාජ්‍ය නිලධාරියෙකු විසින් සිදුකරන ලද සපරාධී අපරාධ වසා දමමින් අභිචෝදනා ඉදිරිපත් නොකර දඬුවමින් නිදහස් කිරීමට පාවිච්චි නොකළ යුතුය".

ශ්‍රිලංකාවේ දන්ඩ නීතී සංග්‍රහය ද සපරාධී වරදක් කිරීම පිණිස කුමන්ත්‍රණය කිරීම, ආධාර කිරීම, අනුබලදීම, පෙළඹවීම තහනම් වේ. (දන්ඩ නීතී සංග්‍රහය 102 හා 113 බි වගන්ති) තවද වරදක් කිරීම පිණිස වක්‍ර ව ආධාර දීම ද විශේෂයෙන් ම රාජ්‍ය නිලධාරින සම්බන්ධයෙන් අදළ කොට දක්වා ඇත. ( දන්ඩ නිති සංග්‍රහය 111-113 හා 112 විශේෂයෙන් ම රාජ්‍ය නිලධාරීන් පිළිබඳව සඳහන් වේ).

දන්ඩ නිති සංග්‍රහය ( සංශෝධිත) 1956 කාන්ඩ අංක 1 පරිච්චේදය 19 ශ්‍රි ලංකාවේ ව්‍යවස්ථාදයක ආඥා පනත්

2008 මාර්තු මස පොන්නතුරෙයි යෝගරාජා ගේ සාක්ෂිය විභාග කරන ලද ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභාව පත් කරන ලද්දේ, පොලිසිය හෝ නීතිපති දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂා නොකොට පැහැර හරින ලද, බරපතළ මානව හිමිකම් කඩ කිරීම් අතරින් තෝරා ගත් කිහිපයක් පරීක්ෂා කිරීම පිණිසය. එබඳු පැහැර හැරීම් ශ්‍රි ලංකාවට අළුත් දෙයක් නොවන අතර, අහඹු සිදුවීමක් ද නොවේ. ජාත්‍යයන්තර මානව හිමිකම් හා ජාත්‍යයන්තර මානවීය නිතිය අනුව, ශ්‍රි ලංකාව තුල දඬුවමින් නිදහස් කිරීම න්‍යායක් බවට පත් වි ඇති අතර, බලයට පත් වු සෑම රජයක් ම එහි පිළිසරණ සොයනු ලැබිනි. දේශපාලන කොන්ත්‍රාත්කරුවන් ඇතැම් නඩු සම්බන්ධයෙන් ඍජුවම මැදිහත් වෙමින් අල්ලස් දීම, තර්ජන හා හිරිහැර කිරීම්, මරා දැමීම ඇතුළු පහර දීම් මගින් පොලිස් පරීක්ෂණ අඩාල කිරීම හා මහජනයා නොමග යැවීම සිදු කෙරීන.[3]

[3] උදාහරණයක් වශයෙන් ජෙරාඩ් මර්වින් පෙරේරා ගේ මානව අයිතිවාසිකම් නඩුව සහ ඔහු මරා දැමීම බලන්න. මර්වින් පෙරේරා වත්තල පොලිසිය විසින් 2002 ජුනි මස පැමිණිල්ලක් සඳහා අවශ්‍ය ව සිටි වෙනත් අයෙක් වෙනුවට, අත් අඩංගුවට ගෙන වධහිංසා පමුණුවන ලද තැනැත්තෙකි. එහි ප්‍රතිඵලයක් වශයෙන් වකුගඩු ආබාධයකට ගොදුරු වු නමුත් මරණින් ගැලවුණි. වින්දිතයා විසින් මූලික අයිතිවාසිකම් පැමිණිල්ලක් ශ්‍රේෂ්ඨාධිකරණයට ගොනු කරන ලද අතර, 2003 අප්‍රියෙල් 4 වන දින ප්‍රකාශයට පත් කළ තින්දුව මගින් වධ හිංසා පැමිණවීම, නිති විරෝධි අත් අඩංගුවට ගැනිම හා රඳවා තබා ගැනිම යන අපරාධයන් වත්තල පොලිසිය විසින් කළ බව පිළි ගන්නා ලදි. 2003 සැප්තැම්බර් 23 දින නිතිපතිවරයා විසින් වත්තල පොලිස් ස්ථානයේ

ශ්‍රී ලංකාවේ යුක්තිය පසඳලිමේ ක්‍රමයේ ඇති ඌනතාවයන් ගෙන් සහ අකාර්‍යක්‍ෂමතාවයන් ගෙන් නිලධාරින් මෙන් ම අනෙකුත් බලපෑමක් සහිත පුද්ගලයන් ද උපරිම ප්‍රයෝජන ලබමින් අභි-චෝදනා පත්‍ර නිකුත් කිරිම වලක්වා ගෙන සිටිති. අණදිමේ වගකිම පිළිබඳ මුලධර්මය පිළි ගැනිම සම්බන්ධයෙන්, මෙරට අධිකරණ තුල තිබෙන නොඑකඟතාවය නිසා බලපෑමක් සහිත පුද්ගලයන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරින්ට තවදුරටත් සිය බලය අයුතු ලෙස පාවිච්චි කරමින්, පවතින ක්‍රමයේ ඌනතාවයන් ගෙන් වාසි ලබන්නට ඉඩ සැලසිම පිළිබඳ ප්‍රශ්නය තවත් තීව්‍ර වි තිබේ.

**ජීවිතවිමේ අයිතිය ආරක්‍ෂා කිරිමේ වගකිම**

ජීවිත්විමේ අයිතිය මුලික මිනිස් අයිතියකි. මෙම අයිතිය මානව හිමිකම් පිළිබඳ ජාත්‍යයන්තර මානව හිමිකම් නිතියේ හා ප්‍රමිතීන් හි ද, ශ්‍රී ලංකාව අත්සන් කොට ඇති ජාත්‍යයන්තර සම්මුතීන් මගින් ගිවිස ඇති පරිදි ද මෙම අයිතියට ගරු කිරිමටත් ආරක්‍ෂා කිරිමටත් බැඳි සිටියි. ශ්‍රී ලංකාව ද පාර්ශවයක් වන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියෙහි 6 (1) වගන්තියට අනුව සෑම මනුෂ්‍යයෙකුම සිය ජීවිතයට ආවේනික වු අයිතිවාකමක් භුක්ති විඳියි. කිසිදු තැනැත්තකුගේ ජීවිතය අත්තනෝමතික ලෙස ඔහුට හෝ ඇයට අහිමි නොකළ යුතුය.

මෙම සම්මුතියෙහි 4 වන වගන්තියට අනුව මෙම අයිතිය රටක සියළු වැසියන් යම්කිසි ජීවිත තර්ජනයකට මුහුණ දි සිටියත් ජීවිතයට ඇති අයිතිය සිමා නොවේ.

ජාත්‍යයන්තර මානවීය නිතී යටතට ගැනෙන 1949 ජිනිවා සම්මුති හතරටම පොදු වු 3 වන වගන්තියට ස්වදේශිය ගැටුම් වලට සම්බන්ධ සියළු පාර්ශවයන් යටත් වේ. ශ්‍රී ලංකාව මෙම සම්මුතියෙහි පාර්ශවකරුවෙකු වන බැවින් මෙම වගන්තිය ශ්‍රී ලංකාවට ද අදළ වේ. මෙම වගන්තියට අනුව "ගැටුමෙහි පාර්ශවකරුවන් නොවන සියළු දෙනාටම මානුෂික ලෙස සලකන්නට සියළු පාර්ශවකරුවන් බැඳි සිටිති. "මේ අනුව කවර අවස්ථාවක කුමන ස්ථානයක කුමන හේතුවක් නිසාවත් කිසිවෙකු ගේ ජීවිතයට හෝ පුද්ගලයාට ප්‍රචන්ඩ ක්‍රියා කිරිම විශේෂයෙන් ම මනුෂ්‍ය ඝාතනයෙහි යෙදිම අන්තර්ජාතික නිතීය යටතේ සපරාධී අපරාධයක් වෙයි.

බලන්න ජාත්‍යයන්තර අපරාධ අධිකරණය 17 ජුලි 1998 (A/CONF.183/9) 2002 ජුලි 01 සිට බලාත්මක විය

වගන්ති 8 (2) (c)(1)

ශ්‍රී ලංකාවේ අපරාධ විනිශ්චය ක්‍රමයෙහි සිදුවන වෙනස් විම් " සයුරෙහි පාවෙන හිම කන්දක" තිබෙන මන්දගාමිත්වය ප්‍රදර්ශනය කරන අතර මෙම ක්‍රමයෙහි තිබෙන බරපතළ අඩුපාඩු, මානව අයිතින් උල්ලංඝණය විමෙන් වින්දිතයන් බවට පත් වුවන් ට, යුක්තිය ඉටු කරවා ගැනිම සඳහා මහත් බාධාවක් වි තිබේ. අපරාධ විනිශ්චය ක්‍රමය දේශපාලන බලපෑමට නිබඳව ගොදුරු වෙන අතර සාක්‍ෂිකරුවන් ආරක්‍ෂා කිරිම පිණිස ප්‍රබල ක්‍රමයක් ද දක්නට නැත. මෙම ක්‍රමය කොපමණ දුරට ගරා වැටි ඇත් දැයි කිවහොත්

---

මුලස්ථාන පොලිස් පරික්‍ෂක සේන සුරවිර ඇතුළු පොලිස් නිලධාරින් හත් දෙනෙකුට එරෙහිව 1994 අංක 22 දරන පනත යටතේ අභි චෝදනා පත්‍ර ගොනු කරන ලදි.පසුව නිතිපතිවරයා විසින් වත්තල මුලස්ථාන පොලිස් පරික්‍ෂවරයා ගේ නම චුදිත ලැයිස්තුවෙන් ඉවත් කරන ලදි. 2004 නොවැම්බර් මස 21 දින එනම් ජෙරාඩ් පෙරේරා මෙම නඩුව සඳහා සාක්‍ෂි දිමට නියමිත දිනට පෙර දින වෙඩි තබා ඝාතනය කරන ලදි. ජෙරාඩ් පෙරේරා නිති විරෝධි අත් අඩංගුවට ගැනිම, රඳවා තබා ගැනිම සහ පොලිසියට ඇතුල් වන විට සෞඛ්‍ය සම්පන්නව සිටි ජෙරාඩ් පෙරේරා වත්තල පොලිසිය විසින් නිදහස් කරන විට බරපතළ ලෙස රෝගාතුර වි සිටිම සම්බන්ධයෙන් ඉහත නම් සඳහන් චුදිත පොලිස් නිලධාරින් වගකිව යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය මිට ඉහත ප්‍රකාශයට පත් කර තිබිය දිත් ( නඩු අංක එච් සි 326/ 03), ඉතිරි චුදිතයින් සය දෙනා වධ හිංසා පැමිණවිම පිළිබඳ ඍජු සාක්‍ෂි සහ ඇසින් දුටු සාක්‍ෂි නොමැතිය යන කාරණය මත 2008 අප්‍රියෙල් 02 දින මිගමුව මහාධිකරණය විසින් නිදහස් කරන ලදි.ආසියානු මානව හිමිකම් කොමිසම සඳහන් කරන පරිදි,වධහිංසාවට එරෙහි ප්‍රඥප්ති නිතියට අනුව " අත් අඩංගුවට ගැනිම, රඳවා තබා ගැනිම, කිකරු කර ගැනිම තුවාල සිදුවිම පොලිස් ස්ථානය තුළ සිදු වු බව ඔප්පු කළ කල් හි තම නිර්දෝෂ භාවය ඔප්පු කිරිම සැක කරුවන් ගේ වගකිමක් වෙයි. ශ්‍රී ලංකාවේ වෙනත් නඩු විභාග සඳහා යොද ගන්නා ඉහත කි නිතිමය මුල ධර්මය මුලික අධිකරණයේ විනිශ්චයකාරවරයා සම්පුර්ණයෙන් ම නොසලකා හැරියේය. ( ආසියානු මානව හිමිකම් කොමිසම විසින් ජෙරාඩ් මර්වින් පෙරේරා පිළිබඳ පිළියෙළ කළ තොරතුරු සංග්‍රහය)

පසුගිය විසි වසරක කාල පරිච්ඡේදය තුළ මානව අයිතීන් උල්ලංඝනය පිළිබඳ බහුතරයක් පැමිණිලි කිසි කලෙක විභාග කිරීමක් හෝ අධිකරණයට යොමු කිරීමක් හෝ සිදු වී නොමැත. පැමිණිල්ල විභාග කිරීම දක්වා ගිය බොහෝ නඩු විත්තිකරුවන් ට දඬුවම් දීමෙන් කෙළවර වූයේ කලාතුරකිනි. බොහොමයක් මානව හිමිකම් නඩු අතර මග දි එක්කෝ සාක්ෂි ප්‍රමාණවත් නොවීම, සාක්ෂිකරු ඉදිරිපත් නොවීම, නඩුවාර සංඛ්‍යාව දිගින් දිගටම කල් යාම, ඇතැම් විට පැමිණිල්ලේ නීතිඥවරයා නඩුවාරයට නොපැමිණීම වැදගත් නඩු සම්බන්ධයෙන් දක්නට ලැබුණි[4]. මෙය සරල ලෙස අප්‍රමාණවත් සම්පත් හෝ ආයතනික නොහැකියාව පිළිබඳ ගැටළුවකට (මෙකී කාරණාත් බාධක වේ)වඩා එය දේශපාලන අධිෂ්ඨානය පිළිබඳ ගැටළුවක් වෙයි.

මෙරට විධිමත් යුක්තිය පසිඳලීමේ ව්‍යුහයෙහි ඇති අසාර්ථක බව සම්බන්ධයෙන් දශක ගණනාවක් තුළ ශ්‍රී ලංකා ආණ්ඩු වෙත ජාතික හා ජාත්‍යයන්තර බලපෑම් එල්ල වුයේය. එකී බලපෑම් හේතු කොට මහත් ආන්දෝලන යට තුඩු දුන් සිද්ධීන් විභාග කිරීම පිණිස ශ්‍රී ලංකා රජයට ඇතැම් විට පරීක්ෂණ කොමිසන් සභා පත් කිරීමට සිදු විය.මෙය ද දඬුවමින් නිදහස් වීම පිටු දැකිම පිණිස එළදයි ප්‍රයත්නයක් නොවිය. එබඳු පරීක්ෂණ කොමිසන් සභා අතර නවතම ප්‍රයත්නය වුයේ ' සපරාධි ලෙස මානව අයිතීන් උල්ලංඝණය වූ සිද්ධීන් 16 සම්බන්ධයෙන් විභාග කිරීම පිණිස පත් කරන ලද ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභාවයි. මෙයින් අඩකටත් වඩා වැඩි සිද්ධීන් ප්‍රමාණයක් සම්බන්ධයෙන් වගකීම පැවරී තිබුනේ ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි සංවිධානයට එරෙහිව ශ්‍රී ලංකා හමුද විසින් සිදු කරන ලද මෙහෙයුම් අතරතුර දි පැහැර හරින ලද මානව අයිතීන් සම්බන්ධයෙනි.[5]

2005-2006 ත් අතර සිදු වු සිද්ධීන්ට අදළ මෙම පැමිණිලි සම්බන්ධ ගවේෂණාත්මක විස්තරයක් පහත දැක්වේ. මෙම සිද්ධීන් අතර මහජන නියෝජිතයින් ඝාතනය, ආධාර සේවකයින් සහ සිවිල් වැසියන් ඝාතනය ඇතුළු බලහත්කාරයෙන් අතුරුදහන් වීම් ද ඇතුලත් වෙයි. සමස්තයක් වශයෙන් මේ සියල්ලම සිදුවෙමින් පවතින සිදුවීම් පිළිබඳ අංශු මාත්‍රයක් වන අතර එය සයුරෙහි පාවෙන හිම කන්දක දෘශ්‍යමාන ශිඛරයක් වැන්න.

පරීක්ෂණ කොමිසන් සභා ශ්‍රී ලංකාව තුළ යුක්තිය පසිඳලීමේ යාන්ත්‍රණයක් වශයෙන් ක්‍රියා නොකරයි. ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභා බොහෝ විට සිය දේශපාලන සතුරන්ට එරෙහි අවියක් ලෙස භාවිතා කිරීම එසේත් නැත්නම් මානව අයිතීන් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් රාජ්‍යයට එල්ල වන ඉතා ප්‍රබල විවේචන වෙනත් අතකට හැරවීම පිණිස මෙවලමක් වශයෙනි. අධිකරණ බලයක් නොමැති මෙම පරීක්ෂණ කොමිසන් සභා සම්බන්ධයෙන් බලාපොරොත්තු විය හැකි ඉතාමත් යහපත් අංගය නම් සත්‍ය හෙළිදරව් කිරීම සම්බන්ධයෙන් දරන උත්සාහයයි. ප්‍රායෝගිකව ඔවුහු ඇතැම් අවස්ථාවලදී වින්දිතයින් ගේ පවුල් වල සාමාජිකයින් හට සීමිත අයුරින් වන්දි ලබා දීමටත් සමත් වුවත් ඇත්ත වශයෙන් ම සිදු වුයේ පොලිසිය

---

[4] උදහරණයක් වශයෙන් 1995 දි ද්‍රවිඩ තරුණයන් විසි තුන් දෙනෙකු ගේ මළ සිරුරු බොල්ගොඩ, අලව්ව සහ දියවන්නා ඔය අසබඩින් හමු අතර ඊට වගතිව යුත්තන් වශයෙන් විශේෂ කාර්ය බලකාලයේ හමුද හටයින් විසි දෙනෙකු අත් අඩංගුවට ගන්නා ලදි. 1996 මුල් භාගයේ දි නිදහස් කරන ලද අතර ඔවුහු සේවයට ද වාර්තා කරන ලදි. 1997 මාර්තු මස කොළඹ මහේස්ත්‍රාත් උසාවියේ මෙම නඩුව කිහිප වාරයක් කැඳවන ලද අතර නීතිපති වරයා හෝ ඔහු ගේ නියෝජිතයෙකු අධිකරණයට වාර්තා නොකිරීමේ හේතුවෙන් දිගින් දිගටම කල් ගියේය.(බලන්න- Vasu Bombard AG ON Bologda" ඉරිද ටයිම්ස් පත්‍රය 27 අප්‍රියෙල් 1997 මෙම පසුව මෙම නඩුවෙහි සැකකරුවන්ට පැහැර ගෙන යාම,අයුතු රඳවා ගැනිම සහ මනුෂ්‍ය ඝාතනය යන චෝදනා මත මහාධිකරණයේ නඩු පවරන ලදි.2000 ජුනි මස නඩුව විභාගයට ගත් අතර ප්‍රධාන සාක්ෂිකරු ගේ නොපැමිණීම නිසා නඩුව වාර ගණනාවක් කල් ගියේය. මේ අතර එක් සැකකරුවෙක් රට හැර ගියේ යැයි අනුමාන කෙරිණ.

[5] පැමිණිලි කිහිපයක් සම්බන්ධයෙන් එකිනෙකට පරස්පර චෝදනා තිබුනි. පැමිණිලි 16 න් 10 ක් සම්බන්ධයෙන් රජයට චෝදනා ඉදිරිපත් වි තිබු අතර ඇතැම් පැමිණිලි එක පිට එක වැටි තිබුනි. එල් ටි ටි ඊ යට එරෙහි ව චෝදනා 10 ක් ඉදිරිපත් වි තිබු අතර ඉන් දෙකක් සම්බන්ධයෙන් නැවත රජයට ද චෝදනා ඉදිරිපත් කර තිබුනි. කරුණා පාර්ශවයට පැමිණිලි කිහිපයක් මගින් රජයේ හමුද සමග එකාබද්ධව ක්‍රියා කිරීම සම්බන්ධයෙන් චෝදනා ඉදිරිපත් වි තිබුනි. ශ්‍රී ලංකා නාවික හමුදවට එරෙහිව පැමිණිලි හතරක් ද විශේෂ කාර්‍ය බලකායට එරෙහිව පැමිණිලි පහක් ද ගොනු කොට තිබුනි

විසින් සිදු කරන අපරාධ පිළිබඳ පරීක්ෂණ ප්‍රමාද වීමත්, සාක්ෂි විකෘති කිරීමේ සම්භාව්‍යතාවයකට ඉඩ සැදීමත් සහ වින්දිතයන් හා සාක්ෂිකරුවන් මහත් අවදානමකට ඇද දැමීමත් ය.

තවත් පරීක්ෂණ කොමිසන් සභාවක් පිහිටුවීම සත්‍ය වශයෙන් ම ශ්‍රී ලංකාව ජත්‍යායන්තර මානව හිමිකම් වගකීම් නොසපුරා ලන අතර එසේ වීමට නම් ප්‍රතිඵලයක් වශයෙන් අධිකරණ ක්‍රියා මාර්ගයන් ට ප්‍රවේශ වීමට වැඩි ඉඩ ප්‍රස්ථාවක් ද, මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ පහළ වැටීමක් ද සිදුවන්නේ නම් පමණි. දැනට පත් කොට ඇති පරීක්ෂණ කොමිසන් සභා ක්‍රියාත්මක වුයේ වත්මන් දේශපාලන හැඩ තලය තුල යම්කිසි ස්වාධීනත්වයකින් හා තාක්ෂණික විශේෂඥභාවයකින් නම්, ශ්‍රී ලංකාවේ යුක්තිය පසඳලිමේ පද්ධතියට වැදගත් දයකත්යක් සැපයිය හැකිව තිබුනි. නමුත් වත්මන් සන්දර්භය තුළ නොකඩවාම බරපතළ ලෙස මානව අයිතින් උල්ලංඝනය වීමත්, මානව අයිතිවාසිකම් සහ යුක්තිය පසදලිමේ යාන්ත්‍රණ තදින් දේශපාලනිකව පාලනය කරමින්, චූදිතයන් විසින් තොන් ලණුව අත දරා සිටිමත් හේතු කොට ගෙන, මෙම පරීක්ෂණ කොමිසන් සභාවන් හි ( හෝ අනුප්‍රාප්තික ) සාර්ථකත්වයක් දැකිම අසිරුය. සැබෑ ප්‍රතිසංස්කරණයකින් තොරව තොරව ශ්‍රී ලංකාවේ පරීක්ෂණ කොමිසන් සභා හුදෙක් සුදු හුනු ගෑමක් වෙයි. පරීක්ෂණ කොමිසන් සභා නොකඩවාම යුක්තිය ඉෂ්ට කිරීම සම්බන්ධයෙන් අසාර්ථක වීම හේතු කොට ගෙන මහජනතාව තුළ විශ්වාසය පළුදුවීමත් ප්‍රචන්ඩත්වය පිළිබඳ චක්‍රය තවත් ජව සම්පන්න වීමත් සිදුවෙයි.

ශ්‍රී ලංකාවේ පරීක්ෂණ කොමිසන් සභා, යුක්තිය පසදලිමේ උපාය මාර්ගයක් වශයෙන් අසාර්ථක වීම ප්‍රදර්ශනය වුයේ ශ්‍රී ලංකාවේ ජනාධිපති විසින් ඉහත කි පරීක්ෂණ කොමිසන් සභාවේ කටයුතු නිරීක්ෂණය පිණිස පත් කරන ලද ජාත්‍යයන්තර ස්වාධීන විශේෂ පුද්ගලයන් ගේ කන්ඩායම විසින් ඉදිරිපත් කරන ලද අවසාන නිගමනය තුලිනි. ඔවුහු ' ශ්‍රී ලංකා රජය, සිය හමුදවන් ගේ හැසිරීම පිළිබඳ පැමිණිලි විභාග කිරීමට' කිසිසේත් ම උනන්දු නොවේ. තවද, ඔවුහු ' යුක්තිය ඉෂ්ට වීම සම්බන්ධයෙන් සිදුවන ක්‍රමානුකුල බිඳ වැටීම සහ එළඹෙන බාධා හෙළිදරව් වීම පිළිබඳ ව බලයේ සිටින රජයේ සතුටට ද හේතු නොවිය[6].

ජනාධිපතවරයා විසින් ජාත්‍යයන්තර නියෝජිතයින් ගේ කන්ඩායමකට, පරීක්ෂණ කොමිසන් සභා සැසිවාර නිරීක්ෂණය පිණිස ආරාධනා කරන ලද්දේ, පරීක්ෂණ කොමිසන් සභා කටයුතු විනිවිදභාවයකින් යුක්තව හා පිළි ගත් ජාත්‍යයන්තර පිළිවෙත් හා ප්‍රමිතින්ට අනුකුලව සිදුවන බවට සහතික වීම පිණිසය. නමුත් ආරම්භයේ සිටම ජාත්‍යයන්තර නියෝජිත පිරිස කොමිසන් සභාවේ වැඩ කටයුතු උසස් මට්ටමකට ගෙන ඒම පිණිස දරන ලද උත්සාහයට රජය විසින් එදිරිවාදි ප්‍රතිචාරයක් දක්වන ලද්දේය. රජය විසින් නිර්මාණය කරන ලද ' ජාත්‍යයන්තර නියෝජිත කන්ඩායමට අභියෝග කිරීම සහ එකග නොවීමේ වාතාවරණය තුල' සහ එම නියෝජිත පිරිස සමග හුවමාරු කර ගන්නා ලද රාජකාරි ලිපි හුවමාරු වලදි පෙනි ගිය ආකාරයට කොමිසන් සභාව සමග සම්බන්ධතාවය ' නොරිස්සුම් සහගත හා අප්‍රසන්න ' එකක් වි යැයි ඔවුහු නිගමනය කළහ[7]. තවද, කොමිසමේ ක්‍රියාපටිපාටිය දියුණු කිරීම පිණිස ජාත්‍යයන්තර නියෝජිත පිරිස ඒක පාර්ශවීය ලෙස අසාර්ථික උත්සාහයක යෙදිණ. අවසානයේ දි ඔවුහු කොමිසන් සභාව;

1- නොකඩවා පැවති බරපතළ මත පිළිගැටුම් හේතු කොට ගෙන කොමිසන් සභාවේ ස්වාධීනත්වය පිරිහි යාම
2- වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ඵලදයි ක්‍රමයක් නොතිබිම

6 IIGEP ප්‍රසිධ ප්‍රකාශනය 14 අප්‍රියෙල් 2008 මුලාශ්‍රයඃ IIGEP-PS-006-2008
7 IIGEP ප්‍රසිධ ප්‍රකාශනය 14 අප්‍රියෙල් 2008 මුලාශ්‍රයඃ IIGEP-PS-006-2008

3- සැසිවාරයන් හි විනිවිද භාවයක් හෝ කාලෝචිත බවක් දක්නට නොලැබීම

4- රාජ්‍ය ආයතන විසින් පූර්ණ සහයෝගය නොදැක්වීම

5- මූල්‍ය ස්වාධීනත්වයක් නොමැති වීම

යන ප්‍රධාන කාරණා සම්බන්ධයෙන් කොමිසන් සභාව ජාත්‍යයන්තර ප්‍රමිතින්ට අනුරූප නොවන බව තීරණය කරන ලදී.

**<u>නීත්‍යානුකූල නොවන මරණ විභාග කිරීම හා අපරාධකරුවන්ට නඩු පැවරීම පිළිබඳ යුතුකම</u>**

ජාත්‍යයන්තර නීති හා ප්‍රමිතින්ට අනුව අනීත්‍යානුකූල මනුෂ්‍ය ඝාතන පිළිබඳ සාධාරණ චෝදනා විභාග කළ යුතු වේ. මෙම වගකීමට රාජ්‍යයන් ගේ යුතුකම් මෙන් ම මානව හිමිකම් උල්ලංඝනයන් හි වින්දිතයන් හට වන්දි ගෙවීම, සත්‍ය හෙළිදරව් කිරීම, මානව හිමිකම් ආරක්ෂා කිරීම, මානව හිමිකම් උල්ලංඝනය කරන අපරාධකරුවන් ට වගකීමට සැලැස්වීම හා එබඳු මානව හිමිකම් උල්ලංඝන ඉදිරියට යලි සිදු නොවන තැනට වග බලා ගැනීමත් ඇතුලත් වේ.

ICCPR හි 2(3) වගන්තියට අනුව මෙම ප්‍රඥප්ති අයිතීන් යම් පාර්ශවයක් විසින් උල්ලංඝනය කරනු ලබයි නම් වෙනත් කාරණා වලට අමතරව ඊට පිළියම් යෙදීම රාජ්‍ය පාර්ශවයන් භාර ගත යුතු වේ. මානව හිමිකම් කමිටුව ICCPR හි දෙවන වගන්තිය සඳහා සිය නිල අර්ථ කථනයෙහි 'මානව අයිතීන් උල්ලංඝනය පිළිබඳ විභාග ස්වාධීන මෙන් ම අපක්ෂපාති ආයතන විසින් කඩිනමින් හා අංග සම්පූර්ණවත් සාර්ථක ලෙසත් නිම කළ යුතු බව දක්වන ලදී. තවද, මෙම ප්‍රඥප්තියෙහි පාර්ශව රාජ්‍යයන් විසින් 'මානව අයිතීන් උල්ල්ංඝනය පිළිබඳ චෝදනා පරීක්ෂා කිරීමට අසමත් වීම ද, එකී රාජ්‍යයන් විසින් මෙම ප්‍රඥප්තිය උල්ලංඝනය කිරීමක් ලෙස' අර්ථ දක්වන ලදී. ඊට අමතරව
එබඳු විභාගයක් කිරීමට හා අධි චෝදනා ඉදිරිපත් කිරීමට තිබෙන වගකීම 'ජාතික හා ජාත්‍යයන්තර නීතිය යටතේ උල්ලංඝනය කිරීම් අපරාධ වශයෙන් ' පිළි ගෙන තිබෙන ප්‍රමාණයට, ලඝු විභාගයක් සහිතව හෝ රහිතව කෙරෙන මනුෂ්‍ය ඝාතන ද ඇතුලත්ව ඉස්මතු වන බවයි.2

එලෙසම නඩු විභාගයකින් තොරව කේවලාත්මක හා ලඝු විභාග වලට පසුව කරනු ලබන මනුෂ්‍ය ඝාතන ඵලදායි ලෙෂ විභාග කිරීම සහ වැළැක්වීම පිළිබඳ මූල ධර්මයන් හි 9 වන මූල ධර්මයට අනුව (3) රාජ්‍යයන් 'අංග සම්පූර්ණවත්, කඩිනමින් හා අපක්ෂපාත ලෙසත් අධිකරණ විභාගයකින් තොර, කේවලාත්මක හෝ ලඝු විභාගයන් ගෙන් පසුව කරනු ලබන මනුෂ්‍ය ඝාතන ද, නෑදෑයින් විසින් කරනු ලබන පැමිණිලි සහ වෙනත් විශ්වාස කටයුතු ලෙස ලැබෙන තොරතුරු පදනම් කොට ගත් අස්වාභාවික මනුෂ්‍ය ඝාතන පිළිබඳ සාධාරණ මරණ පරීක්ෂණ පැවැත්වීම, සාක්ෂිකරුවන් ගෙන් ප්‍රකාශ, භෞතික හා ලිඛිත සාක්ෂි එකතු කිරීම සහ විශ්ලේෂණය වෙත වගකීමක් පැවරේ. 18 වන මූලධර්මයට අනුව රාජ්‍යයන් අපරාධකරුවන් අධිකරණය ඉදිරියට ගෙන ආ යුතු 20 වන මූලධර්මයට අනුව ඉහතකී ආකාරයේ මනුෂ්‍ය ඝාතනයන් හි වින්දිතයින් සඳහා සාධාරණ සහ ප්‍රමාණවත් වන්දි ගෙවීමක් නියමිත කාලයක් තුල දි රාජ්‍යයන් විසින් කළ යුතුය.

1-මානව හිමිකම් කමිටුව; පොදු අර්ථ කථන අංක 31 ICCPR ප්‍රඥප්තියෙහි 2 වන වගන්තිය : ප්‍රඥප්තියෙහි රාජ්‍ය පාර්ශවකරුවන් වෙත පවරන ලද පොදු නෛතික වගකීම් හි ස්වභාවය: UN Doc CCPR/C/74/CRP.4/REV.6.21 April 2004 para 15

2- ඉහත 18 වන ඡේදය

3- ආර්ථික හා සමාජ මණ්ඩලය විසින් නිර්දේශිත යෝජනාව 1989/65 1989 මැයි 24

2008 අප්‍රියෙල් මස දී ජාත්‍යන්තර නියෝජිත කන්ඩායම සිය විරෝධය පළ කරමින් ඉල්ලා අස් වුවෝය. ඉන් අනතුරුව කොමිසන් සභාවේ සාමාජිකයින් කිහිප දෙනෙක් ද ඉල්ලා අස් වු අතර, නොවැම්බර් මස දී කොමිසන් සභා සැසිවාර ස්වාධින නිරීක්ෂකයින් ලෙස නිරීක්ෂණය කරමින් සිටි සිවිල් සමාජ සංවිධාන නියෝජිතයින් ද, විශේෂයෙන්ම අනතුරට භාජනය විය හැකි සාක්ෂිකරුවන් නිරාවරණය කිරිම සහ ඔවුන් හට බලපෑම් කිරිම, සාක්ෂි විමසිම පිණිස විඩියෝ තාක්‍ෂණ භාවිතා කිරිම අත් හිටුවිම පිළිබඳ නොසතුට සහ පැමිණිලි විභාග කිරිමේ අනාගත සිමිත ඉඩප්‍රස්ථා යනා දි හේතුන් මත ඔවුන් ගේ ඉල්ලා අස්විම් බාර දෙන ලදි. මේ සියල්ලෙන්ම සංන්නිවේදනය වු පණිවුඩය ඉතාමත් පැහැදිලි වුයේ ' ශ්‍රී ලංකා රජය සිය පුරවැසියන් ආරක්‍ෂා කිරිමට නොකැමති බවත් යුක්තිය ඉෂ්ට කිරිම පිණිස උනන්දුවක් නොමැති බවත්ය.

2009 පෙබරවාරි වන විට ශ්‍රී ලංකා හමුදව යුධ මෙහෙයුම් මගින් එල් ටි ටි ඊ ය සතු භුමියෙන් සැහෙන ප්‍රමාණයක් අල්ලා ගන්නා ලද අතර උතුරෙහි ඉතිරි කොටස් ද තමන් අල්ලා ගන්නා බව කියා සිටියෝය.

දෙපාර්ශවයම මෙම ගැටුමේ දි සිවිල් වැසියන් ගේ අයිතීන් උල්ලංඝනය කරන බවට ඔවුනොවුන්ට චෝදනා කර ගනිත්. සම්ප්‍රදයික යුද්ධය නිමාවකට පැමිණිමත් සමගම ( එල් ටි ටි ඊ ය ගරිල්ලා ප්‍රහාරයන් කඩින් කඩ එල්ල කිරිමට ඉඩ තිබේ) ශ්‍රී ලංකා රජයට දශක ගණනාවක මානව හිමිකම් කඩ කිරිම්, පිළිබඳ වගකිමේ බර දැරිමටත්, අති විශාල අවතැන් හා යුද්ධයෙන් පිඩාවට පත් වු ජන සංඛ්‍යාවක් රැක බලා ගැනිමටත්, මුලික යටිතල පහසුකම් නැවත ඉදි කිරිමටත්, සිවිල් සමාජයට කළ හානිය හා නිතියේ ආධිපත්‍ය ලෙස සැලකු ඉතා දරුණු ආරක්‍ෂක නිති රිතිත් පිළිසකර කිරිම පිළිබඳ වගකිමේ බර දැරිමට සිදුවනු ඇත. එල් ටි ටි ඊ ය සිවිල් වැසියන් සම්බන්ධයෙන් සිදු කරන ලද මානව හිමිකම් කඩ කිරිම් ඵලදායි විභාග කිරිමට ශ්‍රී ලංකා බලධාරින්ට ඇත්තේ අඩු ධාරිතාවයක් වන අතර, ඊටත් වඩා තමන් ගේ ම හමුද විසින් සිදු කරන ලද මානව හිමිකම් හා මානවීය නිතිය උල්ලංඝනය විම සම්බන්ධයෙන් සාර්ථක ලෙස විභාග කිරිමට හා නඩු පැවරිමට ඇත්තේ අඩු හැකියාවකි.

මැතකදි මෙරට සිදු කරන ලද කෲර ක්‍රියා, පිහිටුවන ලද පරීක්ෂණ කොමිසන් සභා එසේත් නැත්නම් දැනට සිදු වෙමින් පවතින ප්‍රචන්ඩ ක්‍රියා වැළැක්විම සහ අතීතයේ මානව හිමිකම් කඩ කිරිම් සම්බන්ධයෙන් සැබෑ ලෙස වගකිම බාර ගැනිම පිණිස වගකිව යුත්තන්ට ක්‍රියා කිරිමට අවශ්‍ය සහයෝගය මෙන් ම තිරසාර ලෙස මානව හිමිකම් නියාමනය කිරිම හා ඊට අවශ්‍ය තාක්ෂණික සාහය ලබා දිම පිණිස ශ්‍රී ලංකාවේ මෙන් ම ජාත්‍යයන්තර ප්‍රජාව තුලත් පැවති වාද විවාද කෙරෙහි ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් මෙම වාර්තාව මගින් නැවතත් අවධානය යොමු කරයි.

ශ්‍රී ලංකාවට තවදුරටත් මෙලෙස ඉදිරියට යා නොහැකිය.

නිර්දේශ සාරංශයඃ

නිසැකවම ශ්‍රී ලංකාවේ පවතින තත්වය අභියෝගාත්මකය. එල් ටී ටී ඊ සමග පවතින යුද්ධය විසින් රාජ්‍ය සම්පත් අති විශාල ප්‍රමාණයක් ඉල්ලා සිටියි. සිය විවේචකයින් කෙරෙහි දක්වන නිල එදිරිවාදිකම් සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යයන්තර ක්‍රියාකාරකම් විෂයෙහි දක්වන විරෝධතාවත් නිසා මානව අයිතිවාසිකම් පිළිබද ගැටළු සම්බන්ධයෙන් ජාත්‍යයන්තර ප්‍රජාව සමග අන්නොන්‍ය සහයෝගිතාවකට තිබෙන ඉඩ කඩ අහුරාලයි. යුක්තිය ඉටු කරවා ගැනිම පිණිස මෙරට තිබෙන සිමාවන් ඉදිරියේ සහ නොකඩවා කඩ කෙරෙන මානව හිමිකම් උල්ලංඝනත් සමග ගත් කළ අපට ජාත්‍යයන්තර ප්‍රජාව ගේ බලපෑම හැර වෙනත් විසඳුමක් නොපෙනේ. ජාත්‍යයන්තර ප්‍රජාව සිය සුවිශේෂ බලපෑම පාවිච්චි කරමින් ශ්‍රී ලංකා බලධාරින්ට පසුගිය ජාත්‍යයන්තර මානව හිමිකම් සහ මානවීය නිතී උල්ලංඝනයන් විභාග කිරිමටත්, සැක කටයුතු අපරාධකරුවන්ට සාධාරණත්වය පිළිබඳ ජාත්‍යයන්තර ප්‍රමිතින්ට අනුව අභිචෝදනා ඉදිරිපත් කිරිමට පෙළඹව විමත්, වින්දිතයින්ට වන්දි ගෙවිම සහතික කිරිම සහ අනාගත ප්‍රචණ්ඩකාරිත්වයන් වැළැක්විමටත් පෙළඹවිය යුතුය.

ප්‍රබල තත්වයක සිටින ජාත්‍යයන්තර ප්‍රජාව ප්‍රචණ්ඩත්වයේ ගමන් පථය වෙනස් කිරිම පිණිස නිශ්චිත ප්‍රතිසංස්කරණ සඳහා බල කළ යුතු අතර, දඩුවමින් නිදහස් විම පිටුදැකිම පිණිස ශ්‍රී ලංකාවේ ප්‍රගතිය මැනිය හැකි අවම ප්‍රමිතීන් පිහිටු විය යුතුය.

ඇම්නිස්ටි ඉන්ටර්නැෂනල්, ශ්‍රී ලංකා රජයට හා ජාත්‍යයන්තර ප්‍රජාවටත් එක්ව ශ්‍රී ලංකාවේ දඩුවමින් නිදහස් විම පිළිබඳ චක්‍රය බිඳ දැමිමට;

⋆ මානව අයිතීන් උල්ලංඝනය කරන සැකකරුවන් යුක්තිය ඉදිරියට ගෙන එන ජාතික ප්‍රතිපත්තියකට මුල පිරිම ක්‍රියාත්මක කිරිම හා සහයෝගය දැක්විම;

⋆ රජයේ හමුදා විසින් සිදු කරන ලද වැරදි ක්‍රියා ප්‍රසිධියේ පිළිගනිමින් ඒවා හෙළා දකින ලෙසටත්;

⋆ පරීක්ෂණ සාර්ථක ලෙස නිම කරන බවට සහතික විම, සියළු අපරාධකරුවන්ට ඔවුන් භුක්ති විදින දේශපාලන තරාතිරම හෝ ඉහළ සමාජ තත්වය නොසළකා අධි චෝදනා ඉදිරිපත් කරන ලෙසටත්;

⋆ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිමේ වැඩ පිළිවෙළක් ආරම්භ කරමින් එය ඉතා ප්‍රවේශමෙන් ආයතන ගත කිරිමෙන් ද, ඊට ප්‍රමාණවත් සම්පත් හා තාක්ෂණික ආධාර ලබා දිමෙන්;

අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ හා වැඩි දියුණු කිරිම් අත්පත් කර ගැනිමට නම්, බිම් මට්ටමේ ස්වාධින නියාමනයක් දෘශ්‍යමාන විය යුතු අතර, සපරාධි මානව හිමිකම් කඩ කිරිම් විභාග කිරිමටත් ජාතික මට්ටමින් යුක්තිය ඉෂ්ට කිරිම සහතික වන ආයතනත් තිබිය යුතුය. ස්වාධිනත්වය ආරක්ෂා කිරිම පිණිස එබදු ආයතනයන් හි වර පත්‍රය ජනාධිපති ආඥාවකින් ලබා දිම වෙනුවට ජාත්‍යයන්තරව ලබා දිම වැදගත්ය.

මෙය ඉටු කර ගත හැක්කේ;

⋆ සියළු පාර්ශවයන් විසින් කරනු ලබන අපචාර නියාමනය කිරිම පිණිසත්, සිවිල් වැසියන් ආරක්ෂා කිරිම සහ දේශිය ආයතනයන් හි ධාරිතාවය ප්‍රවර්ධනය කිරිම පිණිසත් එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයට මෙරට ක්ෂෙත්‍ර සමීක්ෂණ පිණිස අවසර දිමෙනි.

2- ශ්‍රී ලංකාවේ පරීක්ෂණ කොමිසන් සභා සහ දඩුවමින් නිදහස් කිරිම:

'පරීක්ෂණ කොමිසන් සභා වූ කලී, සිරුර කිලිපොලා යන සිදුවිම් මාලාවකට හිටි අඩියේ දක්වන ප්‍රතිචාරයක් වන අතර අදාළ නිති ක්‍රියාත්මක කිරිමේ බලධාරින් විසින් ගනු ලබන බල සහිත පියවරයන්ට ආදේශකයක් නොවිය යුතුය. එසේම එය, ඉදිරි දැක්මක් සහිත හා විස්තීරණ මානව අයිතිවාසිකම් ආරක්ෂා කිරිමේ බල සහිත ව්‍යුහයකට ආදේශකයක් ද නොවිය යුතුය'. **ලුවිස් ආබර්- එක්සත් ජාතින් ගේ සංවිධානයේ මානව**

**හිමිකම් පිළිබඳව මහ කොමසාරිස්- 2008 ඔක්තෝබර් මස ඇය ගේ ශ්‍රී ලංකා සංචාරය අවසානයේ දි කළ ප්‍රකාශය**

***නෛතික පසුබිම හා ඉතිහාසය***

1948 අංක 17 දරන ජනාධිපති පරීක්ෂණ සභා පනතෙන් බලාපොරොත්තු වුයේ රජයේ දෙපාර්තමේන්තු පරිපාලනය, කාර්යාල සහ ආයතන හෝ රාජ්‍ය සේවයේ සාමාජිකයින් ගේ විෂමාචාර පිළිබඳ විමර්ෂනයන් ආරම්භ කිරිම පිණිස වු යාන්ත්‍රණයක් පිහිටුවිමය[8]. එමගින් කිසිසේත් ම සපරාධී මානව හිමිකම් කඩ කිරිම් විමර්ශනය කිරිම බලාපොරොත්තු නොවිය. පනතෙහි පෙළ පුළුල් අරුත් සහ මහජන ආරක්ෂාව හා ශුභ සාධනය පිළිබඳ පොදු වගන්ති සහිත වු අතර විධායකයට ඉතා පුළුල් බලතල ප්‍රදනය කොට තිබුනි. මේ අනුව පරීක්ෂණ කොමිසන් සභා අනුප්‍රාප්තික ජනාධිපතිවරුන්ට මානව අයිතිවාසිකම් පිළිබඳ ගැටළු සලකා බලන්නැයි එල්ල වන පිඩනයන් ට මුහුණ දිම සඳහා මෙවලමක් වු අතරම එයම පරීක්ෂණ කොමිසන් සභාවේ සැසිවාර හා පරීක්ෂණයන් හි අවසාන නිගමන තිරණාත්මකව පාලනය කිරිමට ද යොදා ගැනිණ.

මෙම පනත මගින්, කොමිසන් සභා සඳහා කාර්‍ය්‍ය සාධන තිරණය කිරිම, සාමාජිකයින් පත් කිරිම, නව සාමාජිකයින් පත් කිරිම, ඕනෑම අවස්ථාවකදි පිහිටුවන ලද කොමිසන් සභාවක් අහෝසි කිරිම, කොමිසන් සභාවේ සාමාජිකයින් හෝ එහි මුලාසනය නොවිමසා එහි ලේකම් වරයාට උපදෙස් දිමට බලය ජනාධිපතිවරයා වෙත අභිමතානුසාරි බලයක් පවරා ඇත. තවද පනතට අනුව පරීක්ෂණ කොමිසන් සභා විසින් සිය වාර්තා හෝ නිර්දේශ ප්‍රසිධ කිරිමට බැඳි නැති අතර යම් පරීක්ෂණයක් හෝ එහි කොටසක් ප්‍රසිධ කිරිම හෝ නොකිරිම ද ජනාධිපතිවරයා සතු අභිමතානුසාරි බලයකි.

ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන විසින් 1977 අගෝසතු මස ජනවාර්ගික ප්‍රචන්ඩ ක්‍රියාවන් ට තුඩු දුන් හේතුන් හා එම වටපිටාව පරීක්ෂා කිරිම පිණිස විශ්‍රාම ලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු එම්. සි. සන්සෝනි ගේ සභාපතිත්වයෙන් පත් කරන ලද පරීක්ෂණ කොමිසන් සභාව මෙම පනත යටතේ මානව හිමිකම් පසුබිමක් යටතේ පත් කරන ලද ප්‍රථම කොමිසන් සභාව විය. මෙම කොමිසන් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කරනවා වෙනුවට රජය නව නිති සම්පාදනය කරමින් රජයේ හමුදාවන් හි අවකල් ක්‍රියාවන් ආවරණය කරන ලද්දේය. කොමිසන් සභාවේ සැසි වාරයන් දේශපාලන බලපෑම් මගින් අවහිර වු බවට වාර්තා පළ වුයේය.[9]

එම වාර්තාව මගින් ද්‍රවිඩ දේශපාලන නායකත්වයට එරෙහි සිදු කරන ලද ප්‍රචන්ඩ ක්‍රියා සම්බන්ධයෙන් වරද පවරන ලද අතර, මේ සම්බන්ධයෙන් වැදගත් ඇසින් දුටු සාක්ෂිකරුවන් ගේ පත් ප්‍රකාශන මගින් රජයේ මැදිහත් විම සනාථ කෙරිණ ( චෝදනා පිළිබඳ විස්තරයක් වාර්තාවේ අඩංගු විය). සන්සෝනි මහතා සිය වාර්තාවේ දි පුරවැසියන් ආරක්ෂා කිරිම හෝ ප්‍රචන්ඩ ක්‍රියා වැළැක්විමට අසමත් වු සැටිත් පොලිස් නිලධාරින් අතළොස්සක් ද්‍රවිඩයන් ට එරෙහිව ප්‍රචන්ඩ ක්‍රියා උසි ගැන්විමේ හා සහභාගි වු බවත් සදහන් කරයි. එම

---

[8] 1-1948 අංක 17 දරන පරීක්ෂණ කොමිසන් සභා පනතේ 2 (1) වගන්තිය.
2- කිෂාලි පින්ටෝ ජයවර්ධන " අයිතින් පිළිබඳ අවධානයඃ ශ්‍රී ලංකාවේ ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභා පිළිබඳ තක්සේරුවක්" සන්ඩේ ටයිම්ස් 14 ජනවාරි 2007

[9] කිෂාලි පින්ටෝ ජයවර්ධන " අයිතින් පිළිබඳ අවධානයඃ ශ්‍රී ලංකාවේ ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභා පිළිබඳ තක්සේරුවක්" තෙවන කොටස සන්ඩේ ටයිම්ස් 17 පෙබරවාරි 2007ඃ එම ලිපියෙහි හුල්- රාජන් ( 2001) "ශ්‍රී ලංකාවේ බල අභිමානය, මිත්‍යාවන්, පරිහානි හා ඝාතන" මානව හිමිකම් සඳහා (යාපනය) සරසවි ආචාර්යවරුඃ වාසල ප්‍රකාශන. කොළඹ " පුරවැසි පනත හා ෆෙඩරල් පක්ෂයේ උපත", පළමුවන පරිච්ඡේදය තුන් වන කොටස 7 වන පිටුවඃ
හිටපු අග විනිසුරු මිලානි ක්ලෝඩ් සන්සෝනි තමා සමග ම අරගලයක් කරන තැනැත්තෙක් බවට පත් වි සිටියේය. කොමිසන් සභාවේ අවසාන භාගයේ දි තම හිතෛෂියෙකුට බරපතළ ලෙසම " මම කිසි කලෙක දේශපාලන කොමිසමක ප්‍රධානත්වය දරා නැත්තෙමි"කියා සිටියේය. එම ග්‍රන්ථයෙහි ම 37 වන පිටුව.
සන්සෝනි වාර්තාව විමසිමේ දි පුද්ගලයා අභිබවා යමින් ඔහු කටයුතු කළ වාතාරණය සළකා බැලිය යුතුය. රටක දේශපාලනය හිතුවක්කාර මුහුණුවරක් ගත් සන්දර්භයක දි, විධායකය බලවත් හා අගරු ප්‍රතිපත්තින් හි පිහිටි කල් හි උසස් මට්ටමේ කොමිසන් සභා වාර්තාවක් යම් පුද්ගලයෙකු ගෙන් අපේක්ෂා කිරිම ඉහළ ලන්සු තැබිමකි.

වාර්තාව විසින් ද්‍රවිඩ වින්දිතයින් හට වන්දි ගෙවන ලෙසට නිර්දේශ ඉදිරිපත් කර තිබුනි. වාර්තාවෙන් හඳුනා ගත් අපරාධකරුවන් ට නඩු නොපවරන ලදි. මේ සියල්ල වෙනුවට 1982 දී පාර්ලිමේන්තුව 1982 අංක 20 දරන දඬුවමින් නිදහස් කිරිමේ පනත සම්මත කරමින් ' රජයේ නියෝජිතයෙකුට හෝ සේවකයෙකුට තමා විසින් කරන ලද ඕනෑම ක්‍රියාවකට නිතිමය ක්‍රියා මාර්ග ගැනිම වළක්වන ලද අතර, ' නෛතික හෝ වෙනත් සත් භාවයකින්, නිතිය හා සාමය ආරක්‍ෂා කිරිම පිණිස 1977 අගෝස්තු 1 දින සිට 1977 අගෝස්තු 31 දින අතර තුර කරන ලද ක්‍රියා නිදහස් කරන ලදි. මෙම පනත තවදුරටත් 1988 දෙසැම්බර් මස සංශෝධනය කරමින් දඬුවමින් නිදහස් කිරිමේ කාල පරිච්ඡේදය 1988 දෙසැම්බර් 16 වන දින දක්වා දිර්ඝ කරන ලදි[10].

1983 ජුලි මස ද්‍රවිඩ විරෝධි කැරලි කෝලාහල පැතිරිම එල් ටි ටි ඊ හා ශ්‍රි ලංකා රජය සමග මහා පරිමාණ ආයුධ සන්නද්ධ ගැටුමකට මුල පුරන ලද අතර ශ්‍රි ලංකාව තුළ වැඩි පිරිසක ගේ මානව අයිතිවාසිකම් බරපතළ ලෙස උල්ලංඝනය වින. 1980 දශකයේ අගභාගයේ දි බලහත්කාරයෙන් අතුරුදහන් විම හා අධිකරණ බාහ්‍ය මිනි මැරුම් සංඛ්‍යාව ද සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගියේය. මෙම මානව හිමිකම් උල්ලංඝනයන් සිදු වුයේ දිවයිනේ ප්‍රධාන සන්දර්භයන් දෙකක් තුල පැන නැගුන ගැටුම් තුල දීයඃ පළමු වැන්න රජය හා එල් ටි ටි ඊ ය අතර උතුරු හා නැගෙනහිර පළාත් හි සිදු වු අතර, දෙවැන්න රජයේ හමුද සහ දකුණු පළාත කේන්ද්‍ර කොට ගත් ජනතා විමුක්ති පෙරමුණ අතරත් සිදු වුයේය. මෙම තත්වය පසුබිම් කොට ගෙන, 1990 ඔක්තෝබර් මස වන විට තවදුරටත් ශ්‍රි ලංකාවේ පිරිහෙන මානව හිමිකම් තත්වයේ වර්ධනයක් නොවන්නේ නම්, පැරිසියේ පවත්වන්නට නියමිත ව තිබූ ශ්‍රි ලංකා ආධාර කන්ඩායම රැස්විමේ දි මෙරටට ආධාර ලබා දිමට දි තිබූ ප්‍රතිඥව ඉල්ලා අස් කර ගැනිමට එම කන්ඩායම සුදනම් විමේ වාතාරණයක් නිර්මානය වි තිබුනි. මේ තත්වය යටතේ ශ්‍රි ලංකා රජය ජාත්‍යයන්තර විවේචකයින් සමග කටයුතු කිරිම ආරම්භ කළේය[11].

*'ඇම්නිස්ටි ඉන්ටර්නැෂනල් ය ඇති වු වෙනස පැසසුමට ලක් කරමින්, ශ්‍රි ලංකාවේ මානව හිමිකම් තත්වය වැඩි දියුණු කිරිම පිණිස රජය සමග කිට්ටු සහයෝගිතාවයකින් ක්‍රියාකිරිමට ප්‍රතිඥ දුන් නමුත් රජය එම ප්‍රතිඥ බරපතළ ලෙස බාර ගත්තේ නැත. මේ අතර නව රාජ තාන්ත්‍රික උපාය මාර්ගයක් එළි දැක්කේය.*

*ශ්‍රි ලංකාවට ආධාර කන්ඩායමේ සම්භාධක පැනවිම කල් දමා ගැනිමට සමත් වුයේ සිය විවේචකයින් දිගින් දිගටම පිහිටුවන ලද ජනාධිපති කොමිසන් පරීක්‍ෂණ සහා හෝ තාවකාලික කමිටු සමග ගැට ගසා දැම්මෙනි. නමුත් මෙමගින් සපරාධී ප්‍රචන්ඩ ක්‍රියා සම්බන්ධයෙන් නෛතික වගකිම් පැවරිමක් හෝ පවතින ව්‍යුහයේ ප්‍රතිසංස්කරණයක් හෝ ප්‍රකාශ නොවිය. මේ අතර ශ්‍රි ලංකාවේ මානව හිමිකම් වාර්තාව ලොව ඉතාමත් අපකිර්තිමත් වාර්තා වලින් එකක් බවට පත් වුයේය'.*

1991 වන විට එක්සත් ජාතින් ගේ සංවිධානයේ බලහත්කාරයෙන් හෝ අකැමැත්තෙන් අතුරුදහන් වුවන් පිළිබඳ ක්‍රියාකාරි කමිටුවට බලහත්කාරයෙන් අතුරුදහන් කිරිම් 15,000 ආසන්න ප්‍රමාණයක් පිළිබඳ පැමිණිලි

---

10 දඬුවමින් නිදහස් විමේ ( සංශෝධිත ) පනත අංක 60 1988

11 1991 දත්වාම මානව හිමිකම් කඩ කිරිම පිළිබඳ විවේචනයන් ට ශ්‍රි ලංකා රජය විසින් දක්වන ලද ප්‍රතිචාරය වුයේ එම විවේචන සම්පුර්ණයෙන් ම ප්‍රතික්ෂේප කිරිමත්, ජත්‍යයන්තර මානව හිමිකම් සංවිධනයන්ට ශ්‍රි ලංකාවට ඇතුල් විමට අවසර නොදිමත්ය. උදහරණයක් වශයෙන් ඇමනිස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයට 1982 සිට 1997 දක්වාම ශ්‍රි ලංකාවට ඇතුල් විමට අවසර දෙනු නොලැබුණි. 1986 දි ඇමනිස්ටි ඉන්ටර්නැෂනල් ය සිය පළමු උද්ඝෝෂණය බලහත්කාරයෙන් අතුරුදහන් කිරිම් පිළිබඳ ව ආරම්භ කළේය. 1991 අවසාන භාගයේ දි ඉහත කි අළුත් වාතාරණය යටතේ ඇමනිස්ටි ඉන්ටර්නැෂනලය විසින් ශ්‍රි ලංකාවේ මානව හිමිකම් ආරක්‍ෂා කිරිම පිණිස නිර්දේශ 32 ක් ඉදිරිපත් කළ අතර ඉන් 30 ශ්‍රි ලංකා රජය විසින් පිළි ගන්නා ලදි.රජය විසින් ප්‍රතික්ෂෙප කළ නිර්දේශ දෙකම දඬුවමින් නිදහස් කිරිම පිළිබඳවයඃ ශ්‍රි ලංකා රජය බලහත්කාරයෙන් අතුරුදහන් කිරිම් පිළිබඳව ජනාධිපති පරීක්‍ෂණ කොමිසන් සහාවට 1991 ජනවාරි 11 දිනට පෙර සිදු වු අතුරුදහන් විම් පිළිබඳව සොයා බැලිමට ඉඩ දිම ප්‍රතික්ෂේප කළ අතර දඬුවමින් නිදහස් කිරිමේ පනත අහෝසි කිරිම ප්‍රතික්ෂේප කළේ එය දැනටමත් අවලංගු යැයි කියමිනි.

ලැබුන අතර ඉන් 4,932 ශ්‍රී ලංකා රජය වෙත යොමු කරන ලදි[12]. ජනාධිපති රණසිංහ ප්‍රේමදස ශ්‍රී ලංකාවේ ප්‍රථම පරීක්ෂණ කොමිසන් සභාව වන 'අතුරුදහන් වූවන් පිළිබඳව' පරීක්ෂා කිරිමට 1991 දි පිහිටුවන ලද්දේය.

මෙම කොමිසන් සභාවේ කාර්ය නිර්දේශය ඉතා සිමිත එකක් වූ අතර ඊට පැවරි තිබුනේ එකි කොමිසන් සභාව පිහිටුවිමෙන් පසු වාර්තා වන අතුරුදහන් විම් පිළිබඳව පමණි(ශ්‍රී ලංකාවේ සිදු වූ අතුරුදහන් විම් සිය දහස් ගනනින් බහුතරයක් අතුරුදහන් විම් වාර්තා වූයේ 1988-1990 අතර දීය). 1991 සිට බලහත්කාරයෙන් සිදුවූ අතුරුදහන් විම් හා අනෙකුත් මානව හිමිකම් කඩ කිරිම් විභාග කිරිම පිණිස පරීක්ෂණ කොමිසන් සභා නමයක් පත් කරන ලද්දේය[13]. සියළුම කොමිසන් සභා කෙසේ වෙතත් බහුතරයක් කොමිසන් සභා විසින් චූදිත අපරාධකරුවන් හදුනා ගත් අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් මානව හිමිකම් උල්ලංඝන පිළිබඳ නඩු පැවරු සංඛ්‍යාව ඉතාමත් සිමිත වුයේය. 1994 දි, ඇම්නස්ටි ඉන්ටර්නැෂනලය විසින් ***ශ්‍රී ලංකාවː යුක්තිය කවද නම් ඉටු වේද?*** නමින්; 1983 සිට ඉතාමත් ප්‍රසිධ අධිකරණ බාහ්‍ය ඝාතන හා බලහත්කාරයෙන් අතුරුදහන් කිරිමේ සිද්ධින් 18 ක් පිළිබඳව රජය විසින් පවත්වන ලද විභාගයන් හි වාර්තා සංග්‍රහයක් පළ කරන ලදි. වින්දිතයින් 750 කට ආසන්න සංඛ්‍යාවක් හා බැදි පැවතුන මෙම සිදුවිම් පොලිස් අත්අඩංගුවේ දි වධ හිංසා පමුණුවා ඝාතනය කරන ලද නිතිඥවරයෙකු ගේ සිද්ධියේ සිට නැගෙනහිර පළාතේ අවතැන් වූවන් ගේ කඳවුරක පුද්ගලයින් 159 දෙනෙකු කන්ඩායමක් අතුරුදහන් කිරිම දක්වා සිද්ධින් ඇතුලත් වුයේය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ගොඩ නැගෙමින් සිටි විරුද්ධ පක්ෂ පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙකු වූද, වර්තමාන ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා මෙබඳු බලහත්කාර අතුරුදහන් කිරිම් පිළිබඳ ව ජාත්‍යයන්තරව උද්ඝෝෂණය කරමින් සිටි අතර මෙම ප්‍රචන්ඩ ක්‍රියා නතර කරන ලෙසට ශ්‍රී ලංකා රජයට බලපෑම් කරන මෙන් ජාත්‍යයන්තර ප්‍රජාවට විශේෂයෙන් ම ආධාර කන්ඩායමට කියා සිටියේය[14]. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් වාර්තාවෙහි උපුටා දක්වන ලද සිද්ධින් අතරින් වරදකරුවන් හදුනා ගන්නා ලද්දේ සිද්ධින් දෙකක් සම්බන්ධයෙන් පමණි. එම සිද්ධින් දෙකෙහි දිම මනුෂ්‍ය ඝාතන පිළිබඳ වැරදිකරුවන් හදුනා නොගත් අතර වෙනත් කරුණු සම්බන්ධයෙන් සුළු නිලධාරින්ට දඩුවම් කරන ලද්දේය. ඉන් එකක් වුයේ 1989 දි පොලිසිය විසින් වධහිංසා පමුණුවා ඝාතනය කරන ලද නිතිඥවරයෙකුට අදළ වූ අතර දෙවැන්න 1989-1990 අතර දි ඇඹිලිපිටිය පාසැල් ළමුන් 25 දෙනෙකු ඝාතනය කිරිම පිළිබඳ සිද්ධියයි[15].

---

12 ශ්‍රී ලංකාවː එක්සත් ජාතින් ගේ සංවිධානයේ බලහත්කාරයෙන් අතුරුදහන් කිරිම් හෝ අතමැත්තෙන් අතුරුදහන් වූවන් පිළිබඳ ව 1991 සහ 1992 ශ්‍රී ලංකාවට පැමිණිමෙන් පසු ඉදිරිපත් කරන ලද නිර්දේශ ඇතුලත් වාර්තාව- ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සූචිය ASA 37/04/98

13 බලහත්කාරයෙන් පුද්ගලයින් පැහැර ගෙන යාම පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභාවන් තුනක් පත් කරන ලදි.( 1991, 1992, සහ 1993) ජනාධිපති ඩි.බි.විජේතුංග විසින් ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභාවක් 1993 ⁾ පත් කරන ලදි. ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග විසින් විවිධ විෂයන් ආවරණය පිණිස පහත සදහන් කොමිසන් සභා පත් කරන ලදි.1994 කලාපීය මට්ටමින් අතුරුදහන් විම් හා බලහත්කාරයෙන් පැහැර ගෙන යාම විභාග කිරිම පිණිස කොමිසන් සභාව; 1998 දි ඇතැම් පුද්ගලයන් පැහැර ගෙන යාම හා අතුරුදහන් කිරිම සොයා බැලිම පිණිස ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභාව; 1995 දි බටලන්ද නිවාස සංකිර්ණය තුළ පවත්වා ගෙන ගිය අනවසර රඳවා ගැනිම් හා වධ හිංසා පැනවිම පරීක්ෂා කිරිම පිණිස කොමිසන් සභාව පත් කරනලද්දේ 1995 දිය. 2000 ඔක්තෝබර් මස බිදුනු වැව පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ සිදු වූ සිදුවිම් පරීක්ෂා කිරිම පිණිස 2001 දිද,1981-1984 අතර සිදු වූ වාර්ගික ප්‍රචන්ඩත්වය පිළිබඳ සත්‍ය විභාග කිරිමට 2001 දි ද ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභා පත් කරන ලදි.

14 1990 දි මහින්ද රාජපක්ෂ කටුනායක බණ්ඩාරනායක ජාත්‍යයන්තර ගුවන් තොටුපළේ දි බලහත්කාරයෙන් අතුරුදහන් කිරිම් සම්බන්ධ තොරතුරු ජිනිවා හි පිහිටි එක්සත් ජාතින් ගේ සංවිධාන මානව හිමිකම් කාර්යාලයට ගෙන යාමට තැත් කරද්දි අත්අඩංගුවට ගන්නා ලදි.

15 නිතිඥ විජේදස ලියනාරාච්චි ඝාතනයට අදළ පොලිස් නිලධාරින් වරදකරුවන් කරන ලද්දේ කුමන්ත්‍රණය කිරිම හා අනවසර ලෙස සිරකර තැබිම යන චෝදනා මත වන අතර 1991 දි ඔවුන්ට නියම කරන ලද්දේ අත් හිටවු දඩුවම්ය. මෙම සිද්ධිය 1995 දි බටලන්ද කොමිසන් සභාවේ දි යලිත් මතු වු අතර වින්දිත විජේදස ලියනාරච්චිට රහසිගත ස්ථානයක දි මිය යන තෙක් වධහිංසා පමුණුවන ලද බව හෙළිදරව් වු නමුත් ඒ පිළිබඳව කිසිදු පියවරක් නොගත්තේය. ඇඹිලිපිටිය සිද්ධිය සම්බන්ධ සැකකරුවන්ට කුමන්ත්‍රණය කිරිම, ඝාතනය කිරිමේ අරමුණින් පැහැර ගෙන යාම, අනවසර ලෙස අත්අඩංගුවේ තබා ගැනිම යන චෝදනා සඳහා අවුරුදු 10 ක සිර දඩුවමක් නියම කරන ලදි. මෙම සිද්ධින් දෙකේ දිම ඉහළ නිලධාරින් දඩුවම් විදිමෙන් ගැලවුණි. ඇඹිලිපිටිය සිද්ධියට අදළ අභියාචනය 2002 දි තින්දු කරන ලද අතර එමගින් විදුහල්පතිවරයා සහ හමුද භටයින් හතර දෙනා ගේ දඩුවම් එලෙසම තබන ලදි. එහෙත් සෙවනගල යුද්ධ හමුද කඳවුරෙහි ඉහළ ම නිලධාරියා වූද, පාසැල් සිසුන් ඝාතනයට පෙර සිය කඳවුරෙහි රඳවා ගෙන සිටි බ්‍රිගේඩියර් ලියනගේ මෙම සිද්ධියට ඍජුව සම්බන්ධ වු බවට ප්‍රමාණවත් සාක්ෂි නොමැති නිසා

1994 සිට සිය ගණනක් පොලිස් නිලධාරින් හා හමුද නිලධාරින් හට මානව අයිතිවාසිකම් උල්ලංඝනය පිළිබඳ ව අධි චෝදනා ඉදිරිපත් කර තිබෙන අතර ( මෙයින් බහුතරයක් වධහිංසා කිරිම, පැහැර ගැනිම, අනවසර ලෙස අත් අඩංගුවේ තබා ගැනිම පිළිබඳ චෝදනා වෙයි.) වැරදිකරුවන් බවට පත් වි ඇත්තේ අතළොස්සක් පමණි [16].

ඇම්නිස්ටි ඉන්ටර්නැෂනල් යට වාර්තා වි ඇති අන්දමට 1994 නිතිගත කරන ලද වධහිංසා සහ අමානුෂික හා අවමන් සහගත ක්‍රියා වැළැක්විමේ දඩුවම් පනත යටතේ 2007 දක්වාම දඩුවම් පමුණුවා ඇත්තේ අවස්ථා හතරක් දි පමණක් වන අතර පැහැර ගැනිම් හෝ අනවසර ලෙස රඳවා තබා ගැනිම( මෙම චෝදනාව සාමාන්‍යයෙන් බලහත්කාරයෙන් අතුරුදහන් කිරිමේ චෝදනාව හා බැඳි පවති) සම්බන්ධයෙන් දඩුවම් පමුණුවා ඇත්තේ අවස්ථා 30 කටත් අඩු සංඛ්‍යාවකි. එකම එක් අවස්ථාවකදි පමණක් ආරක්‍ෂා හමුද මනුෂ්‍ය ඝාතනයක් වරදකරු කොට ඇත[17].

1994 දි ' යුක්තිය තවමත් ඉෂ්ට වි නැත. ඇත්ත වශයෙන් ම සමහර පරීක්ෂණ පවත්වන ලද්දේ මහජනතාව ගෙන් එල්ල වන උද්ඝෝෂණ වැලැක්විමට මිස ඇත්ත වශයෙන් ම අපරාධකරුවන් අධිකරණය ඉදිරියට පැමිණ විමට නොවේ. මේ නිසා සිදු වු ප්‍රතිඵලයක් නොමැත. තවද, ශ්‍රි ලංකාවේ අධිකරණ බාහ්‍ය මනුෂ්‍ය ඝාතන සහ අතුරුදහන් විම් සම්බන්ධයෙන් කිසි කලෙක පරීක්ෂණ පවත්වා නැත.' ඇම්නස්ටි ඉන්ටර්නැෂනල ය විසින් නිගමනය කළේය.

අවුරුදු දහ හතරකට පසුත් අපගේ නිගමන එලෙසම පවති. තවදුරටත් නොකඩවා සිදුවන මානව හිමිකම් උල්ලංඝනයන් සහ එබඳු උල්ලංඝනයන් වැළැක්විම පිණිස දේශපාලන උවමනාවක් නැති කම විසින් යමක් ශක්තිමත් කෙරෙන්නේද එය නිසි ලෙස පරීක්‍ෂා කොට බලා, ජාත්‍යයන්තර මානව හිමිකම් හා මානවීය නිතිය යටතේ ශ්‍රි ලංකාවේ වගකිම් ඉටු කිරිම පිණිස අපරාධ නිතිය යටතේ සැකකරුවන්ට චෝදනා ඉදිරිපත් කිරිම සහ වින්දිතයින්ට වන්දි ගෙවිමත් කළ යුතුය.

*මුතුර් හි ඇක්ෂන් ඒගෙන්ස්ට් හන්ගර් සංවිධානයේ සේවකයින් 17 දෙනෙකු කෲර ලෙස ඝාතනය කිරිමේ සිද්ධිය ශ්‍රි ලංකා රජය සිය හමුද චෝදනා වලින් නිදොස් කිරිම පිණිස සාක්ෂි සුක්‍ෂම ලෙස හැසිරවිම පිළිබඳ දිර්ඝ ලැයිස්තුවෙහි තවත් එක් සිද්ධියක් පමණි. බිඳුනුවැව සමුහ ඝාතනය ( 2000) යාපනය දිස්ත්‍රික්කයේ චෙම්මනි හි සමුහ මිනි වළ ගොඩ ගැනිම (1998) පැහැර ගැනිමෙන් අනතුරුව මරා දමා බොල්ගොඩ වැව*

---

නිදහස් කරන ලදි.' ඉහළ මට්ටමේ පරීක්ෂණ වලදි හෙළිදරව් වු පරිදි බ්‍රිගේඩියර් ලියනගේ ගේ සාවද්‍යභාවය අඩුවැඩි වශයෙන් ඔහු ගේ අණසක යටතේ සිටි සියළුම නිලධාරින් ට ආරෝපණය කළ හැකිව තිබුණි. ( ශ්‍රේෂ්ඨාධිකරණය ට ඉදිරිපත් කළ ඉල්ලුම් පත්‍රය අංක 506/99 SCM 25.11.99 PER ඒ.ආර්.බී.අමරසිංහ ) කිෂාලි පින්ටෝ ජයවර්ධනඃ ' අයිතිවාසිකම් ඉලක්ක කිරිමඃ අපරාධ නිතියෙහි වගවිම සහතික කිරිම පිණිස අත්‍යවශ්‍ය ප්‍රති සංශෝධන- සන්ඩේ ටයිම්ස් 20 මැයි 2007

16 2007 වසර සඳහා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තුමේන්තුව විසින් ශ්‍රි ලංකාවේ මානව හිමිකම් පිළිබඳ වාර්තාව පිට කළ අතර 2008 මාර්තු මස දි විදේශ අමාත්‍ය රෝහිත බෝගොල්ලාගම ශ්‍රි ලංකා රජයේ ප්‍රතිචාරය නිකුත් කරමින් මේසේ කියා සිටියේය.

'අ) 2004 වසරට පෙර සිදුකරන ලද මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් පොලිස් හා හමුද නිලධාරින් 600 පමණ ආවරණය වන පරිදි අධිචෝදනා පත්‍ර 150 වැඩි සංඛ්‍යාවක් නිකුත් කොට තිබේ.චුදිතයින් විසින් කරන ලද වැරදි අතර පැහැර ගැනිම්, අතුරුදහන් කිරිම්, අනවසර ලෙස අත් අඩංගුවේ තබා ගැනිම හා මනුෂ්‍ය ඝාතන ඇතුලත් වේ.

ආ) 2004 සිට වධහිංසා පැමිණ විම පිළිබඳ චෝදනා විභාග කිරිමේ ප්‍රතිඵලයක් වශයෙන් නිතිපතිවරයා විසින් නිලධාරින් 90 කට අධි චෝදනා පත්‍ර 42 මහාධිකරණය වෙත ඉදිරිපත් කරන ලදි. මිට අමතරව තවත් සිද්ධින් 31 මහේස්ත්‍රාත් උසාවියේ නඩු පැවරිම පිණිස පොලිස්පතිවරයා වෙත යවන ලදි.' ( එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුවේ 2007 මානව හිමිකම් භාවිතය පිළිබඳ වාර්තාවට ශ්‍රි ලංකා රජයේ ප්‍රතිචාරය. 31 මාර්තු 2008 ඃ www.lankamission.org/content/view/64)

" කෙසේ වෙතත් විශේෂයෙන් ම කැට් පනත බලාත්මක වි ගෙවි ගිය පසුගිය වසර 14ටම එම පනත යටතේ දඩුවම් ලබා දි ඇත්තේ නඩු හතරකින් පමණකි." ( ශ්‍රි ලංකාඃ වධ හිංසනයට ගොදුරු නොවිමේ අයිතිය- අධිකරණ ප්‍රතිචාර පිළිබඳ ව විචාරත්මක විශ්ලේෂණයත්- ක්‍රිෂාලි පින්ටෝ ජයවර්ධන සහ ලීසා කොයිස්, ලෝ ඇන්ඩ් ට්‍රස්ට් සොසයිටි ජුනි 2008)

" 1998 සිට 2007 දස වසර තුල පොලිස්, හමුද සහ පරිපාලන නිලධාරින් 27 දෙනෙකු පැහැර ගැනිම සහ අනවසර අත්අඩංගුවේ තබා ගැනිම සම්බන්ධයෙන් චුදිතයන් කර ඇත". පාලිත කොහොන; විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ ලේකම් විසින් 2007 ඔක්තෝබර් මස වොෂින්ටන් හි දි හියුමන් රයිට්ස් වොච් වෙත ලබා දෙන ලද පිටු තුනක ලියවිල්ලකින් උපුටා ගනිමින් " නිමක් නොමැති රාත්‍රි බියකරු සිහිනයඃ ශ්‍රි ලංකාවේ අතුරුදහන් විම් හා පැහැර ගැනිම් පිළිබඳ රාජ්‍ය වගකිම" හියුමන් රයිට්ස් වොච් 5 මාර්තු 2008 www.hrw.org/en/node/62398/sectioì/9# ftn273

17 ක්‍රිෂාන්ති කුමාරස්සවාමි වහාම ක්‍රියා කිරිම පිණිස (f) ASA 222/96

*අසල දමා තිබු දවිඩ ජාතිකයින් 20 දෙනා මළ සිරිරු (1995) සහ මේ හා සමාන පෙර සිදුවීම් පිළිබඳ නිදර්ශන ද මේ සම්බන්ධයෙන් ගෙන හැර දැක්විය හැකිය.*

**එම් සි එම් ඉක්බාල්: ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසන් සභාවේ හිටපු උපදේශක සහ පසුව ජාත්‍යයන්තර ස්වාධීන විද්වත් පුද්ගල කන්ඩායමේ ජාතික සබදකම් නිලධාරි**

1990 දශකය පුරාම යුද්ධය දිග්ගැස්සෙමින් පැවති අතර මානව හිමිකම් තත්වයෙහි වර්ධනයක් හෝ දඩුවමින් නිදහස් කිරිම පිටු දැකිම සම්බන්ධයෙන් සැබෑ ප්‍රගතියක් හෝ දක්නට නොලැබුණි. 2002 පෙබරවාරි මස දි ආරම්භ කෙරුන එල් ටි ටි ඊ ය හා ශ්‍රී ලංකා රජය සමග සටන් විරාම ගිවිසුමක හේතු කොට ගෙන
සිවිල් වැසියන්ට විශාල සැනසිමක් උද වු අතර සන්නද්ධ ගැටුම් ආශ්‍රිත මානව හිමිකම් උල්ලංඝනයන් පහත වැටුණි. එහෙත් අනෙකුත් මානව හිමිකම් කඩ කිරිම්; පොලිස් අත් අඩංගුවේ දි වධහිංසා පැමිණවිම් අඛණ්ඩව සිදු වු අතර, එල් ටි ටි ඊ ය විසින් සිය විරුද්ධවාදින් ට ප්‍රහාර එල්ල කිරිම වර්ධනය විම ද සිදු වු අතර, අතපසු වි තිබු පැමිණිලි හා නඩු විභාග කිරිමේ කිසි දු ප්‍රගතියක් දක්නට නොලැබුණි [18]. 2005 දි, සටන් විරාමය බිඳ වැටුන අවස්ථාවේ සිට නැවත වරක් මානව හිමිකම් උල්ලංඝනය විම් දරුණු ලෙස ඉහළ නැගුනි. එහෙත් මෙම නව සිද්ධින් සම්බන්ධයෙන් පරීක්‍ෂණ පැවැත්විමක් හෝ චෝදනා ඉදිරිපත් කිරිමක් සිදුවන බවක් නොපෙනේ. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසන් සභාව බලපෑම් විරහිත අතර දේශපාලන ස්වාධිනත්වය අහිමි විමත්, ව්‍යවස්ථානුකුල භාවයක් නොමැති නිසාත් අකර්මන්‍යවි ගොසිනි. ජාතික හා ජාත්‍යයන්තර සංවිධාන විසින් මේ නිසා ශ්‍රී ලංකාව තුළ අන්තර් ජාතික මානව හිමිකම් නියාමනයක් ස්ථාපිත කරන ලෙස දැඩිව ඉල්ලා සිටිති.

**නැවත වරක් කල් මැරිම- පරීක්‍ෂණ කොමිසන් සභා තුලට ඇතුල් විම**

2006 සැප්තැම්බර් 04 දින ජනාධිපති මහින්ද රාජපක්‍ෂ ආණ්ඩුව; දිවයින පුරාම සිදුවන පැහැර ගැනිම්, බලහත්කාරයෙන් අතුරුදහන් කිරිම්, අධිකරණ බාහ්‍ය මනුෂ්‍ය ඝාතන, පිළිබඳ විභාග කිරිම පිණිස අන්තර් ජාතික ස්වාධින කොමිසන් සභාවකට ආරාධනා කරන බව ප්‍රකාශ කළේය. ඇම්නස්ටි ඉන්ටර්නැෂනලය දිර්ඝ කලක සිට කරනු ලැබු නිර්දේශයක් වන මෙමමානව හිමිකම් උල්ලංඝනයන් විභාග කිරිම පිණිස ශ්‍රී ලංකා ආණ්ඩුවේ කැපවිමත්, ජාත්‍යයන්තර භුමිකාවක් හදුනා ගැනිමත් අගය කළේය. නමුත් 2006 සැප්තැම්බර් 06 දින ප්‍රකාශයක් කරමින් ඉහත කි කාරණය සම්බන්ධයෙන් තමා පත් කරන ජාතික කොමිසන් සභාවක

---

18 එසේ වුවත් ශ්‍රී ලංකා අධිකරණය අණ දිමේ වගකිම පිළිබඳ මුලධර්මය අපරාධ නිතිය පිළිබඳ තින්දු වලදි පිළි ගැනිමට අපොහොසත් විම මානව හිමිකම් නඩු වලදි විනිශ්චයකාරවරුන් " පොලිසිය, යුද්ධ හමුදව ඇතුළු වෙනත් සේවාවන් හි උසස් නිලධාරින් වගකිම් ආදේශ කර ගන්නා පහළ නිලධාරින් විසින් කරනු ලබන මානව හිමිකම් උල්ලංඝනයන් වැළැක්විමක් සිදු වි නැතැයි" ප්‍රකාශ කරයි. " ෆෝකස් ඔන් රයිට්ස්: කිෂාලි පින්ටෝ ජයවර්ධන ද සන්ඩේ ටයිම්ස් 20 මැයි 2007

එහෙත් මේ සම්බන්ධයෙන් අධිකරණ තිරණ එකිනෙකට පරස්පර විරෝධි බව 2008 දි ලෝ ඇන්ඩ් සොසයිටි ට්‍රස්ට් විසින් කරන ලද අධ්‍යයනයකින් පෙන්වා දෙන ලදි. ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඇතැම් මුලික අයිතිවාසිකම් තින්දු වලදි වධ හිංසා කිරිම පිළිබඳ චුදිත පොලිස් නිලධාරින්ට ඔවුන් ගේ මානව හිමිකම් උල්ලංඝන දඩුවම් සිය උසස් විම් වලට බාධාවක් නොවේ යැයි පිළි ගෙන තිබේ. උදහරණයක් ලෙසට කිර්ති නුවන් ජයන්ත වෙදසිංහ, ඉන්දික හපුගොඩ එදිරිව රන්ජිත් අබේසුරිය සහ වෙනත් අය එස්සිඑෆ්ආර් අංක 392/2004 එස්සිඑම් 20.02.2006 ලෝ ඇන්ඩ් සොසයිටි ට්‍රස්ට්: ශ්‍රී ලංකාව: වධ හිංසාවන්ට පත් නොවිමේ අයිතිය; අධිකරණ ප්‍රතිචාරය පිළිබඳ විචාරාත්මක විශ්ලේශනයක් කිෂාලි පින්ටෝ ජයවර්ධන සහ ලීසා කොයිස් 2008

පැහැදිලි කිරිම: ඉහත සඳහන් මුලික අයිතිවාසිකම් නඩු තින්දුවට අනුව පොලිස් පරීක්‍ෂ ඉන්දික හපුගොඩ ව්‍යාපාරිකයෙක් සමග ඇතිවු ඉඩම් ආරවුලක් සම්බන්ධයෙන් නිට්ටඹුව පොලිසියට පැමිණිල්ලක කළ කාන්තාවකට වධ හිංසා පැමිණ විම සම්බන්ධයෙන් වරද කරු කරන ලදි. ඉහත කි ව්‍යාපාරිකයා සමග කිට්ටු සම්බන්ධතාවයක් තිබු නිට්ටඹුව පොලිසිය කාන්තාව පොලිස් ස්ථානයේ රදවා තබා ගෙන වධ හිංසා පමුණුවන ලදි. ඇය මුලික අයිතිවාසිකම් පෙත්සමක් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ගොනු කළ අතර එය විභාග කළ මාර්ක් ප්‍රනාන්දු විනිසුරුවරයා පොලිස් නිලධාරින් කාන්තාවට වධ හිංසා පමුණුවන ලද බව තින්දු කළේය. පසුව මෙම පොලිස් නිලධාරින් දෙදෙනා, පොලිස් කොමිසන් සභාව විසින් සිය උසස් විම් අත් හිටුවිමට එරෙහිව අධිකරණයට පැමිණි අතර එම පැමිණිල්ල විභාග කළ අග විනිසුරු සරත් සිල්වා උසස් විම් සම්බන්ධයෙන් මුල් නඩු තින්දුවෙහි බලපෑමක් නැතැයි තින්දු කළ අතර එක් පොලිස් නිලධාරියෙක් ඉහත කි දඩුවමට යටත් කරන ලද්දේ ඔහු එම අවස්ථාවේ එකි පොලිස් ස්ථානයේ ස්ථානාධිපති වරයා විම නිසා බවත් ඒ අනුව ඔහු ගේ උසස් විමට නඩු තින්දුව බාධාවක් නොවිය යුතු බවත් කියා සිටියේය. නමුත් ඇත්ත වශයෙන් ම පොලිස් පරීක්‍ෂ ඉන්දික හපුගොඩ වධ හිංසා පැමිණ විම කොට තිබුනි. ( බලන්න; කාදර් සහ මල්ලව කුමාර සහ වෙනත් අය)

අධිකරණය තින්දුව වුයේ වගකිම් ( පවරන ලද වුවත්) උසස් විම් සම්බන්ධයෙන් බලපෑමක් නොමැති අතර

කටයුතු නිරීක්‍ෂණය පිණිස අන්තර් ජාතික ස්වාධින විද්වත් කණ්ඩායමකට ආරාධනා කරන බව අවධාරණය කරන ලදි. 2006 නොවැම්බර් 02 දින ජනාධිපතිවරයා අදළ කොමිසන් සභාව පත් කළේය. ජාත්‍යයන්තර විද්වත් කණ්ඩායම ඊට තෙමසකට පසු 2007 පෙබරවාරි මස දි පත් කරන ලද්දේය.

' ඇස් බැන්දුමක් ලෙස රජය විසින් මෙම කොමිසන් සභාව (සහ ඔවුන්ට සාහය පිණිස අන්තර් ජාතික නිරීක්‍ෂණ කන්ඩායමක් නම් කිරීමෙන් )පත් කිරීමෙන් කරන ලද්දේ " සාමාන්‍යයෙන් " අයිතිවාසිකම් ආරක්‍ෂා කිරිම නියාමනය කළ යුතු ජාතික මානව හිමිකම් කොමිසන් සභාව වැනි ආයතන වෙතින් මූලික වශයෙන් අවධානය ඉවතට ගැනිම කිසිසෙත්ම විශ්වාස කළ නොහැකි විය. මෙබදු කොන්දේසි විරහිත සූක්‍ෂම මෙහෙයම් මගින් සාධාරණත්වය පතන මහජනතාව ගේ උදහස නිරාවණය විමක් දකුණු ආසියාවේ අන් රටවල දක්නට නොලැබුණි.'

**කිෂාලි පින්ටෝ ජයවර්ධන-ෆොකස් ඔන් රයිට්ස්ඃ ද සන්ඩේ ටයිම්ස් 7 ජනවාරි 2007**

ශ්‍රි ලංකිකයින් බහුතරයක් දඩුවමින් නිදහස් විම පිණිස ගනු ලබන කවර හෝ බලාපොරොත්තු සහගත පියවරයන් සහ රට තුළ වේගයෙන් පිරිහෙන මානව හිමිකම් තත්වයන් රැක ගැනිමටත් ( අන්තර් ජාතික සම්බන්ධයක් සහිතව) උත්සාහ දරු අතර එය එක්සත් ජාතින් ගේ සංවිධානයේ නිරීක්‍ෂණ කන්ඩායමක ගේ පැමිණිමට වඩා පහළ තලයක කටයුත්තක් වුයේය. ඇතැම් අයෙක් මෙම පියවරයන් දුටුවේ රජය කල් මැරිමක් කරමින් වගකිම පිළිබඳ පිළිවෙත බිඳ දැමිමක් අනුගමනය කිරිමක් ලෙසටය.[19]

2006 නොවැම්බර් මස දි ඇම්නස්ටි ඉන්ටර්නැෂනලය ජනාධිපතිවරයා ගේ ප්‍රති සංශෝධිත ස්ථාවරය පිළිබඳ ප්‍රකාශයක් නිකුත් කරමින් ඔහු ගෙන් ඃ

- යෝජිත පරීක්‍ෂණ කොමිසන් සභාවට ස්වාධින, අපක්‍ෂපාත සහ පරිමිත ජාත්‍යයන්තර විශේෂඥයන් ඇතුලත් කිරිම;
- පරීක්‍ෂණ කොමිසන් සභාවේ කටයුතු රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු සිවිල් සමාජ නියෝජිතයින් විමසමින් පවත්වා ගෙන යාම;
- කොමිසන් සභාව සිය තොරතුරු ඇගයිමේ දි ජාත්‍යයන්තර මානව හිමිකම් සහ මානවීය නිතිය සහ අදළ වන තන් හි ශ්‍රි ලංකාවේ නිතීය භාවිතා කිරිම;
- පරීක්‍ෂණ කොමිසන් සභාවේ ස්වාධීනත්වය ආරක්‍ෂා කිරිම, අදළ පුද්ගලයන් හා තොරතුරු සඳහා ප්‍රවේශය, මහජනතාවට කොමිසම සමග ගණුදෙනු කිරිමට පහසු කිරිම, සාක්‍ෂිකරුවන් ආරක්‍ෂා කිරිම, කොමිසමේ අභිමතිය, ක්‍රියාකාරිත්වය, තාවකාලික හා අනෙකුත් වාර්තා ප්‍රකාශයට පත් කිරිම සහතික කිරිම;

[19] උදහරණයක් ලෙසට බලන්න ආචාර්ය පි සරවනමුත්තු ගේ " මානව හිමිකම් ආරක්‍ෂාවකින් තොර නිදහසේ මිත්‍යාව" ද මෝනින් ලිඩර් 7 පෙබරවාරි 2007ඃ " පෙබරවාරි 12 දින රැස්විමට නියම කරමින් රජය ජාත්‍යයන්තර ස්වාධින විද්වතුන් ගේ කන්ඩායමක් පත් කරන බව ප්‍රකාශයට පත් කිරිමෙන් සිය අපකිර්තිමත් මානව හිමිකම් වාර්තා වලට එරෙහිව ජාත්‍යයන්තරව ගොඩ නැගෙන අප්‍රසාදයන් කල් දමා ගැනිමේ අරමුණ මුදුන් පත් කර ගත්තේය. කොමිසන් සභාව ස්ථාපිත කිරිම ප්‍රකාශයට පත් කිරිමත් සමග ම ශ්‍රි ලංකාවේම එබඳු කොමිසන් සභා පිළිබඳ අතිත අත්දැකිම් නිසා සැකයක් හට ගත්ත ද, අයි අයි ජි ඊ පි පත් කිරිමෙන් රජය මානව හිමිකම් ආරක්‍ෂා කිරිම පිළිබඳ සැබෑ කැපවිමක් නියත වශයෙන් ම ප්‍රදර්ශනය කළේයැයි කිව හැකිය. මෙම ප්‍රයත්නය රජයේ නියෝගාවලිය හරහා ගමන් නොකිරිමක් හෝ අවශ්‍ය පාර්ශවයන් දැනුවත් කිරිමක් සිදු නොවු අතර එවැන්නක් කිරිමේ සැබෑ උවමනාවක් වුයේ ද යන්නත් ගැටළුවක් විය. කොමිසන් සභාව හා අයි අයි ජි ඊ පි ය සථාපිත කිරිම හා ප්‍රකාශයට පත් කිරිමේ දෙමුහුන් වැඩ පිළිවෙළ මගින් රාජ්‍ය නිලධාරින් විසින් තව දුරටත් මානව හිමිකම් උල්ලංඝනය කිරිම් වලක්වන නිවර්තකයක් නොවිය.

" චෝදනා දෛනිකවම සිදුවෙමින් ගොඩ ගැසේ. අනෙකුත් පුද්ගලයන් අතර දවිඩ පුනරුත්ථාපන සංවිධානය නිලධාරින් හෝ දේව ගැති ඥානසිලන් පිළිබඳ පැමිණිල්ල වැනි පැමිණිලි විභාග කිරිම පිණිස කොමිසන් සභාවට නිරන්තරයෙන් ම රැස්විමට සිදුවිය හැකිය. මේ අනුව රජයට මානව හිමිකම් ආරක්‍ෂා කිරිම පිණිස කොමිසන් සභාවේ සහ අයි අයි ජි ඊ පි වාර්තා පිට වන තුරු සිටින්නේ යැයි කිව හැකිය. මේ අතර දඩුවමින් නිදහස් කිරිමේ සංස්කෘතිය ආයතන ගත කරමින් තහවුරු කෙරින.

www.cpalanka..org/newspaper_articles/leader_7_Feb_2007 .pdf

- කොමිසන් සභාවේ නිර්දේශ සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමේ අරමුණින් සැලකිල්ලෙන් සමාලෝචනය කිරීම;

ඉල්ලා සිටියේය.

*ඇම්නස්ටි ඉන්ටර්නැෂනලය විසින් තවදුරටත්:*
*පරීක්ෂණ කොමිසන් සභාව පිහිටුවීම හා ක්‍රියාකාරීත්වය මෙම ප්‍රමිතීන්ට අනුව පවත්වා ගෙන යාමෙන් මිස මෙම කොමිසන් සභාවට ජාත්‍යයන්තර නීතීන් උල්ලංඝනයන් පිළිබඳ ජගත් ප්‍රමිතීන් ට අනුකූල පරීක්ෂණයක් කළ නොහැකි බව කියා සිටියේය.*[20]

තම සංවිධානය පමණක් නොව වෙනත් ජාත්‍යයන්තර සංවිධාන මෙන් ම ජාතික රාජ්‍ය නොවන සංවිධාන හා පුද්ගලයන් විසින් ද කරන ලද ඉල්ලීම් නොසලකා හැරීම පිළිබඳ ව කනගාටු වන අතර පහත විස්තර කරන පරිදි පරීක්ෂණ කොමිසන් සභාව ඇත්ත වශයෙන් ම සිය විභාග ජගත් ප්‍රමිතීන් ට අනුව පවත්වා ගැනීමට ද අසමත් වුයේය.

**පරීක්ෂණ කොමිසන් සභා කටයුතු පිළිබඳ විශ්ලේෂණයක්:**

2006 නොවැම්බර් මස කොමිසන් සභාව පිහිටුවීමේ වරපත්‍රයෙහි මෙම කොමිසන් සභාව විමර්ශනය හා සෝදිසි කළ යුතු සිද්ධීන් පහලොවක ලේඛනයක් සඳහන් කොට තිබුනි; දහසය වන සිද්ධිය, පාර්ලිමේන්තු මන්ත්‍රී නඩරාජා රවිරාජා ඝාතනය ජනාධිපති වරයාම යෝජනා කොට පසුව එකතු කරන ලද්දේය. ජනාධිපති වරපත්‍රය විසින් කොමිසන් සභාවට " ස්වාධීන හා අංග සම්පූර්ණ පරීක්ෂණයක් " පිණිස අධිකාරිය ලබා දී තිබූ අතරම " දැනට සිදු වී ඇති බරපතළ මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ ව කර ඇති පරීක්ෂණයන් හි ප්‍රමාණවත් බව " ද විභාග කරන ලෙස නියම කොට තිබුනි. මේ දක්වා පරීක්ෂණ කොමිසන් සභාවේ වැඩ කටයුතු වල ප්‍රධාන තම ඌනතාවය වුයේ ඔවුහු තමන් ගේම රහස්‍ය පරීක්ෂණයක් හා මහජන සාක්ෂි විභාගයක් කෙරෙහි අවධානය යොමු කළා මිස, කොමිසම වෙත යොමු කරන ලද සිද්ධීන් සම්බන්ධයෙන් පොලිසිය හා නීතිපති දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද පරීක්ෂණයන් හි අසාර්ථික බව පිළිබඳ විභාග නොකළේය. වැදගත් සිද්ධීන් කිහිපයක් සම්බන්ධයෙන් පහත කරනු ලබන සාකච්ඡාවේ දී හෙළිදරව් වන ආකාරයට පොලිසිය හා නීතිපති දෙපාර්තුමේන්තුව අඛණ්ඩව ම මානව හිමිකම් උල්ලංඝනය කරන අපරාධ කරුවන් සම්බන්ධයෙන් ක්‍රියා නොකිරීම නිසා එම දෙපාර්තුමේන්තු වල කාර්ය සාධනය සාධනය පිළිබඳ සවිස්තරාත්මක විචාරයක් අත්‍යවශ්‍ය වෙයි.
කොමිසන් සභා වර පත්‍රයෙ හි පහත් සදහන් සිද්ධීන් විභාග කිරීම පිණිස ලේඛන ගත කොට තිබුණි.[21]

1. ගරු විදේශ අමාත්‍ය ජනාධිපති නීතිඥ ලක්ෂමන් කදිරගාමර් ඝාතනය

2. 2006 අගෝස්තු මස මුල් භාගයේ දි ඇන්ක්ෂන් කොන්ට්‍රා ලා ෆාම් නැමති ජාත්‍යයන්තර රාජ්‍ය නොවන සංවිධානයේ ආධාර සේවකයින් 17 දෙනෙකු ඝාතනය කිරීම

3. 2006 අගෝස්තු මස මුල් භාගයේ දි මුතූර් හි දී මුස්ලිම් වැසියන් හා මුතූර් හි සිට ගිලන් රථයකින් ගමන් කරමින් සිටිය දි වැලිකන්ද ප්‍රදේශයේ දි ඝාතනය කරන ලද මුස්ලිම් වැසියන් පිළිබඳව

---

[20] ශ්‍රී ලංකාව: යෝජිත පරීක්ෂණ කොමිසන් සභාව හා ජාත්‍යයන්තර ස්වාධීන විද්වත් කණ්ඩායම පිළිබඳ නිරීක්ෂණ, ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් දර්ශක: ASA 37/030/2006, 17 නොවැම්බර් 2006

[21] පරීක්ෂණ කොමිසන් සභාවේ කාර්ය සාධනය කොමිසන් සභාවේ වෙබ් අඩවියේ හි ප්‍රකාශයට පත් කොට ඇත. http://www.pchrv.gov.lk/index.html

4. 2005 දෙසැම්බර් 24 දින ජෝශප් පරරාජසිංහම් ඝාතනය කිරීම.

5. 2006 ජනවාරි 2 දින ත්‍රිමලයේ දී තරුණයන් පස් දෙනෙකු ඝාතනය කිරීම.

6. 2006 අගෝස්තු 12 දින ශ්‍රී ලංකා සාම ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්‍ෂක ජනරාල් කේතීස් ලෝගනාදන් ඝාතනය.

7. 2006 අගෝස්තු මස දී සේනචෝලෙයි හි දී පුද්ගලයන් 51 දෙනෙකු ඝාතනය.

8. 2006 අගෝසතු මස 28 දින පිලිප් නේරි දේවස්ථානයේ නිහාල් ජිම් බ්‍රවුන් පියතුමා අතුරුදහන් වීම.

9. 2006 ජුනි 17 දින පේසාලෙයි හි දී ධීවරයින් පස් දෙනෙකු සහ තවත් සාමාන්‍ය සිවිල් වැසියකු ඝාතනය.

10. 2006 මැයි 13 දින කයිට්ස් පොලිස් බල ප්‍රදේශය තුළ පුද්ගලයින් 13 ඝාතනය.

11. 2006 සැප්තැම්බර් 17 දින පොතුවිල් පොලිස් බල ප්‍රදේශය තුල පිහිටි රදැල්ල නැමති ගම්මානයේ දී මුස්ලම් වැසියන් 10 ඝාතනය.

12. 2006 ජුනි 15 දින කැබිලිතිගොල්ලැවේ දී සිවිල් වැසියන් 68 දෙනෙකු ඝාතනය.

13. 2006 අප්‍රියෙල් 28 දින අවිස්සාවේල්ලේ දී හමු වූ හිස නැති මළකඳන් පිළිබඳව.

14. 2005 මැයි 29 දින වැලිකන්දේ දී සිවිල් වැසියන් 13 ඝාතනය.

15. 2006 ඔක්තෝබර් 16 දින සිගිරිය දිගම්පොතන හි දී ආරක්‍ෂ හමුද සාමාජිකයින් 98 දෙනෙකු ඝාතනය. පසුව එකතු කරන ලදි.

16. 2006 නොවැම්බර් 10 දින නඩරාජ් රවිරාජ් ඝාතනය.

කොමිසන් සභාවේ අභිනියෝගයට අනුව ඉදිරියට සිදුවන මානව අයිතින් උල්ලංඝනයන් විභාග කිරීමේ අවසරයක් නැතත්, නඩරාජා රවිරාජ් මන්ත්‍රීවරයා ඝාතනයෙන් පසුව සිදු වුවාක් මෙන් නව සිද්ධීන් එකතු කිරීමේ අවසරය තිබුණි.

**මන්දගාමී ප්‍රගතිය හා සිද්ධීන් ප්‍රමුඛ ගත කිරීම**

පරීක්‍ෂණ කොමිසන් සභාව වෙත විභාග කිරීම පිණිස පවරන සිද්ධීන් බරපතල ගණයේ ඒවා වුවත් ඔවුහු සිය කටයුතු ආරම්භ කරන ලද්දේ ඉතාමත් මන්දගාමී අයුරිනි. කොමිසන් සභාව සය මසකට වැඩි කාලයක් පරිපාලන කටයුතු, කාර්ය මන්ඩලය බඳවා ගැනිම සහ පරීක්‍ෂණ ආරම්භ කිරීම සඳහා ගත කළෝය. පළමු වසර තුල සාක්ෂි විභාග සිදු කරන ලද්දේ කැමරාවක් ඉදිරියේ වූ බැවින් වින්දිතයා ගේ පවුලේ අයට හෝ මහජනයා එම අවස්ථාවලට සහභාගි වීමට නොහැකි විය. අවසාන වශයෙන් මහජනයා ඉදිරියේ සාක්ෂි විභාගය ආරම්භ කරන ලද්දේ 2008 ජනවාරි 8 වන දින දිය.

කොමිසන් සභාව විසින් " පරීක්‍ෂණ" හා " විභාග කිරීම" යනු එකක් නොව දෙකක් වශයෙන් සලකන ලදී. සිය වර පත්‍රයෙහි අට වන වගන්තියට අනුව " පරීක්‍ෂණ "යනු කැමරාවක් ඉදිරියේ කරනු ලබන සාක්ෂි විමසියක් වන අතර " විභාග කිරීම " යනු මහජනයා ඉදිරියේ කරනු ලබන සාක්ෂි විමසීම් අදහස් කෙරින. පරීක්‍ෂණ කොමිසන් සභාව කැමරාව ඉදිරියේ සාක්ෂි විභාග කිරීම අත්‍යවශ්‍ය බවට පක්‍ෂව ඉදිරිපත් කළ තර්කය වුයේ, මෙම සිද්ධීන් පිළිබඳ මුල් ම පරීක්‍ෂණ ඉතාමත් දුර්වල තත්වයක පැවති බැවින් සාක්‍ෂිකරුවන් ගේ ප්‍රකාශ නැවත විභාග කිරීමෙන් ප්‍රසිද්ධ සාක්‍ෂි විමසීමක් සඳහා ඉදිරිපත් කළ යුතු ද නැද්ද යන්න තෝරා ගැනිම පිණිස "කැමරා" සාක්‍ෂි අත්‍යවශ්‍ය බවය.අයි අයි ජී ඉ පි ය මෙම වැඩ පිළිවෙළ පිළිබඳ දැඩි විවේචනයක් ඉදිරිපත් කරමින් එම ක්‍රමය අකාර්‍යක්‍ෂම පමණක් නොව විනිවිදභාවය පිළිබඳ ජාත්‍යයන්තර ප්‍රමිතීන්ට ද නොගැලපෙන බව කියා සිටියේය. ජාත්‍යයන්තර ප්‍රමිතියට අනුව නිති බාහ්‍ය, කේවලාත්මක සහ ලඝු නඩු විභාග වලදි වින්දිතයින් ගේ පවුල් වල සාමාජිකයින් හට ඕනෑම පරීක්‍ෂණ විභාගයකට සහභාගි

විම, එකී පරීක්‍ෂණ පිළිබඳ තොරතුරු ලබා ගැනිමටද වෙනත් සාක්‍ෂි ඉදිරිපත් කිරිමට සහ මෙකී කාරණා පිළිබඳ  තොරතුරු ලබා ගැනිමට ද අයිතියක් තිබේ[22].

2009 ජනවාරි වන විට කොමිසන් සභාව පත් කොට දෙවසරක් ගෙවී ගොස් තිබුන අතර දෙවරක් ඔවුන් ගේ වර පත්‍රය දිර්ඝ කොට තිබුන[23] අතර සිද්ධීන් 16 න් ප්‍රසිද්ධ නඩු විභාග පවත්වන ලද්දේ සිද්ධීන් 4 සම්බන්ධයෙන් පමණක් වන අතර කොමිසන් සභාව සිය පරීක්‍ෂණ නිම කිරිමට සමත් වුයේ ඉන් එක් සිද්ධියක් සම්බන්ධයෙන් පමණි. ( ඒ 2006 ජනවාරි මස දි ත්‍රිමලයේ දි තරුණයන් පස් දෙනෙකු ඝාතනය කිරිමේ සිද්ධිය පමණි) 2009 ජනවාරි මාසය වන විටත් මුතුර් හි දි ඝාතනයට ලක් වු ප්‍රංශ රාජ්‍ය නොවන සංවිධානයක් වු ඇක්ෂන් කොන්ට්‍රා ලා ෆාමින් සේවය කළ සේවකයින් 17 දෙනා ගේ සිද්ධිය තවදුරටත් විභාග වෙමින් තිබුණි. ( දෙවන සිද්ධිය) 2008 සැප්තැම්බර්  මාසයේ දි කැබිලිතිගොල්ලෑවේ දි 2006 ජුනි 15 දින ඝාතනය වු 68 දෙනා ගේ සිද්ධිය (දෙලොස්වන සිද්ධිය) සහ 2006 ඔක්තෝබර් 16 වන දින දිගන්පොතන දි ඝාතනය වු ආරක්‍ෂක හමුද භටයින් 98 දෙනා ගේ බස් බෝම්බ සිද්ධිය ද විභාග කිරිම ආරම්භ කරන ලදි(පහලොස්වන සිද්ධිය).

ප්‍රසිද්ධ නඩු විභාගය පිණිස කොමිසන් සභාව විසින් සිද්ධින් තෝරා ගෙන තිබුනේ දේශපාලන හා වාර්ගික තුලනයක් නියෝජනය වන පරිදි බව පෙනි යයි. ද්‍රවිඩ සිවිල් වැසියන් ගේ මානව හිමිකම් උල්ලංඝනයන් නියෝජනය විම පිණිස මුතුර් සහ ත්‍රිමලය සිද්ධින් ද, සිංහල සිවිල් වැසියන් ට හා යුද්ධ හමුද සාමාජිකයින් ට එරෙහි සිද්ධින් වශයෙන් කැබිලිතිගොල්ලෑව හා දිගන්පොතාන සිද්ධින් තෝරා ගෙන තිබුණි. ආන්ඩුවට නැගෙනහිර පළාතේ 2008 මැයි මස පැවැත්විමට නියමිත ව තිබු පළාත් සභා මැතිවරණයට පෙර එම පළාතේ  දේශපාලන හා යුදමය ස්ථාවර ඇති කර ගැනිමේ උවමනාවක් මෙන් ම ත්‍රිමලය සම්බන්ධයෙන් උපක්‍රමික අවශ්‍යතාවයක් ද  තිබු නිසා ප්‍රසිද්ධ විභාගය සඳහා තෝරා ගත් පළමු සිද්ධි දෙකම නැගෙනහිර පළාතෙන් විම පුදුමයක් නොවිය. එසේම මෙම සිද්ධින් දෙකම ඉතාමත් බරපතළ සිදුවිම් වු අතර මහජනතාව ගේ අවධානය යොමු කිරිමට තරම් සුදුසු සිද්ධින් වුවා පමණක් නොව රජයේ වගකිම පිළිබඳ ව ප්‍රමාණවත් සාක්‍ෂිද හෙළිදරව් කර ගත හැකි සිද්ධින් වුයේය.

වසරකට වැඩි කාලයක් කොමිසන් සභාව ත්‍රිමලය හා මුතුර් හි ප්‍රංශ ආධාර සේවකයින් ඝාතනය පිළිබඳ රහස්‍ය පරීක්‍ෂණ පැවැත්විම පිළිබඳ ව අවධානය යොමු කළ අතර ඉන් පසුව පොතුවිල් හි මුස්ලිම් කම්කරුවන් සහ සෙන්චෝලෙයි හි ද්‍රවිඩ පාසැල් සිසුන් ගුවන් හමුද ප්‍රහාරයකින් ඝාතනය කිරිම පිළිබඳ ව ආරම්භ කළ අතර මෙම සිදුවිම් දෙක සම්බන්ධයෙන් ද රජයට වගකිමක් තිබු සිද්ධින් වුයේය.

පසු කාලයක දි එල් ටි ටි ඊ සංවිධානයේ ක්‍රියා ලෙස සැක කරනු ලබන කැබිලිතිගොල්ලෑව හා දිගන්පොතාන බෝම්බ සිද්ධින් ප්‍රසිද්ධ විභාග සඳහා තෝරා ගත් අතර අයි අයි ජි ඊ පි කන්ඩායම රටින් පිටව ගිය පසු එස් ටි එෆ් සහ හමුදව වෙනුවෙන් සිය දේශපාලන අනන්‍යතාවය මනාව ප්‍රදර්ශනය කළ නිතිවේදින් දෙදෙනෙක් කොමිසම ඉදිරියේ පෙනි සිටියේය.[24]

2008 ජනවාරි 27 දින බ්‍රසලස් හි මාධ්‍ය සාකච්ජාවකට සහභාගි වෙමින් ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍ය රෝහිත බෝගොල්ලාගම පරීක්‍ෂණ කොමිසන් සභාවට ගැටුම් පවතින ප්‍රදේශ වලට ඇතුල් විමට නොහැකි විම නිසා මන්දගාමිත්වයක් ඇති වි තිබු බවත් දැන් තත්වය යහපත් අතට හැරි ඇති බවත් ප්‍රකාශ කළේය. " බොහොමයක් සිද්ධින් විභාග කිරිම දැන් නිම වෙමින් පවතින්නේ යැයි " සඳහන් කළ අතර "ඉන් එක්

---

22 අධිකරණ බාහ්‍ය ඝාතන වැලැක්විම  පිළිබඳ එක්සත් ජාතින් ගේ සංවිධානයේ මුල ධර්මඃ ආර්ථික හා සමාජ කවුන්සිලය විසින් සම්මත කළ යෝජනාව-1989/65 මැයි 1989 16 වන වගන්තිය

23 කොමිසන් සභාවේ කාලය අවසාන වරට වසරක කාලය සඳහා දිර්ඝ කරන ලද්දේ 2008 නොවැම්බර් 08 දිනය. නැවත වරක් ජනාධිපති වරයා විසින් 2009 මැයි මාසය දක්වා සය මාසයක කාලය දිර්ඝ කිරිමක් ලබා දෙන ලදි.

24 " පරීක්‍ෂණ අවසන් කරමින් ශ්‍රි ලංකාව මානව හිමිකම් උල්ලංඝනයන් ප්‍රතික්‍ෂේප කරයි " 28 ජනවාරි 2009 රොයිටර් පුවත් සේවය ඉන්දියාවඃ http://reuteß.com/article/southasiannews/idnindia-37688420090127

සිදුවීමක් වන ආධාර සේවකයින් 17 දෙනා ඝාතනය කිරීමේ සිද්ධියට අදළ වාර්තාව ඉතා ඉක්මනින් ඉදිරිපත් කරන බවත් " කියා සිටියේය.[25] කොමිසන් සභාවේ කටයුතු නිරීක්ෂණය කරමින් සිටි දැනුවත් භාවයක් සහිත පුද්ගලයින් ගේ මතය වුයේ අයි අයි ජී ඊ පි කන්ඩායම ඉවත් වීමත් සමග ම සිවිල් සමාජ නියෝජිතයින් සහ කොමිසන් සභාවේ ඉතාමත් ක්‍රියාශීලි සාමාජිකයින් ඉවත් වු බැවින් පරීක්ෂණ කොමිසම කඩිමුඩියේ සිය ඉතිරි පරීක්ෂණ නිම කොට දුර්වල සහ අසම්පුර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නට ඉඩ තිබෙන් බවයි.

**සිද්ධීන් සවිත්තරාත්මකව**

**2006 ජනවාරි 02 දින ත්‍රිමලයේ දි තරුණයන් පස් දෙනෙකු ඝාතනය කිරිම**

2006 ජනවාරි 02 දින ත්‍රිමලයේ දි ශ්‍රි ලංකා රජයේ ආරක්ෂක හමුදවන් විසින් ද්‍රවිඩ ශිෂ්‍යයන් පස් දෙනෙකු ඝාතනය කරන ලදි. එදින රාත්‍රි හතට පමණ ශ්‍රි කොනේෂ්වරන් සහ ශාන්ත ජෝසප් යන විද්‍යාල් වල සිසුන් කන්ඩායමක් ත්‍රිමල මුහුදු වෙරළේ සතුටු සාමිචයේ යෙදි සිටිය දි ඔවුන් වෙත ත්‍රිවිලරයක ගමන් කරමින් සිටි යම් කිසි අයෙක් ගේනේඩරයක් විසි කරන ලද්දේය. සිසුහු  ඒ මේ අත දිව ගිය නමුත් ඔවුන් ගෙන් තිදෙනෙක් තුවාල ලැබීය. මඳ වේලාවකට පසු විශේෂ කාර්‍ය බලකායේ භටයින් 10-15 අතර කන්ඩායමක් එම ස්ථානයට ළගා වුයේය. ඔවුහු තුවාල ලැබු සිසුන් ඇතුළු පිරිසක් සිය ජිප් රථයට දමා ගත් අතර තුවක්කු කෙළවරින් පහර දෙමින් ඔවුහු නැවත මහා මාර්ගයට ඇද දමන ලදි. ඇසින් දුටු සාක්ෂිකරුවන් ට අනුව ආරක්ෂ හමුද භටයින් විසින් ඉන් සිසුන් පස් දෙනෙකු ම වෙඩි තබා මරා දැමීය[26]. මිය ගිය පස් දෙනාම වයස අවුරුදු විස්සෙහි පසු වුවෝ වෙත්: ගජේන්ද්‍රන් ෂන්මුගරාජා, රෝහණ ලෝහිරාජා, සිවනාතන් තංගතුරෙයි, හේමචන්ද්‍රන් යෝගරාජා සහ රගිහාර් මනෝහරන් මිය ගිය අතර  පරරාජසිංහම් කොකුල්රාජා සහ යෝගරාජා පුනගුලියන් යන  දෙදෙනා තුවාල ලබා දිවි ගලවා ගත්තෝය. මිය ගිය අය සහ තුවාල ලැබුවන් ජිප් රියට පටවා රෝහලට ප්‍රවාහනය කරන ලද්දේය. නමුත් ආරක්ෂක හමුද මුලින් ම කියා සිටියේ මිය ගිය පස් දෙනා මිය ගියේ ඔවුන් විසින් ළග තබා ගෙන සිටි ග්‍රේනඩයක් පුපුරා යාමෙන් බවයි. එහෙත් පශ්චාත් මරණ පරීක්ෂණයේ දි හෙලිදරව් වුයේ ඔවුන් සියළු දෙනාම වෙඩි වැදිමෙන් මිය ගිය බවයි. එයිනුත් තිදෙනෙකුටම වෙඩි වැදි තිබුනේ හිසටය.[27]

සිද්ධිය සිදු වු වහාම ඒ අවට සිටි නාවික හමුද භටයින් විසින් මාර්ග වසා දමන ලද අතර එමගින් කම්පනයට පත් දෙමාපියන් හට සිද්ධිය සිදු වු ස්ථානයට ළගා විම වළක්වාලන ලදි. ප්‍රධාන මාර්ගයේ හි තිබු විදි ලාම්පු නිවා දමනු ලැබු අතර ඇසින් දුටු සාක්ෂි වලට අනුව ඒ අවට ගමන් කරමින් සිටි අය ගිනි අවි එල්ල කොට එක්කෝ දණ ගස්සනු හෝ බිම දිගා කරවනු ලැබුවෝය. මේ සිද්ධිය වුයේ ජනප්‍රිය ත්‍රිමල මුහුදු වෙරළෙහි වන අතර නිවාඩු සමයෙහි අවසානය වු බැවින් රැස්ව සිටි විශාල සෙනග ද පිට විමට නොහැකිව සිර වුවෝය. මොවුන් ගෙන් වැඩි දෙනෙකු සිද්ධිය ඇසින් දුටු බැවින් සාක්ෂිකරුවන් ගේ ආරක්ෂාව පිළිබඳව ප්‍රමාණවත් සහතිකයක් තිබුනේ නම් සහ සිද්ධිය පිළිබඳ ප්‍රමාණවත් පරීක්ෂණයක් කරන ලද්දේ නම් මෙම සිදුවිම පිළිබඳව ප්‍රමාණවත් සාක්ෂි ගොනු කළ හැකිව තිබුනි. අවාසනාවකට මෙන් මුලික පරීක්ෂණ දෝෂ

---

25 පරීක්ෂණ අවසන් කරමින් ශ්‍රි ලංකාව මානව හිමිකම් උල්ලංඝනයන් ප්‍රතික්ෂෙප කරයි " 28 ජනවාරි 2009 රොයිටර් පුවත් සේවය ඉන්දියාව: http://reuteß.com/article/southasiannews/idnindia-37688420090127

26 " වෛද්‍ය කයිලාසපිල්ලේයි මනෝහරන්, UA 114/06 ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් දර්ශක: 37/013/2006 2006 මාර්තු 3

27 " ත්‍රිමලය අධිකරණ වෛද්‍ය නිලධාරි (ජේ එම් ඕ) වෛද්‍ය ගාමිණි ගුණතුංග විසින් පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වන ලද අතර මිය ගිය පස් දෙනාම වෙඩි වැදිමෙන් මරණයට පත් වුයේ යැයි නිගමනය කරන ලදි. අනෙක් දෙදෙනා ගෙන් එක් අයෙකු ගේ උදරයට ද අනෙක්  තැනැත්තා ගේ පපු ප්‍රදේශයට  ද වෙඩි වැදි තිබු බව නිගමනය කෙරිණ. කෙසේ වෙතත් අධිකරණ වෛද්‍යවරයා මිය ගිය අය ලබා තිබු ඇතැම් තුවාල ගිනි අවියකින් නොවන බවද කියා සිටියේය. නමුත් ඔවුන් මිය ගියේ වෙඩි වැදිමෙන් ලත් තුවාල නිසායැයි නිගමනය කෙරිණ. ඩි බි එස් ජෙයරාජ් " ටෙරිබල් ටෲත් ඔෆ් ද ට්‍රින්කමලි ට්‍රැඩජි" ටැමිල් වීක් 15 ජනවාරි 2006 www.tamilweek.com/trincomalee_tragedy_0115.html

සහිත වු අතර සාක්ෂිකරුවන්ට මරණීය තර්ජන ද එල්ල කොට තිබුනි. පරීක්ෂණ කොමිසන් සභාව මූලික පරීක්ෂණයෙහි තිබු ඌනතාවයන් කෙරෙහි අවධානය යොමු කරමින් සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළේ නම් ඔවුන්ට මීට වඩා දයකත්වයක් කළ හැකිව තිබුනි.

**වෛද්‍ය කයිලාසපිල්ලේයි මනෝමරන් සහ ඔහු ගේ පවුලේ අයට එල්ල වු තර්ජන**

වින්දිතයින් ගේ පවුල් සාමාජිකයින්ට මෙම සිදුවීමෙන් පසු එම සිද්ධියෙහි වින්දිතයින් ගේ පවුල් වල සාමාජිකයින් හට නිහඩව සිටින ලෙසට තර්ජන එල්ල වු අතර බිය නිසා ම ඔවුහු නිශ්ශබ්ද වුවෝය.

රජිහාර් මනෝහරන් ගේ පියා වෛද්‍ය කයිලාසපිල්ලෙයි මනෝහරන් මේ සිදු වීමේ දි සුවිශේෂ පුද්ගලයෙක් වුයේය. 2006 ජනවාරි 10 දින ත්‍රිමලය මහේස්ත්‍රාත් අධිකරණයේ පැවති මරණ පරීක්ෂණයට පැමිණි වෛද්‍ය මනෝහරන් එහි දි සාක්ෂි දෙන ලද්දේය. සාක්ෂි දුන් දින රාත්‍රියෙහි ඔහු ගේ නිවසට පිටින් කෑකෝ ගැසීම් ඇසුන අතර පසුව ගල් ගසන ලදි. ඊට පසුව වෛද්‍ය මනෝහරන් හට රාත්‍රි කාලයේ දි නිර්නාමිකව බිඳුන ද්‍රවිඩ වචන භාවිතා කරමින් සිංහල බසින් දුර කථනයෙන් කථා කළ තැනැත්තෙක්, මරණ පරීක්ෂණයේ දි සාක්ෂි දීම නිසා ඔහුත්, ඔහු ගේ පවුලේ අයත් මරා දමන බවට තර්ජන එල්ල කළේය.

ඊ ළඟ සතියේ දි පැවති මහේස්ත්‍රාත් පරීක්ෂණයේ දි සාක්ෂි දුන් කිහිප දෙනා අතර වෛද්‍ය මනෝහරන් ද වුයේය. උසාවියට පැමිණි සිටි සිංහල පොලිස් නිලධාරියෙක් ඔහුට " කොටියා " යැයි ආමන්ත්‍රණය කළ අතර ඉන් අදහස් කරන ලද්දේ ඔහු එල් ටි ටි ඊ සාමාජිකයෙක් වන බවයි. මහේස්ත්‍රාත් පරීක්ෂණයෙන් ටික දිනකට පසු මුහුණ හඳුනා ගත නොහැකි පරිදි හෙල්මටයක් පැළඳ මෝටර් සයිකලයකින් සිය නිවසට පැමිණි තැනැත්තෙක් වෛද්‍ය මනෝහරන් මුණ ගැසීමට අවශ්‍ය බව කියා සිටි අතර, වෛද්‍යවරියක් වු මනෝහරන් මහතා ගේ බිරිඳ පැමිණි තැනැත්තා රෝගියෙක් යැයි සිතා කථා කළ නමුත් ඔහු දිගින් දිගටම වෛද්‍ය මනෝහරන් මුණ ගැසීමට අවශ්‍ය බව කියා සිටි අතර එම ඉල්ලීම ඉටු නොවන කල් හි ඔහු පෙරළා ගොස් තිබුනි.

වෛද්‍ය මනෝහරන් සිය පුද්ගලික ඩිස්පෙන්සරිය වසා දැමු අතර දරුවන් පාසැල් යාම නතර කළේය. තමාටත් තම පවුලේ අයටත් තිබෙන මරණ තර්ජන පිළිබඳ ව  වෛද්‍ය මනෝහරන් විසින් ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂකයින් ට ද  ( රජය හා එල් ටි ටි ඊ ය අතර සටන් විරාමය අත්සන් කළ අවස්ථාවේ දි නෝර්වේ, ඩෙන්මාර්ක්, අයිස්ලන්ඩ් හා ස්විඩන් යන රටවල නියෝජිතයින් ගෙන් සමන්විත විය) ජාත්‍යයන්තර රතු කුරුස කමිටුව, එක්සත් ජාතින් ගේ සරණාගත මහ කොමසාරිස් ට  සහ ජාතික මානව හිමිකම් කොමිසමට ද පැමිණිලි කොට සිටියේය.

2006 ජුනි මාසයේ දි මහේස්ත්‍රාත් පරීක්ෂණය නැවත ආරම්භ කළ අවස්ථාවේ දි තර්ජන වඩාත් තියුනු මුහුණුවරක් ගත්තේය. මෙම අවස්ථාව වන විට පැමිණිල්ලේ එකම සාක්ෂිකරු බවට වෛද්‍ය මනොහරන් පත් ව සිටි අතර ඔහුට තව දුරටත් නඩු විභාගයට පෙනී නොසිටින ලෙසට තර්ජන එල්ල වෙමින් තිබුණි. වෛද්‍ය මනෝහරන් සහ ඔහු ගේ පවුලේ අයට අනුව ඔවුන් ගේ අනෙක් පුතා වන සාහාර් 2006 ජුනි මස 12 දින උසස් පෙළ විභාගයට සහභාගි වීමට යමින් සිටිය දි ත්‍රිමලයේ දි පොලිසිය විසින් නතර කොට ජාතික හැඳුනුම් පත ඉල්ලා තිබුනි. සාහාර් වෛද්‍ය මනෝහරන් ගේ පුතු බවට හඳුනා ගත් පොලිස් නිලධාරින් " තමුසෙ ගේ තාත්තා අපි ගැන ලෝකේ පුරාම කිය කියා ඇවිදිනවා. ඒක තමුසෙ ගේ ගෙදෙට්ට හොඳට හිටින්නේ නෑ. තමුසෙ විභාගේ ට යන්නේ. කමක් නෑ. දැන් පලයන්. පස්සේ බලා ගමු." යනුවෙන් කියා තිබුනි. බැලු බැල්මට මෙම තර්ජනයට පාදක වි තිබුනේ ඇම්නස්ටි ඉන්ටර්නැෂනලය සහ අනෙකුත් සංවිධාන විසින් මනෝහරන් පවුලේ උදවිය වෙනුවෙන් ආරම්භ කොට තිබු උද්ඝෝෂණයයි. පොලිස්

නිලධාරින් ගේ තර්ජනය නිසා බියට පත් සාරහාර් විභාගයට පෙනි නොසිට ආපසු නිවෙස බලා ගොස් තිබුණි.[28]

2006 ජුනි 21 දින වෛද්‍ය මනෝහරන් ත්‍රිමලයේ ත්‍රීවිලරයකින් ගමන් කරමින් සිටිය දි පොලිස් මාර්ග බාධකයක දි නතර කරන ලැබිනි. රාජකාරියෙහි නියුක්ත පොලිස් නිලධාරින් විසින් ජාතික හැඳුනුම්පත ඉල්ලා පරීක්ෂා කිරීමේ දි ඔහු කවුදැයි හඳුනා ගත් අතර " තමුසේ ගේ පුතා ඉවරයි " යනුවෙන් කියමින් පැය භාගයකට අධික වේලාවක් නිකරුනේ ඔහු රඳවා ගෙන සිටි අතර එම අවස්ථාවේ එකී මාර්ග බාධකය පසු කළ අනෙක් කිසි දු වාහනයක් පරීක්ෂාවට ලක් නොකෙරිණ. වෛද්‍ය මනෝහරන් මෙම අවස්ථාවේ දි තමා නිකරුනේ රඳවා ගෙන සිටීම පිළිබඳ ව ප්‍රදේශය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාට සහ පොලිස් පති වරයාට පැමිණිලි කරන බව කියා සිටි අතර එක් පොලිස් භටයෙකු විසින් " උඹ ඇවිල්ලා කොටියෙක්. ඔට අපේ ලොක්කොත් සපෝර්ට්. කොහොම ද ඉතින් අපි අපේ රාජකාරිය කරන්නේ" යනුවෙන් කියනු ලැබිනි. මඳ වේලාවකට පසු වෛද්‍ය මනෝහරන් ට නික්ම යාමට ඉඩ දෙනු ලැබිනි.

සිය පවුලේ ආරක්ෂාව පිළිබඳ බියක් ඔහු තුළ හට ගත් අතර නොබෝ දිනකින් ම  ඔහු ශ්‍රී ලංකාව අතහැර ගියේය. ඔහු පරීක්ෂණ කොමිසන් සභාව ඉදිරියේ වීඩියෝ තාක්ෂණය යොදා ගනිමින් හෙළිදරව් නොකළ ස්ථානයක සිට සාක්ෂි දෙන ලද්දේය. ඔහු සිය සාක්ෂියේ දි මානව හිමිකම් හා ආපදා කළමනාකරණ අමාත්‍ය මහින්ද සමරසිංහ කොළඹ නිවස කදි තමාව මුණ ගැසුන බවත් එහි දි තමා නිශ්ශබ්දව සිටින්නේ නම් ඊට හිලව්වක් වශයෙන් ජීවතුන් අතර සිටින පුතුට කොළඹ පාසැලක් ලබා දීමට කැමති බව ප්‍රකාශ කළ බවත් කියා සිටියේය.

පොන්නතුරෙයි යෝගරාජා ගේ සාක්ෂිය

2008 පෙබරවාරි මස දි පොන්නතුරෙයි යෝගරාජා සිය අත්දැකිම මානව හිමිකම් පිළිබඳ විශ්ව විද්‍යාල ආචාර්යවරු (යාපනය) හි රාජන් හූල් වෙත ප්‍රකාශ කොට  තිබුනි. යෝගරාජා ජීවත් වුයේ සිය පුතා වන හේමචන්ද්‍රන් ඝාතනය කළ මුහුදු වෙරළට ආසන්න නිවසකය. තමාටත් තම බිරිඳටත් ග්‍රේනඩයක් පුපුරන ශබ්දය ඇසිමත් සමග එය කුමක් දැයි විමසා බැලිම පිණිස ඔහු මුහුදු වෙරළට දිව ගියේය. ඔහු ප්‍රධාන මාර්ගයට ඇතුල් විමත් සමගම මිල්ටරි පන්නයේ ඇඳුමින් සැරසුන පිරිසක් තමාව නතර කරමින් බිම දිගා විමට අණ කොට තිබුනි.

*එක් මිනිසෙක් ගිනි අවිය අප දෙසට අමෝරා ගෙන සිංහලෙන් " ඔක්කෝම කොටි. වෙඩි තියන්නඩ ඕනෑ" යනුවෙන් කෑ ගැසිය. ඇතැම් කාන්තාවන් මොර දෙන්නට පටන් ගත් අතර මම මුණින් අතට දිගා වුවෙමි. මම දහයකටත් විස්සකටත් අතර කන්ඩායමක් එලෙස සිටින බව දුටුවෙමි. තානායම් හන්දිය ආසන්නයේ නාවික හමුදවේ මුර පොළක් තිබෙන  අතර එතැන සාමාන්‍යයෙන් නාවික භටයින් රාජකාරියේ යෙදී සිටින තැනක්. එතන ලොකු ලයිට් එකක් තිබුනා ඒක ඒ වේලාවේ නිවා දැම්මා.  මිනිත්තු කිහිපයකට පස්සේ මුළු පළාතේ ම ලයිට් ගියා. මට ළමයි " අයියෝ අම්මා " කියමින් කෑ ගහනවා ඇහුනා. ඒ කෑ ගැහිල්ල මිනිත්තු ගණනාවක් තිබුනා. ඊට පස්සේ මට වෙඩි තියන සද්දය ඇහුනා. ඔව් මට තේරුනා ඒ වෙඩි තිබ්බේ අහසට නෙවෙයි බිමට පොළව පැත්තට. මට තේරුනා මොකක් හරි ලොකු දෙයක් වුනා කියලා. මට වෙඩි සද්ද විස්සක් තිහක් විතර ඇහුනා. විනාඩි දහයකට විතර පස්සේ අපිට ආපු පාරෙන් ම යන්න කිව්වා. එතන නිල් පාට යුනිෆෝම් ඇඳ ගත්තු නාවික හමුදවේ අය හිටියා. ඒ ගොල්ලෝ අපිට මොකුත් කරේ නෑ. කාකි ඇඳ ගෙන හිටිය අය තමයි අපිව වාඩි කරේ, ගැහැව්වේ, පලයල්ලා කිව්වේ. ඒ ගොල්ලෝ එක්කෝ පොලිසියෙන් එහෙම නැත්නම් එස් ටී එෆ් එකෙන්. බිම දිගා කරපු අය අතරේ කාන්තාවනුත් හිටියා. මම තමයි අන්තිමට එතනට ආවේ. මගේ පිටි පස්සට ඇන්නා මිසක අනෙක් අයට ගහනවා මම දැක්කේ නෑ.*

---

[28] ශ්‍රී ලංකා: ආරක්ෂාව පිළිබඳ හිතිය වැඩි මනත් තොරතුරු: 28 ජුනි 2006 ඇම්දර්:ASA 37/019/ 2006

**පොන්නතුරෙයි යෝගරාජා ගේ ප්‍රකාශයඃ සිසුන් පස් දෙනා ගේ ඝාතනය හා ඒ සි එෆ් බෙදවාචකය, පෙබරවාරි 2008 යුටිඑච්ආර් විශේෂ වාර්තාව අංක 30**

*යෝගරාජා පෙරළා නිවසට ගියේය. සිය පුතු පිළිබඳව කනස්සල්ලට පත් වූ හෙතෙම ඔහු ගැන සොයා බැලීමට රෝහලට යන බව සිය බිරිඳට කිවේය. මගේ හේමචන්ද්‍රන්ට මොකක් හරි වුනා කියලා මගේ හිතට දැනුනා. ඒ කෑ ගහපු ළමයින් ගෙන් එක් කෙනෙක් ගේ කට හඬ මගේ පුතා ගේ. එතකොට වේලාව රාත්‍රි හතාමරට විතර ඇති. මම බයිසිකලේ ට නැගලා අස්සේ පාරකින් ඉස්පිරිතාලේට යන්න පිටත් වුනා. නේවි එකේ අය තැන් තැන් වල හිටියා. චෙක් පොයින්ට් තුනක් හතරක් විතර පහු කලාට ඒ එක තැනක දී වත් මගෙන් මොකවත් ඇහුව්වේ නෑ. මම ඉස්පිරිතාලේට යන කොට හමුදාවේ කවුරුත් ගේට්ටුව ළඟ හිටියේ නෑ. දොස්තරලා කිහිප දෙනෙක් ඉස්පිරිතාලේ දොරකඩ හිට ගෙන හිටියා. මම කංකානි කෙනෙක් ගෙන් ඇහුව්වා මොකක් හරි සිද්ධියක් වුනා ද කියලා. එහෙම එකක් වුනා කියලා ආරංචියි, ඒ නිසා තමයි බලා ගෙන ඉන්නේ කිව්වා. ජීප් එක එන කොට අට විතර වුනා. ඉස්පිරිතාල බිල්ඩිමේ දොරකඩ වාහනේ නැවැත්තුවා. මම ළඟට ගිහින් එබිලා බැලුවා. මිනී දෙකක් ඇරෙන්ඩ වෙන මොකුත් පිටු පස්සේ තිබුනේ නෑ. රාළහාමි ලා දෙන්නෙක් ඉස්සරහින් වාඩි වෙලා හිටියා. පැත්තකින් මම ජීප් එකට ගොඩ වුනා. මම ලේ පෙරෙන මුණු හරවලා බැලුවා ඒ මගේ පුතා ද කියලා. මගේ පුතා එතන හිටියේ නැහ. කංකානිලා ස්ටෙචර් එක අර ගෙන ආවාම මමත් උදව් වුනා මළ කඳන් එළියට අර ගෙන යන්න. තවත් ජීප් දෙකක් විනාඩි දහයකට විතර පස්සේ ආවා. ඉස්සේලා එකේ මළ කඳන් තුනක් තිබුනා. ඊ ළඟ එකේ දෙකක් තිබුනා. ඉස්සේල්ලා වගේ ම මම පළවෙනි ජීප් එකට නැගලා බැලුවා මුණුවල් අඳූර ගන්න බැහ. එහෙත් මගේ පුතා එතන හිටියේ නැහ. තුන් වෙනි ජීප් එකේ එක මිනියක හැඩ රුවෙන්නුයි ඇඳුම් වලින්නුයි අඳූර ගත්තා ඒ මගේ පුතා කියලා. මම කෑ ගහන්න පටන් ගත්තා. මිනී ටික බෑවාට පස්සේ ජීප් එක ඇදලා ගියා"*

*ඉස්පිරිතාලේ ඇතුලේ මිනී හතම එක පේලියට දමලා තිබුනා. දෙස්තරලා එක් කෙනෙක් හෝ දෙන්නෙක් ආවා. එක දෙස්තර කෙනෙකුට දෙමළ කථා කරපු එක දෙස්තර කෙනෙක් දෙන්නෙක් ගේ හකු ගැහෙනවා දැකලා ඒ දෙන්නාව ක්ලිනික් එකටත් අනෙක් එව්වා මොචරියටත් ගෙනි කිව්වා. මෝචරියට ගෙනිච්ච මිනී වලින් එකක් මගේ පුතා. මම ටිකක් වෙලා අඬ අඬාඑළියේ වාඩි වෙලා ඉඳලා ඊට පස්සේ ගෙදර ගියා.*

**පොන්නතුරෙයි යෝගරාජා ගේ තම පුතුන් පිළිබඳ ප්‍රකාශයඃ පංච සිසු ඝාතනය හා ඒ සි එෆ් බෙදවාචකය පෙබරවාරි 2008 යු ටි එච් ආර් විශේෂ වාර්තාව අංක 30**

*පොන්නතුරෙයි යෝගරාජා පරීක්ෂණ කොමිසන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් ත්‍රිකුනාමල පොලිසියේ නිලධාරින් තමාටත්, මැරුම් කෑ අනෙක් දරුවන් ගේ දෙමාපියන්ටත්, තම පුතුන් එල් ටි ටි ඊ සාමාජිකයින් බවට පිළිගනිමින් අසත්‍ය ප්‍රකාශ ලබා දෙන මෙන් බල කර තිබුනි.*

*මරණ පරීක්ෂණ පැවැත්වෙන අතරතුර දී, පොලිස් නිලධාරින් මගේ පුතා එල් ටි ටි ඊ සාමාජිකයෙක් කියලා කොලයකට අත්සන් කරන්න් බල කළා. මම අත්සන් කරන්නේ නැත්නම් මිනිය දෙන්නේ නැහැයි කියලත් කිව්වා. අනෙක් දෙමාපියන්ටත් මට වගේ ම ලියුමකට අත්සන් කරන්න කියලා බල කරා කියලා දැන ගන්න ලැබුනා. ඉස්පිරිතාලේ ඒ වේලාවේ හාබර් පොලිසියේ නිලධාරින් සහ ප්‍රදේශයේ අනෙකුත් උසස් නිලධාරිනුත් ඇවිත් හිටියා. මම මේ වගේ දෙයක් බාර ගන්නේ කොහොමද? මගේ පුතා ඒ ලෙවල් විභාගය ඉවර කරලා විශ්ව විද්‍යාලයට ඇතුල් වෙන්ඩ බලා ගෙන හිටියේ. මට නම් සහතිකයි මගේ පුතා එල් ටි ටි ඊ එකට කිසිම සම්බන්ධයක් නැහ කියලා. අසත්‍ය ප්‍රකාශය අත්සන් කරන්න බැහැයි කියලා මම තදින් ම කිව්වා. ඊට පැයකට විතර පස්සේ රෝහල් පොලිසිය මිනිය බාර දෙන්නඩ කියලා කිව්වා.*

**පරීක්ෂණ කොමිසන් සභාව ඉදිරියේ පොන්නතුරෙයි යෝගරාජා විසින් කළ ප්‍රකාශය 17 මාර්තු 2008[29]**

පොන්නතුරෙයි යෝගරාජා, පොලිස් නිලධාරියෙකු ගේ ප්‍රධානත්වයෙන් යුත් විශේෂ ආරක්ෂක බලකාය සිය පුතු ගේ මරණය සම්බන්ධයෙන් වගකිව යුතු බව පොලිසියේ නිලධාරියෙකු ගෙන් ම දැන ගත් බව කියා සිටියේය.

*මගේ පුතා ඝාතනය වී සති දෙකකට පසු දොස්තර මනෝහරන් පණිවුඩයක් එවමින් මහේස්ත්‍රාත් පරීක්ෂණයක් තියෙන බව කියා සිටියා. මට මේ කාරණය කොයිම වේලාවක වත් උසාවියෙන් දැන්නුවේ නැහැ. මම උසාවියේ ඉන්න කොට එතන දෙමළ පොලිස් නිලධාරියෙකුත් හිටියා. මට එයා ගේ නම මතක නැහැ. අවුරුදු හතලිස් පහක් විතර ඇති. එයා හාබර් පොලිසියේ නෙමෙයි. වෙනින් පොලිසියක. අපේ ළමයින්ට වෙච්චි දේ ගැන එයා හරි කෙන්තියෙන් හිටියේ. එයා අපිට ළඟ හිටපු රාළහාමි කෙනෙක් පෙන්නුවා. තව එක්කෙනෙක් ගේ නමකුත් කිව්වා. එයා ෂන්මුගරාජාටයි ( එයා ගේ ළමයත් මැරුනා) මටයි කිව්වා, මේ වැඩේ කළේ එස් ටී එෆ් එක තමයි කියලා. ඒ අර කියපු පොලිස් නිලධාරියා යටතේ තමයි එස් ටී එෆ් එක තියෙන්නේත් කිව්වා.*

**පරීක්ෂණ කොමිසන් සභාව ඉදිරියේ පොන්නතුරෙයි යෝගරාජා විසින් කළ ප්‍රකාශය 17 මාර්තු 2008[30]**

ඊට මාසයකට පසු පවත්වන ලද විශේෂ දේව පූජාවකට සහභාගි වූ එම උසස් පොලිස් නිලධාරියා මියගිය දරුවන් ගේ පවුල් වල අයට බලපෑම් කරනු දක්නට ලැබුන බව කියා සිටියේය.

*ඔවුන් ඝාතනය කොට දින 90 පසු එම සිද්ධිය වූ ස්ථානයේ අනුස්මරණ දේව මෙහෙයක් පවත්වන ලදි. මිය ගිය අය ගේ පවුල් වල සාමාජිකයින් සහ ඥතීන් ඊට සහභාගි වීම පිණිස පැමිණ සිටියෝය. පූජාව පැවැත් වෙන අතරතුර වේගයෙන් වාහනය පදවා ගෙන ගිය ඔහු තවත් පොලිස් නිලධාරීන් තුන් හතර දෙනෙක් සමග ආපසු පැමිණියේය. ඒ ගොල්ල පූජාව තියෙන තැනට ඇවිත් අපේ ඉස්සරින් හිට ගත්තා. එහෙම කළේ තමන් ගේ පුතුන් නැති වීමේ දුකෙන් ඉන්න පවුල් වල අය බය කරන්නයි*

**පරීක්ෂණ කොමිසන් සභාව ඉදිරියේ පොන්නතුරෙයි යෝගරාජා විසින් කළ ප්‍රකාශය 17 මාර්තු 2008[31]**

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල ය මුලික පොලිස් පරීක්ෂණ පැවැත්වූ ආකාරය පිළිබඳ දැඩි සෝදිසියකින් සිටියේය. එම සිද්ධිය සිදු වූ අවස්ථාවේ වහාම තුවාල වල ස්වභාවය තක්සේරු කිරීම සහ හදිසි අනතුරු අංශයට දැනුම් දීම, සිය පහළ නිළධාරීන් විශේෂයෙන් රෝහල් පොලිසියේ රාජකාරී, අපරාධය සිදු වූ ස්ථානයට වහාම පැමිණීමට අසමත් වීම, භෞතික සාක්ෂි සුරක්ෂිත කර ගැනීමට හා අනාගත සාක්ෂිකරුවන් හඳුනා ගෙන ඔවුන් ගෙන් සිදු වුයේ කුමක් දැයි තහවුරු කර නොගැනීම සහ විශේෂයෙන් ම එම අවස්ථාවේ සේවයේ යෙදී සිටි ආරක්ෂක හමුදා මුණ ගැසීම හා පාවිච්චි කරන ලදැයි සිතිය හැකි ගිනි අවි පිළිබඳ විස්තර රැස්කිරීම යනාදී කාරණා සම්බන්ධයෙන් රාජකාරිය භාර ව සිටි පොලිස් නිලධාරියා සිය දුරවබෝධය, නොසැලකිල්ල, මුග්ධභාවය මැනවින් ප්‍රදර්ශනය කර තිබේ.

සිද්ධිය සම්බන්ධයෙන් ආරම්භයේ සිටම නිල ප්‍රකාශ අතර පරස්පරතාවයක් දක්නට තිබුණි. ත්‍රිකුනාමලය භාර හමුදා අණ දෙන නිලධාරියා ආරම්භයේ දීම මෙම සිදුවීමේ වින්දිතයින් එල් ටී ටී ඊ සාමාජිකයින් වන අතර ඔවුහු තමන් අත තිබු ග්‍රේනේඩයක් පිපිරීමෙන් අනතුර සිදු වූ බවත් ඔවුන් එම අවස්ථාවේ ආරක්ෂක හමුදවන්ට ප්‍රහාරයක් එල්ල කිරීමේ අදහසින් එහි රුස්ව සිටි බවත් ප්‍රකාශ කළේය[32]. ආරක්ෂක හමුදා කාර්ය

---

[29] " ක්‍රයින් ෆෝ ජස්ටිස් " ඩේලි මිරර් 22 මාර්තු 2008 සහ " විටිනස් ඇකියුසස් පොලිස් ෆෝ ඉන්ටිමිඩේෂන්" ඩේලි මිරර් 18 මාර්තු 2008

[30] අංක 29 සඳහන් ලිපිය

[31] අංක 29 සඳහන් ලිපිය

[32] " ආමි ඩිනයි කිලින් ටැමිල් යූත්" බි බි සි නිව්ස් 3 ජනවාරි 2006

මන්ඩලය විසින් නිකුත් කරන ලද ප්‍රකාශ ගණනාවක් විසින් ද මෙම සිද්ධිය සම්බන්ධයෙන් චෝදනා එල්ල කරන ලද්දේ එල් ටි ටි ඊ වෙත වන අතර ඒ සියළු ප්‍රකාශ කලින් ගොතන ලද එක සමාන වචන මාලාවකින් යුක්ත වු බව මනාව පැහැදිලි විය. මුලින් කරන ලද ප්‍රකාශ එකකවත් වෙඩි තැබිම් හෝ වෙඩි වැදිමෙන් සිදුවු තුවාල ගැන පමණක් නොව ආරක්ෂක හමුද සම්බන්ධයක් පිළිබඳවත් කිසිම සඳහනක් නොවිය. අධිකරණ වෛද්‍ය නිලධාරි වාර්තාවට අනුව වෙඩි තැබිම සිදු වි ඇත්තේ ආසන්න දුරක සිටය යන්න ප්‍රසිද්ධවිමත් සමග ම පරීක්ෂණයක් සඳහා කරන බලපෑම වැඩි වන්නට විය. ජනවාරි 4 දින ආරක්ෂක අමාත්‍යංශය ඝාතන පිළිබඳ ව "පූර්ණ පරීක්ෂණයක්" කරන බවට ප්‍රකාශයක් නිකුත් කළේය[33]. නමුත් එම උනන්දුව වැඩි කලක් නොපැවතින.

2006 ජනවාරි 8 දින ද සන්ඩේ ටයිම්ස් පුවත් පතේ ඉක්බාල් අතාස් මෙම ඝාතනයට විශේෂ ආරක්ෂක බලකාය සම්බන්ධ බව ප්‍රකාශ කළේය. සිය පළමු තිරු ලිපියෙන් ආරක්ෂක අමාත්‍යංශ උපදේශක එච් එම් ජී බි කොටකේදෙනිය ගේ භූමිකාව කෙරෙහි අවධානය යොමු කළ අතර ආරක්‍ෂ අමාත්‍යංශයේ ලේකම්වරයා ඉන්දියාවට ගොස් සිටි අවස්ථාවේ ඔහු සිය තනි මතයට විශේෂ කාර්ය බලකාය ත්‍රිමලයෙහි ස්ථාන ගත කිරිමට තිරණය කළ බව අනාවරණය කළේය. ඊට සතිටකට පසු 16 ජනවාරි 2006 එම තිරු ලිපියෙහි ම තමා ත්‍රිමලයට විශේෂ කාර්ය බලකාය යැවිමට තිරණය කළත් එම තිරණය ගන්නා ලද්දේ ජනාධිපති සහෝදර ආරක්ෂක අමාත්‍යංශ ලේකම් ගෝඨාභය රාජපක්‍ෂ ගේ අනුමැතිය ඇතිව බව ප්‍රකාශ කළේය.

*මම ආරක්‍ෂ අමාත්‍යංශ ලේකම් ගෝඨාභය රාජපක්‍ෂ හට කථා කොට ඔහුගේ අනුමැතිය ලබා ගත්තා. හමුද භටයින් ස්ථාන ගත කිරිම පිළිබඳ වගකිම මම භාර ගන්නවා. මෙය ජනාධිපති මහින්ද රාජපක්‍ෂ සමග ගෝඨාභය රාජපක්‍ෂ ඉන්දියානු සංචාරයට සහභාගි විමට සතියකට පෙර ගත් තිරණයක්. මට දිගින් දිගටම දිස්ත්‍රික්කයේ සිංහළ වැසියන් ගෙන් පැමිණිලි ලැබෙමින් තිබෙනවා. ඔවුන් ගෙන් 40 කට වඩා මරා දමා තිබෙනවා. මට හැඟෙනවා ත්‍රිමලේ නිතිය හා සාමය පවත්වා ගැනිමටත් නගරයේ තිබෙන උපක්‍රමික වැදගත් කමක් නිසා එහි පොලිසිය ශක්තිමත් කිරිමට අවශ්‍ය යයි කියා. විශේෂ කාර්ය බලකායේ කොමාන්ඩර් ඩි අයි ජි නිමල් ලෙව්කේ සිය භටයින් ට තිබෙන අධික ඉල්ලුම නිසා මුලින් ඔහු එම යෝජනාවට එකඟ වුනෙත් නැහ. මට ඔහුට මෙම කාරණයේ තිබෙන වැදගත් කමත් හදිස්සියත් නිසා ඔහුට බල කරන්නට සිදු වුනා.*

**විශ්‍රාමලත් නියෝජ්‍ය පොලිස්පති එච් එම් ජී බි කොටකේදෙනිය ආරක්ෂක අමාත්‍යංශයේ උපදේශක ඉක්බාල් අතායස් ගේ සිටුවේෂන් රිපෝට් උපුටා දක්වන ලදි. ද සන්ඩේ ටයිම්ස් 15 ජනවාරි 2006**

ආරක්ෂක ලේකම් වරයා විසින් ම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට විශේෂ කාර්ය බලකායේ සැකකරුවන් අත් අඩංගුවට ගැනිමේ නියෝගයක නිකුත්කළ බව වාර්තා විය. 2006 පෙබරවාරි 13 දින, ඒ වන විටත් මාසයකට වඩා පැරණි මෙම සිද්ධිය සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හදිසි අවස්ථා නියෝග යටතේ ආරක්ෂක අමාත්‍යංශයේ ලේකම් වරයා ගේ අත්සනින් ත්‍රිමලයේ පොලිසියේ උප පොලිස් පරීක්ෂක වරයෙකු ඇතුළු විශේෂ කාර්ය බලකායේ භටයින් 12 අත් අඩංගුවට ගැනිම ලබා ගත් ගෙන තිබුන[34]. නිතිපතිවරයා පසුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සැකකරුවන් නිදහස් කරන ලෙසට උපදේස් දෙන ලද අතර ඒ සඳහා හේතුවක් දක්වා නොතිබුනි. නමුත් මෙම පුද්ගලයින් නිදහස් කිරිමේ නියෝගය නිකුත් කරන ලද්දේ රජයේ රස පරීක්ෂක දෙපාර්තුමේන්තුව විසින් " මළ සිරිරු වල දක්නට ලැබුන

---

33 " සිටුවේෂන් රිපෝර්ට්: ජිනිවා: හව් ෆාර් කැන් ටු සයිඩ්ස් ගෝ? ඉක්බාල් අතායස් ද සන්ඩේ ටයිම්ස් 19 පෙබරවාරි 2006 http://sundaytimes.lk/060219/index.html

34 ශ්‍රී ලංකා ඕඩර්ස් ප්‍රෝබ් ඉන් ටු කිලින්ස් ඕෆ් ස්ටුඩන්ස්, ඒ පි එෆ් 4 ජනවාරි 2006

මුනිස්සන් එකක් වත් මෙම හමුද භටයින්ට නිකුත් කළ ගිනි අවි වලින් නිකුත් කළ ඒවා බවට සනාථ නොවි යැයි " තීරණය කිරිම නිසාය.[35] පරීක්ෂණ එතකින් නිමා වු බවක් පෙනින.

13 මාර්තු 2008 දින, වෛද්‍ය මනෝහරන් පරීක්ෂණ කොමිසන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් මානව හිමිකම් හා ආපද කළමනාකරණ අමාත්‍ය මහින්ද සමරසිංහ තමාට 2006 අප්‍රියෙල් මස දුර කථනයෙන් කථා කරමින් ඔහු ගේ පුතා සහ ඔහු ගේ මිත්‍රයන් ඝාතනය " අවසනාවන්ත සිදුවිමක් බවත්, හමුද භටයින් මෙම ළමයින් එල් ටි ටි ඊ යැයි සිතු බවත් " කියා සිටියේ යැයි ප්‍රකාශ කළේය.

**ජාත්‍යයන්තර රාජ්‍ය නොවන සංවිධානයක් වු ඇක්ෂන් කොන්ට්‍රා ලා පෙයිම් හි ආධාර සේවකයින් 17 දෙනා ඝාතනය අගෝස්තු 2006**

2006 අගොස්තු 6 වන දින ප්‍රංශ ආධාර ඒජන්සියක් වන ඇක්ෂන් එගෙන්ස්ට් හන්ගර් ( ඇක්ෂන් කොන්ට්‍රා ලා පෙයිම් ඒ සි එෆ් ) හි ආධාර සේවකයින් 15 දෙනෙකු මුනින් අතට දිගා කොට, ඉතාමත් ආසන්නයේ සිට ඝාතන විලාශයකින් හිසට හා බෙල්ලට තබන ලද වෙඩි පහරවල් සහිත මළ කඳන් ඒ සි ඒෆ් මුතුර් කාර්යාල භූමියේ දි හමු වින. අගෝස්තු 8 වන දින තවත් කාර්ය මන්ඩල සේවකයින් දෙදෙනකු ගේ මළ කඳන් මෝටර් රථයක් තුල තිබි හමු විය. ඔවුන් පලා යාමට තැත් කිරිමේ දි මරා දමනු ලැබු විලාශයක් දක්නට ලැබුනි. මිය ගිය කාර්ය මන්ඩලයේ 17 දෙනා ගෙන් 13 පිරිමින් වු අතර 4 දෙනෙක් කාන්තාවෝ විය. 2006 අගොස්තු 4 හෝ 5 දින ඝාතනය නාදුනන කන්ඩායමක්, බොහෝ විට  ආරක්‍ෂක හමුද සාමාජිකයින් විසින් සිදු කරන්නට ඇතැයි අනුමාන කෙරින.

ඒ සි එෆ් සාමාජිකයින් ගේ ඝාතනය සම්බන්ධයෙන් ජාත්‍යයන්තර සංවිධාන රාශියක් ප්‍රබල හඩක් නැගු අතර ඔවුහු මෙම ඝාතනයට ආරක්‍ෂක හමුද සම්බන්ධ යැයි අනුමාන කළහ. රජය ඝාතනයේ වගකිම එල් ටි ටි ඊ ය වෙත පවරන ලදි. ඒ සි එෆ් ඝාතනය කරන ලද්දේ කවුරුන් විසින් දැයි යන්න තිරණය කිරිම විශාල වශයෙන් ම රද පැවතුනේ මරණය සිදු වු වේලාව මත විමට හේතු වුයේ 2006 අගෝස්තු මුල් සතියේ එම ප්‍රදේශය කඩින් කඩ  එල් ටි ටි ඊ හා ආරක්‍ෂක හමුද පාලනය යටතේ පැවති බැවිනි. අපරාධ ස්ථානයට ප්‍රවේශ විම ආරක්‍ෂක හමුද විසින් වළක්වා තිබු අතර ශ්‍රි ලංකා නිරික්ෂකයින් ගේ මතය වුයේ එය ඍජුවම රජය විසින් සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කිරිමක් වශයෙනි[36]. රොයිටර් වාර්තාකරු පිටර් එප්ස් 2006 අගොස්තු 06 දින මුතුර් කරා පැමිණි අතර, ආරක්‍ෂක හමුද සමග කරන ලද සම්මුඛ සාකච්ඡා වලදි එල් ටි ටි ඊ ය ඊට පෙර දින එම ප්‍රදේශයෙන් පසුබැස ගිය බව ඉතාමත් පැහැදිලි යැයි ප්‍රකාශ කරමින් සමුහ ඝාතනය සිද්ධ වුයේ ආරක්‍ෂක හමුද එම ප්‍රදේශයේ පාලනය  ඔවුන් අතට ගත්  පසු බව සඳහන් කළේය.

*මගෙන් විමසනු ලැබු බොහෝ දෙනෙකුට නැවත නැවතත් කි පරිදි යුද්ධ හමුදව විසින් සංවිධානය කරන ලද මාධ්‍ය සංචාරයක සාමාජිකයෙක් වශයෙන් මා නගරයට පැමිණි අතර නගරය අවට ගැටුම් පැවතියත් සියල්ල සිය පාලනයට නතු යැයි දක්වන්නට ඔවුහු විශාල උනන්දුවක් දක්වුහ. ඒ සි එෆ් කන්ඩායම අතුරුදහන් වු බව මා දන නොසිටි නමුත් එහි සිටි හමුද අණ දෙන නිලධාරින් ගෙන් සිවිල් වැසියන් ට සිදු වු හානි පිළිබඳ ව මම නොකඩවාම ප්‍රශ්න කළෙමි. ඔවුහු ඝාතනය පිළිබඳ කිසිවක් සඳහන් නොකළ නමුත් කැරලිකරුවන් ඊට පෙර දින පසුබැස ගිය බව අවධාරනය කළහ*[37].

ඉතාමත් වැදගත් සාක්ෂියක් වුයේ කොන්ස්ටෝරියම් ඔෆ් හියුමැනිටේරියන් ඒජන්සිස් ( සි එච් ඒ ) නිලධාරියෙක් විසින් ගනු ලැබු ඡායාරූප සමුහයයි. ඔවුහු අගෝස්තු 06 දින එහි ළගා වු අතර, අපරාධ

---

35 " එස් ටි එෆ් සස්පෙක්ට්ස් ඉන් ට්‍රින්කෝ යුත් මර්ඩර් ටු බි රිලිස්ඩ්" ඩි බි එස් ජෙයරාජ් ටැමිල් වීක් 4 මැයි 2006 htttp://tamilweek.com/news-features/archived/311

36 "මිල්ටරි කිල්ඩ් ලංකා එයිඩ් ස්ටාෆ්" බි බි සි සිංහල 30 අගොස්තු 2006 http://news.bbc.co.uk1/hi/world/south asia/5298470.stm

37 පිටර් ඒප්ස් " එයිඩ් වර්කර් මැසකර් රිමෙයින් අන් රිසෝල්ව්ඩ්" රොයිටර්ස් එලර්ට් නෙට් 3 අගෝස්තු 2007 www.alertnet.org/db/blogs/36072/2007/07/3-161605-1.htm

ස්ථානයට බාහිරින් පැමිණි ප්‍රථම කන්ඩායම ඔවුන් විය.මලකඳන් කුණුවෙමින් තිබෙන බව ඡායාරූප වලින් පැහැදිලිව පෙනෙන්නට තිබූ අතර ඝාතනය සිදුවන්නට ඇත්තේ අගෝස්තු 4 දින හෝ අගෝස්තු 5 දින පාන්දර යැයි යන මතය ඉන් සනාථ කෙරිණ. මානව අයිතිවාසිකම් සඳහා වන ආචාර්යවරු ( යාපනය) ( යු ටි එච් ආර් (ජේ) ) මාස ගනනාවක වෙහෙස කර අධ්‍යනයකින් පසු ස්ථිර වශයෙන් ම ඒ සි එෆ් කාර්ය මන්ඩලය අගෝස්තු 04 දින සවස්වරුවේ අපරාධය සිදු කරන ලද්දේ ආරක්ෂක අංශයේ සාමාජිකයින් වන අතර, නාවික විශෙෂ හමුදවේ කොමාන්ඩෝ හටයින් විසින් ඒ සි එෆ් කාර්යාලයට කැටුව පැමිණි මුස්ලිම් ග්‍රාමාරක්ෂක හටයෙක් සහ පොලිස් කොස්තාපල් වරුන් දෙදෙනෙක් විසින් ඔවුහු මරා දමන ලද බව සනාථ කරන ලදි[38]. ඝාතනය සිදු වුයේ අගෝස්තු 4 දින උදෑසන බවත් එම අවස්ථාවේ එල් ටි ටි ඊ එම ප්‍රදේශය පාලනය කළ බව රජයේ ස්ථාවරය වු එය සනාථ කිරිම පිණිස අධිකරණ වෛද්‍ය නිලධාරි වාර්තාව උපුටා දක්වන ලදි.

යු ටි එච් ආර් වාර්තාව, ඝාතනය සිදු වු  අවස්ථාවේ නගරය තුල හමුදව සැරිසැරූ ආකාරය සවිස්තරාත්මකව දක්වමින් පරීක්ෂණයක් කිරිමට අංවක සුදනමක් ඇත්නම් සහ සාක්ෂිකරුවන් ගේ ආරක්ෂාව ප්‍රමාණාවත් පරිදි සහතික විය හැකි නම් වෙනත් සාධක  ඉදිරිපත් කිරිමට සුදනම් සාක්ෂිකරුවන් සිටින බව  සඳහන් කරයි.

ශ්‍රි ලංකාව තුළ මෙතෙක් සිදු වු මානවීය ආධාර සේවකයින් විශාලම සංඛ්‍යාවකට එකවර ප්‍රහාරයක් එල්ල කළ  අවස්ථාව මෙය වන අතර  රජයේ ආරක්ෂක හමුද එම අවස්ථාවේ මුතූර් නගරය තුලත් ඒ අවටත් රැඳි සිටි නිසා, ආරක්ෂක හමුදවන් හි කවර හෝ අංශයක් ඒ සි එෆ්  සමුල ඝාතනය පිළිබඳ පරීක්ෂණයක් කරනු ඇතැයි සිතිය නොහැක.

පොලිසිය ඒ සි එෆ් අංගනය තුල අපරාධ ස්ථානය සුරක්ෂිතව ආරක්ෂා කර ගැනිමටත්, සාක්ෂි ක්‍රමානුකුලව එකතු කිරිමටත් අසමත් වු අයුරු මැනවින් වාර්තා ගත කොට තිබේ. "ඒ සි එෆ් අංගනය පස් වන දින උදෑසන සිට දින ගනනාවක් යනතුරුම අනාරක්ෂිතව ඕනෑම කෙනෙකුට නිදහසේ ගැවසිමට හැකි පරිදි විවෘතව තිබුනි". යුටිඑච්ආර් (ජේ) විශේෂ වාර්තා අංක 27ට අනුව, පොලිසිය මෘත ශරිර ඉවත් නොකළා පමණක් නොව එම මෘත ශරිර ත්‍රිමලය දක්වා ප්‍රවාහනය  කිරිම පවා වින්දිතයින් ගේ ඥතීන් ට හා හිතවතුන්ට බාර දි තිබුනි. යුටිඑච්ආර් (ජේ) මේ සම්බන්ධයෙන් වාර්තා ගනනාවක් ම පළ කරමින් ඒසිඑෆ් ඝාතනය පිළිබඳව මේසේ සටහන් කරයි.

*වින්දිතයින් ගේ ඥතින් හා හිතවතුන් එහි ළගාවිමට පෙර කොයිලා නැමති එක් කාන්තා වින්දිතියක  ගේ මුතූර් හි පදිංචිව වෛද්‍යවරයෙක් ලෙසට සේවය කරන මාමා කෙනෙක් ඒසිඑෆ් කාර්යාලයට දුර කථන ඇමතුමක් දෙමින් බලධාරින් විසින් මෘත ශරිර පුළුස්සා දැමිමට සුදනමක් ඇතැයි ආරංචි පැතිරෙන බව කාර්ය මන්ඩලයට දන්වීය. සේරුවිල හා මුතූර් එකිනෙක වෙන් කරන පාලම අසල දි තමන් කැටුව පැමිණි පොලිස් නිලධාරින් දෙදෙනා  තමන්ට මුතූර් වලට ඇතුල් නොවන ලෙසට ත්‍රිමලයෙන් උපදෙස් ලැබි ඇතැයි පවසමින් නතර විත. යුද්ධ හමුදව ඒසිඑෆ් කන්ඩායමට මුතූර් වලට ඇතුල් විමට ඉඩ දෙන ලද්දේ ඔවුන් ගේ නිල ඇදුම් ඇන්ටනා යනාදිය ගලවා ඉවත් කිරිමෙන් පසුව සවස තුනට පමණය. එහි ළගා වුවන් පුදුමයට පත් කරමින් පස් වන දින උදෑසන සිට දින දෙකක් තිස්සේ පොලිසිය අපරාධ ස්ථානයෙහි සීමා වෙන් කොට ලකුණු කිරිමට අසමත් වි තිබුනි. ඒසිඑෆ් වෙත ප්‍රථමයෙන් ම පණිවුඩය ලබා දුන් ප්‍රාදේශිය දේශපාලනඥයා එම ස්ථානයට පැමිණ ඔවුන් කලින් නොපැමිණියේ මන්දැයි අසමින් තවත් ප්‍රමාද වි නම්, මෘත ශරිර පුළුස්සා දැමිමට සැලසුම් කරමින් සිටි බව ප්‍රකාශ කරන ලදි.*

**යුටිඑච්ආර් (ජේ) වාර්තා අංක 25**

[38] යුටිඑච්ආර් (ජේ) අන් පිනිෂ්ඩ් බිස්නස් ඔෆ් ද පෆ්ච් ස්ටුඩුඩර්න්ස් ඇන්ඩ් ඒ සි එෆ් කේස්  අ ටයිම් ටු කෝල් ද බෆ් ස්පෙෂල් රිපොර්ට් අංක 30 1 අප්‍රියෙල් 2008

ත්‍රිමලය මහේස්ත්‍රාවරයා ත්‍රිමලේ අධිකරණ වෛද්‍ය නිලධාරියාට ( ජේ එම් ඕ ) පශ්චාත් මරණ පරීක්ෂණ සිදු කරන ලෙසට නියෝග කර තිබියදීත්, රජය අනුරාධපුරයෙහි අධිකරණ වෛද්‍ය නිලධාරියා පශ්චාත් මරණ පරීක්ෂණ සඳහා කැඳවන ලදි. අනුරපඅර ජේ එම් ඕ වෛද්‍ය වෛද්‍යරත්න ඇත්ත වශයෙන් ම අංග සම්පූර්ණ මරණ පරීක්ෂණයක් කරනු වෙනුවට මෘත ශරිරවල තුවාල සහ මරණයට හේතු සටහන් කිරිම කරන ලද්දේය[39]. ශ්‍රී ලංකා බලධාරින්ට සිද්ධිය නැවත විභාග කිරිමට සාහය විම පිණිස ඕස්ට්‍රේලියානු රජය විසින් ලබා දෙන ලද ජ්‍යෙෂ්ඨ අපරාධ අධිකරණ ව්‍යාථ වේදි වෛද්‍ය මැල්කම් ඩොඩ් ඉදිරිපත් කළ වාර්තාවට අනුව වෛද්‍ය වෛද්‍යරත්න සහ ඔහුගේ සාහකයින් විසින් 20006 අගෝස්තු 8 දින පැය පහක් තුල සිදුකරන ලද කාර්ය ප්‍රශස්ත තත්වයකට වඩා අඩු තත්වයක් යටතේ සිදු කෙරුනක් විය.[40]

දේශපාලන මැදිහත් විම් අඛන්ඩව සිදු වු අතර මරණ පරීක්ෂණ වාර්තාව ප්‍රකාශයට පත් කිරිමට පෙර දින මුතූර් මහේස්ත්‍රාත් වරයා මාරු කරන ලද්දේය. මහේස්ත්‍රාත්වරයා එතෙක් පරීක්ෂණ කටයුතු කරන ලද ආකාරය පිළිබඳව සෑහිමට පත් නොවුයේ ඒ බව සිය තීන්දුවේ දි ප්‍රකාශයට පත් කිරිමට බලාපෙරොත්තුවෙන් සිටියේ මාරුවත් සමග ම ඔහු නිශ්ශබ්ද කෙරිණ. මෙම මාරුවිම කරන ලද්දේ අධිකරණ අමාත්‍යංශයේ ලේකම්වරයා විසින් දුරකථනයෙනි. නමුත් මහේස්ත්‍රාත් වරයෙකුට ස්ථාන මාරුවිමක් ලබා දෙන පිළිවෙත වන්නේ අධිකරණ සේවා කොමිසන් සභාව මගින් එම කටයුත්ත කිරිමයි. මුතූර් මහේස්ත්‍රාත්වරයා වෙනුවට අනුරාධපුර මහේස්ත්‍රාත්වරයා ආදේශ කෙරුන අතර එහි ප්‍රතිඵයක් වශයෙන් නඩුව සිංහල බසින් කටයුතු කරන අනුරාධපුරයට ගෙන ලැබිමෙන් ද්‍රවිඩ ජාතික වින්දිතයින් මහත් දුෂ්කරතාවයකට පත් කළේය. මුතූර් හි සිට අනුරාධපුරයට යාමට ඒමට සිදුවිම වින්දිතයින්ට තවත් අතිරේක දුෂ්කර කටයුත්තක් වුයේය. 2006 සැප්තැම්බර් මස දි නඩුව කන්තලේ මහේස්ත්‍රාත් අධිකරණයට ත්‍රිමලයට හා මුතූර් වලට කන්තලේ මහේස්ත්‍රාත් අධිකරණයට මාරු කිරිම නිසා වින්දිතයින්ට ගමනාගමනයට තිබූ දුෂ්කරතාව නිරාකරණය වින. .නඩු අධිකරණයෙන් අධිකරණයට මාරු කිරිම ශ්‍රී ලංකවේ නිතර සිදුවන්නක් වන අතර එය දඩුවමින් නිදහස් කිරිම කෙරෙහි සෑහෙන දුරකට බලපායි. ඉතාමත් වැදගත් මානව හිමිකම් පිළිබඳ නඩු බොහොමයක් ම උතුරු හා නැගෙනහිරින් පිටතට මාරු කර ඇත. විශේෂයෙන් ම ආරක්ෂක හමුදවන්ට මානව හිමිකම් උල්ලංඝනය කිරිම සම්බන්ධ නඩු උතුරු සහ නැගෙනහිරින් විත්තිකරුවන් ගේ ආරක්ෂාව සහතික කිරිමේ පදනම මත සිංහල භාෂාව කථා කරන ප්‍රදේශ වලට මාරුකර තිබේ. මෙම මාරු කිරිම් සාක්ෂිකරුවන්ටත් වින්දිතයින් හා ඔවුන් ගේ පවුල් වල අයටත් මහත් දුෂ්කරතාත්, අධික වියදම් සහ අනතුරුදයක තත්වයක් ද ඇති කල අතර බොහෝ දුරට ඔවුන් අධිකරණයට පැමිණි ම වැලැකිමෙන් සාක්ෂි නොමැති කම නිසා නඩු විසි කරිමට ඉඩ තිබුනි[41].

---

39 යුටිඑච්ආර් (යාපනය) විශේෂ වාර්තාව අංක 27 පිටුව 24

40 ඉන්ඩිපෙන්ඩන්ට් ෆොරෙන්සික් ඉන්වෙස්ටිගේෂන් ඔෆ් ද මුතූර් මැසකර්" වෛද්‍ය මැකලම් ජේ ඩොඩ් ජ්‍යෙෂ්ඨ අධිකරණ වෛද්‍ය ව්‍යාථ වේදි උපදේශක වික්ටෝරියානු අධිකරණ වෛද්‍ය විද්‍යා ආයතනය, සවුත් බෑන්ක්, වික්ටෝරියා, ඕස්ට්‍රේලියාව

41 2000 දෙසැම්බර් මස යාපනයට ආසන්න මිරුසිවෙලි හි සිවිල් වැසියන් නව දෙනෙක් අතුරුදහන් වු බව වාර්තා කෙරිණ. මෙම වින්දිතයින් සරණාගතයින් වු අතර සිය නිවාස හා ඉඩම් පරික්ෂා කිරිමට යුද්ධ හමුදවෙන් ලබා ගත් අවසරයක් මත සිය කදවුරෙන් පිට වි තිබුනි.2000 දෙසැම්බර් 24 දින අතුරුදහන් ව සිටි පොන්නතුරෙයි මහේෂවරන් වධ හිංසාවන්ය භාජන වි බරපතළ තුවාල සහිතව අත් අඩංගුවෙන් මිදි පලා ආවේය. ඔහු විසින් දෙන ලද සාක්ෂි අනුව පස් වියැති වධ හිංසාවන්ට භාජනය කොට මරා දමු දරුවකු සහිත අට දෙනෙකු ගේ මළ කඳන් සහිත සමුහ මිනි වලක් සොයා ගනු ලැබිය. මළ කඳන් ගොඩ ගැනිම දෙසැම්බර් මස 24 දින සිදු විය. යුධ හමුද හටයින් 14 දෙනෙකු අත් අඩංගුවට ගත් අතර ඉන් 5 දෙනෙකුට විරුද්ධව චාවාකච්චේරි මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පවරන ලදි. ප්‍රථමයෙන් ම නඩුව අනුරාධපුරයටත් දෙවනුව කොළඹටත් මාරු කළේය. 2005 මැයි මාසයේ දි මහාධිකරණය මෙම නඩුව විභාග කිරිම පිණිස ත්‍රි-පුද්ගල විනිසුරු මඩුල්ලක් පත් කළේ නඩුව තවදුරටත් ප්‍රමාද කෙරින.

ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් වාර්තාව- 2001ශ්‍රි ලංකාව 1 ජුනි 2001 අන්තර් ජාලය UNCHR REFWORLD www.unchr.org/refworld/docid/3b1de37b13.html; asian centre for human rights.SAARC Human Rights Report 2006 www.achrweb.org/reports/saarcar2006/srilanka.htm

ඉද කාමලිටා එල් ටි ටි ඊ හිටපු සාමාජිකාවක් වන අතර ඇය මන්නාරම් දිස්ත්‍රික්කයෙහි පලිමුනාල් හි හමුද භටයින් සමුහයක් විසින් දුෂණය කොට 1999 ජුනි 12 දින වධ හිංසා පමුණුවා මරා දැමිමට මාසයකට පෙර යුද්ධ හමුදවට භාර වු තැනැත්තියකි.මන්නාරම් දිස්ත්‍රික්ක වෛද්‍ය නිලධාරිවරයා සිය වාර්තාවේ ස්ත්‍රි දුෂණය හා ලිංගික අපරාධ පිළිබඳ සාක්ෂි ගොනු

පශ්චාත් මරණ පරීක්ෂණය පිණිස මෘත ශරීර ගොඩ ගැනීම වැළැක්වීම පිණිස වින්දියන් ගේ පවුල් වල සාමාජිකයින් ට ඊට එකඟ නොවන ලෙසට ඉතා විශාල බලපෑමක් එල්ල කරන තිබුනි. නමුත් අවසානයේ දි 2006 ඔක්තෝබර් මස අධිකරණ වෛද්‍ය නිලධාරී වෛද්‍ය වෛද්‍යරත්න සහ ඔහුගේ කන්ඩායම විසින් මෘත ශරීර් 11 ගොඩ ගත් අතර, වෛද්‍ය ඩොඩ් නිරීක්ෂකයෙකු ලෙස එම අවස්ථාවට සහභාගි වි සිටියේය. පශ්චාත් මරණ පරීක්ෂණයේ දි වින්දිතයින් 11 දෙනෙකු මිය ගොස් තිබුනේ ගිනි අවි තුවාල වලින් තවත් මළ සිරිරු හයක[42]

වෛද්‍ය ඩොඩ් ගේ වාර්තාව විසින් යුද අවි විශේෂඥයකු ගේ සේවය ලබා ගෙන මෙම ඝාතන වලදි කොපමණ සංඛ්‍යාවක් ගිනි අවි භාවිතා කොට තිබුනේ ද යන්න පිළිබඳ සවිස්තරාත්මක විශ්ලේෂණයක් කළ යුතු යැයි නිර්දේශ කොට තිබුනි. ශ්‍රී ලංකා රජය සහ ඕස්ට්‍රේලියානු රජය සමග මෙම කටයුත්ත පිණිස ඇති කරගත් සහයෝගිතා ගිවිසුමට අනුව සහ මහේස්ත්‍රාත් වරයා ගේ නියෝගයටත් අනුව ඕස්ට්‍රේලියානු යුද අවි විශේෂඥයකු ඉදිරියේ සොයා ගන්නා ලද මුනිස්සන් පරීක්ෂා කළ යුතුයැයි නියම කොට තිබියදීත්, පොලිසිය විසින් අධිකරණ වෛද්‍ය නිලධාරිවරයා ගෙන් එකි මුනිස්සන් සිය භාරයට ගෙන රජයේ රස පරීක්ෂක වෙත යැවීමට කටයුතු කිරීම නිරීක්ෂකයන් විසින් සලකන ලද්දේ ඉතා තිරණාත්මක සාක්ෂි පිළිබඳව කිසිවෙක් වගකීම නොගත් බවයි. "අවාසනාවකට මෙන් නඩු භාන්ඩයක් ලෙසට සොයා ගත් මුනිස්සන් රජයේ රස පරීක්ෂක වෙත යැවීම පිළිබඳ රාජකාරි පිළිවෙත බිඳ දමමින්, අධිකරණ වෛද්‍ය නිලධාරී වෛද්‍ය වෛද්‍යරත්න ගෙන් මුනිස්සන් රජයේ රස පරීක්ෂක වෙත ගිනි අවි පරීක්ෂණය සඳහා යැවීමට පෙර, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පරීක්ෂවරයා විසින් මුනිස්සන් සිය භාරයට ගන්නා ලදි[43].

මෙම සිද්ධිය විභාග කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ආරක්ෂක හමුද විසින් ජාතික ආරක්ෂාවට බලපාන පදනම මත පරීක්ෂණ කොමිසන් සභාවට ලබා දීම අඛන්ඩවම ප්‍රතික්ෂෙප කරමින් එහි වැඩ කටයුතු වලට බාධා කළේය. මහජන සාක්ෂි විභාග පැවැත්වූ අවස්ථාවන් හි දීත්, පරීක්ෂණ කොමිසම රුස්වි සිටින අවස්ථාවන් හි දීත්, විවිධාකාරයේ ප්‍රසිධ ප්‍රකාශ මගින් ද, සාක්ෂිකරුවන්, කොමිසන් සභාවේ සාමාජිකයින්, ඇක්ෂන් එගෙන්ස්ට් හන්ගර් සහ අයි අයි ජි ඊ පි සාමාජිකයින් ද අභියෝගයට ලක් කරමින්, කුපිත කරවන සුළු හා පක්ෂග්‍රාහි දේශපාලන භාෂාවක් භාවිතා යොද ගනිමින්, මෙවැනි අවස්ථාවකට නොගැලපෙන විසුළු

---

කරමින් ඇය ගේ යෝනි ප්‍රදේශයට වෙඩි තබා තිබීමත්, පියයුරු හා දෙතොල් සපා කෑ තුවාල පිළිබඳ විස්තරත් වාර්තා කළේය. අසල් වැසියෙකු විසින් සැක කරුවන් දෙදෙනකු හඳුනා ගත් අතර තවත් එක් අයෙක් වින්දිතයා ගේ සහෝදරයා විසින් හඳුනා ගන්නා ලදි. හඳුනා ගැනීමේ පෙරෙට්ටුවේ දි කොපරල් වරයෙකු හා හමුද හටයින් දෙදෙනකු හඳුනා ගනු ලැබූ අතර ඔවුහු අත් අඩංගුවට ගනු ලැබින. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් දෙන ලද උපදේස් මත නීතිපති වරයා විසින් නඩුව කොළඹට මාරු කරන ලදි. මන්නාරමෙහි සිටි ප්‍රධාන සාක්ෂිකරුවන්ට දිගින් දිගටම තර්ජන එල්ල කෙරුන අතර අවසානයේ දි ඔවුහු ඉන්දියාවට පලා ගියහ.සැක කරුවන් පසුව ඇප මත නිදහස් කරන ලදි. ( ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා රේප් ඉන් කස්ඩටි 28 ජනවාරි 2002 ASA37/001/2002)

1992 අගොස්තු මස දි මඩකලපුව දිස්ත්‍රික්කයෙහි මහිලාන්තානෙයි හි දි සිවිල් වැසියන් 35 දෙනෙකු ඝාතනය කරන ලදි.ශ්‍රී ලංකා යුද්ධ හමුදවේ හටයින් විසි එක් දෙනෙකු මේ සම්බන්ධයෙන් චොදනා ලැබූ අතර ( පසුව දහ අට දක්වා අඩු කෙරින) නඩුව මඩකලපු අධිකරණයෙහි විභාගයට ගැනින. මෙම නඩුව සිංහල බහුතරයක් සිටින පොළොන්නරුව නගරයටත් පසුව කොළඹටත් මාරු කෙරින. මෙම නඩුවේ සාක්ෂිකරුවන් වාලච්චිචේනෙයි හි සරණාගත කඳවුරු වල දීර්ඝ කාලයක් රුදි සිටින්නන් වු අතර කොළඹට යාමට හා ඒම මහත් දුෂ්කර වියදම් අධික කාර්යක් විය.2002 දි සැක කරුවන් නිදහස් කරනු ලැබින. වින්දිතයින් ගේ නියෝජිතයින් විසින් ඇපෑලක් ඉදිරිපත් තිරිම පිණිස නීතිපති වරයා ගෙන් අවසර ඉල්ලා සිටි නමුත් එම ඉල්ලීම ප්‍රතික්ෂෙප කළේය..

42 මෙම අනාවරණය කිරිම රජයේ රස පරීක්ෂක විසින් අභියෝගයට ලක් කරමින් සියලුම මුනිස්සන් 7.62 සනාථ කළ අතර පසුව සිය ස්ථාවරය වෙනස් කළ ඩොඩ් තමා යුධ ගිනි අවි පිළිබඳ විශේෂඥයෙක් නොවන බව කියා සිටියේය.

43 " ආධාර සේවකයින් 17 දෙනා ගේ ඝාතන පිළිබඳ පරීක්ෂණ ඇණ හිටින තත්වයක් ඇති විත. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව රාජකාරි පටිපාටිය බිඳ දමමින් මරණ පරීක්ෂණය අවසානයේ දි රජයේ රස පරීක්ෂක වෙත යැවිය යුතු නඩු භාන්ඩ සිය භාරයට ගෙන තිබුණි." ද නේෂන් ඔන් සන්ඩේ 26 අගොස්තු 2007

ස්වරූපයක් ප්‍රදර්ශනය කළ නිතිඥවරයා ද පරීක්ෂණ කොමිසන් සභාවේ වැඩ කටයුතු වලට නොකඩවාම බාධා විය[44].

සාක්ෂිකරුවන් ගේ වාචික හා ලිඛිත සාක්ෂි ද, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලද වාර්තා ද පරිවර්තනය කළ ආකාරය කොමිසන් සභාවේ සැසි වාරයන් ට බාධාකාරී වූ තවත් ගැටළුවකි. 2008 අප්‍රියෙල් 25 දින ඩේලි මිරර් පුවත් පතෙහි එබඳු එක් නිදර්ශනයක් උපුටා දක්වා තිබුනි.

**වැදගත් සාක්ෂි පරිවර්තනයේ දී අතුරුදහන් වෙයි ?**

*2006 දී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සාක්ෂිකරුවන් විසින් තමන් 2006 අගෝස්තු 04 දින ඒ සි එෆ් කාර්යාලයට ගිය අවස්ථාවේ මුතූර් හි සටන් කරුවන් දුටුවේ යැයි කියන තොරතුර පිළිබඳ ලබා දෙන ලද ප්‍රකාශ පරිවර්තනය කිරීමේ විෂමතාවයන් පරීක්ෂණ කොමිසන් සභාවේ කටයුතු වලට බාධාවක් විය.*

*දෝෂ සහිත පරිවර්තනයෙහි ගැටළුව පැන නැගුනේ, නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් යසන්ත කෝදාගොඩ 2006 ඔක්තෝබර් 4 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සටහන් කරන ගන්නා ලද ප්‍රකාශ පදනම් කොට ගෙන පරීක්ෂණ කොමිසන් සභාව වෙනුවෙන් සාක්ෂිකරු ගෙන් ප්‍රශ්න කරන ලද අවස්ථාව් දී ය. තමන් අගෝස්තු 04 දින උදෑසන 8.30 පමණ කාර්යාලයට ගොස් සාක්ෂිකරු විසින් ඒ සි එෆ් කාර්ය මණ්ඩලය මුණ ගැසුන බව කියා සිටියත් පරිවර්තනයේ දී මෙම කාරණය අත් හැර දමා තිබුණි. තවද " අපි මෝටර් බයිසිකල් වලින් හොස්පිටල් එක පැත්තට යන කොට ඒ පාරේ එල් ටී ටී ඊ කට්ටිය තුවක්කුත් තියා ගෙන ෆෝස්ට් ඕපිස් හන්දියත් පන්සල් හන්දියත් අතර හිටියා දැක්කා. අපි මුතූර් ජැටිය පැත්තට ගියා. අපිට වෙඩි තියා ගන්න සද්දය ඇහුන හින්ද බය වෙලා අපි ආපහු හැරිලා ආවා. පස්සේ අපි ඒ සි එෆ් ඕපිස් එක පැත්තට යන කොට එතන හිටපු මිනිස්සු කට්ටියට මනිවානන් ( ප්‍රාදේශිය ලේකම් )කථා කරලා කිව්වා මෝඩයෝ වගේ මෙතන ඉන්නේ නැතිව පල්ලිය පැත්තට පලයල්ලා කියලා. ආමි එක ජැටිය පැත්තේත් එල් ටී ටී ඊ එක ටවුම පැත්තේත් හිටියා." යනුවෙන් සාක්ෂිකරු දක්වන ලද ඇතැම් කරුණු පිළිබඳ කොටස් සිංහල හා ඉංග්‍රිසි පරිවර්තන හි දී අත් හැර තිබුන බව සොයා ගන්නා ලදී.*

*මනෝරී මුත්තේට්ටුගම මහත්මිය පරීක්ෂණ කොමිසන් සභාවේ සාමාජිකා-*

> *" අපට යම් කිසි කාරණයක් සනාථ කර ගැනීමට අවශ්‍ය වුනා ම බොහෝ අවස්ථා වලදී (බොහෝ විට යම් කිසි සිද්ධියක් සම්බන්ධයෙන් ) විවිධ පරිවර්තනයන් හි එකම සිද්ධිය දක්වා තිබෙන්නේ එකිනෙකට වෙනස් ආකාරයට නිසා යමක් අවබෝධ කර ගැනීම මහත් අසිරු කටයුත්තක්."*

*එවිට කෝදාගොඩ මහතා මහත් කනස්සල්ලෙන් " මම කියවන්නේ මට ලබා දී තිබෙන සහතික කළ කළ නිල පිටපතින් " කිවේය.*

*පරිවර්තනයන් හි මෙම පරස්පරයන් විසඳ ගැනීම පිණිස සැසි වාරය විනාඩි දහයකට කල් තබා සාක්ෂිකරුවන් ද සභා ශාලාවෙන් පිටත රඳවා දරන ලද උත්සාහයේ ප්‍රතිඵලය වූයේ සාක්ෂිකරුවන් හතර දෙනා ගේ ම ප්‍රකාශයන් හි පරිවර්තනයන් හි නිරවද්‍යභාවය සාක්ෂිකරුවන් විමසා පැහැදිලි කර නොගත් බව හෙළිදරව් විමයි. මෙහි දී අනාවරණය වූ තවත් කාරණයක් නම් පරීක්ෂණ කොමිසන් සභාවේ නිතිඥවරයාටත් 2006 දී සාක්ෂිකරුවන් විසින් කරන ලද ප්‍රකාශයන් හි පිටපත් ලබා නොදුන් බවයි.*

*පරීක්ෂණ කොමිසන් සභාවේ කාල අවසානයට කලින් සැසිවාරය කල් තැබීමට හේතු වූ කළ කිරීම, කොමිසන් සභාවේ සාමාජිකාවක් වූ මනෝරි මුත්තේට්ටුවේගම " මේක නම් නියම වධයක්" යනුවෙන් කළ ප්‍රකාශයෙන් පැහැදිලි විය.*

---

44 පරීක්ෂණ කොමිසන් සභා සැසිවාරයන් හි දී නිතිඥ ගෝමින් දයාසිරි ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වෙනුවෙන් පෙනී සිටියේය. දයාසිරි මහතා සුරකිමු ශ්‍රී ලංකා සංවිධානයේ කළමනාකරණ මන්ඩලයේ ක්‍රියාකාරී සාමාජිකයෙක් වන අතර බුද්ධි මණ්ඩලයක් ලෙස තමන් විසින් ම හඳුන්වා ගන්නා ඔවුහු " සියලුම ශ්‍රී ලංකිකයින් වෙත අනොන්‍ය අවබෝධය, විදේශීය මැදිහත්වීම් සාමයට බලපාන ආකාරය, මානව අයිතිවාසිකම් නියමාර්ථීයෙන් වටහා ගැනීම, සංවර්ධනය හා ජාතික ඒකාග්‍රතාවය හා සමගිය, භෞමික අඛණ්ඩතාවය ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය. www.protectsrilanka.org/aboutus.html

*අවසානයේ දී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සපයන ලද "පරිවර්තිත සහතික කළ සාක්ෂි පිටපත්" දෝෂ සහිත වූ බැවින් කොමිසන් සභාව සාක්ෂි පිටපත් හි "නව සහතික කළ පරිවර්තනයන්" කොමිසන් සභාවේ පරිවර්තකයින් ලව සිදු කරවා ගැනීමට තිරණය කළේය.*

**ඩේලි මිරර් 25 අප්‍රියෙල් 2008**

2008 ජුලි මාසයේ දී ඒ සි එෆ් සිය සංවිධානයේ දේශිය කාර්ය මන්ඩලයේ සාමාජික සාමාජිකාවන් 17 දෙනෙකු ඝාතනය කිරිම පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂණ පිළිබඳ සෑහිමකට පත් නොවූ බැවින් ඔවුහු ශ්‍රී ලංකාවෙන් පිටව ගියහ.

2008 ඔක්තෝබර් මාසයේ දි පරීක්ෂණ කොමිසන් සභාවේ සභාපති නිංශ්ශක උදලාගම ත්‍රිමලය පංච ශිෂ්‍ය සජ් සී එෆ් කාර්ය මන්ඩල ඝාතන පිළිබඳ අතුරු වාර්තාවක් ජනාධිපති වරයාට ළගදිම බාර දෙන බව ප්‍රකාශ කළ අතර එහි දි පරීක්ෂණ කොමිසන් සභාව මෙම සිද්ධි දෙකෙහි ම වින්දිතයින් ගේ ආසන්න ම ඥතියා හට වන්දි ලබා දිම නිර්දේශ කරන බවත් ප්‍රකාශ කළේය. මේ අනුව වන්දි ලබා ගැනිම පිණිස වින්දිතයා හට තමා ගේ තිබෙන ඥතිත්වය සනාථ කරන දිවුරුම් ප්‍රකාශයක් කොමිසන් සභාව වෙත ඉදිරිපත් කරන මෙන් පරීක්ෂණ කොමිසන් සභාව විසින් ආරාධනය කරන ලදි[45].

**2006 ජුනි 16 වන දින කැබිලිතිගොල්ලෑවෙ හි දි පුද්ගලයින් 68 දෙනෙකු ඝාතනය කිරිම**

2006 ජුනි 16 දින උදෑසන ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ වවුනියාවත් හොරොව්පොතානත් අතර සිංහල බහුතරයක් වාසය කරන කැබිලිතිගොල්ලෑව ආසන්නයේ සිවිල් වැසියන් 150 කට ආසන්න සංඛ්‍යාවක් පටවා ගත් බස් රියක් ඉලක්ක කොට ගෙන ක්ලේමෝ බිම් බෝම්බයක් පුපුරවා හරින ලදි. සිවිල් වැසියන් 68 දෙනෙකු ඝාතනය වු අතර ඉන් බොහෝ දෙනෙක් එකම පවුලේ අය වු අතර, ළමයින් 12 දෙනෙක් ද ඒ අතර වුයේය. තවත් 70 කට ආසන්න ප්‍රමාණයක් තුවාල ලැබිය. මගීන් ගෙන් බොහෝ දෙනෙක් යකා වැව ගම් වාසින් වු අතර, ඔවුහු වව්නියාව ආසන්න ගමක බින්න බැස ජිවත් ව සිටිය දි, මිය ගිය හිටපු ග්‍රාමාරක්ෂ භටයෙකු ගේ අවමංගල්‍ය කටයුතු සඳහා සහභාගි විමට යමින් සිටියෝය. ආණ්ඩුව ප්‍රහාරයේ වගකිම එල් ටි ටි ඊ වෙත පවරන ලදි. ශ්‍රී ලංකා යුද්ධ හමුදවට අනුව බස් රථය පුපුරවා හැර තිබුනේ බිම් බොම්බ යුගලයක් දුරස්ථ පාලකයක් මගින් පුපුරවා හැරිමෙන[46].නැවත පදිංචි කිරිමේ අමාත්‍යාංශය විසින් බෝම්බ පිපිරිමේ වින්දිතයෙකුට රුපියල් 50,000 ( ඩොලර් 500) මුදලක් ලබා දිමට සුදනම් බව ප්‍රකාශ කළේය[47].

මෙම සිද්ධියේ දි දිවි ගලවා ගත් එන් දිසානායක, කැබිලිතිගොල්ලෑව රෝහලේ සිට, දි අයිලන්ඩ් පුවත් පතට ප්‍රකාශයක් කරමින් " මෙම බස් රථයෙහි සිටි මගීන් ගෙන් වැඩි දෙනෙක් වවුනියාවේ පැවැත්විමට නියමිත ව තිබු සිය මුණුබුරා ගේ අවමංගලය ට සහභාගි විම පිණිස ගමන් කරමින් සිටි බවත්, එම කන්ඩායම අතර පිරිමින්, කාන්තාවන්, ළමයින්, බෞද්ධ භික්ෂූන් වහන්සේලා සහ ග්‍රාමරක්ෂ භටයින් 15 දෙනෙකු පමණ සිටි බව" කියා සිටියේය. " මම සෙනඟ පිරුන බස් එකේ දෙරේ එල්ලි ලා යන කොට එක පාරට ම විශාල පිපිරිම් ශබ්ද දෙකක් ඇහුනා. මට මතක බස් එක එක පාරටම මිටර් 20ක් 30 ක් විතර ඈතට විසී විතරයි." යනුවෙන් ඔහු තවදුරටත් ප්‍රකාශ කළේය.[48]

---

45 ' පටාචාරා සිනාරියෝ ඇට් කැබිලිතිගොල්ලෑව හියරින් ' ඩේලි මිරර් 4 ඔක්තෝබර් 2008

46 ' මැසකර් ඇන්ඩ් මේහැම් ටයිගර්ස්-ස්පුන්ඩ් මොටෝ' සන්ඩේ ඔබ්සර්වර් 10 පෙබරවාරි 2008

47 'අම්ඩ්ස් ෆියුනරල්ස් විලේජස් ෆියරින් ටයිගර් ටෙරර්' සිරිල් බස්නායක දි අයිලන්ඩ් 17 ජුනි 2006

48 " ටුවින් බලාස්ට් කිල්ස් 61 සිවිලියන්ස් ඉන් සිටිබ් බස්" දි අයිලන්ඩ් 16 ජුනි 2008

2007 දි කැබිලිතිගොල්ලෑව ට ආසන්න අභිමාන පුර ගම්මානයේ දි දෙවන බස් බෝම්බයක් පුපුරා ගිය අතර එහි දි 16 දෙනෙකු මිය ගියේය. 2008 ජනවාරි මුල දි කැබිලිතිගොල්ලෑව ප්‍රදේශයේ තල්ගස්වැව දි යුදධ හමුද රථයකට එල්ල කළ බෝම්බ ප්‍රහාරයේ දි හමුද භටයින් තිදෙනෙකු මිය ගියේය. 2008 ජනවාරි 24 දින හොරොව්පොතාන්-කැබිලිතිගොල්ලෑව හිජ්රා පුර අසල දි නොගැඹුරු වල වල් දෙකක වළ දමා තිබු හදුනා නොගත් මළ කඳන් 16 ක් සොයා ගන්නා ලදි.පොලිසිය ට අනුව මෙම වින්දිතයින් සියළු දෙනාම වයස අවුරුදු 25ත් 40ත් අතර වු මෙම වින්දිතයින් ගේ දෑත් පිටු පසට ගැට ගසා ඇස් වසා බැද තිබුනි. ඔවුන් සියළු දෙනා ගේ ම වෙඩි වැදුන තුවාල තිබින.

මෙම යුද්ධයෙහි ප්‍රතිඵලයක් වශයෙන්, එල් ටි ටි ඊ ය යුද්ධ හමුදව අතර ගැටුම් පැවති ප්‍රදේශයන්ට ආසන්නව සිදු වූ මෙම ප්‍රහාරයන් හේතු කොට ගෙන, ගම්වාසීන් ට සිය ගම් බිම් අතහැර පලා ගියෝය. කැබිලිගොල්ලෑව ට ආසන්නව සිදු වූ වෙනත් ප්‍රචන්ඩ ක්‍රියා හේතු කොට ගෙන ද "මායිම් ගම්මාන" නමින් හඳුන්වන ලද ගම්මානයන් හි ගම් වැසියන් හට අවතැන් ව සිටිමට සිදු විය[49]. 2006 ජුනි ප්‍රහාරයේ දි බොහෝ දෙනෙකු ට පවුලේ ආදයම් උපයන්නන් අහිමි වූ අතර තවත් බොහෝ දෙනෙකුට සිදු වූ තුවාල සම්බන්ධයෙන් වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනිමේ ගැටළු මතු වි තිබුනි. යකා වැව ගම්මානයේ පමණක් 54 දෙනෙකු ගේ ජිවිත අහිමි තිබුනි. එම ගම්මානයේ ජිවත් වූ පවුල් 128 න් පවුල් 45 ( එක් අයෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සාමාජිකයින් අහිමි වූ ) ප්‍රහාරයෙන් වසරකටත් පසුවත්, රජයේ ආධාර නතර වි තිබිය දිත් අවතැන් ව කඳවුරු වල ජිවත් වුවෝය. එසේ නතර වි සිටි අය ගෙන් බොහෝ දෙනෙක් ආරක්‍ෂාව හා ආර්ථික හේතුන් මත පමණක් නොව සිය පවුල් වල සාමාජිකයින් බෝහෝ දෙනෙක් අහිමි විමේ කම්පනය තුරන් නොවිම නිසා ද සිය ගම් බිම් බලා නොයන බව ප්‍රකාශ කළෝය[50].

*බෝකුන්දර කඳවුරෙහි රැඳි සිටි යකා වැව ගම්මානයෙ හි බොහෝ දෙනෙක් එසේ රැඳි සිටියේ ආරක්‍ෂක හේතුන් මත වන අතර එක් අයෙක් රැඳි සිටිමට හේතුව වශයෙන් කියා සිටියේ සිය නිවසට ගිය කල් හි පවුලේ සාමාජිකයින් පිළිබඳ අතිත මතකයන් ඇවිස්සෙන බවයි. ග්‍රාමාරක්‍ෂක භටයෙක් වූ ප්‍රියන්ත කඳවුරෙහි රැඳි සිටින්නේ බෝම්බය පුපුරා ගිය බියකරු දින තමන් දැඩිව පෙළා දමූ කම්පනය තවමත් ඔහු පිටුපස හඹා එන බැවින් යැයි කිවේය. ප්‍රියන්ත ගේ මුහුණ බොහෝ දෙනෙකුට ඔහු සිය පුතු ගේ මළකඳ මත වැලපෙන අයුරු දක්වා තිබූ 2006 ජුනි 15 දිනට පසු දින සියළු ම ජන මාධ්‍යයන් හි පළ කොට තිබූ ඡායාරූප මතකයට නැංවිය. මෙලොව තනි වූ ප්‍රියන්ත තවමත් සිය පවුලේ සාමාජිකයින් 23 සමග සිය බිරිඳ සහ අවුරුදු දෙකක් වයසැති සිය පුතු අහිමි විමේ ශෝකය තුනි කර ගත නොහැකිව තැවෙයි. ඔහු ගේ කම්පාව තවමත් ඔහු ගේ මුහුනෙ හි ඇඳි තිබින. එද කැබිලිතිගොල්ලෑවට බයිසිකලයෙන් නො ගොස් තමාත් ඔවුන් සමග මිය ගියා නම් හොඳ යැයි ඔහු තවමත් සිතයි.*

*" මම ආපුහු ගෙදර ගොහින් එගොල්ලෝ නැතිව ජිවත් වන්නේ කොහොම ද?" ඔහු අසයි.*[51]

2008 දෙසැම්බර් 9 දින පරීක්ෂණ කොමිසන් සභාවේ සභාපති විශ්‍රාම ලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු නිශ්ශංක උදලාගම කැබිලිතිගොල්ලෑව සිද්ධිය පිළිබඳ සිය පරීක්ෂණ අවසන් බව ප්‍රකාශ කළේය. 2008 ඔක්තෝබර් මස මෙම සිද්ධිය පිළිබඳ ව ප්‍රසිද්ධ සාක්ෂි විභාගය ආරම්භ කළ අතර බි පද්මාවති ඇතුළු සිදධියෙන් දිවි ගලවා ගත් අය ගෙන් සාක්ෂි විමසන ලදි. 48 හැවිරිදි පද්මාවති සාක්ෂි දෙමින් තමාට සිය සැමියාත් පුතුන් හතර දෙනාත් කිට්ටුම නෑදයින් හා හිතවතුන් අහිමි වූ බවත් ගමට ගොස් දුක් විදිනවාට වඩා කඳවුරෙහි රැඳි සිටිම මැනවයි කිවාය.[52]

**2006 ඔක්තෝබර් 16 දින සිගිරිය දිගම්පොතන දි ආරක්‍ෂක හමුද භටයින් 98 දෙනා ගේ ඝාතනය**

2006 ඔක්තෝබර් 06 දින නාවික හමුද භටයින් 102 ක් හා තවත් සිවිල් වැසියන් ඇතුළු තවත් 116 කට තුවාල සිදු කරමින්, හමුද භටයින් ගමන් කරමින් සිටි බස් රථ පෙළකට පුපුරන ද්‍රව්‍ය පුරවා ගත් ලොරි රථයක් පැද වූ මරා ගෙන මැරෙන බෝම්බකරුවෙකු කඩා වැදින. සිද්ධිය සිදුවන අවස්ථාවේ බස් රථ පෙළ ත්‍රිමල-හබරන

---

49 කැබිලිතිගොල්ලෑව ආසන්නයේ අභිමානපුර දි 2007 දි දෙවන වරටත් බෝම්බයක් පුපුරා ගිය අතර එහි දි 16 දෙනෙකු මිය ගියේය. 2008 ජනවාරි මස දි කැබිලිතිගොල්ලෑව ආසන්නයේ තල්ගස් වැව දි යුද්ධ හමුද රථයක් ඉල්ලක කොට බෝම්බයක් පුපුර ගිය අතර එහි දි හමුද භටයින් තිදෙනෙක් මිය ගියේය. 2008 ජනවාරි 24 දින හොරොව්පොතාන-කැබිලිතිගොල්ලෑව මාර්ගයේ හිජ්රාපුර දි නාඳුනන පුද්ගලයින් 16 දෙනෙකු ගේ මළ කඳන් හමු විය. පොලිස් වාර්තාවන්ට අනුව මිය ගිය සියලු දෙනාම වයස අවුරුදු 25-40 අතර වුවෝ වූ අතර ඔවුන් ගේ අත් පිටුපස කොට ගැට දැස් බැඳ තිබුනි. ඔවුන් සියලු දෙනාම ඝාතනය කොට තිබුනේ වෙඩි තැබිමෙනි. " ඒ ට්‍රැජඩි ඔෆ් සරවයිවරස් " රොහාන් ගුණරත්න

50 " ඒ ටැජඩි ඔෆ් සවර්වයිවර්ස්" රෝහන අබේවර්ධන-www.sundaytimes.lk/0720624/news/nws23.html

51 " ෆොගොටොන් කැබිලිතිගොල්ලෑව" ද සන්ඩේ ලිඩර් 17 ජුනි 2008

52 " පටාචාරා සිනාරියෝ ඇට් කැබිලිතිගොල්ලෑව" ඩේලි මිරර් 4 ඔක්තෝබර් 2008

මාර්ගයේ දිගම්පොතාන විවේකස්ථානයේ නතර කොට තිබිනි. ඒ වන විට නාවික භටයින් 300 ක් පමණ එම ස්ථානයේ සිටි අතර ඔවුන් ගෙන් කොටසක් නිවාඩු ලබා නිවෙස් බලා යමින් සිටි අතර අනෙක් කොටස රාජකාරි සඳහා වාර්තා කිරීමට යමින් සිටියහ[53]. ශ්‍රී ලංකා රජය ප්‍රහාරය සම්බන්ධයෙන් එල් ටි ටි ඊ යට චෝදනා කරන ලදි. පරීක්ෂණ කොමිසන් සභාව දිගම්පොතන සිද්ධිය සම්බන්ධයෙන් සිය විභාගය 2008 ඔක්තෝබර් 20 දින ආරම්භ කළ අතර ප්‍රථමයෙන් සාක්ෂි දුන් සාක්ෂිකරුවන් දෙදෙනා ගේ සාක්ෂි විභාගය ජන මාධ්‍යයට විවෘත නොවිය.[54]

**2006 අගෝස්තු මස නඩ්ඩලාකෝට්ටුකුලම් ( සෙන්චොලේ) හි දී පුද්ගලයින් 51 දෙනකු ඝාතනය**

මිට ප්‍රථමයෙන් ද සඳහන් කළ පරිදි කොමිසන් සභාවේ සියළු ම විමර්ශනයන් සිදු කරන ලද්දේ කැමරාවක් ඔස්සේ වන අතර ඇතැම් සිද්ධින් සම්බන්ධයෙන් කිසි විටෙකත් ප්‍රසිදධ සැසිවරා නොපැවැත්විනි. එම නිසා මෙම සිද්ධිය සම්බන්ධයෙන් ද යමක් කිව හැක්කේ ඉතා මඳ වශයෙනි. ප්‍රසිද්ධ සැසි වාරයක් පවත්වනු නොලැබුවත් සෙන්චොලෙයි ගොඩනැගිලි සංකීර්ණයට එල්ල කරන ලද ගුවන් ප්‍රහාරය සම්බන්ධයෙන් තව දුරටත් සාකච්ඡා කළ යුතු ව තිබේ. 2006 අගෝසතු 14 දින ශ්‍රී ලංකා ගුවන් හමුදව විසින් මුලතිව් දිස්ත්‍රිකයෙ හි සෙන්චෝලෙයි හි පිහිටි ගොඩනැගිලි සංකීර්ණයකට බෝම්බ හෙළන ලදි.එහි දි එම ස්ථානයට රැස් වි සිටි පාසැල් ළමුන් ගෙන් 50 දෙනෙකු මිය ගිය අතර තවත් 150 දෙනෙකුට ආසන්න සංඛ්‍යාවක් තුවාල ලැබුහ. කලින් අනාථ නිවාසයක් ව පැවති මෙම ස්ථානයේ තිබූ පහසුකම් හා ළමුන් රැස්ව සිටියේ කුමන ආකාරයේ පුහුණුවක් සඳහා ද යන්න පිළිබඳ රජය හා එල් ටි ටි ඊ එකිනෙකාට චෝදනා කර ගන්නා ලදි. එල් ටි ටි ඊ සංවිධානය විසින් ළමුන් රැස් ව සිටියේ " නායකත්ව" හා ප්‍රථමාධාර පුහුණුවක් සඳහා යැයි කියා සිටි අතර රජය මෙම ළමුන් එල් ටි ටි ඊ යට බඳවා ගත් තැන්තතන් යැයි කියා සිටියේය.

පරීක්ෂණ කොමිසන් සභාවේ වැඩ කටයුතු නතර කොට ඇති අතර එහි තොරතුරු රහස්‍ය වුවත් මෙම සිද්ධිය පිළිබඳ ව ඒ වන විටත් ඉතා විශාල ප්‍රචාරයක් මුද්‍රිත හා රූපවාහිනි මාධ්‍ය ඔස්සේ ලබා දි තිබුනි. තුවාල ලබා දිවි ගලවා ගත් ළමුන් තිදෙනෙක් ඔවුහු පොලිස් රැකවරන මධ්‍යයේ ජන මාධ්‍යයන් ට ප්‍රකාශ ලබා දිමට සමත් වුහ. ඔවුහු පසුව පරීක්ෂණ කොමිසන් සභාව විසින් අප්‍රසිද්ධ පරීක්ෂණයක නැවතත් ප්‍රශ්න කරන ලදි. ශ්‍රී ලංකා රජයේ සාම ක්‍රියාවලිය සම්බන්ධිකරණ ලේකම් කාර්යාලයේ (ස්කුප්) නිතී අංශයේ අධ්‍යක්ෂිකා සහ පරීක්ෂණ කොමිසන් සභාවේ වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අංශයේ උපදේශිකා ශ්‍රියානි ගුණතිලක දැඩි අවදානමක් දුරු මෙම සාක්ෂිකරුවන් කොමිසන් සභාවේ සැසි වාර සඳහා කැඳවා ගෙන ඒම, සාක්ෂි විමසන අවස්ථාවිදි පෙනි සිටිම සහ ආපසු කැඳවා ගෙන යාම පෞද්ගලිකවම පෙනි සිටි බව වාර්තා විය.[55]

නොවැම්බර් මාසයේ දි ශ්‍රී ලංකා රජයේ සාම ක්‍රියාවලිය සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය පරීක්ෂණ කොමිසන් සභාවේ කටයුතු නිම විමට පෙර මෙම සිද්ධිය පිළිබඳ ව තමන් ගේ ම විස්තරයක් නිකුත් කරන ලදි. 2008 නොවැම්බර් 10 දින " උතුරට මානවීය ආධාර" නමින් වාර්තාවක් පළ කරමින් සාම ලේකම් කාර්යාංශ්‍යය:

*වර්තමාන ගැටුම් ආරම්භ වී පසු ගිය දෙවසර තුල ගුවන් ප්‍රහාර 350 කට ආසන්න ප්‍රමාණයක් එල්ල කර තිබෙන අතර සිවිල් වැසියන් ගේ මරණ සංඛ්‍යාව 50 අඩු විය. මීට එල් ටි ටි ඊ ය විසින් බලහත්කාරයෙන් බඳවා ගෙන සිටිය දි විපතට පත් වු තරුණ පාසැල් ශිෂ්‍යාවන් 61 දෙනා ඇතුලත් නොවෙයි. ගුවන් හමුදවේ*

---

53 " පර්සනෙල් කිල්ඩ් ඇට් දිගම්පොතන බොම්බ් බලාස්ට්" ශ්‍රී ලංකා නාවික හමුද වෙබ් අඩවිය. www.navy.lk/index.php?id=297

54 "සිඕඅයි කොමෙන්ස් ප්‍රොබ් ඉන් ටු දිගන්පොතන බොම්බ් බලාස්ට්" ඩේලි මිරර් 21 ඔක්තෝබර් 2008

55 රහස්‍යව ලබා ගත් තොරතුරකි

*ඉලක්කය වුයේ ලැබුන තොරතුරු අනුව එම ස්ථානය පුහුණු කඳවුරක් බවත්, ඡායාරූප වලට අනුව ඔවුහු ආයුධ සන්නද්ධව මිල්ටරි ඇඳුමෙන් සැරසි සිටි නිසා ලැබුන තොරතුරු නිවරදි බවට සනාථ කර ගන්නා ලදී. ආරම්භයේ දී එල් ටි ටි ඊ ප්‍රකාශය වුයේ මෙම ස්ථානය අනාථ කඳවුරක් බව නමුත් එම අනාථ කඳවුර ඊට බොහෝ කලකට පෙර කිලිනොච්චියට ගෙන ගිය බව හෙලිදරව් විමෙන් පසුව එම ප්‍රකාශය වෙනස් කළේය. ඉන් පසුව මෙම ස්ථානය ප්‍රථමාධාර පුහුණු මධ්‍යස්ථානයක් යැයි එල් ටි ටි ඊ ය ප්‍රකාශ කළ නමුත් එම ස්ථානය බලහත්කාරයෙන් බඳවා ගෙන සිටි දූරියන් ගේ පදිංචි නිවාස වලින් ඉතා දුරින් පිහිටා තිබිමත්, ඡායාරූප වලට අනුව ඔවුන් ට බලහත්කාරයෙන් ඇදුම් අන්දවා කටයුතු කිරිමට සැලස්විම සහ එම ස්ථානයෙන් බේරා ගත් යුවලක් රජයේ භාරයට පත් විමෙන් පසු දෙන ලද සාක්ෂි වලින් ද ඒ බව තහවුරු විය. එම ස්ථානයෙන් බේරා ගත් තුන් වැන්නා උතුරේ රෝහලක දි අභිරහස් ලෙස මිය ගියේය[56].*

එක් තුවාලකරුවෙක් සැත්කමින් දින කිහිපයක ට පසු මහනුවර මහ රෝහලින්, වවුනියා රෝහලට මාරුකර යවන ලද අතර පැහැදිලිව විස්තර කළ නොහැකි හේතුවක් මත ඇය දින කිහිපයකට පසු එහි දි මිය ගියාය.[57]තවත් ශිෂ්‍යාවක් මහනුවර මහ රෝහලින් නිවස බලා යාමට පිටත් කරන ලද අතර ඇය නැවත මහනුවර පොලීසිය විසින් නැවත අත් අඩංගුවට ගෙන රඳවා තබා ගෙන ප්‍රකාශයක් සටහන් කර ගන්නා ලද්දේය. ඇයට සිය අත්දැකිම යලි යලිත් වාර්තාකරුවන්ට ප්‍රකාශ කරන්නට බල කෙරිණ. ඇය ගේ සම්මුඛ සාකච්ඡා රූපවාහිනි නාලිකා ඔස්සේ විසුරුවා හරින ලද අතර අනෙකුත් වින්දිතයින් ගේ ප්‍රකාශ ද, ඇය ගේ මව ගේ ප්‍රකාශ ද විසුරුවා හැරිමෙන් එල් ටි ටි ඊ යේ ඉලක්කයක් පත් විමේ මහත් අවදානමකට ඇද දමන ලදි. මෙම සම්මුඛ සාකච්ඡාවන් හි රූප මාලාව ශ්‍රි ලංකා ආරක්ෂක අමාත්‍යංශ වෙබ් අඩවියෙ හි ගබඩා කොට තිබේ.[58] මීට පෙර කිහිප අවස්ථාවක දි සිදු ආකාරයටම මෙහි දි ද වින්දිතයින් ගේ සම්පුර්ණ නම ප්‍රකාශයට පත් කළ අතර ඔවුන් ගේ මුහුණු ද ඉතා හොඳින් ප්‍රදර්ශනය කිරිමෙන් අනතුරුව කොළඹ වැලිකඩ බන්ධනාගාරයට මාරු කරන ලදි.

සාම කාර්‍යංශය විසින් සඳහන් කරන ලද ආරක්ෂිත ලෙස රජයේ අත්අඩංගුවේ තබා ගැනිම යනුවෙන් අදහස් කළේ මහනුවර පොලිසීය හා කොළඹ බලධාරින් විසින් අත් අඩංගුවේ තබා ගැනිම සහ ප්‍රශ්න කිරිම්ය. මෙම සිද්ධියේ දි තුවාලකරුවන් හට කිසිදු චෝදනාවක් ඉදිරිපත් නොකරන ලදි. වාර්තා වු ආකාරයට ඔවුහු උසස් පෙළ සිසුන් වු අතර සිය කැමැත්තෙන් තොරව සිය පාසැල් අසල දි පැහැර ගන්නා ලදුව සෙන්චෝලේ කරා ගෙන එනු ලැබින. එල් ටි ටි ඊ අත්අඩංගුවට පත් වී දින කිහිපයකින් ම ඔවුහු බෝම්බ ප්‍රහාරයට ගොදුරු වුවෝය. ඇම්නස්ටි ඉන්ටර්නැෂනලයට එත්තු ගිය පරිදි ඔවුන් ගේ පුහුණුකරුවන් මිල්ටරි නිල ඇදුම් ඇඳ සිටියා මිස පුහුණු ලාභි ශිෂ්‍යාවන් එබඳු නිල ඇදුමකින් සැරසි නොසිටියහ. තව දුරටත් වාර්තා වු ආකාරයට මෙම ළමුන් ප්‍රථමාධාර පුහුණුවක් ලබා දි තිබු අතර ගිනි අවියක කොටස් ගලවා යලි සවි කරන ආකාරය පිළිබඳ ද පුහුණුවක් ලබා දිමට නියමිත ව තිබුනි යන්නේන් එල් ටි ටි ඊ ය යම් කිසි ආකාරයක යුදයට පුහුණුවක් ලබා දිමේ බලාපොරොත්තවක් තිබි ඇත. එල් ටි ටි ඊ පාලන ප්‍රදේශය තුල පදිංචි සෑම තැනැත්තෙක් ම අනිවාර්යෙන් ම යුධමය පුහුණුවක් ලබා තිබුනත් ඔවුහු සියළු දෙනා ම සක්‍රිය කාඩර්වරු නොවෙති). බැලු බැල්මට පුහුණුව ගුවන් හමුදා ප්‍රහාරයත් සමග ම කඩා කප්පල් වු බව පෙනේ. වින්දිතයෝ තරුණ ( මාධ්‍ය වාර්තාවන් ට අනුව ඔවුහු අවුරුදු 18, 19 සහ 20 අතර වුවෝ වෙති) එල් ටි ටි ඊ ය විසින්

---

56 " හියුමැනිටේරියන් සර්විස් ටු ද නොර්ත්" ස්තූප් වාර්තාව 10 නොවැම්බර් 2008 www.

57 වෝල්ටර් ජයවර්ධන " මිස්ටරි සරවුන්ඩස් ද ඩෙත් ඔෆ් සෙන්චෝලෙයි වික්ටිම් දයාලිනිඃ විනිශ්චයකාරවරයා ඇය කුමන හේතුවක් නිසා මහනුවර සිට වවුනියා රෝහලට මාරු කරන ලද්දේ දැයි අසන ලදි. එෂියන් ට්‍රිබියුන් 1 ඔක්තෝබර් 2006 www.asiantribune.com 2006 ඔක්තෝබර් මස දි මෙම මරණය මහනුවර මහ රෝහලෙහි නොසැලකිල්ල නිසා සිදු බවට චෝදනා කළ නොර්ත් ඊස්ට් සෙකටේරියට් ඔන් හියුමන් රයිට්ස් (NESOHR) ඡාත්‍යයන්තර මැදිහත්විමක් සඳහා ආයාචනය කළේය. www.nesohr.org /inception-sept 2007/human-rights-reports/sensolai.pdf

58 මේ පිළිබඳ ප්‍රවෘත්ති හා විශේෂංග ජාතික නාලිකාව වන රූපවාහිනිය හා අයි ටි එන් ඔස්සේ විසරුවා හරින ලදි.

සුරාකෑමට හා අනතුරට හෙලනු ලැබුවෝ වෙති. ඔවුහු තවදුරටත් රජය විසින් ද සුරා කෑමටත් අනතුරේ හෙලිමටත් භාජනය වනු ඇත.

**2006 සැප්තැම්බර් 17 දින පොතුවිල් පොලිස් බල ප්‍රදේශයේ රුදල්ලෙ හි මුස්ලිම් වැසියන් 10 දෙනෙකු ඝාතනය කිරිම**

සැප්තැම්බර් 18 දින අම්පාර දිස්ත්‍රික්කයෙ හි පොතුවිල් නගරයෙහි සිට කිලෝ මිටර 9 ක් ඔබ්බෙහි පිහිටි ලාහුගල ජාතික වනෝද්‍යානය මායිමේ හි  රදල්ල පැරණි ජලාශය ආසන්නයේ පිහිටි රාට්ටුකුලම් හි කපා කොටා ඝාතනය කොට තිබූ තරුණයින් 10 දෙනෙකු ගේ සමු විණ. විපතට පත්වූ  සියළුදෙනාම මුස්ලිම් ජාතිකයෝ වූ අතර  වයස අවුරුදු 18-25 වයස් සීමාවේ සිටියහ. මහළු වයසෙහි සිටි  මීරා  මොහින්ඩින් නැමැත්තා බරපතළ ලෙස තුවාල ලබා මරණාසන්නව සිටි අතර ඔහු වහාම රෝහල් ගත කෙරිණ. පොතුවිල් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඉල්ලිම පරිදි වැව් සොරොව්ව ප්‍රතිසංස්කරණ කොන්ත්‍රාත්කරුවෙකු වෙත ඔවුහු සේවය කරමින් සිටියහ. කම්කරුවන් හා ඔවුන් ගේ හිතවතුන් සමග වැඩ බිමට පිටත් ව ගිය නමුත් පෙරළා නොපැමිණි හෙයින්, ගම් වාසින් කිලෝමිටර් හතරකට ඔබ්බෙන් පිහිටි ශාස්ත්‍රාවෙලි හි  විශේෂ කාර්ය බලකා මුලස්ථානය වෙත ගොස් 'සර්ච් පාර්ටි' එකක් සංවිධානය කරන මෙන් ඉල්ලා සිටියහ. විශේෂ කාර්ය බලකාය ගම්වාසින් ගේ ඉල්ලිම ප්‍රතික්ෂෙප කරනු ලැබූ හෙයින් තුමු ම අතුරුදහන් වූ ගම්වාසින් සොයන්නට පිටත් වූහ. ඔවුන්ට එදින රාත්‍රියෙහි වැඩ බිම ආසන්නයේ හිස් කළ මත්පැන් බෝතල් හමු වූ ඊට ආසන්නයේ ම පසු දින උදෑසන අත් බැඳ දෑස් ගැට ගසන ලද උගුරු දන්ඩෙහි හා බෙල්ලෙහි ගැඹුරු කැපුම් තුවාල සහිත මෘත ශරිර හමු විය[59]. මිට සමාන තුවාල සහිතව නමුත් ජිවතුන් අතර සිටි එකම තැනැත්තා මීරා මොහිඩින් වහාම රෝහල් ගත කෙරිණ.

එල් ටි ටි ඊ හා මුස්ලිම් නායකයින්, විශේෂ කාර්ය බලකායට මෙම ප්‍රජාව සමග තිබූ අතිත ගැටුම් සිහිපත් කරමින් ඔවුන්ට  චෝදනා එල්ල කළේය. ශ්‍රි ලංකික බලධාරින් එල් ටි ටි ඊ යට චෝදනා කරමින් මීරා මොහිඩින් ප්‍රහාරකයන් එල් ටි ටි ඊ බවට ප්‍රකාශයක් කළ බව කියා සිටියේය. මීරා මොහිඩීන් ගේ සිද්ධියේ දි ඔහු ගේ දියණිය තමාට සිය පියා බැලිමට සති ගණනාවක් යනතුරුම ඉඩ නොදුන් බව කියා සිටියාය. ප්‍රථමයෙන් ම ඔහු කල්මුනේ රෝහලට ඇතුලත් කළ අතර ආරක්ෂක අමාත්‍යංශයට අනුව ආරක්ෂක හේතුන් මත ඔහු නැවත අම්පාර මුලික රෝහලට ඇතුලත් කරන ලදි[60]. පසුව ඔහු කොළඹ ජාතික රෝහලට මාරු කරන ලදි.

*තුවාලකරු මීරා මොහිඩීන් පොතුවිල් දිස්ත්‍රික්ක වෛද්‍ය නිලධාරියා ගේ ලිඛිත උපදෙස් මත ගිලන් රථයකින් කල්මුනේ රෝහල වෙත ගෙන යමින් සිටියහ. කල්මුනේ රෝහල් දෙකක් තිබෙන අතර ඉන් එකක් අෂ්රොප් අනුස්මරණ රෝහල වන අතර දෙවැන්න දවිඩ අංශය ලෙස හැඳින්වූ මුලික රෝහල වෙයි. මේ දෙකම 2004 සුනාමියෙන්  පසු අංග සම්පූර්ණ රෝහල් බවට පත් කෙරිණ. ගිලන් රථය කාරතිව් හි පිහිටි විශේෂ ආරක්ෂක බලකා මුර පොළ පසු කළ අතර කල්මුනේ ආසන්නයේ පිහිටි මලියක්කුඩා මුර පොළේ දි පොලිසිය විසින් ගිලන් රථය නතර කරමින් තුවාලකරු අම්පාර රෝහල වෙත ගෙන යන මෙන් නියෝග කරන ලදි.*

*තමම සිදුවිම ජන මාධ්‍යයට හෙළිදරව් වූ අතර 19 වන ද රජය විසින් පත් කරන ලද විශේෂ පරීක්ෂණ කන්ඩායමට  තමාට ගිනි අවි, මුගුරු, කැති සහ පොරෝ වලින් සන්නද්ධව පැමිණි එල් ටි ටි ඊ ය විසින් ඝාතනය සිදු කළේ යැයි  මීරා මොහිඩීන් ප්‍රකාශයක් කළ බවට නිවේදනයක් නිකුත් කරන ලදි. සටන් විරාම නිරික්ෂණ කමිටුව දිවි ගලවා ගත් තැනැත්තා හමුවිමට උත්සාහ දරන ලද නමුත් පොලිසිය විසින් එම ඉල්ලිම*

---

[59] ද වොයිස් බිට් වින් ඇනාකි ඇන්ඩ් ඉන්ටර්නැෂනල් ලෝ විත් මොනිටරින් යුටිඑච්ආර් (ජේ) විශේෂ වාර්තාව අංක 23 7 නොවැම්බර් 2006

[60] " පොතුවිල් මැසකර්" හිනස් ක්‍රියිම් බයි ද එල් ටි ටි ඊ" ආරක්ෂක අමාත්‍යංශයේ වෙබ් අඩවිය 7 නොවැම්බර් 2006 www.defence.lk/news.asp?fnme=20060919_01

*ප්‍රතික්ෂේප කරන ලදි. මුස්ලිම් අයිතිවාසිකම් කන්ඩායමක් වින්දිතයා ගේ පවුලේ උදවිය මුණ ගැසුන අතර ඔවුහු තුවාල කරුට ප්‍රකාශයක් කිරිමට බැරි තරම් දූර්වල තත්වයක සිටින බවත් කථා කිරිමට කිසිසේත් නොහැකි බවත් කියා සිටියේය. ඔහුට යන්තම් කෙඳරි ගෑම හැර වෙන යමක් පැහැදිලිව කිමට නුපුළුවන් විය. සටන් විරාම කමිටුවට සහ පවුලේ සාමාජිකයින්ට ඔහුව මුණ ගැසිමට ඉඩ නො දිමට හේතුව වශයෙන් පොලිසිය ඉදිරිපත් කළ තර්කයත් එයයි. සටන් විරාම කමිටුවට ඔහුව මුණ ගැසිමට ඉඩ දෙන ලද්දේ 22 වනදය. මේ අතර රජයත් මුස්ලිම් ජාතික අමාත්‍යවරයෙකු වු එච් එම් පවුසි අමාත්‍යවරයාත් එල් ටි ටි ඊ ය වෙත දෝෂාරෝපණය කරන ලදි.*[61]

සැප්තැම්බර් 27 දින මීරා මොහිඩීන් අම්පාර මහ රෝහලේ ගිලන් ඇඳෙහි සිට අමාත්‍ය ඒ එල් එම් අතාවුල්ලා අමතමින් කළ " ප්‍රහාරකයින් ද්‍රවිඩ බස කථා කළ අතර තමා ඔවුන් එල් ටි ටි ඊ යැයි සිතන බවට" කළ ප්‍රකාශයක් රූපවාහිනි නාලිකාවක් මගින් ප්‍රචාරය කරන ලදි[62]. එම රූප මාලාව ආරක්ෂක අමාත්‍යංශ වෙබ් අඩවියෙහි ගොනු කොට තිබුන අතර ආන්ඩු හිතවාදි වෙබ් අඩවියක ද නිරන්තරයෙන් ප්‍රදර්ශනය කෙරින.[63] නමුත් මෙම අවස්ථාව වන විටත් ඔහු ගේ පවුලේ ඥතීන්ට ඔහු බැලිමට අවසර දි නොතිබින. යුටිඑච්ආර් වාර්තාවට අනුව පසුව පවුලේ සාමාජිකයින් ඔහු ගෙන් මෙම සම්මුඛ සාකච්ඡාව පිළිබඳව විමසු විට තමාට එවැන්නක් මතකයේ නැතැයි කියා සිටියේය.

*ඔක්තෝබර් 04 දින හෝ ඊට ආසන්න දිනක මීරා මොහිඩීන් අම්පාර රෝහලේ වෛද්‍ය සුපිරින්ඩෙන්ටන් වරයා මෙම රෝගියා ඉතා ඉක්මනින් සුව අතට හැරෙමින් සිටින නිසා ඉතා ඉක්මනින් පිටත් කළ හැකි බව ප්‍රකාශ කර තිබු නමුත් නොදන්නා හේතුවක් මත රෝගියා කොළඹ මහ රෝහලේ ගෙවන වාට්ටුවකට මාරු කරන ලදි. ඔහුගේ පවුලේ ඥතින්ට සම්බන්ධ ආරංචි මාර්ග ප්‍රකාශ කරන ආකාරයට මොහිඩීන් දිගින් දිගටම ආපසු ගෙදර යාමට දැඩි කැමැත්තෙන් සිටින බැවින් ඔහු කොළඹ රඳවා තබා ගැනිම ඉතාමත් අසීරු බවයි. මොහිඩීන් ගේ බෑනා පොතුවිල් සිට කොළඹට කැඳවන ලද අතර ඔහු තම මාමන්ඩියාට තව ටික කාලයකට කොළඹ රැඳි සිටින මෙන් ආයාචනය කරන කරන ලදි. කොළඹ රෝහල් බලධාරින් ගේ ගැටළුව වුයේ රෝගියා රෝහලට බාර දි තිබුනේ අම්පාර පොලිසීය විසින් බැවින් රෝගියා පිටත් කිරිමටත් අම්පාර පොලිසීයේ උපදෙස් අවශ්‍ය බවයි.*[64]

අවසානයේ දි මීරා මොහිඩීන් රෝහලින් පිටත් කර යවන ලද්දේ සිය පවුලේ උදවිය හා එකතු වුයේය.

ප්‍රහාර වලින් දිවි බේරා ගත් මීරා මොහිඩින්ට හා සෙන්චෝලෙයි තරුණ වින්දිතයින්ට ප්‍රතිකාර කරන ලද ආකාරය පිළිබඳව සිත් කළඹන සුළු සමාන කම් ඇත්තේය. වින්දිතයින් දෙපාර්ශවයම වෛද්‍යවරුන් විසින් බලාපෙරොත්තු වනවාට වඩා වැඩි කාලයක් ඔවුහු රෝහල් තුළ එක්කෝ ආරක්ෂක හේතුන් මත එසේත් නැත්නම් තොරතරු පාලනය කිරිම පිණිස රඳවා තබා ගැනින. ඔවුන් ට මුකවාඩම් දමන ලද අතර රෝහලේ ඇඳ මත හිඳිමින් පොලිස් ආරක්ෂාව යටතේ රූපවාහිනි නාලිකා වන්ට ප්‍රකාශ නිකුත් කරන්නට බල කෙරින. රූපවාහිනි නාලිකා කිසිම අවස්ථාවක දි ඔවුන් ගේ අනන්‍යතාව වසන් කිරිමට ද උත්සාහ නොදරන ලදි.

**වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිම**

61 යුටිඑච්ආර් අංක 23 වාර්තාව

62 " එස්ටිඑෆ් ඕඅයිසි ෆයිල්ස් පෙටිෂන් එගෙන්ස්ට් අයි ජී පි ඇන්ඩ් රාවුෆ් හකිම්" සුසිතා ආර් ප්‍රනාන්දු ඩේලි මිරර් 19 ඔක්තෝබර් 2006

63 "ටැමිල් ටයිගර් ටෙරරිස්ට් බිහඉන්ඩ් පොතුවිල් මුස්ලිම් මැසකර්. සෝල් සර්වයිවර්" ශ්‍රී ලංකා ඔන් ලයින් 29 සැප්තැම්බර් 2006 www.youtube.com/watch?v=wrMThYTADKY

64 අයි අයි ජී ඊ පි ප්‍රසිධ ප්‍රකාශය 15 අප්‍රියෙල් 2008 www.iigep.org/prelease/estatement8.pdf

ශ්‍රී ලංකාවේ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළක් නොමැත. සාක්ෂිකරුවන් බිය ගැන්වීමට එරෙහිව ඔවුන් ඵලදායි ලෙස ආරක්ෂා කිරීමක් නොමැතිකම මානව හිමිකම් නඩු විභාග කිරීම සම්බන්ධයෙන් අති විශාල බාධාවක් වන අතර පරීක්ෂණ කොමිසන් සභාවේ වැඩ කටයුතු වලටද සාක්ෂිකරුවන් හා ඉදිරිපත් විය හැකි අනතුරු හඟවන්නන් වැළැක්වීම විශාල බාධාවක් විය.[65] හිටපු කොමසාරිස්වරුන්ට අනුව භීතියේ සෙවනැල්ල ඔවුන් මත පවා වැටින. ප්‍රාථමික මට්ටමින් සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම අරමුණු කොට ගත් පනත් කෙටුම්පතක් 2006 ජුනි මස සිට හමස් පෙට්ටියට දමා තිබේ. වඩාත් ඵලදායි ලෙස සාක්ෂිකරුවන් ආරක්ෂා කරන ක්‍රමවේදයක් අවශ්‍ය වන අතර එබඳු උත්සාහයක් සඳහා පෙර මඟ සුදුනමක් ද තිබේ. දැනට යෝජිත පනත් කෙටුම්පතෙහි පමණක් නොව එය කෙටුම්පත් කළ ආකාරයේ ද මහත් දෝෂ මහත් රාශියක් තිබෙන බව නිතී විශාරදයින් පෙන්වා දි තිබේ. ඒ අතර සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමට ස්වාධීන ආරක්ෂණ අංශයක් නොපිහිටුවා පොලිසිය මත යැපීම; සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම පිණිස විදේස් සාහය ලබා ගැනීම තහනම් කොට තිබීම; සාක්ෂිකරුවෙකු ගෙන් ප්‍රශ්න කිරීමේ දි රාජ්‍ය නිලධාරියෙකු අභියස එය සිදු කළ යුතු වීම යනාදිය කැපි පෙනෙයි.

තවද මෙම පනත් කෙටුම්පත විසින් ආරක්ෂිත තැනැත්තන් පිළිබඳ තොරතුරු සත්භාවයෙන් හෝ අණ කිරීමක් නිසා පිටතට සපයන තැනැත්තන් අපරාධයක් කළ තැනැත්තෙක් ලෙසට නොසලකන අතර
(වගන්ති 7 (5) සහ 7 (8) යන වගන්ති) ඕනෑම සාක්ෂි විභාගයක් අත් හිටුවීමට නිතීපති වරයාට බලය පැවරීම; මීට (10 (1) වගන්තිය ) රාජ්‍ය උවමනා සැලකීම ද ඇතුලත්ය; මෙමගින් අපරාධ වින්දිත හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිකයක් පිහිටුවීමත් එහි බහුතරය රාජ්‍ය නිලධාරින් වීම (12 (1)); යම්නකිසි තැනැත්තෙක් ප්‍රශ්න කර විට අනිවාර්යෙන් ම රාජ්‍ය නිලධාරියෙක් ඉදිරිපිට එය සිදු කළ යුතු වීම (29 (අ) සහ29 (ආ) වගන්ති)[66]

ඊට අමතරව, මෙම අණ පනත් සම්මත කිරීමේ දි නොකඩවාම සිදුවන ප්‍රමාදය සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම පිණිස ඇති දේශපාලන නොඋවමනාව ද පෙන්නුම් කරයි.

සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමට විධිමත් ක්‍රමයක් නොමැති කල් හි, පරීක්ෂණ කොමිසන් සභාව අංශයක් ලෙසට ශ්‍රී ලංකා පොලිසියේ නියෝජ්‍ය පොලිස්පති තංගවේලු මහතා ගේ ප්‍රධානත්වයෙන් වින්දිතයින් හා සාක්ෂිකරුවන් සාහය වීම සහ ආරක්ෂා කිරීමේ අංශයක් පිහිටුවන ලදි. මෙම අංශය සඳහා අවශ්‍ය මැන්ඩේටය 2007 පෙබරවාරි සහ 2007 මැයි 8 වන දිනයන් හි දි වින්දිතයින් හා සාක්ෂිකරුවන් ට සාහය සැපයීම හා ආරක්ෂා කිරීමේ ක්‍රියා පටිපාටිය නමින් අනුමත කර ගන්නා ලදි. නියෝජ්‍ය පොලිස්පති තංගවේලු 2007 ජුනි 19 දින තෙක් නිල වශයෙන් පත් නො කළේය. ඔහු ගේ පත් කිරීමෙන් පසු අර්ධ-කාලීන සාහයකයෙක් සහ පුර්ණ කාලීන නිලධාරින් 13 දෙනෙකු ද මෙම අංශයට පත් කරන ලදි[67]. කෙසේ වෙතත් මෙම අංශයට, ප්‍රමාණවත් සම්පත් හෝ සිය රාජකාරි ඉටු කිරීමට අවශ්‍ය පුහුණුවක් හෝ අධීක්ෂණය කිරීමේ ස්වාධිකාරියක් රහිත විය. හිටපු කොමසාරිස්වරුන්ට අනුව, අයි අයි ජී ඊ පි නිරීක්ෂකයින්ට හා ( මෙය ඔවුන් ගේ අවසාන ප්‍රකාශයෙහි දක්වා තිබින) කොමිසන් සභාවේ කටයුතු පිළිබඳ හුරු පුරුදු තැනැත්තන්ටත් අනුව ඉහත කී අංශය කලාතුරකින් යමක් කළ අතර එය ද හිටි අඩියේ කළ සෙයක් පෙනින[68]. හිටපු කොමිසන් සභා සාමාජිකයෙක් වූ දේවානිසන් නේසයියා ට අනුව " සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ සිය විෂය පථය ට අනුව

---

65 යුටිඑච්ආර් (ජේ) අංක 23 උඩ යට මාරු කරන්න

66 බලන්න- ඕබ්ජෙක්ෂන්ස් ටු ද ඇසිස්ටන්ස් ඇන්ඩ් ප්‍රොටෙක්ෂන් ටු වික්ටිම්ස් ඔෆ් ක්‍රයිම් ඇන්ඩ් විට්නසස් බිල්: ලෝ ඇන්ඩ් ට්‍රස්ට් සොසයිටි ට්‍රස්ට් 17 ජුනි 2008

67 මැන්ඩේට්, ඔගනයිෂේෂනල් ස්ට්‍රක්චර් ඇන්ඩ් රූල්ස් ඔෆ් පොසිජියර් ඔෆ් වික්ටිම්ස් ඇන්ඩ් විට්නස් ඇසිස්ටන්ස් ඇන්ඩ් පොටෙක්ෂන් යුනිට්, 2007 පෙබරවාරි 07 දින සම්මත කර ගන්නා ලදි.

68 රහස්‍ය තොරතරු

ශ්‍රී ලංකාව තුළ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සිය පදිංචි ස්ථානය දක්වා පුළුල් ලෙසත් යම් කිසි කාලපරාසයක් තුලත් විහිදුවීමට කොමිසන් සභාවට තිබූ ඉඩකඩ සීමිතය”[69].

සාක්ෂිකරුවන්ට මෙන් ම වින්දිතයින් ආරක්ෂා කිරීමේ අංශයේ සාමාජිකයින් ට ද මාරාන්තික තර්ජන එල්ල වූ බව වාර්තා වුවත් ඔවුහු එබන්දක් ප්‍රසිද්ධියේ පිළි ගැනීමට අකමැති වූහ.

පරීක්ෂණ කොමිසන් සභාව විසින් විභාග කළ සියළු සිද්ධින් ඉතාමත් සංවේදි වූ අතර මුතූර් හි ඒ සි එෆ් සිද්ධිය සම්බන්ධයෙන් මෙය වඩාත් නිවරුදි විය. මරා දමන විලාශයේ ඝාතනයක් වූ මෙම සිද්ධිය උවමනාවෙන් ම කළ බවටත් බොහෝ විට කලින් සැලසුම් කළ බවට සෑම ලකුණක් ම තිබූ අතර ඉහළ මට්මමේ රාජ්‍ය මැදිහත් වීමක් තිබූ බවට ද චෝදනා කෙරිණ. ඒ සි එෆ් සිද්ධිය පිළිබඳ විභාගය ආරම්භ කරන ලද්දේ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම පිළිබඳ කිසිදු වැඩ පිළිවෙළකින් තොරව සහ පුදුමයට මෙන් " බොහෝ දෙනෙකු වෙත තොරතුරු තිබූ නමුත් ඔවුහු ඒ පිළිබඳ ව කථා කිරීමට පවා බිය වූ බව” ජ්‍යෙෂ්ඨ නිතිඥවරයෙකු විසින් ඇම්නස්ටි ඉන්ටර්නැෂනලයට ප්‍රකාශ කර තිබුනි. යුටිඑච්ආර් (ජේ) වාර්තාවට අනුව ඒ සි එෆ් සිද්ධියට අදළ සාක්ෂිකරුවන් ගෙන් තිදෙනෙක් ඒ වන විටත් ඝාතනය කර තිබූ අතර හතර වැන්නා අතුරුදහන් වින[70]. ඒ සි එෆ් සිද්ධියේ වින්දිත පවුල් සාමාජිකයින් වැඩි දෙනෙක් ද ශ්‍රී ලංකාව අතහැර ජිවිත ආරක්ෂා සඳහා පලා ගියෝය. ඇතැම් අවස්ථාවල දි පරීක්ෂණ කොමිසන් සභාව ඉදිරියට කැඳවනු ලැබිමෙන් පසු සාක්ෂිකරුවන් තමන්ට ආරක්ෂාව ඉල්ලා සිටි නමුත් එවැනි ඉල්ලීමක් සපුරාලිමට සුදුසු යාන්ත්‍රණයක් පරීක්ෂණ කොමිසන් සභාව සතු නොවිය[71].

2008 මාර්තු 25 දින ඒ සි එෆ් සිද්ධිය පිළිබඳව කොමිසන් සභාව ඉදිරියේ පෙනි සිටි සාක්ෂිකරුවකු;

*මම සාක්ෂි දෙන්න ඕනෑ මෙන්න විධියටයි කියලා මගෙන් ඉල්ලා හිටින ලියුම් මට ලැබී තියෙනවා. මම කොමිසන් ඉදිරියේ සාක්ෂි දෙන කොට මේ මේ දේවල් කිව්වොත් මගේ මුළු පවුල ම ශුද්ධ කරනවා කියලත් මට ලියුම් ආවා. මට මේ තර්ජන තියෙන බව පොලිසියේ ලොකු මහත්වරුන් පිළි ගන්නේ නැහ මම මේ දේවල් ඒ ගොල්ලන්ට දැන්වුයේ නැති නිසා කියනවා. මම ආයෙත් ඒ ගොල්ලන් ගෙන් ඉල්ලා හිටින්න කැමතියි මගෙන් අහන්න මම ඒ ගැන කියන්නම් කියලා[72] යනුවෙන් කියා සිටියේය.*

මෙම සාක්ෂිකරු මුතූර් හි මේ සිද්ධිය පිළිබඳ දන්නා අනෙකුත් සාක්ෂිකරුවන් ගේ නම් කොමිසමට ලබා දිම ප්‍රතික්ෂේප කළේය.

*දැනට වුනත් මම මෙතනට ආව හින්ද ශ්‍රී ලංකාවේ ඉන්ඩ බැරි තරමට මට ප්‍රශ්න තියෙනවා. මම නම් ගම් කියන්න ගත්තොත්, මට විතරක් නෙවෙයි මගේ පවුලටයි, ඉස්සරාට එන්න ඉන්න පරම්පරා ගනනාවකටත් ශ්‍රී ලංකාවේ ඉන්න බැරි තත්වයක් එනවා*[73]

අප්‍රියෙල් මාසයේ දි මෙම සාක්ෂිකරු තමා සාක්ෂි දිමට පෙර දින තමාට තවත් මරණිය තර්ජනයක් ලැබුන බවත් ඒ නිසා තමාට වඩා හොඳ ආරක්ෂාවක් අවශ්‍ය බවත් කියා සිටියේය[74].

කොමිසන් සභාව ඉදිරියට කැඳවනු ලැබූ තවත් සාක්ෂිකරුවෙකු කොමිසන් සභා කාර්යාලය තුල දිම තමන් ගේ සම්පුර්ණ කථාව කොමිසමට නොකියන මෙන් පොලිසිය විසින් අණ කළ බව කියා සිටියේය. කොමිසන්

---

69 දේවානිසන් නේසයියා ඉල්ලා අස්විමේ ලිපිය

70 "රිපෝටට් බෙල්මිස් ෆෝසස් ඉන් ශ්‍රී ලංකා එයිඩ් මැසකර්”1 අප්‍රියෙල් 2008 රොයිටර් පුවත් සේවය

71 ඒ සි එෆ් සමුහ ඝාතනය පිළිබඳ වැදගත් සාක්ෂිකරුවකු කොමිසම ඉදිරියේ පෙනි සිටි පසු තමාට තර්ජන එල්ල වන බවට නිල පැමිණිල්ලක් කරන ලදි. 'විට්නස් ත්‍රිර්ටන් බයි ඕපිෂියල්ස්' බිබිසි සිංහල 5 මැයි 2008

72 ' ඒ සි එෆ් ඉන්ක්‍යයරි; විට්නස් අන්ඩර් ත්‍රෙට්, ඩේලි මිරර් 26 මාර්තු 2008

73 ඉහත සටහන

74 'ඒ සි ඒෆ් විභාගයඃ විට්නස් ත්‍රිටන්ඩ් ද නයිට් බිෆෝ ශි ටෙස්ටිපෆඩ්' ඩෙලි මිරර් 25 අප්‍රියෙල් 2008

සභාවේ කටයුතු නිරීක්ෂණය කිරිමට අවසර ලබා සිටි සිවිල් සමාජ සංවිධාන කොමිසන් සභාවේ සභාපතිවරයාට යොමු කළ අවසාන සන්දේශයෙන් කොමිසන් සභා සැසිවාර පවත්වා ගෙන ගිය ගොඩනැගිල්ල තුල දිමත් සාක්ෂිකරුවන් ට එල්ල වු තර්ජන පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කළේය.

*'මෙම සිද්ධින් අතරින් වඩාත් ම ඇග කිලි පොලා යන සිද්ධිය වුයේ අංක 2 සිද්ධිය ලෙසට නම් කොට තිබු මුතුර් හි ඒ සි එෆ් සිද්ධිය සම්බන්ධ සාක්ෂිකරුවන් කොමිසන් සභාව ඉදිරියේ පෙනි සිටිමට පෙර අවස්ථා දෙකක දි ඔවුන් බිය ගැන්වු ආකාරයයි. පළමුව ශ්‍රී ලංකා යුද්ධ හමුදව වෙනුවෙන් පෙනි සිටි පෞද්ගලික මට්ටමින් පෙනි සිටි නිතිඥවරයා සාක්ෂිකරු ගේ පුර්ව අනුදැනුමකින් හෝ අවසරයකින් තොරව ජංගම දුර කථනයකින් ඔහු ගේ ඡායාරූප ගත්තේය. දෙවන අවස්ථාව වුයේ තමා සාක්ෂි දෙමින් සිටිය දි කොමිසන් සභාව තේ විවේකය සඳහා විරාමයක් ගත් විට තමා නොහදුනන පුද්ගලයින් දෙදෙනකු තමා වෙත පැමිණ ඒ වන විට කොමිසන් සභ සැසිවාරය තුළ තමා ප්‍රකාශ කරමින් සිටි කරුණු පිළිබඳ ව මහත් සැඩ පරුෂ ලෙසට ප්‍රශ්න කළ බව කොමිසමට වාර්තා කළේය. මේ පිළිබඳව කොමිසන් සභාව විමසු කළ එම සිද්ධිය වන අවස්ථාවේ දි කොමිසන් සභාවේ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිමේ නිලධාරින් ද එතන සිටි නමුත් ඔවුහු ඊට මැදිහත් විම නොවි සිටියා පමණක් නොව සාක්ෂිකරු ආරක්ෂා කිරිමට ඉදිරිපත් නොවු බව ද හෙලිදරව් විය. මෙම නාඳුනන පුද්ගලයින් අන් කවරෙක් වත් නොව කොමිසන් සභාවේ පර්යේෂණ නිලධාරින වන අතර ඔවුහු සිය අංශ අනුදැනුමින් තොර ක්‍රියා කොට ඇති බව ද අනාරණය විය[75].*

ඉහත සඳහන් ආකාරයේ සිද්ධින් දැඩි අවදනමක් සහිත සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිම සම්බන්ධයෙන් කොමිසන් සභාව ක්‍රියාපටිපාටියේ බරපතළ අඩුපාඩු කම් ( තේ විවේකයේ දි නිතිඥයින්ට, මාධ්‍ය හා මහජනතාවට සාක්ෂිකරුවන් අතර නිදහසේ ගැවසිමට ඉඩ දිම ) ඉස්මතු කරන අතර මෙබඳු සිද්ධින් ජන මාධ්‍ය මගින් වාර්තා විමත් සමගම අනෙකුත් සාක්ෂිකරුවන් ට නිදහසේ හා විවෘතව කොමිසන් සභාව ඉදිරියේ සාක්ෂි දිමට තිබෙන ඉඩකඩ ද අහුරා දැම්මේය.

2007 ජුනි 11 දින අන්තර් ජාතික ස්වාධින විද්වත් කන්ඩායම (අයි අයි ජී ඊ පි) සිය ප්‍රථම ප්‍රසිද්ධ ප්‍රකාශයේ දි; *ශ්‍රී ලංකවේ වින්දිතයින් හා සාක්ෂිකරුවන් ගේ ආරක්ෂාව පිණිස ප්‍රමාණවත් නිති නොමැති කම අප ගේ දැඩි අවධානයට ගන්නේමු. කොමිසන් සභාවේ මැන්ඩේටය වන බරපතළ මානව හිමිකම් උල්ලංඝණය කිරිම් නිසි පරිදි විභාග කිරිමට නම් සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිම අතිශයින් වැදගත් බව අප ගේ මතයයි. මිට අදළ නිති රිති ජාත්‍යයන්තර ව්‍යවහාරයන් ට හා ප්‍රමිතින් ට අනුකුලව හැකි ඉක්මනින් සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිම පිණිස පනවා ගත යුතු වෙයි. කොමිසන් සභාවට වින්දිතයින් හා සාක්ෂිකරවන් ආරක්ෂා කරන යාන්ත්‍රණයක් භාවිතයේ නොපවතියි. අදළ නිතිරිති මාලාවක්, බලපෑමක් සහිත වැඩ පිළිවෙළක් හෝ ක්‍රියාත්මක වන ආරක්ෂණ අංශයකුත් රහිත මෙම කොමිසන් සභාව මහජනයාට ඉදිරියට පැමිණ සාක්ෂි දෙන ලෙස ආරාධනය කරන්නේ කෙසේදැයි අපට නම් අවබෝධ කර ගත නොහැකිය[76].*

ඔවුහු ඊට පසුව නිකුත් කළ ප්‍රසිධ ප්‍රකාශයන් හි දිත් මෙම කාරණය පිළිබඳව දිගින් දිගටම අවධානය යොමු කළ අතර සිය අවසාන වාර්තාවේ දිත් මෙම කාරණය පිළිබඳව සඳහන් කරන්නට අමතක නොකළේය[77].

සිය පිටව යාමට පෙර අයි අයි ජී ඊ පි කොමිසන් සභාවේ වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිමේ අංශය පිළිබඳ මෙසේ නිගමනය කළේය.

---

[75] පර්යේෂණ කොමිසන් සභාවේ සභාපති වරයා වෙත සිවිල් සමාජ නියෝජිතයින් ඉදිරිපත් කළ ලිපිය

[76] ඉන්ටර්නැෂනල් ඉන්ඩිපෙන්ඩන්ට් ගෲප් ඔෆ් එහමිනියන්ට් පර්සන්ස් පබ්ලික් එස්ටේට්මන්ට් 11 ජුනි 2007 www.iigep.org/prelease/estatement.pdfpp1-2

[77] ඉන්ටර්නැෂනල් ඉන්ඩිපෙන්ඩන්ට් ගෲප් ඔෆ් එහමිනියන්ට් පර්සන්ස් පබ්ලික් එස්ටේට්මන්ට් 15 අප්‍රියෙල් 2008 www.iigep.org/prelease/estatement.pdfpp8-10

නිසි නීතියානුකූල පදනමකින් තොර වුවා වූ ද, අංග සම්පූර්ණ පුහුණුවකින් තොර කාර්ය මන්ඩලයකින් ද සමන්විතවූ ද කොමිසන් සභාව ඉදිරියේ පෙනී සිටීම නිසා ම පළි ගැනීමට ලක් විය ගොදුරු විය හැකි ප්‍රමාණවත් ආරක්ෂාවක් ලැබිය යුතු වූ තැනැත්තන් ආරක්ෂා කිරීම පිණිස අරමුදලකුත් රහිතව මෙම අංශය පැවතින. කොමිසන් සභාව වින්දිතයින් සහ ඔවුන් ගේ පවුල් වල උදවිය බිය ගැන්වීම් වලින් ආරක්ෂා කිරීමට හෝ ඔවුනට නීතිඥයෙකු මාර්ගයෙන් කොමිසම ඉදිරියේ නියෝජනයක් ලබා දීමට හෝ නොහැකි විය. එසේම ආරක්ෂණ වැඩ පිළිවෙළවල් කොමිසන් සභාවේ කාල සීමාවෙන් ඔබ්බට දිගු කිරීමක් ද නොවිය. මෙම තත්වය යටතේ වින්දිතයින් හෝ සාක්ෂිකරුවන් කොමිසන් සභාව ඉදිරියට නොපැමිණීම මහත් පුදුමවට කරුනක් නොවිය. වැදගත් සාක්ෂිකරුවන්ට සිය ජීවිත බේරා ගැනීම පිණිස විදේශ රටවලට පලා යන්නට සිදුවිය. ඒ හා සමානව ම "අනතුරු හඟවන්නන් " ලෙස භූමිකාවක් ඉටු කරමින්, නිලධාරීන් රාජකාරිය නොසලකා හැරීම පිළිබඳව සාක්ෂි දීමට සූදනම් රාජ්‍ය නිලධාරීන් ආරක්ෂා කිරීමක් ද නොවිය[78].

කොමිසන් සභාව සාක්ෂිකරුවන් අවදානමකට හා සාක්ෂි අවුල් කිරීමකට උපකාර විය හැකි භාවිතයන් ගණනාවක් කොමිසන් සභාව ක්‍රියාත්මක කරන ලද්දේය. ඒ අතර;

- සාක්ෂිකරුවන් හා මහජනතාව ආරක්ෂා කිරීමට කොමිසන් සභාවට ධාරිතාවයක් ඇතැයි යන වැරදි අර්ථ කථනයක පිහිටා සාක්ෂිකරුවන්ට හා මහජනයාට කොමිසන් සභාව ඉදිරියේ සාක්ෂි දීමට ඉදිරිපත් වන ලෙසට ප්‍රසිධ දැන්වීම් මගින් ආරාධනය කළ අතර එමගින් ( මේ වන විට කොමිසන් සභාවේ වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ට සාහය වීමේ හා ආරක්ෂා කිරීමේ අංශය පිහිටුවා නොතිබුනි) කොමිසන් සභාවට ඔවුන් ආරක්ෂා කිරීමට ධාරිතාවයක් ඇතැයි හැඟීමක් දෙන ලදි[79].
- වින්දිතයින් හා ඔවුන් ගේ පවුල් වල සාමාජිකයින්ට ඇති තර්ජන ප්‍රමාණවත්ව තක්සේරු කිරීමට අපොහොසත් වීම
- කොමිසන් සභාවේ පර්යේෂක ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ පොලිස් නිලධාරියෙකු පත් කොට තිබූ අතර නමුත් ඇත්ත වශයෙන් ම කොමිසන් සභාවේ විෂය පථයට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවත් ඇතුලත් ව තිබූ අතර සාක්ෂිකරුවන්ට තර්ජනය කිරීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ද චෝදනා එල්ල කෙරින.
- ජනාධිපති විසින් පිහිටුවන ලද සාම ලේකම් කාර්යාංශයේ නීති අංශයේ අධ්‍යක්ෂිකාට ආන්ඩුවේහමුදවන්ට එරෙහිව පැමිණිල්ලක් තිබිය දීත් කොමිසමේ සාක්ෂිකරුවෙකු මුණ ගැසීමට ඉඩ දීම
- ආක්‍රමණශීලි ප්‍රශ්න කිරීම් නිසා භීතියට හා මානසික කම්පනයට පත් වූ සාක්ෂිකරුවන් සම්බන්ධයෙන් පෙනී සිටීමට අපොහොසත් වීම

සිවිල් සමාජ සංවිධාන කොමිසන් සභාවේ සැසිවාර නිරීක්ෂණය සඳහා ඉදිරිපත් වීමට පෙළඹවූ ප්‍රධාන සාධකය වූයේ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම වූ අතර නමුත් පසුව ඔවුහු ඇත්ත වශයෙන් ම නිරීක්ෂණය කළේ ශ්‍රී ලංකා යුද්ධ හමුදව වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා සහ විශේෂ කාර්ය බලකාය විසින් සාක්ෂිකරුවන් ට අනුමත කළ නොහැකි පරිදි හිරිහැර කිරීම හා බාධා කිරීම"යි. සිවිල් සමාජ සංවිධාන කොමිසමේ සැසිවාර නිරීක්ෂණය සඳහා ඉදිරිපත් වන්නේත් කොමිසන් සභාව 2008 මුල් කාර්තුවේ දී

[78] ඉන්ටර්නැෂනල් ඉන්ඩිපෙන්ඩන්ට් ගෘප් ඔෆ් එහමිනියන්ට් පර්සන්ස් පබ්ලික් එස්ටේට්මන්ට් 11 ජුනි 2007 www.iigep.org/prelease/estatement.pdfpp1-2

[79] ඉන්වයිටින් රෙපරසෙන්ටේසනස්; නොටිස් ටු ද පබ්ලික් ප්‍රසිඩෙන්ටියල් කොමිසන් ඔෆ් ඉන්ක්‍යුයිරි ටු ඉන්වෙස්ටිගේට් ඇන්ඩ් ඉන්ක්‍යුයර් සිරියස් වයලේෂන්ස් ඔෆ් හියුමන් රයිට්ස් www.pchrv.gov.lk/news/inviting.html

ප්‍රසිද්ධ රැස්වීම් හා ශ්‍රී ලංකාවෙන් පිට වි සිටින සාක්ෂිකරුවන් සඳහා වීඩියෝ තාක්ෂණය භාවිතා කරන්නට තිරණය කිරිම සමගයි.

බොහෝ නිරීක්ෂකයින් සඳහන් කළ පරිදි පෞද්ගලික මට්ටමින් ශ්‍රී ලංකා යුද්ධ හමුදව වෙනුවෙන් පෙනි සිටි ගොමින් දයාසිරි සහ විශෙෂ කාර්ය බලකාය වෙනුවෙන් පෙනි සිටි එස් එල් ගුණසේකරත් යන දෙපල සාක්ෂිකරුවන් දැඩි පිඩනයකට ගොදුරුකරමින් ප්‍රශ්න කළ අතර සාක්ෂිකරුවන් දැඩි කලකිරිමකට පත්වු බව කාටත් පෙනුනි. මෙම තත්වය ඩේලි මිරර් පත්‍රයට ලියු ලිපියකින් පූර්ණිමා විරසේකර මේසේ විස්තර කළාය.

*පි.යෝගරාජා ( ත්‍රිමලයේ දි ඝාතනය වු තරුණයෙකු ගේ පියෙක්) දැඩි කම්පනයකට පත් ව සිටි බව පිළිතුරු දිමෙහි දි ඔළුවෙහි අත ගසා ගන්නට දරන ලද උත්සාහයෙන්නුත් පත්තරයකින් පවන් සලා ගනිමින් සිටි ආකාරයෙන්නුත් පැහැදිලි විය. තත්වට මෙසේ තිබියදි විශේෂ කාර්ය බලකාය වෙනුවෙන් පෙනි සිටි නිතිඥවරයා ප්‍රශ්න වැලක් ඔහුට ඉදිරිපත් කරමින් ඔහු ගේ විශ්වසනීයත්වය ට පහර ගැසීය. සාක්ෂිකරු තමා පාසැල් ගියේ දෙක වසර දක්වා බව දිගින් දිගටම කියා සිටිය දිත් ත්‍රිමලය බෞද්ධ ප්‍රතිමාවක් ඉදි කිරිම සම්බන්ධ අධිකරණ තින්දුව නොදැන සිටිම ගැන ඔහුව හැල්ලුවට ලක් කරන ලදී*[80].

අවසානයේ දි අයි අයි ජී ඊ පි හි නිති උපදේශක ඩි අර්බන් මැදිහත් විය.

සාක්ෂිකරුවෙකු ගේ විශ්වසනීයත්වයට පහර ගැසිමට නිතිඥවරයෙකු උත්සාහ දැරිම වලංගු වුවත් එම පහර ගැසිම සාධාරණ එකක් විය යුතුය. අසන ප්‍රශ්න වල යම් සම්බන්ධයක් තිබිය යුතුය. මෙම සාක්ෂිකරු සාක්ෂි දිමට ඉදිරිපත් වුවත් ඔහු එසේ කිරිමට බැදි නැත. ඒ නිසා ඔහුට ගරුත්වයෙන් සැලකිය යුතු අතර කාරුණිකව හා දයානුකම්පාවෙන් දැක්විය යුතුය. මන්ද මෙම සිද්ධි වලදි ඔහුට සිය දරු දෙදෙනාම අහිමි වු බැවිනි. මෙම සැසිවාර රජය සඳහා වෙළඳ වැඩසටහනක් නොවන අතරම ත්‍රිමලයේ බෞදධ ප්‍රතිමාවක් නිතියානුකුලව ඉදි කර ඇත්තේ ද යන්න මෙම පරීක්ෂණයට අදළ නොවේ. එහෙත් විශේෂ කාර්ය බලකාය වෙනුවෙන් පෙනි සිටින නිතිඥවරයා අදළ නොවන මේ සියල්ල ම යෝගරාජා ගේ සාක්ෂියේ විශ්වසනීයත්වය පළුදු කිරිමට තෝරා ගනියි[81].

කොමිසන් සභා සැසි වාර නිරීක්ෂණය කළ ඇමෙරිකානු නිතිඥවරයෙක් 2008 මැයි මාසයේ එහි පැවති තර්ජන පිළිබඳ වාතාවරණය පිළිබඳ මේසේ කියා සිටියේය.

*සිවිල් සමාජය ඇතුල් විමෙන් පසු, සිය සාක්ෂි මගින් රාජ්‍ය ආරක්‍ෂක හමුද දෝෂ දර්ශනයට ලක් කරවු සාක්ෂිකරුවන් හට, ශ්‍රී ලංකා යුද්ධ හමුදව හා විශේෂ කාර්ය බලකාය නියෝජනය කළ නිතිඥයින් විසින් ප්‍රසිද්ධියේ එදිරිවාදිකම් දැක්විමෙන් යම්කිසි තරමකට වැළැකි සිටියද, උපායශිලීව තර්ජනය කිරිම පැහැදිලිවම දක්නට ලැබුනි. මෙම නිතිඥවරු සිය ප්‍රශ්න කිරිම් ආරම්භයේ දි අනිවාර්යෙන්ම නොකඩවාම ප්‍රදර්ශනය කළ කාරණයක් නම් සාක්ෂිකරුවන් ගේ රැකියාව,පෞද්ගලික ලිපිනය, පවුලේ කිට්ටුම සාමාජිකයින් ගේ හා ඥතින් ගේ නම් සහ පදිංචි ස්ථාන පිළිබඳ තොරතුරු තමන් සතු බවත් ඒ නිසා ප්‍රශ්න අසනු ලබන්නේ එම තොරතුරු සනාථ කර ගැනිමට බව හැගවිමයි. එක් අවස්ථාවක දි නිතිඥවරයා අස්වාභාවික හැසිරිමක් ප්‍රදර්ශනය කරමින්, සාක්ෂිකරු ඉදිරියේ දිම හමුද බුද්ධි අංශයේ නිලධාරියෙකු මගින් සිල් තබන ලද විඩියෝ කැසට් පටයක් තමා අතට පත් කරන්නට සලස්වා, එම විඩියෝ පටය සාක්ෂිකරු දෙසට වනමින් වත්මන් විභාගයට අදළව බලන ලද ඔත්තු පිළිබඳ තොරතුරු එහි අඩංගු බවට ඉගියක් දෙමින්, එම නිසා සිය සාක්ෂියේ දි ප්‍රවේශම් විය යුතුයැයි කියා සිටියේය.*

*සිවිල් සමාජය නියෝජනය කරමින් එහි සිටි නිතිඥවරු වක්‍රව තර්ජනය කිරිමක් ලෙස හදුන්වා විරෝධය පළ කළහ. මෙම කාරණයම කොමිසන් සභාවෙන් පරිබාහිරව සාක්ෂිකරුවන් ට හා ඔවුන් ගේ පවුල්*

---

80 ක්‍රයින් ෆෝ ජස්ටිස් පූර්ණිමා විරසේකර ඩේලි මිරර් 22 මාර්තු 2008

81 ඉහත සඳහන් ලිපිය

*සාමාජිකයින් හට මුහුණ දිමට සිදුවිය හැකි අනතුර පෙන්වයි. මේ නිසා සාක්ෂිකරුවන් ගෙන් කිහිප දෙනෙක්ම තමන් ගේ සාක්ෂි විභාග නොකරන මෙන් පරීක්ෂණ කොමිසන් සභාවට බල කිරිම පුදුමයකට කාරණයක් නොවේ. අවසනාවකට මෙන් පරීක්ෂණ කොමිසන් සභාවට ආරක්ෂාව සැපයිම පිණිස ධාරිතාවයක් නොතිබුන අතර කළ හැකිව තිබු එකම කාර්ය වුයේ සාක්ෂිකරුවන් ගේ නම් හෙලි නොකරන මෙන් ජන මාධ්‍යයන් ගෙන් ඉල්ලා සිටිමයි. අනතුරට ගොදුරු විය හැකි සාක්ෂිකරුවන් ට එක්කෝ යුක්තිය පරිත්‍යාග කිරිම හෝ අන් අය රැක ගැනිම පිණිස තම ජිවිත පුජා කිරිම යන භායනක විකල්ප දෙකෙන් එකක් තෝරා ගැනිමට සිදු විය*[82].

- සාක්ෂිකරුවන් ට මානුෂික ලෙස හා ගරුත්වයෙන් සැලකිමට අසමත් විම

නිරික්ෂකයන් සඳහන් කළ එක් නිදර්ශනයක් නම් එක් අවස්ථාවක දි සාක්ෂිකරුවෙක් සාක්ෂි කුඩුවේ හඩා වැලෙපෙමින් සිටිය දිම කොමසාරිස් වරු තේ විවේකය සඳහා පෞද්ගලික කාමර වෙත ගිය බවයි,

- සාක්ෂිකරුවන් ගේ ප්‍රකාශ නිවරදිව පරිවර්තනය කරන ලද බවට සහතිකයක් නොවිම

ප්‍රසිද්ධ සැසිවාරයන් හි ලිඛිත හා වාචික සාක්ෂි පරිවර්තනයන් ගේ වැරදි හෝ යම් යම් තොරතුරු මග හැර පරිවර්තනය වි තිබුන බව හෙළිදරව් විම පරීක්ෂණ කටයුතු වලට බාධාවක් ලෙසට සලකන ලදි[83].

- එකම සිද්ධි මාලාවක් සම්බන්ධයෙන් පරීක්ෂණ දෙකක් පවත්වා ගෙන යාමෙන් ස්වාධින පරීක්ෂණ කොමිසන් සභා සහ රාජ්‍ය විසින් කරනු ලබන පරීක්ෂණ අතර වෙනස බොඳ වි ගියේය.

මෙය වින්දිතයින් සහ අනෙකුත් විභවයක් ඇති සාක්ෂිකරුවන් ඉදිරියට ඒම අධෛර්ය කෙරෙනු අතර ඇතැම් සාක්ෂිකරුවන් නොමග යාම හෝ ඔවුන් ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරිමකට ඉඩ තිබුණි. සාක්ෂි විභාගයේ යම් කිසි අවස්ථාවකදි සාක්ෂිකරු තර්ජනයන් ගෙන් හෝ ප්‍රචන්ඩත්වයෙන් ආරක්ෂා කිරිම සහ සාධාරණ නඩු විභාගයකට තිබෙන අයිතිය වැනි කාරණා අහිමි කිරිමෙන් ද සාක්ෂිකරුවන් ඉදිරිපත් විම වැලැක්විත.

2007 සැප්තැම්බර් මස දි සිය පරීක්ෂණ අංශයේ සාමාජිකයින් යොදා ගනිමින් ( පොලිස් සේවයේ සථිර පත්විම් සහිත මෙම නිලධාරින් කොමිසන් සභාවේ රාජකාරි සඳහා නිදහස් කර සිටියහ) කොමිසන් සභාව ඉදිරියේ මේ වන විට සාක්ෂි දි තිබු සියළුම සාක්ෂිකරුවන් ගෙන් සහ ඉදිරියේ දි සාක්ෂි දිමට බලාපොරොත්තු වන සාක්ෂිකරුවන් ගෙන් ද නැවත ( කොමසාරිසවරුන් අභියස නොවේ) ප්‍රකාශ සටහන් කර ගැනිම ආරම්භ කරන ලදි. මෙමගින් අරමුණු දෙකක් සපුරා ගැනිමට අපේක්ෂා කෙරින.

පළමු වැන්න කොමිසන් සභාව වෙත නව තොරතුරු සපයා ගැනිම වු අතර දෙවැන්න සපරාධි අපරාධ පිළිබඳ අනාගත පැවරිමකට සුදනම් ( මෙය කොමිසන් සභාවේ විෂය පථය ට ඇතලත් නොවිය.) විමයි. මෙම පියවර ගැනිමට හේතු වුයේ කොමිසන් සභාව විසින් ම කරන ලද පරීක්ෂණයකින් තොරව කොමිස්න් සභාව අධිකරණය විසින් නොපිළි ගනු ඇත. සමස්තයක් වශයෙන් ගත් කළ පරීක්ෂණ කොමිසන් සභා විමර්ශන අංශයට, රාජ්‍ය සේවයෙහි යෙදි සිටින අතරම කොමිසන් සභාවේ ස්වාධින පරීක්ෂකවරයකු ලෙස ද ද්විත්ව භුමිකාවක් රඟ පෑමට සිදු විය.

---

82 විටිනස් ඉන්ටෙමිඩෙෂන් ඇඩම් නොර්ඩ් www.advocacynet.org/blogs/index.php/2008/05/04/witness.intimidation?blog=104

83 "පරිවර්තන තුල අතරමං විම" පරිවර්තනයන් හි තිබෙන අසිරුතා නිසා ජාත්‍යයන්තර ස්වාධින විද්වත් කන්ඩායමෙහි විමර්ශන පවා ඇණ හිටින තත්වයක් උද විය. අයි අයි ජි ඊ පි කන්ඩායමේ නිති උපදේශක ඩි ඌබන් සඳහන් කරන පරිදි ' ඇතැම් භාෂණ පරිවර්තනයන් කොපමණ පරස්පර විරෝධි වි ද යත් ඉංග්‍රිසි පරිවර්තන සමහර විට සම්පුර්ණයෙන් ම ප්‍රතිවිරුද්ධාර්ථියට පරිවර්තනය කරන ලදි.එක් අවස්ථාවකදි පි.යෝගරාජා විසින් " මම ලංකාවෙන් පිට මං නොවුනා නම් මට මේ සාක්ෂිය දිමට නොහැකිය" යන ප්‍රකාශය තුන් වරක් ම අවධාරණය කළ නමුත් පරිවර්කනය නොකරන ලදි.පරීක්ෂණ කොමිසමේ සාමාජිකා මනෝරි මුත්තෙට්ටුවේගම පරිවර්තකට සිය උච්චස්වර ය පාවිච්චි නොකර, මෘදු හඩින් පරිවර්තනය කරන මෙන් ඉල්ලා සිටින ලදි. මේ අතර විශ්‍රාම ලත් පාර්ලිමේන්තු භාෂා පරිවර්තක තමා යක්ෂයාත් ගැඹුරු මුහුදත් අතර හිර වි සිටින්නේ යැයි ප්‍රකාශ කළේය. ක්‍රයින් ෆෝ ජස්ටිස් ඩේලි මිරර් 22 මාර්තු 2008

මෙම ක්‍රමයෙහි, ක්‍රියා පටිපාටිමය දුර්වලතා රාශියක් තිබුනි. ඉතාමත් වැදගත් කාරණය නම්, කොමිසන් සභා පරීක්ෂණ අංශයෙහි පරීක්ෂකයින් ගේ ස්වාධීනත්වය දැඩිව සීමා වූ අතර එපමණටම සාක්ෂිකරුවන් ගෙන් බහුතරයක් තර්ජනයන් ට ලක් වීම හෝ සාක්ෂිකරුවන්ට හිරිහැර කිරීමට තිබෙන ඉඩකඩ ඉහළ යාමක් පෙන්නුම් කළේ, විභාගයට ගෙන තිබූ සිද්ධීන් ගෙන් බොහොමයක දීම පොලිසියට හා රජයේ ආරක්ෂක හමුදවන් ට චෝදනා එල්ල වී තිබීමත්, දැනටමත් සාක්ෂිකරුවන්ට එරෙහිව තර්ජනය කිරීම් චෝදනා කිහිපයක් ම තිබෙන නිසාත්ය.

*සිදුවුයේ කුමක් දැයි සොයා බැලීමේ අරමුණ සාධනය කර ගැනීමට නම්, කොමිසන් සභාවට විමර්ශනාත්මක කාර්යන් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වෙයි. පරීක්ෂණ කොමිසන් සභා, පොලිස් පරීක්ෂණ බාර ගැනීමට තරම් සුදුසු යාන්ත්‍රණයක් නොවන අතර මීට පෙර අවස්ථාවලදී පෙනී ගිය ආකාරයට එය අඩුපාඩු කම් සහිත බලපෑමක් රහිත ක්‍රමයක් විය. අයි අයි ජී ඊ පි අවධාරණය කළ පරිදි කොමිසන් සභාවට ඇත්ත වශයෙන් ම මහත් ආයාසයක් දරන ලද්දේ අපරාධ විසදීම පිණිස පොලිසියට ආදේශකයක් බවට පත් වීමටයි. කොමිසන් සභාව ඉදිරියේ ඇති සිද්ධීන් 16 න් සෑම එකක් ම සවිස්තරාත්තමක ලෙස විමර්ශනය සඳහා අවශ්‍ය විශේෂඥභාවය, අරමුදල් හෝ මානව සම්පත් කොමිසන් සභාව සතු නොවිය[84].*

**වීඩියෝ සම්මන්ත්‍රණ පිළිබඳ ගැටළු**

කොමිසන් සභාව සිය ප්‍රසිද්ධ විභාගයන් හි දි විශේෂයෙන් ම තර්ජනයට ලක් වී සිටින සාක්ෂිකරුවන් කරා ළඟාවීමටත්, විනිවිද භාවය ප්‍රවර්ධනය කිරීම සහ කොමිසන් සභාවේ සැසිවාර පිළිබඳව මහජනයා ගේ සහ ජන මාධ්‍ය තුල උනන්දුව අවුස්සා ලීමටත් දුරස්ථ වීඩියෝ සම්මන්ත්‍රණ ශිල්ප ක්‍රමය පාවිච්චි කිරීම හේතුවක් විය. 2008 අප්‍රියෙල් මස අවසානය වන විට, ප්‍රසිද්ධ සැසි වාර 20ක් පවත්වා තිබුන අතර ඊට ත්‍රිමලේ පංච ශිෂ්‍ය ඝාතනයට සම්බන්ධ විදෙස් ගත ව සිටින සාක්ෂිකරුවන් ගේ සාක්ෂි ලබා ගැනීමත්, මුතූර් හි ඒ සි ඒෆ් සිද්ධිය පිළිබඳව පැවැත්වූ සැසිවාර පහත් ඇතුලත් විය.

කොමිසන් සභාව විෂයෙහි මහජන උනන්දුව ඉහළ නැංවූ එක් අවස්ථාවක් වුයේ විශේෂයෙන් ම හැගීම් බරව නමුත් චිත්තියට එරෙහිව ත්‍රිමල සිද්ධියේ දි වින්දිත ශිෂ්‍යයෙකු ගේ පියා වූ වෛද්‍ය මනෝහරන් කළ ප්‍රබල ප්‍රකාශයයි. මේ අවස්ථාව වන විට ඔහු ජිවත් ව සිටින සිය පවුලේ සාමාජිකයින් ද සමග රටින් පලා ගොස් විදේස් ගතව ජිවත් වෙයි. ශ්‍රී ලංකාවේ රූපවාහිනී නාලිකාවන් හි ප්‍රවෘත්ති වැඩ සටහන් හි වෛද්‍ය මනෝහරන් ගේ හැගීම් බර කම්පනයත් ඔහු විසින් නගන ලද චෝදනාත් ප්‍රචාරය කෙරින. මේ නිසා මෙම සිද්ධීන් පිළිබඳව මහජන අවධානය ආකර්ශනය වූ අතර වින්දිතයින් කෙරෙහි පෙරටත් වඩා වින්දිතයින් කෙරෙහි සානුකම්පිත බවක් ඇති කිරීමට සමත් විය.

2008 මාර්තු 03 දින එක්සත් ජාතින් ගේ මානව හිමිකම් කවුන්සිලයේ ඉහළ මට්ටමේ සැසි වාරයක දි ශ්‍රී ලංකාවේ ආපද කළමනාකරණ සහ මානව හිමිකම් අමාත්‍ය මහින්ද සමරසිංහ දඩුවමින් නිදහස් කිරීමේ පිළිවෙත සම්බන්ධයෙන් එල්ල වන චෝදනාවන් ගෙන් ඔහු ගේ රජය ආරක්ෂා කිරීමට පරීක්ෂණ කොමිසන් සභාවේ සැසිවාර විශේෂයෙන් ම වීඩියෝ සම්මන්ත්‍රණ ගෙන හැර දක්වන ලදි.

පරීක්ෂණ කොමිසන් සභාවේ සවිස්තරාත්මක පරීක්ෂණ හා විමර්ශනයන් හි සතුටුදයක ප්‍රගතියක් ජාත්‍යයන්තර ස්වාධීන විද්වත් කන්ඩායමේ නිරීක්ෂණය යටතේ සිදුවෙයි. අද මේ අවස්ථාවේ දි, ඇක්ෂන්

[84] අයි අයි ජී ඊ පි ප්‍රසිධ ප්‍රකාශය 14 අප්‍රියෙල් 2008 ref: iigep-Ñ-006-2008

කොන්ට්‍රා ලා ෆාම් හි ජීවිත අහිමි වු ආධාර සේවකයින් 17 දෙනා පිළිබඳව ප්‍රසිධ සැසි වාර ආරම්භ කොට තිබේ. විමර්ශනයන් අවසාන විමට ආසන්න අතර කොමිසන් සභාව සිය වැඩකටයුතු අවසාන කළ විට යුක්තිය පිළිබඳ මුල ධර්මය මත පිහිටා ලැබෙන ප්‍රතිඵලයක් බලාපොරොත්තු වෙමු. ත්‍රිමලේ පංච ශිෂ්‍ය ඝාතනය පිළිබඳ ප්‍රසිද්ධ සැසි වාර ජනවාරි මස ආරම්භ විය. විදේශ ගතව සිටින සාක්ෂිකරුවන් ගේ සාක්ෂි විඩියෝ තාක්ෂණය භාවිතා කොට ලබා ගැනිමට විධිවිධාන සලසා ඇත්තේමු. නැගෙනහිර පළාතේ පොතුවිල් හි මුස්ලිම් ජාතිකයින් 10 දෙනා ගේ ඝාතනය ඇතුළු කොමිසන් සභාවේ මැන්ඩේටයට ඇතුලත් අනෙකුත් සිද්ධින් පිළිබඳව පරීක්ෂණ සිදු වෙමින් පවති. ගරු සභාපතිතුමනි, ඇතැම් පාර්ශවයන් ගේ උවමනාවන් ට අනුව දඩුවමින් නිදහස් කිරිම පිළිබඳ රජයේ හමුදවන්ට එරෙහිව එල්ල කරන චෝදනා අපරිණත හා අනවබෝධයෙන් කරන්නකි[85].

එහෙත් ඊට මාස දෙකකට පසුව ජනාධිපති ලේකම් කාර්යාලය විඩියෝ තාක්ෂණය භාවිතා කරමින් පරීක්ෂණ කොමිසන් සභාව විසින් ප්‍රසිද්ධියේ සාක්ෂිකරුවන් ගෙන් ප්‍රකාශ ලබා ගැනිම අත්හිටුවන ලදි. මෙය පරීක්ෂණ කොමිසන් සභාවට එල්ල කරන ලද දැවැන්ත ප්‍රහාරයක් විය. කොමිසන් සභාවේ සාමාජිකයෙක් වශයෙන් සිට ඉල්ලා අස් වු දෙවානිසන් නේසයියා මාධ්‍ය සම්මුඛ පරීක්ෂණ යක දි මෙසේ කිවේය.

සැලසුම් කොට තිබු විඩියෝ සම්මන්ත්‍රණ ජනාධිපති ලේකම් කාර්යංශයේ නියෝගයක් පරිදි අවලංගු කිරිම විශාල පසුබෑමකි. ඒ සි එෆ් ආධාර සේවකයින් ගේ සිද්ධිය ඇතුළු, ත්‍රිමලේ ශිෂ්‍ය ඝාතනයත් හා අනෙකුත් සිද්ධින් සම්බන්ධයෙන් ද සතුටුදයක නිගමන කරා පැමිණිමට තිබු ඉඩකඩ මෙම නියෝගය නිසා දැඩි ලෙස පහළ වැටුන[86].

ජනාධිපති නියෝගය විසින් අත් හිටුවන ලද පරීක්ෂණ කොමිසන් සභාව විසින් විඩියෝ සම්මන්ත්‍රණ මගින් විදේශ ගත ව සිටින සාක්ෂිකරුවන් ගේ සාක්ෂි එකතු කිරිම අනාගත සාක්ෂිකරුවන් ආරක්‍ෂා කිරිමේ නිතියෙහි ද විදේශිය ආධාර ලබා ගෙන එබඳු පියවරයන් ගැනිම තහනම් කරන ප්‍රධාන වගන්තියක් ලෙසට අංඩගු වනු ඇත. ඉහත කි වගන්තිය සාක්ෂිකරුවන් ආරක්‍ෂා කිරිමේ පනත් කෙටුම්පතට ඇතුලත් කිරිම පරීක්ෂණ කොමිසන් සභාව ලබා ගත් ජයග්‍රහණ ආපසු හැරවිමක් ලෙසත් මෙම පුර්වාදර්ශය අනාගතයේ දි භාවිතා කිරිම වැළැක්විමක් ලෙසටත් ද ලෝ ඇන්ඩ් ට්‍රස්ට් සංවිධානය අර්ථ කථනය කරන ලදි.

*ඉහත කි වගන්තිය කෙටුම්පත් කරන ලද බව පෙනි යන්නේ වර්තමාන පරීක්ෂණ කොමිසන් සභාව විසින් 2008 අප්‍රියෙල් මස දි එඩිතරව භාවිතා කරන ලද විඩියෝ සම්මන්ත්‍රණ තාක්ෂණය අතිනයටත් බලපාන පරිද්දෙන් තහනම් කිරිම සඳහා බව පෙනි යයි[87].*

පරීක්ෂණ කොමිසන් සභාවේ විඩියෝ තාක්ෂණය සඳහා අරමුදල් සම්පාදනය හා පහසුකම් සපයන ලද්දේ නිතිපතිවරයා සහ විදේශ අමාත්‍යංශය දැනුවත් ව විදේශ රාජ්‍යයන් කිහිපයක් මගිනි. විඩියෝ සම්මන්ත්‍රණ දෙවන වටය 2008 ජුනි මාසයේ දි ආරම්භ කොට අඛන්ඩව සති දෙකක් පවත්වා ගෙන යාමට සැලසුම් කර තිබියදි එක් වරම නතර කරන ලදි. ජනාධිපති ලේකම් කාර්යංශය විසින් විඩියෝ සම්මන්ත්‍රන සම්බන්ධිකරණය කළ, ශ්‍රි ලංකා පරිපාලන අභ්‍යාස ආයතනයට ඒ සඳහා අරමුදල් සැපයිම නතර කළේය. ජනාධිපති ලේකම් කාර්යාංශය විසින් ඊට ඉදිරිපත් කරන ලද හේතුව වුයේ විඩියෝ සම්මන්ත්‍රණ මගින් ලබා ගත් සාක්ෂි පිළිබඳව නිතිමය තත්වය අපැහැදිලි බවයි. එම ලිපිය විසින්

---

85 අමාත්‍ය මහින්ද සමරසිංහ එක්සත් ජාතින් ගේ මානව හිමිකම් කවුන්සිලයේ ඉහළ පෙළේ හත් වන සැසි වාරය අමතයි. විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශය ශ්‍රි ලංකාව 2008 මාර්තු 5

86 නම්මුනි විජේදස- ලක්බිම නිවිස් දිනය නැත

87 ලෝ ඇන්ඩ් සොසයිටි ට්‍රස්ට් " පොෂිසන් පේපර්; ඔබ්ජේක්ෂන් ටු ද ඇසිස්ටන්ස් ඇන්ඩ් පොටෙක්ෂන් ටු වික්ටිම්ස් ඔෆ් ක්‍රයිම් ඇන්ඩ් විටිනස් බිල්" 17 ජුනි 2008

කොමිසන් සභාවට සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිමේ පනත සම්මත කොට කොමිසන් සභාවේ සැසිවාර නිතිඍානුකුල කරන තෙක් එහි වැඩ කටයුතු නතර කරන මෙන් නිර්දේශ කර තිබුනි. " ජනාධිපති ලේකම් කාර්යාලයේ මෙම ලිපිය නිකුත් කිරිම ප්‍රශ්නයට තුඩු දි ඇති වගන්තිය සමග බලන කල් හි විඩියෝ තාක්ෂණය තහනම් කරන වගන්තිය කෙටුම්පත් කරන ලද්දේ වත්මන් කොමිසන් සභාව විසින් විඩියෝ තාක්ෂණය තවදුරටත් භාවිතා කිරිම වැලැක්විමේ අරමුණින් බව පැහැදිලිය"[88].

ජනාධිපතිවරයා හෝ රජය කොමිසන් සභාවේ සැසිවාරයන්ට මැදිහත් වන්නේ ද යන්න පිළිබඳව හිටපු කොමසාරිස් දේවනේසන් නේසයියා මහතා ගෙන් අසනු ලැබු විට " ජනාධිපති ලේකම් කාර්යාලය විසින් අයිතමයෙන් අයිතමය පාලනය කිරිම ප්‍රගතියට බාධාවක් වුවා. විඩියෝ සම්මන්ත්‍රණ පළමු වටයට ඉඩ දිම අතිශ්‍යයින්ම ප්‍රයෝජනවත් වුවා මෙන් ම දෙවැන්න අවලංගු කිරිම මහත් විනාශයක් විය. විඩියෝ සම්මන්ත්‍රණ අවලංගු කිරිමට ජනාධිපති ලේකම් කාර්යාංශය ගත් තිරණය පරීක්ෂණ කොමිසන් සභාව විමසා ගත් එකක් නොවිය. එහි බලපෑම නිසා කොමිසමේ කටයුතු අඩාල විය[89].

සාක්ෂිකරුවන් ආරක්ෂා කරමින් විමර්ශන පැවැත්විමේ දි විඩියෝ සම්මන්ත්‍රණ ඉතාමත් වැදගත් මෙවලමක් වෙයි. ශ්‍රි ලංකාවේ නිති විශේෂඥයින් පෙන්වා දි ඇති පරිදි ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභාව තහනම් කිරිමට නිතිඍානුකුල පදනමක් නොමැත්තේ ජනාධිපති ලේකම් කාර්යාලය අවසානයේ දි අපරාධ යුක්තිය පසඳිලිමේ පද්ධතියෙ හි කොටසක් නොවන බැවිනි. වර්තමානයේ බලපවත්වන නිතියට අනුව 1948 පරීක්ෂණ කොමිසන් සභා පනත සාක්ෂි පනත සහ කොමිසන් සභාවේ කාර්ය පටිපාටිය පිළිබඳ රෙගුලාසි යන මේ සියල්ලටම අනුව විඩියෝ සම්මන්ත්‍රණ හරහා සාක්ෂි ලබා ගැනිමට කිසිදු බාධාවක් නොමැත. ඇත්ත වශයෙන් ම සාක්ෂි ආඥා පනත යටතේ පිළි ගත නොහැකි සාක්ෂි පිළිබඳ ගැටළු සියල්ලම 1948 පනතේ 7 (ඩි) වගන්තියෙන් සුවිශේෂිතව ම අත් හැර තිබේ[90].

සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිමේ පනත් කෙටුම්පතට අනුව රජය සිය නියෝජිතයෙක් මගින් ශ්‍රි ලංකාව තුළ හෝ ඉන් බැහැර ස්ථානයක සාක්ෂි විමසිමකදි හෝ පෙනි සිටිය යුතුය යන වගන්තිය විඩියෝ සම්මන්ත්‍රණ මගින් ප්‍රකාශ ලබා ගනිමින් දැඩි අවදනමක් සහිත සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිමේ අරමුණ පරාජය කරන ලදි. මෙම පනත් කෙටුම්පත සම්මත වුවහොත් පරීක්ෂණ කොමිසන් සභාව ඉදිරියේ ත්‍රිමලය සිද්ධිය සම්බන්ධයෙන් ලබා ගත් අතිශයින් ම වැදගත් සාක්ෂි වර්ගයේ ප්‍රකාශ ලබා ගැනිම අධෛර්යමත් කෙරෙනු ඇත[91].

*අධිකරණය ඉදිරියට පැමිණිය නොහැකි සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිම හා ඔවුන් ගේ විශ්වසනීයත්වය සහතික කිරිමත් කළ හැකි බව පිළි ගන්නා අතරම ශ්‍රි ලංකාවේ සිටින සාක්ෂිකරුවෙකු සාක්ෂි ලබා දිමේ දි රාජ්‍ය නිලධාරියෙකු පෙනි සිටිම සාක්ෂිකරු ගේ ආරක්ෂාව ඉතාමත් බරපතල ලෙස අනතුරේ හෙළීමකි. ඊට හේතුව බොහෝ අවස්ථාවලදි සාක්ෂිකරුවන් ගේ සාක්ෂි රාජ්‍ය අංශයේ වගකිව යුත්තේක් හා වෙලි පවතින බැවිනි. 29 (බි) වගන්තිය ශ්‍රි ලංකාවෙන් පිටත සිට සාක්ෂි දිම හා සම්බන්ධයෙනි. මෙය වඩාත් ගැටළු සහගත වගන්තියක් වන්නේ එමගින් විදේශ රටක සිටින සාක්ෂිකරු, නිතිපතිවරයා සහ විදේශ අමාත්‍යවරයා ගේ නිර්දේශ අනුව නම් කරන ලද "සුදුසු තැනැත්තෙක් " ඉදිරියේ සිය සාක්ෂිය ලබා දිය යුතු විම නිසයි. ත්‍රිමලයේ දි ඝාතනයට ලක් වු සිසුන් ගේ පවුල් සාමාජිකයින් ගේ තත්වය ගත් කළ එම සාක්ෂිකරුවන් ශ්‍රී ලංකාව විදේශිය රටකට පලා යන්නේ රාජ්‍ය බලධාරින් විසින්ම කරනු ලබන වධ*

88 ඉහත ලිපිය
89 නම්මුණි විජේදස ඉහත සඳහන් ලිපිය
90 ලෝ ඇන්ඩ් සොසයිටි ට්‍රස්ට් 2008 ජුනි 17 දින පත්‍රිකාව
91 සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිමේ පනත් කෙටුම්පත 29 (අ) සහ (ආ)

*හිංසා තාඩන පීඩන වලින් බේරීමට සිය රටේ හි දී ප්‍රමාණවත් ආරක්ෂාවක් එම පුද්ගලයාට ලබා දීමට රජය අකමැති හෝ අසමත් වීම නිසාය. මෙම සිද්ධියට සම්බන්ධ පවුල් වල සාමාජිකයෝ අද ඔවුන් පදිංචි රටවලින් සරණාගත වීසා බලපත්‍ර ලබා ගෙන එහි ජීවත් වන අතර ඔවුන්ට මෙරටින් පලා යාමට සැලැස්සූ එම රජයේ ම නිලධාරියෙකු ඔවුන් ඉදිරියේ පෙනී සිටීමට පක්ෂව කිසිදු තර්කයක් ඉදිරිපත් කළ නොහැකිය[92].*

**කොමසාරිස්වරු මත පීඩනය**

කොමිසන් සභාවේ වැඩ කටයුතු දේශපාලන මැදිහත් වීම් නිසා යටපත් විය. මීට පෙර කොමිසන් සභාවල සේවය කොට ප්‍රමාණවත් පළපුරුද්දක් ලත් මෙම කොමිසන් සභාවේ සාමාජිකයින් ගේ වටිනා විශේෂඥභාවය රජය විසින් නාස්ති කරන ලදී[93].

කොමසාරිස්වරුන් රජයේ විවිධ ආයතන වලින් විවේචනයන් ට හා පිඩනයට භාජනය විත. ශ්‍රී ලංකා යුද්ධ හමුදව හා විශේෂ කාර්ය බලකාය වෙනුවෙන් පෙනී සිටි නිතිඥවරු විශේෂයෙන්ම කොමිසන් සභාවේ සාමාජික ආචාර්ය දේවානිසන් නේසයියා ගේ භූමිකාව සම්බන්ධයෙන් දැඩිව විවේචන ඉදිරිපත් කළෝය. ජේෂ්ඨ සිවිල් සේවකයෙකු සහ 2002 දි පත් කරන ලද යාපනය අතුරුදහන් වුවන් පිළිබඳ කමිටුවේ හිටපු ප්‍රධානියා ඔහු මෙම කොමිසමට පත් කිරිමෙන් " අපේක්ෂාවන් " පිළිබඳ ගැටුමක් ඇති ඉහත කි නිතිඥ දෙපොළ තර්ක කළෝය. ආචාර්ය නේසයියා පර්යේෂණ උපදේශකවරයෙක් ලෙසට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ සේවය කරන බවට තර්ක කළ මෙම නිතිඥවරු, එම සංවිධානය මෙම කොමිසන් සභාවේ සැසිවාර නිරීක්ෂණය පිණිස සහභාගි ද වෙන බව පෙන්වා දෙන ලදි. මෙම චෝදනාවන්ට ප්‍රතිපක්ෂව සිටි ආචාර්ය නේසයියා, ජනාධිපතිවරයා මෙම කොමිසන් සභාවේ කාලය නැවත දිර්ඝ කිරිමේ දි තමා නැවත පත් කරන බවට සහතිකයක් නොවු බැවින්, 2008 ජුනි මාසයේ දි සිය ඉල්ලා අස්විමේ ලිපිය බාර දෙන ලදි[94]. 2008 නොවැම්බර් වන විට කොමිසන් සභාවේ අඩුම තරමින් තවත් සාමාජිකයින් දෙදෙනෙක් ඉල්ලා අස් වු බව වාර්තා විය[95].

*කොමිසන් සභාව නොයෙකුත් බාධක මධ්‍යයේ සෙමින් සෙමින් ප්‍රගතියක් ලැබීය. ශ්‍රී ලංකාවේ පදිංචි සාක්ෂිකරුවන් ට කොමිසන් සභාව විසින් සපයා දී තිබු ආරක්ෂාව, එහි මට්ටම හා කාලය අනුව ද සීමා සහිත විය. කෙසේ වෙතත් සාක්ෂිකරුවන් කිහිප දෙනෙක් ම විදේශ ගතව සිටි අතර වීඩියෝ සම්මන්ත්‍රණ හඳුන්වා දීමෙන් මෙම සාක්ෂිකරුවන් ගෙන් කිහිප දෙනෙක් කොමිසන් සභාවට සම්බන්ධ කර ගැනීමට අවස්ථාව ලැබිනි. වේගවත් ප්‍රගතියක් ලැබුන අතර එය තිරසාර ලෙස පවත්වා ගත හැකියැයි පෙනිනි. නමුත් එතැන් සිට වීඩියෝ සම්මන්ත්‍රණ අත්හිටුවන ලද අතර සාක්ෂිකරුවන් ආරක්ෂා කරන නව අණ පනත් සම්මත වනතුරු කොමිසන් සභාවේ වැඩ කටයුතු ද අත් හිටුවන ලදින් කොමිසන් සභාවේ ප්‍රගතිය ආපස්සට වැටිනි. මගේ මතය වන්නේ පනත් කෙටුම්පතෙහි ඇතැම් වගන්ති ඉතා වැදගත් සාක්ෂිකරුවන් ප්‍රශ්න කිරීමෙන් වළක්වා ලන බවයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් තමන් වෙත පවරන ලද සිද්ධින් 16 සම්බන්ධයෙන් ශක්තිමත් නිගමනයන්ට එළඹීමට කොමිසන් සභාවට නොහැකි වනු ඇත. මෙය කොමිසන් සභාවටත්, අපේ*

92 ලෝ ඇන්ඩ් සොසයිටි ට්‍රස්ට් 17 ජුනි 2008 පත්‍රිකාව

93 ඉහත වාර්තාව

94 ආචාර්ය නේසයියා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍ර අධ්‍යක්ෂක මන්ඩල සාමාජිකයෙකු යැයි කරන ලද චෝදනාව සාවද්‍ය කාරණයකි. ඔහු එහි පර්යේෂණ උපදේශකවරයෙකු වන අතර මේ බව ජනාධිපති ලේකම් වරයාට යවන ලද ලිපියක සඳහන් කොට තිබුනි.

95 දෙවන හා සය වන සිද්ධින් සම්බන්ධයෙන් පරීක්ෂණ කොමිසන් සභාව ඉදිරියේ පෙනී සිටීම ප්‍රතික්ෂේප කරමින් ජාවාඩ් යුසුෆ් හා මානෝරි මුත්තේට්ටුගම යන සිවිල් සමාජ නියෝජිතයින් ඉල්ලා අස්වූ විට ඊට අනුප්‍රාප්තිකයින් වශයෙන් මොහොමඩ් ෆයිසාල් රාසීන් හා ඩෙන්සිල් සරත් ගුණරත්න යන නිතිඥයින් ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් පත් කරන ලදි.

*ජාතික අභිමානයට, ජාතියක් වශයෙන් බරපතළ මානව හිමිකම් උල්ලංඝනයන් හි වින්දිතයින් බවට පත් වුවන්ට සත්‍ය හා යුක්තිය ප්‍රදානය කිරිමට නොහැකි විමත් විශාල හානියකි. ඔබ ගේ ලිපියට පසු ශ්‍රිලංකා යුද්ධ හමුදව හා විශේෂ කාර්ය බලකාය වෙනුවෙන් පෙනී සිටින නිතිඥවරයා ගේ ප්‍රමුඛත්වයෙන් රාජ්‍ය මාධ්‍ය හරහා මට විරුද්ධව ගෙන යන මාධ්‍ය ප්‍රචාරය ගැනත් මම අතිශයින්ම කනගාටුවෙමි. මට විරුද්ධව ගෙන යන ප්‍රචාරයත්, විඩියෝ සම්මන්ත්‍රණ ක්‍රියාවලිය පිළිබඳ දක්වන හුවා දැක්විමෙත් අවසාන අරමුණ සාර්ථික විඩියෝ සම්මන්ත්‍රණ සහ කොමිසන් සභාවේ වැඩ කටයුතු කඩාකප්පල් කිරිමයි.*

**දේවනිසන් නේසයියා ඉල්ලා අස්විමේ ලිපිය 24 ජුනි 2008**

**රාජ්‍ය ආයතන මගින් සහයෝගයක් නොමැති විම**

විශේෂයෙන් ම පරීක්ෂණ කොමිසන් සභාවේ වැඩ කටයුතු වලට අදළව අවශ්‍ය තොරතුරු හා වාර්තා යනාදිය ලබා ගැනිම සම්බන්ධයෙන් රාජ්‍ය ආයතනයන් මගින් ලැබුන සහයෝගය අල්ප සහ සිත් කළකිරිමට පත් කර කළේය. ආරක්ෂක හමුද, නිතිපති දෙපාර්තමේන්තුව, අපරාධ පරීක්ෂණ දෙපාර්තුමේන්තුව සහ ජාතික මානව හිමිකම් කොමිසන් සභාව යන මේ සියල්ලෙන්ම  කොමිසන් සභාව විසින් අදළ සාක්ෂි ඉල්ලා සිටි විට ඒවා සපයා දිමට එම ආයතන  අපොහොසත් විය.

අයි අයි ජී ඊ පි සිය වාර අවසානයේ ඉදිරිපත් කළ අවසාන වාර්තාවෙන්;

*පරීක්ෂණ කොමිසන් සභාව විසින් තොරතුරු හා වාර්තා ඉල්ලා සිටි විට ඊට අනුකුලතාවයක් දැක්විමට රාජ්‍ය ආයතන ප්‍රතික්ෂෙප කරන ලදි. ඊට අමතරව, කොමිසන් සභාව විසින් මේ දක්වා පරීක්ෂා කරන ලද සිද්ධින් ට අදළව  ඇතැම් අවස්ථා වලදි ත්‍රිවිධ හමුදවේ භට පිරිස් යම්කිසි නිශ්චිත වේලාවක යම්කිසි ස්ථානයක සිටියේ ද නැද්ද යන්න පිළිබඳ ව තොරතුරු ඉල්ලා සිටි විට ඇතැම් නිලධාරින් විසින් එය ප්‍රතික්ෂෙප කළේය. මිට හේතුව වශයෙන් දක්වන ලද්දේ ජාතික ආරක්ෂාවයි. මේ ආකාරයේ තොරතුරු ලබා ගැනිමේ වරප්‍රසාදය සම්බන්ධයෙන් නිතිමය තත්වය ද පැහැදිලි නොවිය. තවද, මේ සම්බන්ධයෙන් අදළ බලතල පිළිබඳ සහතිකයක් ද කොමිසන් සභාවට ලබා දුන්නේ නැති අතර කොමිසන් සභාව විසින් සිය කාර්ය ජාතික ආරක්ෂාවට හිලව් කළ යුත්තේ මන්ද යන්නට හේතු දැක්විමක් ද නොවිය. කොමිසන් සභාව මේ සම්බන්ධයෙන් සාක්ෂිකරුවන් හඹා යාමක් ද නොකළේය*[96].

කොමිසන් සභාව වෙත තොරතුරු ලබා ගැනිම පිණිස සිතාසි නිකුත් කිරිමට හා සාක්ෂි ලබා දිමට අපොහොසත් වන පුද්ගලයන් ට එරෙහිව කටයුතු කිරිමට තිබුන බලතල, ඇම්නස්ටි ඉන්ටර්නැෂනල යට වාර්තා වු  පරිදි කුමන අවස්ථාවක දි වත් ඔවුහු පාවිච්චි නොකළෝය.

**නිතීපතිවරයා**

නිතී නිළධාරින් අතර උසස්තම තානාන්තරය දරන්නේ නිතීපතිවරයාය. නිතිපති දෙපාර්තුමේන්තුව විසින් විවිධ චෝදනා සම්බන්ධයෙන් සිදුකරන අපරාධ පරීක්ෂණ වාර්තා විමසා බැලිම; චුදිතයින් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ ආරම්භ කිරිම හා අධිකරණයන් හි නඩුකර පවත්වා ගෙන යාම ද කරනු ලබයි. සපරාධී වරදවල් සම්බන්ධයෙන් දඩුවම් පැනවිම සිදුකරනු ලබන්නේ ද නිතිපතිවරයා ගේ නමිනි. ත්‍රිවිධ හමුදව, පොලිසිය සහ සන්නද්ධ සේවාවන් හි සේනාධිනායක වරයා මෙන් ම වර්තමානයේ ආරක්ෂක අමාත්‍යය වරයා ද වන ජනාධිපති වරයාට නිතිමය උපදෙස් ලබා දිම ද කරයි.නිතිමය කාරණා වලදි නිතිපතිවරයා රජය නියෝජනය කරයි. මෙම තනතුර අර්ධ-අධිකරණ ස්වභාවයක් දරන අතර ව්‍යවස්ථානුකුලව නිර්වචනය

96 අයි අයි ජී ඊ පි ප්‍රසිධ ප්‍රකාශය 14 අප්‍රියෙල් 2008 Ref: IIGEP-006-2008

කොට තිබේ. මෙම තනතුර ස්වාධින තනතුරක් යැයි කියනු ලබන අතර එම ස්වාධිනත්වය වඩ වඩාත් කෙලෙසිමකට ගොදුරු වෙයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 වන සංශෝධනයෙන් නිතිපති දෙපාර්තමේන්තුවේ (ඇතුළු අනෙකුත් ප්‍රධාන තනතුරු වල) ස්වාධිනත්වය ආරක්‍ෂා කිරිම පිණිස නිතිපතිවරයා පත් විම බහු පාර්ශවීය ව්‍යවස්ථානුකුල සභාවෙන් අනුමත කිරිම අවශ්‍ය විය. ව්‍යවස්ථානුකුල තනතුරුවලට ජනාධිපතිවරයා සෘජුවම පත් කිරිම් කිරිම ආරම්භ කිරිමත් සමග ම 2005 සිය පළමු වාර අවසානයෙන් පසු ව්‍යවස්ථානුකුල සභාව අක්‍රිය විය. නිතිපති සි ආර් ද සිල්වා විශ්‍රාම ගැනිමෙන් පසු ආරක්‍ෂක අමාත්‍යංශයේ නිති උපදේශක වරයා ව සිටි ජනාධිපති නිතිඥ මොහාන් පිරිස් මහතා, 2008 නව නිතිපතිවරයා වශයෙන දිවුරුම් දෙන ලදි.

ශ්‍රි ලංකාවේ නිතී ක්‍ෂෙත්‍රයෙහි විශේෂඥවරියක් වන කිෂාලි පින්ටෝ ජයවර්ධන, සන්සෝනි කොමිසමේ සිට ම ( ඉහත සාකච්ඡා කරන ලද) ජනාධිපති පරීක්‍ෂණ කොමිසන් සභා සහ නිතිපතිවරයා අතර නොකඩවාම වර්ධනය වන නොඉවසිලිභාවයක් දක්නට ලැබුනි. " දේශපාලක පිඩනය නිසා නිතීපතිවරයා ගේ අවිනිශ්චිතභාවය නොකඩවාම වර්ධනය වුයේය. දේශපාලන වශයෙන් ඉතාමත් සංවේදිභාවයකින් යුක්ත විමර්ශනයකට සාහය වන්නැයි නිතීපතිවරයාට ආරාධනය කිරිම කොපමණ දුරට සුදුසු ද?. එසේම අනිත් අතට එවැනි සහායක් අවශ්‍ය වුවත්, වර්තමාන සංන්දර්භය තුළ දඩුවමින් නිදහස් විමේ සංස්කෘතිය තුළ නඩු නොපැවරිම සම්බන්ධයෙන් ද වගකිව යුත්තේ නිතිපතිවරයා විසින් විම නිසා ඔහුගේ සාහය ලබා ගැනිම කොපමණ සුදුසු ද යන්න විමසිය යුතු වේ[97].

**පරීක්‍ෂණ කොමිසන් සභා සැසිවාර හා නිතීපතිවරයා ගේ භුමිකාවඃ**

උවමනාවන් ගේ සට්ටනයක් තිබින. පරීක්‍ෂණ කොමිසන් සභාව විසින් විමර්ශනය කරනු ලබන සිද්ධින් ට අදළව මුලික පරීක්‍ෂණ පොලිසිය විසින් මෙහෙයවන ලද්දේ නිතීපතිවරයා ගෙන් ලබා ගත් උපදේස් මතය. නමුත් කොමිසන් සභාවේ මැන්ඩේටයට අනුව එක් කාර්‍යයක් වුයේ මුලික පරීක්‍ෂණයන් ගේ අසාර්ථකත්වය විමර්ශනය කිරිමයි.

අයි අයි ජි ඊ පි මුලාශයන්ට අනුව පරීක්‍ෂණ කොමිසන් සභාව සම්බන්ධයෙන් නිතීපතිවරයා ගේ භුමිකාව සම්බන්ධයෙන් විරෝධතා ඉස්මතු කරන ලදි. අපරාධ පරීක්‍ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම කොමිසන් සභාව වෙත ලබා දුන් වාර්තාවන්ට අනුව පැහැදිලිවම නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් වරයා ( නිතීපතිවරයා ගේ පරිවාර නිලධාරියකු වු නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් වරයා පරීක්‍ෂණ කොමිසන් සභාවේ නිතිඥ මන්ඩලයේ ද ප්‍රධානියා විය.) මුතුර් හි ඒ සි එෆ් සිද්ධිය සම්බන්ධයෙන් පොලිසියට, මුලික පරීක්‍ෂණ සඳහා උපදෙස් ලබා දුන් බලධාරියා ද වේ[98]. නමුත් ඒ අතරම නිතීපති දෙපාර්තමේන්තුවේ නිතිඥයින් කොමිසන් සභාවේ විමර්ශනයන් ගොනු කරමින්ද, සාක්ෂි එක්කාසු කරමින් හා පිළියෙළ කරමින් සහ සාක්‍ෂිකරුවන් ගේ සාක්ෂි මෙහෙයවමින්ද කොමිසන් සභාවට සහාය වුවෝය.

කොමිසන් සභාවට සාහාය පිණිස සිටි නිතීඥ මන්ඩලය එකිනෙකට පරස්පර භුමිකාවන් හි නියැලි සිටියෝය.

- ස්වාධින පරීක්‍ෂණ කොමිසන් සභාව තුළ ස්වාධින නිතීඥ කන්ඩායමක් ලෙසට පෙනි සිටිම
- කොමිසන් සභාවේ කටයුතු පිළිබඳ ව ( ජනාධිපතිවරයා ඇතුළු ) රජයට නිතිමය උපදෙස් ලබා දිම

97 කිෂාලි පින්ටෝ ජයවර්ධන " ෆෝකස් ඔන් රයිට්ස්ඃ ෆරදර් රිෆ්ලෙක්ෂන් ඔන් කොමිසන් ඔෆ් ඉන්කුයිරි ඇන්ඩ් රයිට් වයලේසන්ස්- තෙවන කොටස ද සන්ඩේ ටයිම්ස් 17 පෙබරවාරි 2008

98 නිතිපති දෙපාර්තමේන්තුව නිතිපති වරයා,ඔහුගේ සාහය නිලධාරියා වන සොලිසිටර් ජනරාල් ද, ඉක්බිතිව ඔහු යටතේ අතිරේක සොලිසිටර් ජනරාල් වරු පස් දෙනෙක් ද, නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් වරු විසි දෙනෙක්ද, ජෙෂ්ඨ රජයේ නිතිඥවරු හතලිස් දෙනෙක්ද, රජයේ නිතිඥවරු සියයක්ද, රජයේ නිතිඥවරු දෙදෙනෙක් ද, ජෙෂ්ඨ සහකාර රජයේ නිතිඥවරු පස් දෙනෙක් ද, සහකාර රජයේ නිතිඥවරු දස දෙනෙක් ද සිටිති. පරීක්‍ෂණ කොමිසන් සභාවට සාහය වු නිතීඥ මන්ඩලයට අතිරේක සොලිසිටර් ජනරාල් පාලිත ප්‍රනාන්දු, අතිරේක සොලිසිටර් ජනරාල් යසන්ත කෝදගොඩ,

- අයි අයි ජී ඊ පී විසින් නිකුත් කරන ලද විවිධ ප්‍රකාශයන්ට ප්‍රතිචාර දැක්වීම
- නීතීපති දෙපාර්තමේන්තුවේ දෛනිකව ගොඩ ගැසී ඇති අපරාධ නඩුකරයන් සම්බන්ධව කටයුතු කිරීම

මීට අමතරව නීතීපතිවරයා මානව හිමිකම් ගැටළු සම්බන්ධයෙන් රජයේ ප්‍රකාශකයා ලෙස ද පෙනී සිටියි. 2007 මාර්තු මාසයේ ජිනිවා හි පැවති මානව හිමිකම් කවුන්සලයේ රැස්වීමට සහභාගි වූ රජයේ නියෝජිත පිරිසට නීතීපතිවරයා, නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් යසන්ත කෝදාගොඩ සහ ජාතික සාම ලේකම් කාර්යාලයේ නීති අංශයේ අධ්‍යක්ෂිකා මෙන් ම පරීක්ෂණ කොමිසන් සභාවේ වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අංශයේ උපදේශිකා ශිරානි ගුණතිලක හා ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍ය මහින්ද  සමරසිංහ ද අයත් වුවෝය. මෙම නියෝජිත පිරිසේ මූලික අරමුණ වූයේ යුරෝපීය සංගමය විසින් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් වාර්තාව ට එරෙහි සම්මත කර ගැනීමට තිබූ යෝජනාව  අභියස ශ්‍රී ලංකාවේ මානව හිමිකම් වාර්තාව වෙනුවෙන් පෙනී සිටීමයි[99].

2007 ජූනි මස 27 දින මුතූර් හි ඒ එස් ඒෆ් සිද්ධිය පිළිබඳ පැවති ජන මාධ්‍ය සාකච්ඡාවට නීතීපතිවරයා නියෝජනය කරමින් රජය වෙනුවෙන් නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් වරයා සහභාගි විය. එහි දී ඔහු මුතූර් සිද්ධියට අදාළව, ශ්‍රී ලංකා රාජ්‍යය විසින් එම සිද්ධියේ සාක්ෂි වශයෙන් ඉදිරිපත් කිරීමට නියමිතව තිබූ මුනිස්සන් වෙනස් කරන ලද්දේ යැයි  අන්තර් ජාතික ජූරි කොමිසන් සභාව විසින් කර තිබූ නිගමනය විවේචනය කරන ලදි.

රජය විසින් නීතීපතිවරයා ගේ කාර්යාලය තියුණු පරීක්ෂණයන් ගෙන් වසන් කර තබා ගැනීමට දරන ලද දුස්සාහය මැනවින් ප්‍රදර්ශනය වුයේ, 2007 නොවැම්බර් මස ජනාධිපති වරයා විසින් නීතිපති දෙපාර්තුමේන්තුව හා එහි කාර්ය මන්ඩලය පරීක්ෂණ කොමිසන් සභාවේ විෂය පථයෙන් ඉවත් කිරීමෙනි." කොමිසන් සභාව වෙත යොමු කර තිබෙන දැනට පරීක්ෂණ  නිම කොට ඇති සිද්ධීන් හෝ වර්තමානයේ පරීක්ෂණ පවත්වා ගෙන යන සිද්ධීන් ට අදාළව නීතීපති දෙපාර්තුමේන්තුව හෝ එහි නිලධාරීන් විසින් සිදු කරන ලද හෝ සිදු කිරීමට නියමිත කාර්යන් සම්බන්ධයෙන් කවර ආකාරයක වත් විශ්ලේෂණයක්, නියාමනයක්, ගවේෂණයක් හෝ විමසා බැලීමක් අවශ්‍ය නොවන බව ජනාධිපතිවරයා අදහස් කරන්නේ යැයි " නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කර සිටියේය.[100]

2008 මැයි මාසයේ දි නීතීපතිවරයා සහ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්වරයාත්, ජනාධිපතිවරයා නියෝජනය කළ නියෝජිත පිරිසට ඇතුලත් වූ අතර, ජිනිවා හි පැවති එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් පවත්වන ලද වාර්ෂික විමර්ශනයේ දි, ඒ ඉදිරියේ පෙනී සිටිමින් ශ්‍රී ලංකාවේ මානව හිමිකම් වාර්තාව ආරක්ෂා කළේය.

මෙම තත්වය නීතිඥ කිශාලි පින්ටෝ ජයවර්ධන මෙම තත්වය විස්තර කළේ " හොරා ගේ අම්මා ගෙන් පේන ඇසීමක් " වශයෙනි.[101]

*අයි අයි ජීඊ පී විසින් ඉදිරිපත් කරන ලද උග්‍ර විවේචන මධ්‍යයේ නම්බුකාර ඕනෑම රජයක් කළ යුත්තේ නීතිපති දෙපාර්තුමේන්තුව පිළිබඳ ව ඉහළ පෙළේ විමර්ශනයක් ආරම්භ කිරීමයි. දෙපාර්තුමේන්තුව ඇතුලතින් ආරම්භ වි ඇති උග්‍ර පරිහානිය නතර කර ගත හැක්කේ ඉහළ මට්ටමේ විශ්වසනීය විමර්ශනය ක්*

---

99 "ඒ යූ ටු මුව් රිසලූෂන් ඔන් ශ්‍රී ලංකා ඇට් හියුමන් රයිට්ස් කවුන්සිල්" ද මෝනින් ලීඩර් 29 අගෝස්තු 2007

100 ජාත්‍යයන්තර ස්වාධීන විද්වත් පුද්ගලයන් ගේ කන්ඩායම විසින් 2007 දෙසැම්බර් 19 දින කරන ලද ප්‍රසිධ ප්‍රකාශය"අයි අයි ජී ඊ පී වාර්තාවට අනුව ඔවුන් විසින් කරන ලද නිවැරදි වීම පිණිස කරන් ලද නිර්දේශයන් ක්‍රියාත්මක කළ බවට සලකුනක් නොමැති ය. මේ නිසා ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභාවට අතට පත් වීමට ඇති පරීක්ෂණයන් සාර්ථක වීමට අවම කොන්දේසි වලට වත් එකඟ විය යුතුය" www.iigep.org/prelease/estatement5.pdf

101 කිෂාලි පින්ටෝ ජයවර්ධන- 17 පෙබරවාරි 2008 ලිපිය

*කිරිමෙන් සහ දෙපාර්තුමේන්තුව නිවරදි මාවතට ගැනිම පිණිස විස්තීරණ සහ තීරණාත්මක ක්‍රියාකාරි සැලැස්මක් ඉදිරිපත් කිරිමෙනි. යුක්තිය පැරද විම පිණිස ඉතාමත් සූක්ෂක්ම ක්‍රම භාවිතා කරමින් ගොඩ පෙරකදෝරුවෙකු ගේ භුමිකාව ඉටු කරන මෙම දෙපාර්තුමේන්තුවේ නිලධාරින් අතෘප්තිකර කාර්යන් හි නියැලිම ඔවුන් ගේ දෛවය විය හැකියි.*

*නිතිපතිවරයා අධිචෝදනා ඉදිරිපත් කිරිමේ අංශයේ ප්‍රධානියා විමට සුදුසුකම් නොලබන්නේ ඔහුට එක් අතකින් පොලිසිය හා යුද්ධ හමුද නිලධාරින් විසින් සිදු කරන ලද මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ අධිචෝදනා ඉදිරිපත් කරන අතරම අනිත් අතට රජය නියෝජනය කරමින් රජයේ ප්‍රකාශකයා වශයෙන් එම චෝදනා ප්‍රතික්ෂප කරන හෙයිනි[102].*

***ශ්‍රී ලංකාවේ සිවිල් සමාජයේ ප්‍රතිචාරයන්:***

2008 නොවැම්බර් මස 6 දින විකල්ප ප්‍රතිපත්ති කේන්දය, හෝම් ෆෝ හියුමන් රයිට්, ඉන්ෆෝම්, ලෝ ඇන්ඩ් සොසයිටි ට්‍රස්ට්, ශ්‍රී ලංකාවේ මව්වරු සහ දියණියෝ, රයිට්ස් නවු, ප්‍රජාතන්ත්‍රවාදය සඳහා සාමුහිකය, සහ ශ්‍රී ලංකාවේ නිතීවේදින් ගේ ජාතික කොම්සම යන සිවිල් සමාජ සංවිධාන කොමිසන් සභාවේ සැසිවාරයන් නිරීක්ෂණයට සහභාගි විමෙන් ඉවත් විය. මෙම කන්ඩායම 2008 මාර්තු සිට 2008 නොවැම්බර් දක්වා පරීක්ෂණ කොමිසන් සභාවේ සෑම සැසිවාරයකටම නිතිඥ කන්ඩායමක් වශයෙන් සහභාගි විය. ඔවුහු මෙම කොමිසන් සභාවට ලිඛිත සංදේශ ගනනාවක් ද ඉදිරිපත් කරන ලදි[103].

මෙම සිවිල් සමාජ සංවිධාන එකතුව ප්‍රසිධ ප්‍රකාශයක් කරමින් කොමිසන් සභාවේ සැසිවාරයන් ට කන්ඩායමක් වශයෙන් ඔවුහු සහභාගි වුයේ, විශේෂයෙන් ම ශ්‍රී ලංකා යුද්ධ හමුදව හා පොලිස් විශේෂ කාර්ය බලකාය නියෝජනය කළ නිතිඥවරුන,' විඩියෝ සම්මන්ත්‍රණ මගින් වැදගත් සාක්ෂිකරුවන් විදේශ ගතව සිට සාක්ෂි දිමත් සමගම කොමිසන් සභාවේ වැඩ කටයුතු වල දක්නට ලැබුන ප්‍රගතිය අඩාල කිරිමට එම සාක්ෂිකරුවන් අපහසුතාවයට පත් කරන්නට පටන් ගැනිම වළක්වන්නට බව කියා සිටියේය.

මෙම ප්‍රගතිය අඛන්ඩව නොතිබුනි. 2006 නොවැම්බර් මස මෙම කොමිසන් සභාව පිහිට වු අවස්ථාවේ සිට ඔවුන්ට විභාග කිරිමට නියම කරන ලද සිද්ධින් 16 විභාග කොට නිම කරන ලද්දේ එක් සිද්ධියක් පමණක් වන අතර කොමිසන් සභාවේ විනිවිද භාවයත්, ස්වාධීනත්වයත් පිළිබඳ බරපතළ ගැටළු මතු වු අතර පහත සඳහන් හේතුන් නිසා විශ්වසනීයත්වය බිඳ වැටුනි.

- ජනාධිපතිවරයා සිය පරම අභිමතය පරිදි විඩීයෝ ස්මමන්ත්‍රණ මගින් සාක්ෂි ලබා ගැනිම නතර කිරිම නිසා මෙම කොමිසන් සභාව පිහිටුවිමේ මුලධර්මය බිඳ වැටුනි. සිද්ධින්ට අදළ සියළුම සාක්ෂි විභාග කිරිමට තරම් එඩිතරභාවයක් කොමිසන් සභාවට නොමැති වු බැවින් තවදුරටත් ප්‍රගතියක් අපේක්ෂා කිරිම අර්ථවිරහිත විය.
- කොමසාරිසවරුන් සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිම බිඳ වැටිම සම්බන්ධයෙන් හා කොමිසමේ ප්‍රගතිය පිණිස අප විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් හෝ කිසිදු සැලකිය යුතු පියවරක් ගැනිමට අපොහොසත් විම.
- නිතිපතිවරයා ගේ දෙපාර්තුමේන්තුව කොමිසන් සභාවේ නිතිඥ මන්ඩලය වශයෙන් පිළි ගැනිම කොමිසන් සභාවේ ස්වාධින්ත්වය හා අපක්ෂපාතිභාවය මුලික ගැටළු පැන නැගුනේ නිතිපති දෙපාර්තමේන්තුව මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් රාජ්‍යයට එල්ල වන චෝදනා සම්බන්ධයෙන් ප්‍රසිධියේ පිළිතුරු දෙන්නට යාම හා මුතුර් හි ඒ සි එෆ් සිද්ධිය සම්බන්ධයෙන්

102 " ද කොම්ප්‍රොමයිසින් පොෂිසන් ඔෆ් ශ්‍රී ලංකා ස් ඇටර්නි ජනරල්" බැසිල් ප්‍රනාන්දු යූ පි අයි ආසියාව 15 ජුනි 2007

103 අංක 2 සහ 6 යන සිද්ධින් සම්බන්ධයෙන් සිවිල් සමාජ සංවිධාන ඉවත් විම 2008 නොවැම්බර්

නීතිපති දෙපාර්තුමේන්තුව රජය ආරක්‍ෂා කිරිමට උත්සාහ දැරිමත් අනිත් අතට ජනාධිපතිවරයා නීතිපති දෙපාර්තුමේන්තුව ආරක්‍ෂා කිරිමදීමට ඉදිරිපත් විමත් නිසාය.

- 2008 දෙසැම්බර් මස දි වර්ෂයකට අධික කාලයක් තිස්සේ දෙරගුළු වසා ගෙන විශේෂයෙන් ම සිවිල් සමාජ නියෝජිත කන්ඩායමෙන් හා පොදු මහජනතාව ගෙන් ඉතා රහස්‍ය ලෙස වසන් වි කරන ලද සාක්ෂි විභාගය,, අවසානයේ දි පුස්සක් බව හෙළිදරව් වුයේ ශ්‍රි ලංකා නාවික හමුදවේ ලුතිනන්වරයයෙක් සිය සාක්ෂියේ දි කොමිසන් සභාවේ සැසිවාර වාර්තාවක් අයථා මාර්ගයෙන් ලබා ගත් බව හෙළිදරව් කිරිමත් සමගය.
- එක් කොමසාරිස් වරයෙක් හට ජනාධිපති වරයා ඉල්ලා අස් වන්නට බලකල අතර ඊට පසුව පත් කොට සිටි අට දෙනා ගෙන් තවත් තිදෙනෙක් හෝ ඊට වැඩි පිරිසක් ඉල්ලා අස් විත. මෙම ඉල්ලා අස්විම් වලින් බහුතරයක් ප්‍රසිධ නොකළ අතර එසේ ඉල්ලා අස්වුයේ මන්ද යන කාරණය ප්‍රමාණවත්ව පැහැදිලි නොකෙරිණ. කොමිසන් සභාව වෙත කරන ලද ඍජු මැදිහත් විම නිසා සහ එහි සංයුතිය කෙරෙහි කළ වෙනස් කම් නිසාත් කොමිසන් සභාවේ විශ්වසනීයත්වයට හා වලංගුභාවයට කැළලක් සිදු විය.

සිවිල් සමාජ සංවිධාන විසින් අවසාන මොහොතේත් පෙන්වා දුන් කාරණයක් නම්, ජනාධිපති වරයා කොමිසන් සභාවේ මැන්ඩේටයෙන් කොටසක් පමණක් හිටි අඩියේ දිර්ඝ කිරිම මගින් එහි ස්වාධීනත්වයටත් විනිවිදභාවයටත් හානි සිදු කළ බවයි. සිවිල් සමාජ සංවිධාන විසින් කොමිසන් සභාව එහි අවසාන සය මාසය තුළ ප්‍රමාණවත් ප්‍රගතියක් අත්පත් කර ගනිතැයි නොසිතු අතර "අනතුරකට පත් විය හැකි වැදගත් සාක්ෂිකරුවන් ගේ ආරක්ෂාව හා අභිමානය" ගැන සැලකිලිමත් වන්නැයි නැවතත් ඉල්ලා සිටියාය.

### 3. අන්තර් ජාතික ස්වාධින විද්වත් කන්ඩායම; ප්‍රගතියක් නොලද්දෝ

ඔහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් අන්තර් ජාතික ස්වාධින විද්වත් කන්ඩායම ( අයි අයි ජී ඊ පි) පත් කරන ලද්දේ ශ්‍රි ලංකාවට මානව හිමිකම් මහ කොමසාරිස්වරයා ගේ කාර්යාලයක් ස්ථාපිත කළ යුතුයැයි ක්‍රමයෙන් වර්ධනය වෙමින් තිබු බලපෑමට ප්‍රතිචාරයක් වශයෙනි. හුදෙක් මෙම සිද්ධිමාලාව පමණක් වුවද ඇත්ත වශයෙන් ම ජනාධිපතිවරයා සොයමින් සිටියේ පලා යාමට මාර්ගයක් මිස නිර්ව්‍යාජවම පිරිහෙමින් යන මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ ගැටළු ආමන්ත්‍රණය කිරිමට නොවන බව සිවිල් සමාජයට මැනවින් එත්තු ගොස් තිබුනි. ජගත් මානව හිමිකම් නිරීක්‍ෂකයන් සඳහා දේශිය මෙන් ම විදේශියවත් කරන ලද ඉල්ලිම් වර්ධනය වුයේ දඩුවමින් නිදහස් කිරිම සංවරණයකට ලක් කිරිමට ශ්‍රි ලංකාව තුල ස්ථාපිත යාන්ත්‍රණයන් නොකඩවාම අසමත් විම නිසා ඇති වි තිබු කලකිරිම හේතු කොට ගෙනය.

ශ්‍රි ලංකා මානව හිමිකම් කොමිසන් සභාව රට තුල මානව හිමිකම් තිරසාර ලෙස නියාමනය සඳහා පිහිටුවන ලද ආයතනය ලෙසට තර්කානුකුල ලෙසට පිළිගත හැකි වෙයි. සාඩම්බර නිලබල ක්‍රමය හා සංකෝචිත වැය ශිර්ෂ පිළිබඳ තත්වය කෙසේ වෙතත් ශ්‍රි ලංකා මානව හිමිකම් කොමිසම, විශේෂයෙන් ම එහි ප්‍රාදේශිය කාර්යාල මානව හිමිකම් පිළිබඳ පැමිණිලි ඉදිරිපත් කළ හැකි ස්වාධින යාන්ත්‍රණයක් වශයෙන් ඉතා විශාල සේවයක් සිදුකරන තිබුනි. නමුත් 2006 දි ශ්‍රි ලංකා මානව හිමිකම් කොමිසමට එහි ව්‍යවස්ථාපිත ස්වාධිනත්වය අහිමි කර වුයේ ව්‍යවස්ථාදයක සභාව විසින් ඊට සාමාජිකයින් පත් කළ

යුතුයැයි නියම විමත් සමගය. මෙම කොමිසන් සභාවට ද ජනාධිපති වරයා සෘජුවම සාමාජිකයින් පත් කරමින් එහි ස්වාධිනත්වයද, ජගත් පිළි ගැනිම සහ එහි බලපෑම ද අනතුරෙහි හෙළන ලදි.[104]

2005 අවසාන භාගයේ දි එක්සත් ජාතින් ගේ අධිකරණ බාහිර හා නඩුවිභාගයකින් තොර කේවලාත්මක ඝාතන පිළිබඳ විශේෂ නියෝජිත පිලිප් ඇල්ස්ටන් ශ්‍රී ලංකාවට පැමිණි අතර ඔහු රට තුල වර්ධනය වන මානව හිමික්මි උල්ලංඝනයන් සහ දඩුවමින් නිදහස් විම පිළිබඳ ගැටළු ඉස්මතු කළේය. 2007 ඔක්තෝබර් මස ශ්‍රී ලංකාවට පැමිණි එක්සත් ජාතින් ගේ වධහිංසා පැමිණවිම පිළිබඳ විශේෂ නියෝජිත මැන්ෆර්ඩ් නොආර්ක් ද, එජසං මානව හිමිකම් මහ කොමසාරිස් ලුයිස් හාබර් යන මේ සියළු දෙනාම ඉහත කි තත්වයන් පිළිබඳ ව දැඩිව අවධානය යොමු කළහ. මෙම නියෝජිතයින් තිදෙනාම මානව හිමිකම් පිළිබඳව ජාත්‍යයන්තර නිරික්ෂණයක් අවශ්‍ය බව කියා සිටියහ. 2006 මාර්තු මාසයේ දි ඇල්ස්ටන් විසින්:

*සිවිල් සමාජ නියෝජිතයින් බොහෝ දෙනෙක් ජාත්‍යයන්තර මානව හිමිකම් නිරීක්ෂණයක අවශ්‍යතාවය පිළිබඳ ව මට බල කළහ. නව මානව හිමිකම් නිරීක්ෂණ භුමිකාවක් නිරූපනය කළ හැකි ආයතන හා පුද්ගලයින් ගේ හඳුනා ගැනිමක් ද තිබුනි.මේ අතර ඉතාමත් ඉහළින් සිටියේ එක්සත් ජාතින් ගේ සංවිධානය වන අතර ඊට මානව හිමිකම් ස්ථාපිත කිරිම පිළිබඳ විශේෂඥභාවයක් ද, සාම ක්‍රියාවලිය තුල දේශපාලන උවමනාවන් ප්‍රදර්ශනය නොකිරිම මගින් ද සුදුසුකම් ලබා තිබුනි. අනෙකුත් අපේක්ෂයින් වුයේ ශ්‍රී ලංකා ආධාර කන්ඩායමේ සම සභාපතිවරු සහ මානව හිමිකම් පිළිබඳ විශේෂඥයින් ගෙන් සමන්විත මන්ඩලයක් පත් කිරිමයි. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසන් සභාව සම්පත් වර්ධනය කොට ශක්තිමත් කළත් දිවයින පුරා සිද්ධවන දේශපාලන ඝාතන විභාග කිරිමට සුදුසු ආයතනයක් නොවන බවට පොදු එකඟත්වයක් තිබුනි. මගේ සගයින් කිහිප දෙනෙක් අතර එල් ටි ටි ඊ යෙහි සහභාගිත්වයකින් තොරව එලදයි නිරීක්ෂණයක් කළ හැකිය යන මතයේ ද සිටියෝය.*[105]

එජස මහා මන්ඩලයට ඉදිරිපත් කළ සිය වාර්තාවෙන් මැන්ෆර්ඩ් නොආක් ශ්‍රී ලංකාව පිළිබඳ විශේෂයෙන් සඳහන් කරමින්:

*එජස මානව හිමිකම් පිළිබඳ* මහ කොමසාරිස් කාර්යාල ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්වය නිරීක්ෂණය කිරිමට සහ අත්අඩංගුවේ තබා ගෙන සිටින සියළුම ස්ථානයන්ට බාධාවකින් තොර ඇතුල් විමේ බලයක් සහිත බිම් මට්ටමේ කාර්යාල පිහිටුවිමත් අධිකරණ පොලිසිය හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණයක් පිණිස තාක්ෂණික ආධාර සැපයිම ද කළ හැකිය[106].

---

[104] 2001ශ්‍රී ලංකා ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද 17 වන සංශෝධනය මගින් රාජ්‍ය සේවයට කරන ලද ඇතැම් පත්විම් දේශපාලනිකරණය විම වැලැක්විමට දරන ලද උත්සාහයක් වශයෙන් ව්‍යවස්ථානුකුල සභාව පිහිට වු අතර එහි පාර්ලිමෙන්තුවේ ආන්ඩු පක්ෂයේ මෙන් ම විරුද්ධ පක්ෂයේ හා ස්වාධින පුද්ගලයින් ගෙන් සමන්විත විය. පොලිස් කොමිසම හා මානව හිමිකම් කොමිසම ඇතුළු ආයතන ගනනාවකට කරන පත් කිරිම් සඳහා ව්‍යවස්ථානුකුල සභාවේ අනුමැතිය අවශ්‍ය විය. 2006 දි ව්‍යවස්ථානුකුල සභාවට සාමාජිකයින් පත් කිරිම සම්බන්ධයෙන් ආන්ඩු හා විරුදධ පක්ෂ අතර මතභේදයක් හට ගත් අතර ඉතාමත් ඉහළ සුදුසුකම් ලත් හා අත්දැකිම් සහිත පුද්ගලයින් ව්‍යවස්ථානුකුල හේතුන් මත ඊට පත් නොකරන ලදි. විශේෂයෙන් ම මානව හිමිකම් ආරක්ෂා කිරිම හා නියාමනය සම්බන්ධ වගකිම් පැවරුන ශ්‍රිලංකා මානව හිමිකම් කොමිසන් සභාවටත් ශ්‍රී ලංකා පොලිස් කොමිසන් සභාවටත් මෙය ඉතා විශාල පහරක් විය. අවසානයේ දි " සියළුම පත්විම් ලාභින් එක්කෝ ජනාධිපතිවරයා ගේ ආධාරකරුන් හෝ එසේත් නැත්නම් ළඟම හිතවතුන් " වු අතර මානව හිමිකම් වෙනුවෙන් පෙනි සිටි ප්‍රජාව ඔවුන් සමග නොවිය. කිෂාලි පින්ටෝ ජයවර්ධන"කොන්ටෙම්ට් 'ඔෆ් කෝර්ට්ස්: ඩිස් රිගාඩ්ස් ඔෆ් රූල් ඔෆ් ලෝ ඇන්ඩ් ඉට්ස් ඉන්පැක්ට් ඔන් එත්නික් කොන්පිලික්ට් ඉන් ශ්‍රී ලංකා" කොමන්වෙලත් හියුමන් රයිට්ස් ඉනිෂටිව් නිව්ස් ලෙටර් 13 කාන්ඩය 2 වෙළුම නව දිල්ලිය 2006

[105] එක්ස්ට්‍රා ජුඩිෂියල් සමරි ඕ ආබිටරරි එක්ස්ක්‍යුෂන්ස් රිපෝට් ඔෆ් ද ඉස්පෙෂල් රැපටෝර් පිලිප් ඇල්ස්ටන් මිෂන් ටු ශ්‍රී ලංකා (2005 නොවැම්බර් 28 දෙසැම්බර් 6) එජාසං ලියවිලි E/CN.4/2006/53/Add.527 මාර්තු 2006 42 හා 44 ඡේද

[106] රිපෝට් ඔෆ් ද ස්පෙෂල් රැපටියර් ඔන් ටොර්චර් ඇන්ඩ් අදර් කුරල් ඉන් හියුමන් ඕ ඩිග්‍රෙඩින් ට්‍රිට්මන්ට් ඕ පනිෂ්මන්ට් මැන්ෆ්ල්ඩ් නොආත් මිෂන් ටු ශ්‍රී ලංකා UN DOC A/HRC/7/3/Add6, 26 පෙබරවාරි 2008 94 (වයි) ඡේදය

ලුයිස් ආබර් විසින් ද මානව හිමිකම් ආරක්ෂාව හා නිරීක්ෂණය සඳහා ජාත්‍යයන්තර සහයෝගය පිළිබඳ ආයාචනයකට සහයෝගය දක්වන ලදී. ඇය එජස ආධාර ලබා ගැනිමට රජය දක්වන මැලිකම පිළිබඳ ව සඳහන් කරමින් නැවත නැවතත් එම යෝජනාව ඉදිරිපත් කරන ලදී.

*මගේ සාකච්ඡා වලදී රජයේ නියෝජිතයෝ දිගින් දිගටම ඉල්ලා සිටි ඉල්ලීමක් නම් මානව හිමිකම් ආරක්ෂකා කිරිම පිණිස ප්‍රමාණවත් යාන්ත්‍රණයන් ශ්‍රී ලංකාව තුල තිබෙන අතර අවශ්‍යව ඇත්තේ එම යාන්ත්‍රණයන් හි ධාරිතා වර්ධනය කිරිම බවයි. මිට ප්‍රතිවිරුධව, අති බහුතරයක් දේශපාලන සංවිධානයන් හි සිට ප්‍රජා සංවිධාන දක්වා පැතිරි ගිය කන්ඩායම් විසින් පමණක් නොව ඇතැම් ආයතන විසින් ද බරපතල මානව හිමිකම් උල්ලංඝනයන් ගෙන් පුරවැසියන් ආරක්ෂා කිරිමට මෙම ආයතනයන් ට තිබෙන හැකියාව පිළිබඳව විශ්වාසයක් නොමැති බව මා සමග ප්‍රකාශ කර තිබුනි.*

*මට පෙනෙන ලෙසට ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂා කිරිම පිළිබඳ පරතරය ඇති වන්නේ හුදෙක් ම ධාරිතාව පිළිබඳ ප්‍රශ්නයක් නිසාම නොවන බවයි. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් පිළිබඳ මුල් බැස ගෙන දප්‍රමාණික තොරතුරු විරල විමයි. අපි ඒ සඳහා ආන්ඩුවට උපකාර කරන්න කැමතියි.මානව හිමිකම් ආරක්ෂා කිරිම පිණිස ජාත්‍යයන්තර සහයෝගයක් අවශ්‍යයි යනුවෙන් මෙරට ගොඩ නැගී ඇති සජීවී සංවාදය පිළිබඳව මම දනුවත්. දනට වාර්තා වන අන්දමට බරපතළ ලෙස සිදුවන හිංසනයන් විශේෂයෙන් ම ජීවිත තර්ජන හා පුද්ගල ආරක්ෂාව තොරතුරු පසුබිමේ තබා ගෙන අනාගතයේ දි මානව හිමිකම් කවුන්සිලයත් රජයත් අතර එලදයි සම්බන්ධතාවයක් සඳහා වර්තමානයේ මානව හිමිකම් කවුන්සිලය හා රජය අතර සිදුවන සාකචඡා සමාප්තියකට ගෙන ඒමට කැමතියි[107].*

අයි අයි ජි ඊ පි ය පත් කරමින්, ශ්‍රී ලංකාවේ සිදුවන බරපතළ මානව හිමිකම් හිංසනයන් පිළිබඳව ජාත්‍යයන්තර භූමිකාවක් අවශ්‍ය බව සිහිපත් කළේය. 1990 ගණන් වලදි මෙන් කාල මානය ඉතාමත් වැදගත්. නැවත වර්ධනය වු ප්‍රචන්ඩත්වය පිළිබඳ ශ්‍රී ලංකා සන්දර්භය තුළ ආධාර ප්‍රජාව තවදුරටත් කවර ආකාරයක අඛන්ඩ සම්බන්ධතාවයක් පවත්වා ගත යුතු දැයි ප්‍රශ්න කරමින් සිටිති. මෙය විශේෂයෙන් ම ත්‍රිවිධ හමුදාවට හා පොලිසියට මානව හිමිකම් පිළිබඳව පුහුණු ලබා දිමට කරන ලද අරමුදල් ආයෝජනයත්, අධිකරණ ක්‍රමය නගා සිටුවිමට මුලාරම්භයක් වශයෙන් ලබා දෙන ලද අරමුදල්, සාම ක්‍රියාවලිය සම්බන්ධයෙන් ආධාර කන්ඩායමේ සහයෝගය යනාදිය සම්බන්ධයෙන් කළ කි දැ සියල්ලෙන් ම රටේ තත්වයෙහි සිදු වි වු වෙනස ඉතාමත් අල්පය. නමුත් ජනාධිපතිවරයා ද කවර ආකාරයක හෝ ජාත්‍යයන්තර මැදිහත් විමක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ දේශපාලන බලවේගයන් හි බලපෑමට යටත්ය. මේ අනුව අයි අයි ජි ඊ පි ය එකම අතරමැදි විසදුම විය.

ඇම්නස්ටි ඉන්ටර්නැෂනලය කිසිසේත් ම බරපතළ මානව හිමිකම් උල්ලංඝනයන් සම්බන්ධයෙන් පොලිස් පරීක්ෂණයන් හි අනවතරයෙන් සිදුවන බිඳ වැටිම අහඹු සිදුවිමක් ලෙසද, නිතිය ක්‍රියාත්මක කිරිම සම්බන්ධයෙන් හැකියාවක් නැතැයි යන්න විශ්වාස නොකරයි. මානව සම්පත් පුහුණු කිරිමට හා අපරාධ පර්යේෂන රසායනාගාර යාවත් කාලීන කිරිමටත් විදේශිය ආධාර පාවිච්චි කරන ලද නමුත් බරපතළ මානව හිමිකම් කඩකිරිම් සම්බන්ධයෙන් බලන කළ පවරන ලද නඩුකර සංඛ්‍යාවේ වර්ධනයක් නොපෙන්වයි. ශ්‍රී ලංකා පොලිසියට බලපෑමක් සහිත පරීක්ෂණ පැවැත්විමේ හැකියාව පවතින්නේ දේශපාලන වාතාවරණය ඒ සඳහා හේතු කාරක වන විට බවත්, මෙම ධාරිතාව ඉහළ දැමීම සඳහා

107 මානව හිමිතම් මහ කොමසාරිස්තුමිය සිය සංචාරය අවසානයේ නිකුත් කරන ලද ජන මාධ්‍ය ප්‍රකාශය-13 ඔක්තෝබර් 2007

සැලකිය යුතු විදේශීය ආයෝජනයක් කැප කොට ඇති බවත් පිළි ගන්නට ඇම්නස්ටි ඉන්ටර්නැෂනලය පෙළඹෙයි[108].

ඇම්නස්ටි ඉන්ටර්නැෂනලය ත්‍රිමලයේ පංච ශිෂ්‍ය ඝාතනය, මුතූර් හි අධිකරණ බාහ්‍ය ඒ සි එෆ් ඝාතනය, පොතුවිල් හි කම්කරුවන් ඝාතනය, මෙම සිද්ධීන් සම්බන්ධව ඉදිරිපත් වූ සාක්ෂිකරුවන්ට කරන ලද හිරිහැර හා මුහුණ දෙන්නට සිදු වූ ප්‍රචන්ඩත්වය යන මේ සියල්ලම දඩුවමින් නිදහස් ව සිටීමේ සංස්කෘතිය පිළිබඳ ලකුණු වෙයි. ශ්‍රි ලංකා බලධාරින් මෙම සංස්කෘතිය අප්‍රමාදව අවසන් කරනවා වෙනුවට එය තවදුරටත් ආරක්‍ෂා කිරිමට ක්‍රියා කරයි.

*ප්‍රබල නෛතික ප්‍රතිචාරයක් සහතික විය හැක්කේ අපරාධකරුවන් ට එරෙහිව වේගවත් අධිකරණ ක්‍රියා මාර්ගයකින් මිස සමහරු සිතන ආකාරයට ජාත්‍යයන්තර විද්වත්වතුන් ගේ ආධාර ලබා ගන්නා කරුණු සොයා බැලීමේ කොමිසන් සභා මගින් නොවේ. මෙම ගෞරවාන්විත ව්‍යායාමයන් බොහෝ විට එහි ප්‍රගතිය පිණිස කැප කරන අපමණ සම්පත් ප්‍රමාණයන් නොසලකා නිර්ථක වෙයි. පදනම් විරහිත ලෙස මා නරුමවාදියෙක් ලෙස හංවඩු ගැසිය හැකි වුවත්, මට පක්‍ෂව ඉදිරිපත් කළ හැකි තර්කය නම් 1994 දකුණු පළාත් අතුරුදහන් විම් පරීක්‍ෂා කිරිමේ කොමිසන් සභාව විසින් හෙළිදරව් කළ පරිදි ජනතා විමුක්ති පෙරමුණ හා රජය සමග එකදහස් නමසිය අසූ ගණන් අග භාගයේ හා එක දහස් නවසිය අනූ ගණනන් මුල් භාගයේ ඇති වූ ගැටුම් වල ප්‍රතිඵලයක් වශයෙන් එම දකුණේ සිදු වූ අතුරුදහන් විම් වලින් සියයට 40 - 70 අතර ප්‍රමාණයකට වගකිව යුත්තේ ත්‍රිවිධ හමුදව බව පෙන්වා දුන්නත් 2004 දි වරදකරුවන් ලෙස ඔප්පු කළ හැකි වූයේ ඉන් සිද්ධීන් නවයක් පමණි.*

*මෑතකදි පත් කළ 2006 කොමිසන් සභාව එසේ නැත්නම් වෙනත් සිද්ධීන් ගත්තද වර්තමාන අපරාධ නිතියේ අනම්‍යභාවය නිසා සාර්ථක අධි චෝදනා ඉදිරිපත් කිරිමක් කළ නොහැකි වෙයි. අණදීමේ වගකීම පිළිබඳ න්‍යාය ධර්මය නොපිළිගැනිම අපරාධකරු ගේ වාසිය පිණිස සකස් වී ඇති මෙම වංචා සහගත හා මන්දගාමී නිතී ක්‍රමයෙහි විවිධ මුහුණු අතර සාක්‍ෂිකරුවන් ආරක්‍ෂා කිරිමේ ප්‍රබල වැඩ පිළිවෙළක් නොමැති කම, නිර්ව්‍යාජ වින්දිතයින් හට හිතුවක්කාර ලෙස එදිරිවාදිකම් දැක්විම යනාදිය අතර එක් මුහුණු වරක් වෙයි[109].*

**කිෂාලි පින්ටෝ ජයවර්ධන**

පරීක්‍ෂණ කොමිසන් සභා තුල ඊට ආවේනික සිමාවන් තිබේ. ඒවා හිටි හැටියේ පහළ වන, කෙටිකාලින, පටු විෂය පථයක් සහිතය. ශ්‍රි ලංකාව තුළ නම් මෙම කොමිසන් සභා මහජන උපදේශනයකින් තොර විධායකය විසින් පමණක් පිහිටු ලබන්නෙකි. පත් කිරිම්, සැසිවාර හා සොයා ගැනිම් යනාදිය සියල්ලම ජනාධිපතිවරයා ගේ පාලනය කරනු ලබයි. දශක ගණනාවක් ම ශ්‍රි ලංකාවේ විධායකය, කොමිසන් සභා තමන්ට වාසිදයක සුදු හුනු ගා ගැනිමක් ලෙසට පාවිච්චි කොට තිබේ.

*ඇත්ත වශයෙන් ම ශ්‍රි ලංකාවේ හිටි අඩියේ පිහිටු වන පරීක්‍ෂණ කොමිසන් සභා නිර්දේශ කිසි කලෙක ක්‍රියාත්මක කොට නැත. මෙය දේශපාලන අධිෂ්ඨානය පිළිබඳ බරපතළ ගැටළු මතු කරයි. බරපතළ මානව හිමිකම් උල්ලංඝනයන් විමසා බැලිමට තරම් අවශ්‍ය දේශපාලන අධිෂ්ඨානයක් තිබේද? පරීක්‍ෂණ*

---

108 උදහරණයක් වශයෙන් ස්විඩන් රජය ස්විඩන් කෝනාර් මිලියන 30 ක මුදලක් ( දළ වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 3.7) ක මුදලක් 2005 ජුනි මස සිට 2008 මැයි දක්වා කාලය තුල දි ශ්‍රි ලංකා රජය විසින් පොලිසියෙහි ප්‍රතිව්‍යුගත සංවර්ධනයක් සැලසුම් කිරිම; අපරාධයක් සිදු වූ ස්ථානයේ පරීක්‍ෂණ ඇතුළු අපරාධ පරීක්‍ෂණ, මානව අයිතිවාසිකම්,;පොලිස් බලකායට වාර්ගික හා ස්ත්‍රි පුරුෂ සමාජභාවය වැඩි දියුණු කිරිම සඳහා ලබා දෙන ලදි. මෙම ව්‍යාපෘතිය යටතේ ස්ථානගත අපරාධ පරීක්‍ෂණ නිලධාරින් 271 පුහුණු කරන ලද අතර දිවයින පුරා ස්ථානගත අපරාධ පරීක්‍ෂණ රසායනාගාර 37 පිහිටුවන ලදි. එහෙත් ඉන් ඔබ්බට සිදු වූ යමක් නොමැත. 2007 දි මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කරන ලද සමාලෝචනයේදි මානව අයිතීන් සම්බන්ධයෙන් මෙම ව්‍යාපෘතියෙන් අපේක්‍ෂා කළ වෙනස්කම් කිසිවක් සිදු වූ බවට කිසි දු ලකුණක් නොමැති බවත් ඊට හේතුව රටේ සිදුවන මහා පරිමාණ මානව හිමිකම් උල්ලංඝනයන් සියල්ලක්ක් ම ජාතික ආරක්‍ෂාව පිළිබඳ කඩතුරාව විසින් වසා දමා තිබිමත් නිසාය නිගමනය කරන ලදි. නුඩ් ඔලන්ඩර්, කැමිලා ඕජුලා, රොහාන් එදිරිසිංහ, විසින් කරන ලද සීඩා සමාලේචනය නැෂනල් පොලිස් බෝර්ඩ් 5 පිටුව www.sida.se/shared/jsp/download.jsp?f=Utvo7_43_SIDA40261en.pdf&a=35261

109 කිෂාලි පින්ටෝ ජයවර්ධන ද සන්ඩේ ටයිම්ස් 20 මැයි 2007 ලිපිය

*කොමිසන් සභා නිර්දේශ හා එම නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම සලකා බලන විට හඬ නගා දිය හැකි පිළිතුර නැත යන්නයි. නැවතත් දිය හැකි හොඳම නිර්දේශය නම් අතුරුදහන්වීම් පරීක්ෂා කිරීම පිණිස පත් කරන ලද කොමිසන් සභා හා පිහිටුවන ලද යාන්ත්‍රණයන් සමූහයයි. මෙම යාන්ත්‍රණයන්ට අමතර ව බලයට පත් වූ සෑම රජයකටම සිය ගණනක් වූ එම කොමිසන් සභා නිර්දේශ ඉදිරිපත් කරන ලද නමුත් අතුරුදහන් වීම් පශ්චාත් සටන් විරාම දේශපාලන භූමිතලයෙහි අනවරත ලක්ෂණයක් ලෙසට යලිත් ඉස්මතු වෙයි. තවදුරටත්, ආන්ඩු බලයට පත් වී අයිතිවාසිකම් කඩා බිඳ දමන විට පරීක්ෂණ කොමිසන් සභා පත් කරනු ලැබිය හැකි අතර සිවිල් සමාජයේ බහුතරයක් (එබඳු කොමිස්න් සභා වල සිවිල් සමාජයේ ප්‍රමුඛ තැනැත්තන් අසුන් ගැනිමට ද පසුබට නොවේ) ඊට සහයෝගය දීමෙන් පරීක්ෂණ කොමිසන් සභා වගවීම පිළිබඳව අර්ථවත් ප්‍රවේශයක් නියෝජනය කරන්නේ යැයි කියනු ඇත. යථාර්තය වන්නේ කරුණු සෙවීමේ කාර්ය සම්බන්ධයෙන් සීමිත වැදගත් සේවයක් කළත් ඊට සමාන්තරවම දඬුවමින් නිදහස් කිරීමේ වාතාවරණය රැක ගැනීමේ නිත්‍ය සාධකයක් බවට ද පරීක්ෂණ කොමිසන් සභා පත් වී ඇත[110].*

**නිගමන හා නිර්දේශ**

**නිගමන...**

පරීක්ෂණ කොමිසන් සභා විසින් ගවේෂණාත්මක භූමිකාවක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරුනු අතර එමගින් මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ සිද්ධීන් සම්බන්ධයෙන්  සත්‍යය හා යුක්තිය සොයා ගැනීමට උපකාරි වනු ඇතැයි බලාපොරොත්තු විය. ඔවුහු පවතින අධිකරණ ක්‍රමය ඌනපූරණය කරනු ඇත. විධිමත් යුක්තිය පසඳලීමේ ක්‍රමය සුනුවිසුනු වී ඇති ශ්‍රී ලංකාවේ පරීක්ෂණ කොමිසන් සභා සාර්ථකත්වයක් පෙන්නුම් නොකරයි. බරපතළ මානව හිමිකම් උල්ලංඝනයන් ( වධහිංසා පැමිණ වීම, හිතුවක්කාර ලෙස අත්අඩංගුවට ගැනීම සහ රඳවා තබා ගැනීම, ජීවිතයට ඇති අයිතිය උල්ලංඝනය යනාදිය ද ඇතුලත්ව ) නොකඩවාම සිදුවන අතර අධි චෝදනා ඉදිරිපත් කිරීමකින් තොරව අපරාධ කරුවන් සුරක්ෂිතව සිටින අතරම පුරවැසියන් ගේ මානව අයිතීන් ආරක්ෂා කරමින් යුක්තිය කරා එළඹීමට සමාන ඉඩ කඩ සලසනවාට  වඩා  රජය පටු ඡන්ද දයකින් ආරක්ෂා කිරීම වැදගත් යැයි සිතයි. ස්වාධීන නිරීක්ෂණයක් සඳහා තිබෙන ඉඩකඩ ඉතාමත් සීමිතය. ජාතික මානව හිමිකම් කොමිසන් සභාව ඉතාමත් අධම තත්වයකට වැටී ඇත. එක්සත් ජාතීන් ගේ ආයතනයන්ට නොකඩවාම බාධා පමුණුවයි. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ආරක්ෂකයින් නොකඩවාම තර්ජනයට භාජනය විමට හා ලක් වෙයි. ජන මාධ්‍ය මැඩ පවත්වා තිබේ.

ශ්‍රී ලංකාන්ඩුව පසුගිය විසිවසර තුල රඟ දක්වන ලද අභිරූපයන් ජාත්‍යයන්තර ප්‍රජාව විසින් තවදුරටත් විශ්වාස නොකළ යුතුය. ශ්‍රී ලංකාවට දඬුවමින් නිදහස් විම පිළිබඳ නිදහස් විම පිළිබඳව කථා කිරීමට කැමැත්තක් හෝ උවමනාවක් නැත. ශ්‍රී ලංකාවේ බලධාරින්ට ජාත්‍යයන්තර මානව හිමිකම් හා මානවීය නිතීය මත පිහිටා පසුගිය උල්ලංඝනයන් ගවේෂණය කිරීමටත්, සාධාරණත්වය පිළිබඳ ප්‍රමිතීන් හි පිහිටා සැකකාර අපරාධකරුවන් ට අධිචෝදනා ඉදිරිපත් කිරීම, වින්දිතයින්ට වන්දි ගෙවීමටත් අනාගත උල්ලංඝනයන් වළක්වා ගැනීම පිණිසත් ජාත්‍යයන්තර ප්‍රජාව සිය වැදගත් ධානාන්තර භාවිතා කළ යුතුය. ජාත්‍යයන්තර ප්‍රජාව සිය ප්‍රබල ධානන්තරයන් පාවිච්චි කොට, සිය ප්‍රචන්ඩකාරි ගමන් පථය වෙනස් කිරීමට අවශ්‍ය නිශ්චිත ප්‍රතිසංස්කරණ සඳහා ශ්‍රී ලංකාව තල්ලු කිරීමටත්, දඬුවමින් නිදහස් කිරීම පිටු දැකිම පිණිස පහත සඳහන් නිර්දේශයන් ආරම්භක ලක්ෂයක් ලෙස සලකා නියාමනයත් කළ යුතුය.

---

110 ලෝ ඇන්ඩ් සොසයිටි ට්‍රස්ට්- අප්‍රකාශිත සංකල්ප පත්‍රිකාව, සිවිල් හා දේශපාලන වැඩ සටහන යටතේ ජනාධිපති පරීක්ෂණ කොමිසන් සභා පිළිබඳව අධ්‍යයනය අගෝස්තු 2007

මෙම වාර්තාව දඬුවමින් නිදහස් කිරීම හා බලපෑමක් සහිත අපරාධ පරීක්ෂණ හා අධි-චෝදනා ඉදිරිපත් කිරීමක් නොමැති රටක ජගත් මානව හිමිකම් හා මානවීය නීතීය පදනම් කොට ගෙන පරීක්ෂණ කොමිසන් සභාවේ භූමිකාව පිළිබඳව අවධානය යොමු කළේය. ඇම්නස්ටි ඉන්ටර්නැෂනලය දඬුවමින් නිදහස් කිරීම පිටුදැකීම පිණිස ක්‍රියාත්මක යුක්තිය පසඳලීමේ ක්‍රමයක වැදගත් කම අවධාරණය කරන අතර පරීක්ෂණ කොමිසන් සභාවන් කිසිසේත් ම යහපත් පොලිසි හෝ නීතීයේ ආධිපත්‍යයට ආදේශ කළ නොහැකිය. අණ දීමේ වගකීම දරන ධානාන්තර ලාභීන් ඇතුළු අපරාධකරුවන් නීතීය යටතට ගැනීම දඬුවමින් නිදහස් වීමේ චක්‍රය බිඳ දැමීමේ එකම මාවත වෙයි.

**නිර්දේශ**

**ඇම්නස්ටි ඉන්ටර්නැෂනලය ශ්‍රී ලංකා රජයෙන් මෙසේ ඉල්ලා සිටියි.**

**පහත සඳහන් පියවරයන් ගැනීමෙන් දඬුවමින් නිදහස් කිරීමේ චක්‍රය බිඳ තම සූදානම ප්‍රදර්ශනය කරන්න**

-මානව හිමිකම් උල්ලංඝනය කළ අපරාධකරුවන් අධිකණය ඉදිරියට ගෙන ඒම අරමුණු කොට ගත් ජාතික ප්‍රතිපත්තියක් පිහිටුවීම හා එ මගින් සිය හමුද තුලත් වැරදිකරුවන් සිටින බව ප්‍රසිධියේ පිළි ගනිමින් මානව හිමිකම් උල්ලංඝනය ට එරෙහිව ප්‍රබල ලෙස හඬ නගන්න. පරීක්ෂණ නියමාකාරයෙන් පැවැත්වීමෙන් ද, ඉහළ සමාජ තත්වයක සිටින දේශපාලන වරප්‍රසාද භුක්ති විඳින තැනැත්තන් ඇතුළු අපරාධකරුවන් කඩිනමින් අධිකරණය ඉදිරියට ගෙන ඒ මෙන් රජයට සිය වචන ක්‍රියාවට නැංවිය හැකිය.

-සියළුම මානව හිමිකම් උල්ලංඝනයන් හා අන්තර් ජාතික මානවීය නීතීය බිඳ දැමීම් ප්‍රසිධියේ ප්‍රකාශයට පත් කිරීමෙන් හා අපරාධකරු හෝ වින්දිතයා ගේ අනන්‍යතාවය හා දේශපාලන බලපෑම නොසලකා සිදුකරන ලද වැරදි සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම හා නඩු පැවරීම.

**අතීත වැරදි වලින් පාඩම් ඉගෙන ගැනීමත් එම වැරදි නිවරදි කර ගැනීම**

-ජනාධිපතිවරයා විසින් යුක්තිය පසඳලීමේ ක්‍රමය විමසුමට ලක් කිරීමට මුල පිරීමෙන් හා එම ක්‍රමයෙහි තිබෙන අසාර්ථිකත්වයත් ඊට ආදේශකයක් වශයෙන් හිටි අඩියේ පරීක්ෂණ කොමිසන් සභා පත් කිරීමත් ප්‍රමාණවත් නොවන බවත් ප්‍රසිදධියේ පිළි ගැනීම. මෙම විමර්ශනය පැහැදිලි අරමුණු හා කාල රාමුවක් සහිත අවංකවම රාජනුග්‍රහය ලබා දෙන්නක් විය යුතුය. අධිකරණ ක්‍රමයෙහි පවතින බොහෝ අඩුලුහුඩුකම් හා විභවයක් සහිත පිළියම් දැනටමත් පසුගිය පරීක්ෂණ කොමිසන් සභා මගින් හඳුනා ගෙන ඇත.

**මෙම විමර්ශනය විශේෂයෙන් ම;**

-නිසි පොලිස් පරීක්ෂණ, පරීක්ෂණ කොමිසන් සභා විමර්ශන, අධි චෝදනා ඉදිරිපත් කිරීම හා නඩු පැවරීම හා ජාත්‍යයන්තර අපරාධ පිළිබඳව විත්තිකරුවන්ට දඬුවම් කිරීම පිණිස බාධා කරන සැඟවුනු දෝෂ හෙළිදරව් කිරීම

-අයි අයි ජී ඊ පි විසින් ජනාධිපතිවරයාට ඉදිරිපත් කරන ලද වාර්තා ඇතළු මෙතෙක් රහස්‍ය ගනයේ ලා සලකා තබා තිබෙන සියළුම වාර්තා පරීක්ෂා කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම.

-අන්තර් ජාතික මානව අයිතිවාසිකම් පිළිබඳ නීතී හා ප්‍රමිතීන් අනුව යමින් ඉහත කී අඩුපාඩු නිවරදි කර ගැනීම පිණිස ව්‍යවස්ථාදයක, පරිපාලන හා ප්‍රයෝගික පියවරයන් යෝජනා කිරීම.

-මෙම විමර්ශන වාර්තාව ප්‍රසිධ කළ යුතුය.

-ඉහත සඳහන් පරීක්ෂණ කොමිසන් සභාවන් හි නිගමන හා නිර්දේශ සමග ඒවා ක්‍රියාත්මක කිරීම නිල වාර්තාවක් මගින් ප්‍රසිධ කිරීමත් මහජනයාට පහසුවෙන් ලබා ගැනීමට පහසුකම් සැලසීම.

-පරීක්ෂණ කොමිසන් සභා ඵලදායි ලෙස යුක්තිය පසඳලීමෙ හි ක්‍රමයවත්, අපරාධ පරීක්ෂණ හෝ අධිකරණ ක්‍රියා මාර්ගයක් වත් නොවන නමුත් කෙසේ වෙතත් එහි සොයා ගැනීම් ඉතාමත් සීමිත ආකාරයට වගවීම සහතික කිරීම පිණිස මහත් ලෙස දයක වෙයි. පරීක්ෂණ කොමිසන් සභා සහ අයි අයි ජී ඊ පි වාර්තා ප්‍රසිධ කළ යුතු අතර විමර්ශනය කිරීමට නියම කරන ලද සිද්ධීන් සම්බන්ධයෙන් රජය ගන්නා ක්‍රියා මාර්ගත් ශ්‍රී ලංකික මහජනතාවට ප්‍රකාශ කළ යුතුය. අපරාධ සම්බන්ධයෙන් අධි චෝදනා ඉදිරිපත් කිරීමට ඇතැම් විට වසර 10 ක 20 පමණ ප්‍රමාණයක කාලය ගැනීම කිසි සෙත් ම පිළි ගත නොහැක්කකි.

**අංග සම්පූර්ණ හා කාර්යක්‍ෂ අපරාධ පරීක්ෂණයන් සහතික වීම**

-මෙම වාර්තාවෙහි සවිස්තරව දක්වා තිබෙන සිද්ධීන් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ කඩිනම් කිරීමට හා ජාත්‍යයන්තර මානව හිමිකම් හා මානවීය නිති උල්ලංඝනය කළ සිද්ධීන් පරීක්ෂා කිරීම පිණිස ශ්‍රී ලංකා පොලිසියට අවශ්‍ය සහයෝගය ලබා දීම, එබඳු පරීක්ෂණ කඩාකප්පල් කිරීම පිණිස කටයුතු කරන්නන්ට නිති ප්‍රකාර කටයුතු කිරීම.

-ශ්‍රී ලංකාව තුළ මානව හිමිකම් උල්ලංඝනයන් විමර්ශනය කිරීමට පිළි ගත් සුදුසු යාන්ත්‍රණයක් නොමැත. ඉහත කි විමසුමේ කොටසක් වශයෙන් රජය එබඳු යාන්ත්‍රණයක් පිහිටු වීම ( ස්වාධින පැමිණිලි ඉදිරිපත් කිරීමේ කාර්යාලයක් එක් යොජනාවකි) පිණිස තිබෙන ඉඩකඩ සොයා බැලිය යුතුය. ඊට ස්වාධින පරීක්ෂණ පැවැත්වීමට බලතල ලබා දිය යුතු අතර මානව හිමිකම් කොමිසන් සභාව සමග සහයෝගයෙන් ක්‍රියා කිරීමේ ඉඩකඩ ලබා දිය යුතුය.

**ස්වාධින ප්‍රබල මානව හිමිකම් කොමිසන් සභාවක් පිහිටුවීම:**

-මෙම සහයෝගිතාව ඵලදායි එකක් වීමට නම් මානව හිමිකම් කොමිසන් සභාව සහයෝගය දීමත්, ශක්තිමත් කිරීම හා ස්වාධිනත්වයත් තහවුරු කළ යුතුවේ. මානව හිමිකම් කොමිසන් සභාව සෑම මානව හිමිකම් උල්ලංඝනයක් ම අපරාධයක් ලෙස සලකා ක්‍රියා කරමින් ඊට වගකිව යුතුය.

-17 වන ව්‍යවස්ථා සංශෝධනය හා එහි උප ලේඛනයට අනුව ක්‍රියාකරමින් මානව හිමිකම් කොමිසන් සභාවේ ස්වාධිනත්වය හා අපක්‍ෂපාතී බව ස්ථාපිත කිරීම.

-කොමිසන් සභාවට අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන සම්පූර්ණයෙන් ම සැපයීම මගින් මානව හිමිකම් පිළිබඳ උල්ලංඝනයන් ස්වාධිනව හා සර්ව සම්පූර්ණ ලෙස විභාග කරන බවට සහතික වීම.

-පරීක්ෂණයන් සහ නඩු පැවරීම පිණිස අවශ්‍ය තොරතුරු බාධාවකින් තොරව ලබා ගැනීමට විධිමත් ක්‍රමයක් පිහිට විය යුතුය. මානව හිමිකම් කොමිසන් සභාවේ ද නිර්දේශ ලබා ගෙන මෙම කාර්ය පටිපාටි නිතියානුකුල ලෙස ස්ථාපිත කළ යුතුය.

-මානව හිමිකම් කොමිසන් සභාවේ ස්වාධිනත්වයට හානියක් නොවන පරිදි මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳව කටයුතු කිරීමට ශ්‍රී ලංකා පොලිසිය, නිතිපති දෙපාර්තමේන්තුව අතර පැහැදිලිව නිර්වචනය කළ නිතිරිති පදනම් කොට ගත් සහයෝගිතාවයක් පිහිට විය යුතුය. මෙම මග පෙන්වීම් මහජනතාව ගේ දැන ගැනීම පිණිස ප්‍රකාශයට පත් කළ යුතු අතර එමගින් පැමිණිලි විභාග කිරීම හා අධිචෝදනා ඉදිරිපත් කරන ආකාරය පිළිබඳව ඔවුහු මැනවින් දැනුවත් වනු ඇත.

-මානව හිමිකම් කොමිසන් සභාව සිය කාර්ය මන්ඩලය බිම් මට්ටමේ සිට අධීක්ෂණය කළ යුතු අතර එමගින් මානව හිමිකම් මුලධර්මයන්ට අනුගත සිය කටයුතු තුළ වෘත්තීයමය භාවයක් තබා ගත යුතුය.

**දඬුවමින් නිදහස් කිරීම හා වින්දිතයින්ට යුක්තිය සහතික කිරීම**

-සෑම ආකාරයකම මානව හිමිකම් උල්ලංඝනයන්, ජාත්‍යයන්තර මානව හිමිකම් හා මානවීය නිතීය අනුව යමින් අපරාධකරු ගේ අනන්‍යතාවය නොසලකා කඩිනමින් ස්වාධිනව හා අපක්ෂපාතව සම්පූර්ණයෙන් ම විභාග කළ යුතුය.

-පොලිස් විශේෂ විමර්ශන ඒකකය ශක්තිමත් කොට පුළුල් කළ යුතු අතර ස්ථිර පදනමක් මත මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ පැමිණිලි විභාග කිරිමේ ඒකකයක් ඇති කොට ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කළ යුතුය. මෙම ඒකකයේ නිලධාරින්ට මානව හිමිකම් උල්ලංඝනයන් පිළිබඳ පරීක්ෂණ හැර අන් කිසි රාජකාරියක් නොපැවරිය යුතුය.

-ශ්‍රි ලංකාවේ නිතී විශෙෂඥයින් විසින් මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කොට ඇති නිර්දේශ සලක්ෂක්ෂක්ෂබැලිය යුතු අතර ඉහත කි ඒකකය නිතිපති දෙපාර්තුමේන්තුවේ මේ කාර්ය සඳහාම නම් කළ සහ අනෙක් රාජකාරියක් නොපැවරූ ( ඒ නිසාම උවමනාවන් ගේ ගැටුමක් ඇති නොවන) නිලධාරින් විසින් අධික්ෂණය කළ යුතුය.

-පොලිසියේ හා ත්‍රිවිධ හමුද නිලධාරින් විසින් සිදු කරන ලද මානව හිමිකම් උල්ලංඝනය කිරිමට සම්බන්ධ යැයි චෝදනා ලැබුන විට එම චෝදනාවන් රාජ්‍ය ආයතන විසින් විමර්ශනය කිරිම, අධි- චෝදනා ඉදිරිපත් කිරිම හා අප්‍රමාදව දඩුවම් කිරිම බල පවත්නා නිතිය යටතේත්, ජාත්‍යන්තර වශයෙන් පිළි ගත් යුක්තිය පිල්බඳ මුල ධර්මයට අනුව කළ යුත්තේය. පොලිස් නිලධාරින් ගේ බරපතළ හිංසනයන් හා විෂමාචාරයන් පිළිබඳව අධික්ෂණය කිරිමටත්, මහජන පැමිණිලි සාර්ථකව ලබා ගැනිම සඳහා ක්‍රියා කිරිමට 17 වන ව්‍යවස්ථා සංශෝධනය 15 ජී (2) යටතේ ජාතික පොලිස් කොමිසමට තිබෙන අධිකාරියක් තිබේ.

-පොලිස් නිලධාරින් ගේ විනය පරීක්ෂණ පිළිබඳ බලතල පොලිස්පති වරයාට පවරා නොදිය යුතුය. ඒ අතරම ජාතික පොලිස් කොමිසන් සභාව විසින් හිංසනයන් සහ විෂමාචාර යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද සහ තමන් සිය විමර්ශනයන් කරන්නේ කෙසේ ද යන්න හා වැරදිකරුවන්ට කවර ආකාරයක දඩුවම් ලබා දෙන්නේ ද යන්න පිළිබඳ පැහැදිලි විස්තරයක් නිකුත් කර තිබිය යුතුය.

-ශ්‍රි ලංකාවේ මානව හිමිකම් ආරක්ෂකයන් නිරන්තරයෙන් පෙන්වා දුන් පරිදි, මානව හිමිකම් කොමිසන් සභාව හා ජාතික පොලිස් කොමිසන් සභාව සිය ප්‍රාදේශිය කාර්යාල කාර්ය මන්ඩලය හා එම කාර්යාලයන් හි කටයුතු දැඩිව අධික්ෂණය කළ යුතුවා පමනක් නොව උපරිම සහයෝගයක් ද ලබා දිය යුතුවේ. බිම් මට්ටමේ විශ්වාසයක් නොමැති විම මෙම කොමිසන් සභා දෙකෙහිම බලපෑම යටපත් කිරිමට හේතු වෙයි. අනිත් අතට මෙම ආයතනයන් ගේ කාර්යක්ෂම ක්‍රියාකාරිත්වය මගින් මහජන පැමිණිලි සටහන් කර ගැනිම හා පරීක්ෂණ පැවැත්විම ඉහළ දමා ගැනිමට ද එය හේතුවක් වෙයි.

-සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිමේ ක්‍රමයක් නොමැති නිසා මානව හිමිකම් පිළිබඳ අධිචෝදනා ඉදිරිපත් කිරිමට බාධාවක් පමණක් නොව අනාගත උල්ලංඝනයන් වළක්වා ගැනිමට ද එය බාධාවක් වෙයි. සාක්ෂිකරුවන් ආරක්ෂා කිරිමේ වැඩ පිළිවෙළකට සම්පත් ප්‍රමාණවත් ව ලබා දිය යුතු අතර සැලකිල්ලෙන් ආයතන ගත කිරිම කළ යුතුවා පමණක් නොව තාක්ෂණික ආධාර ද ප්‍රමාණවත්ව ලබා දිය යුතුය.

-ශ්‍රි ලංකාවේ අධිකරණ ඉතිහාසය තුල සාක්ෂි විමසිම සඳහා විඩියෝ තාක්ෂණය භාවිතා කරන ලද්දේ මෙම පරීක්ෂණ කොමිසන් සභාව විසින් වන අතර ඇම්නස්ටි ඉන්ටර්නැෂනලය එම මුලික පියවර ඉතාමත් අගය කරයි. විඩියෝ තාක්ෂණය ඔස්සේ සාක්ෂි ලබා දෙන විට සාක්ෂිකරු ගෙන් ඔහු හෝ ඇය එම මොහොතේ සිටින ස්ථානය පිළිබඳව හෝ වෙනත් සංවේදි ප්‍රශ්න කිරිම තහනම් කරන පරිදි දන්ඩ නිති සංග්‍රහය සංශෝධනය කිරිම සලකා බැලිම සුදුසුය.

-මානව හිමිකම් පිළිබඳ උල්ලංඝන යන් හි වින්දිතයන් සහ ජාත්‍යයන්තර මානවීය නිතීය යටතේ වන්දි ලබා ගැනිම, හානිපූරණය, පුනරුථාපනය ඇතුලත් ව සතුටුදයක මෙන් ම පුනරුච්චානය නොවන ජාත්‍යයන්තර ප්‍රමිතින් ට අනුකුලව සකස් කළ වැඩපිළිටවෙලක් තිබිය යුතුය.

**නිතිමය වෙනස්කම් මුල පිරිම**

-ශ්‍රි ලංකාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සංශෝධන ඉදිරිපත් කිරිම පසුපස හඹා යමින් ජීවත් විමට ඇති අයිතිය ව්‍යවස්ථානුකුල අයිතියක් ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුලත් කර ගැනිමටත්, බලහත්කාරයෙන් පැහැර ගෙන යාම දන්ඩ නිති සංග්‍රහය යටතේ වරදක් බවට පත් කිරිමටත්, අණ දිමේ වගකිම පිළිබඳ ජාත්‍යයන්තර නිති මුලධර්මය අපරාධ විධිවිධාන සංග්‍රහය යටතේ පිළි ගැනිමත් සිදු කර ගත යුතුය.
-ජාත්‍යයන්තර නිතීය හා ප්‍රමිතීන් උල්ලංඝනය කරන හදිසි නිතී රෙගුලාසි සංශෝධනය හෝ අවලංගු කිරිම විශේෂයෙන්ම ජාත්‍යයන්තර නිතීයට අනුව අපරාධකරුවන් දඩුවමින් නිදහස් කිරිම බරපතළ වරදක් ලෙස සලකා අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කිරිම.

**ජාත්‍යයන්තර සම්මුතීන් පිළිගැනිමඃ**
-ඕනෑම පුද්ගලයෙක් බලහත්කාරයෙන් පැහැර ගෙන යාමෙන් ආරක්ෂා කිරිම පිළිබඳ අන්තර ජාතික සම්මුතිය පිළිගැනිම
-වධහිංසා පැමිණ විම සහ වෙනත් ආකාරයක කෲර අමානුෂික හෝ ගර්හිත සැලකිල්ලකට හෝ දඩුවමකට භාජනය කිරිමට එරෙහි වෛකල්පිත සම්මුතිය පිළිගැනිම
-අන්තර් ජාතික අපරාධ අධිකරණය පිළිබඳ රෝම ආඥාව පිළිගැනිම
-එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් කමිටුව අදළ අවස්ථාවන් හි දි ඉදිරිපත් කරන අදහස් හා යෝජනා කරන වෙනස්කම් නිතීමය වශයෙන් පිළිගෙන ක්‍රියාත්මක කිරිම

**නායකත්වය, සම්පත් හා දේශපාලන අධිෂ්ඨානය ද සපයමින් වර්තමාන ශ්‍රි ලංකාවේ අතුරුදහන් වු තැනැත්තන් වෙනුවෙන් වගකිව යුත්තන් හට වගකිම බාර ගන්නා ලෙසට බලකරන්නැයි ඇම්නස්ටි ඉන්ටර්නැෂනලය ජාත්‍යයන්තර ප්‍රජාව ගෙන් ඉල්ලා සිටියි.**
විසිවසරක් තිස්සේ ජාත්‍යයන්තර ප්‍රජාව ඉදිරියේ ප්‍රදර්ශනය කළ මනබන්දනීය ඉන්ද්‍රජ තවදුරටත් විශ්වාස නොකිරිමට කාලය එළඹ තිබේ. ශ්‍රි ලංකාව කිසි විටෙකත් දඩුවමින් නිදහස් කිරිම තමන් විසින් ම විසද ගැනිමට හැකියාවක් හෝ කැමැත්තක් නැත. ඇත්ත වශයෙන් ම පසුගිය දශකය තුල ඉතාමත් වැදගත් අධිකරණ යාන්ත්‍රණයන් ක්‍රමානුකුලව කඩා බිඳ දමනු ලැබින. ජාත්‍යයන්තර ප්‍රජාව සිය වැදගත් ඨානාන්තර ශ්‍රි ලංකා බලධාරින්ට බලපෑම් කිරිමට පාවිච්චි කළ යුතුය.
-ජාත්‍යයන්තර මානව හිමිකම් හා ජාත්‍යයන්තර මානවීය නිතීය පිළිබඳ පසුගිය උල්ලංඝනයන් විභාග කිරිම, සාධාරණත්වය පිළිබඳ ජාත්‍යයන්තර ප්‍රමිතීන්ට අනුව පවත්වන සැසිවාර මගින් සැකකාර

අපරාධකරුවන්ට අධි චෝදනා ඉදිරිපත් කිරිම සහ වින්දිතයින් සඳහා වන්දි ගෙවීමත් අනාගත උල්ලංඝනයන් වළක්වා ලිමත් පිණිස ක්‍රියා කිරිම.

-මෙම ගමන් පථය වෙනස් කිරිම පිණිස අවශ්‍ය ප්‍රතිසංස්කරණ ඉදිරියට ගෙන යාමත්, දඬුවමින් නිදහස් කිරිම පිළිබඳව ශ්‍රි ලංකාවේ ප්‍රගතිය අධීක්ෂණය පිණිස ඉහත සඳහන් නිර්දේශයන් පදනම් කොට ගත් ආරම්භක ලක්‍ෂයන් පිහිටුවා ගැනිම.

-බරපතළ මානව හිමිකම් උල්ලංඝනයන් විමර්ශනය කිරිමට පමණක් නොව, මානව හිමිකම් අධීක්ෂණය පිළිබඳ වැඩ පිළිවෙළක්ද, පශ්චාත් යුද්ධ තත්වයකට උපකාර විම හා වගවීම පිළිබඳව අත්‍යවශ්‍ය ප්‍රතිසංස්කරණ හා වැඩි දියුණු කිරිම් සම්පුර්ණ කර ගැනිම පිණිස යුක්තිය පසඳලිමේ ජාතික මට්මමේ ආයතනයන්ට සාහය විම පිණිසත් ස්වාධින බිම් මට්ටමේ විමර්ශනයන් පැවත්විම සඳහා පූර්ණ බලතල සහිත ක්‍ෂෙත්‍ර අධීක්ෂණය විධික් ක්‍රමයක් පිහිටුවිම.

-ස්වාධිනත්වය සහතික කර ගැනිම පිණිස එබඳු ඒකකයක් අනිවාර්යෙන් ම ජාත්‍යයන්තර මැන්ඩේටයක් මගින් බල ගැන්විය යුතු අතර එය කිසිසේත්ම ජනාධිපති මැන්ඩේටයක් නොවිය යුතුය. වඩාත් අර්ථවත් හා වගකිමෙන් යුක්ත අධිකරණ ක්‍රමයක් සඳහා වන මෙම සංක්‍රාන්තියට උපකාරයක් විම පිණිස සියළු පාර්ශවයන් විසින් සිදුකරන හිංසනයන් අධීක්ෂණය කිරිම, සිවිල් වැසියන් ආරක්‍ෂා කිරිම සහ දේශිය ආයතනයන් ගේ ධාරිතා වර්ධනය පිණිස උපකාර කිරිම සඳහා එක්සත් ජාතීන් ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය විසින් ක්‍ෂෙත්‍ර කාර්යාල පිහිට විය යුතුය.

## උපග්‍රන්ථය 1

**මානව හිමිකම් හා ජාත්‍යයන්තර නිතීය උල්ලංඝනයන් පිළිබඳ විමර්ශන කොමිසන් සභා සඳහා මග පෙන්විමේ මුල ධර්ම**[111]

1. **පිහිටුවිමඃ නිපුණත්වය, ස්වාධිනත්වය සහ අපක්ෂපාතිත්වයඃ**

- කොමිසන් සභාවේ සාමාජිකයින් තෝරා ගත යුත්තේ ඔවුන් ගේ පුද්ගලයන් ලෙසට පිළිගත් අපක්ෂපාතිත්වය හා නිපුණත්වයන් මත වන අතර විමර්ශනයට භාජනය වන ආයතන, ඒජන්සි හෝ පුද්ගලයන් සම්බන්ධයෙන් කිසිදු ආකාරයක බැඳිමකින් තොර විම.
- කොමිසන් සභාවට ඇතුලත් කර ගන්නා තැනැත්තන්, මානව හිමිකම් ආරක්‍ෂා කිරිම හා ප්‍රවර්ධනය කිරිම සම්බන්ධයෙන් පමණක් නොව ජාත්‍යයන්තර මානව හිමිකම් හා මානවීය නිතීය සම්බන්ධයෙන් ද ඔවුන් ගේ ප්‍රත්‍යක්‍ෂය වු විශේෂඥභාවය, දැනුම හා අත්දැකිම් මත තෝරා ගත යුතුය.
- සිවිල් සමාජ සංවිධාන විශේෂයෙන් ම මානව හිමිකම්, වින්දිත කන්ඩායම්, කාන්තා කන්ඩායම් සහ අනෙකුත් සුළුතර කන්ඩායම් යන ක්‍ෂෙත්‍රයන් හි නියුතු රාජ්‍ය නොවන සංවිධාන කොමිසන් සභා සාමාජිකයින් තෝරා ගැනිම හා පත් කිරිමේ ක්‍රියාවලියට සහභාගී කර ගත යුතුය.
- නිපුණත්වය, අපක්ෂපාතිත්වය හා ස්වාධිනත්වය පිළිබඳ මේ හා සමාන මිනුම් දන්ඩක් කොමිසන් සභාවේ වෘත්තීය පරිපාලන කාර්ය මන්ඩලය තෝරා ගැනිමේ දි ද භාවිතා කළ යුතුය..

[111] වැඩිවිස්තර සඳහා බලන්න ශ්‍රිලංකාඃ ශ්‍රි ලංකාව මානව හිමිතම් හා ජාත්‍යයන්තර නිති බරපතළ ලෙෂ උල්ලංඝනය කිරිම් පිළිබඳ
විමර්ශනය පිණිස පිහිටුවන ලද කොමිසන් සභාවඃ ඇම්නස්ටි ඉන්ටර්නැෂනලය විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ, AI Index: ASA37/031/2006,14 සැප්තැම්බර් 2006 www.amnesty.org/en/lib¾ry/info/ASA37/031/2006

- අපක්ෂපාතිත්වය හා ස්වාධීනත්වය සහතික කිරීම පිණිස කොමිසන් සභාවේ මූල්‍ය ස්වාධීනත්වය ද සහතික කළ යුතුය.

2. මැන්ඩේටය

අ. *විෂය පථය පිළිබඳ මැන්ඩේටයඃ විමර්ශනයට ලක් කළ යුතු උල්ලංඝනයන් වර්ග*

- කොමිසන් සභාවට අන්තර් ජාතික මානව හිමිකම් සහ මානවීය නීතිය හා අදාළ හිංසනයන් පිළිබඳ බරපතළ උල්ලංඝනයන් සම්පූර්ණයෙන් ම විමර්ශනය සඳහා මැන්ඩේටයක් ලබා දිය යුතුය.(උදා බලහත්කාරයෙන් පැහැර ගෙන ගොස් වධ හිංසනයන් ට භාජනය කිරීම)
- කොමිසන් සභාව ගොනු කර ගත් තොරතුරු තක්සේරු කිරීමේ දී ජාත්‍යයන්තර මානව අයිතීන් හා මානවීය නීතිය පිළිබඳ කෝණයෙන් පමණක් නොව අදාළ ස්වදේශීය නීතිය ද සලකා බැලිය යුතුය.
- කොමිසන් සභාව විසින් රජයේ හමුදා විසින් වේවා අනෙකුත් ආයුධ සන්නද්ධ කන්ඩායමක් විසින් වේවා සිදු කරන ලද සියළුම ආකාරයේ බරපතළ උල්ලංඝනයන් විමර්ශනය කළ යුතු අතර ඊට මිලිටරි හා සිවිල් අණ දෙන්නන් ද, සැලසුම් කිරීමෙන්, අණ දීමෙන් හෝ සාහය වීමෙන් යන කවර ආකාරයකින් හෝ සම්බන්ධ වුවන් පිළිබඳව කරන විමර්ශනයන් ඇතුලත් විය යුතුය.
- කොමිසන් සභාවට අවශ්‍ය නම් අනාගතයේ දීත් සිදු කළ යුතු විමර්ශනයන් හා පරීක්ෂණ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමට මැන්ඩේටයක් තිබිය යුතුය.
- කොමිසන් සභාව සිය වාර්තාවේ ජාත්‍යයන්තර මානව හිමිකම් හා මානවීය නීතිය උල්ලංඝනයන් විශේෂයෙන් නීතී ආයතනික ව්‍යුහයන් ප්‍රතිපත්ති හා භාවිතයන් ඇතුළු සාධක ද විචාර ශිලි ලෙස සළකා බැලිය යුතුය.

*ආ. කාල රාමුව*

- කොමිසන් සභාවේ මැන්ඩේටයෙ හි එම කොමිසන් සභාව සිය කටයුතු අවසාන කළ යුතු කාලය සහ වාර්තාව ඉදිරිපත් කළ යුතු කාල වකවානු දක්වා තිබිය යුතුය.
- කොමිසන් සභාව විසින් අඛන්ඩව සහ නිතරම සිය ප්‍රගතිය, මුහුණ දුන් බාධක සංක්ෂප්තව දක්වන අතුරු වාර්තා ප්‍රකාශයට පත් කළ යුතු අතර ඊට වින්දිතයින් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම හා අධි-චෝදනා ඉදිරිපත් කිරීම පිළිබඳ තොරතුරු ඇතුලත් විය යුතුය.

3. බලතල

*අ. පුළුල් විමර්ශනාත්මක බලතල*

- යම් කිසි විමර්ශනයක් සඳහා අවශ්‍ය සියළු ම තොරතුරු ලබා ගැනිමේ බලය කොමිසන් සභාව සතු විය යුතුය. 4 (ආ) කොටසෙහි සවිස්තරව දක්වා ඇති පරිදි රාජ්‍ය නිලධාරින් ඇතුළු සාක්ෂිකරුවන් කැඳවීමේ හා ඔවුන් ගේ සහයෝගය ලබා ගැනිම සඳහා වන බලතල ද, ලියවිලි ඉදිපත් කිරිමට ඉල්ලා සිටිමේ බලයද මීට ඇතුලත්ය. මීට අමතරව කොමිසන් සභාවට සිය නියෝගයන් පිළි නොගන්නා විට ඔවුන්ට දඩුවම් පැමිණ විමේ බලය ද තිබිය යුතුය.
- කොමිසන් සභාව විසින් යම් තොරතුරක් අවශ්‍ය යැයි සලකා ඉල්ලා සිටි විට ලේඛනාරක්ෂගාර, වෙනත් වාර්තා සහ රාජ්‍ය නිලධාරින් ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ සාමාජිකයින් දෙන ලද වාචික සාක්ෂි ඇතුලත් ව එම තොරතුරු ඊට සපයා දූන් බවට රජය සහතික විය යුතුය.

- දඩුවමින් නිදහස් වීම පිටු දැකීම පිණිස ජාත්‍යයන්තර නිතීය යටතේ රාජ්‍යය වගකීම කොමිසන් සභාව විසින් යලි සහතික කළ යුතුය. මෙම වගකීමට ජාත්‍යයන්තර නිතියට අනුව අපරාධ විමර්ශනය සහ යම් කිසි අවස්ථාවකදී ප්‍රමාණවත් සාක්ෂි ඇත්නම්, සාධාරණත්වය පිළිබඳ ජාත්‍යයන්තර ප්‍රමිතීන්ට අනුව සැකකාර අපරාධකරුවන් ට අධි-චෝදනා පත්‍ර ලබා දී අධිකරණය ඉදිරියට පැමිණ විය යුතු අතර වැරදිකරුවන් වන අයට කිසිම අවස්ථාවක මරණීය දන්ඩනය හෝ ඊට සමාන වෙනත් හිංසාකාරී අමානුෂික අවමන් සහගත දඩුවමකට ලක් නොකළ යුතුය.
- ජාත්‍යයන්තර නිතීයට අනුව කොමිසන් සභාව කිසිම අවස්ථාවක, එම නිතීය යටතේ අපරාධයක් සිදු කළ තැනැත්තෙකුට පොදු සමාවක්, දඩුමින් නිදහස් කිරීමක් හෝ ඊට සමාන වෙනත් පියවරක් නිර්දේශ නොකළ යුතුය.

**4. කාර්ය කරණය සහ කාර්ය පටිපාටීන්**

*අ. විවෘත හා ප්‍රසිධ විමර්ශන*

- මූල ධර්මයක් වශයෙන්, පරීක්ෂණ කොමිසන් සභාවේ සෑම කටයුත්තක් ම මහජනයා සඳහා විවෘත විය යුතුය. හැකි සෑම අවස්ථාවකම කොමිසන් සභාවේ සැසිවාර හා සිය අධිගමනයන්ට පදනම් කොට ගත සාක්ෂි ද ජන මාධ්‍යයන්ට හා මහජනයාට විවෘත විය.
- යම් කිසි සැසිවාරයකින් සම්පූර්ණයෙන්ම හෝ ඉන් කොටසකින් ජන මාධ්‍ය හා මහජනයා සංවෘතව තබමින් වින්දිතයින් හා සාක්ෂිකරුවන් ගේ අනන්‍යතාවය ආරක්ෂා කළ යුතු අවස්ථාවක දී, වින්දිතයෙක් හෝ සාක්ෂිකරුවෙක් ගේ ඉල්ලීම අනුව කොමිසන් සභා වාර්තාවෙන් යම්කිසි තොරතුරක් ඉවත් කිරීමට ඉල්ලා සිටි අවස්ථාවක, ඔවුන් ආරක්ෂා කිරීම පිණිස එබඳු පියවරයන් අවශ්‍ය යැයි හැඟී ගිය අවස්ථාවක කොමිසන් සභාවට එසේ කළ හැකිය. වින්දිතයෙකු, සාක්ෂිකරුවෙකු හෝ සැකකාර අපරාධකරුවෙකු ගේ ආරක්ෂාව හෝ වෙනත් කිසියම් අයිතිවාසිකමක් ආරක්ෂා කිරීම පිණිස සාක්ෂි විමසීම ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ කළ යුතු ද නැද්ද තීරණය කිරීමේ අභිමතානුසාරී බලයක් කොමිසන් සභාව සතුය.

*ආ. වින්දිත කේන්ද්‍රීය ප්‍රවේශයක්*

- සියළුම වින්දිතයන් හට මානුෂික ලෙස සැලකිය යුතු අතර ඔවුන්ට ඵලදායි ආරක්ෂණ යාන්ත්‍රණයක් හා සහයෝගයක් සහතික විය යුතුය.
- පැමිණිලි කරුවන් සාක්ෂිකරුවන් විමර්ශන පවත්වන නිලධාරින සහ යම් කිසි ආකාරයකට පරීක්ෂණ කොමිසන් සභා හා සම්බන්ධ තැනැත්තන් ප්‍රචන්ඩත්වයෙන් හෝ වෙනත් ආකාරයක බිය ගැන්වීම් වලින් ආරක්ෂා කළ යුතුය.
- වින්දිතයින්, සාක්ෂිකරුවන්, ඔවුන් ගේ පවුල් වල සාමාජිකයින් සහ විමර්ශනයන් හා සම්බන්ධ කාර්ය මන්ඩලය ද මෙම ක්‍රියාවලිය හා සම්බන්ධ වෙනත් තැනත්තන් ආරක්ෂා කිරීමේ වැඩ පිළිවෙළක් ගොඩ නැගීමට හා ක්‍රියාත්මක කිරීම පිණිස සියළු ආකාරයකම අවශ්‍ය මානව හා භෞතික සම්පත් කොමිසන් සභාව වෙත මුදා හැරිය යුතුය.

- කවර ආකාරයක ආරක්ෂක පියවරයන් ගත යුතු ද යන්න තීරණය කිරිමේ දී කොමිසන් සභාව වින්දිතයින් ගේ සහ සාක්ෂිකරුවන් ගෙන් තමන් ට අවශ්‍ය කවර ආකාරයක ආරක්ෂාවක් ද යන්න පිළිබඳ ව අදහස් ලබා ගත යුතු අතර සපයනු ලබන ආරක්ෂාව ඔවුන් විසින් දරන අවදනමට තරම් සරිලන එකක් විය යුතුය.
- වින්දිතයෙක්, සාක්ෂිකරුවෙක් හෝ පරීක්ෂණ කොමිසන් සභාවේ ආරක්ෂාව ලබන වෙනත් කිසියම් තැනැත්තෙක් තමාට ලබා දි ආරක්ෂාව පිළිබඳව සෑහිමට පත් නොවන්නේ නම් එවැනි තැනැත්තන් හට සිය පැමිණිලි ඉදිරිපත් කොට සහනයක් ලබා ගැනිම පිණිස යම්කිසි වැඩ පිළවෙළක් කොමිසන් සභාව විසින් පිහිට විය යුතුය.
- තහනම් නියෝග නිකුත් කිරිම හෝ යම්කිසි තැනැත්තෙකු ගේ රාජකාරිය අත්හිටුවිම නැත්නම් ස්ථාන මාරු කිරිම සඳහා අධිකාරිය කොමිසන් සභාවට ලබා දිය යුතුය. එවිට කිසියම් වින්දිතයෙක් සාක්ෂිකරුවෙක් ඔවුන් ගේ පවුල් වල තැනැත්තන් හෝ පොලිස් රැකවරණයක් නියම කළ විට ඔවුන් ගේ අනන්‍යතාවය හෝ පදිංචි ස්ථානය හෙළිදරව් කිරිමෙන් වැළකිය යුතු අතර ආරක්ෂාව ලබන තැනැත්තන්ට අවශ්‍ය වෛද්‍ය හෝ මනෝවිද්‍යාත්මක ප්‍රතිකාර සපයන බවට සහතිකයක් කොමිසන් සභාවට තිබිය යුතුය.

*ඇ. සාධාරණ ක්‍රියාපටිපාටි*

සියළුම සාක්ෂිකරුවන්ට චුදිත අපරාධකරුවන්ට මෙන් ම අනෙකුත පුද්ගලයන් ට කොමිසන් සභා ක්‍රියාපටිපාටියේ සෑම අදියරක දිම අනෙකුත කාරණා අතර පහත සඳහන් අයිතීන් ද සහතික කළ යුතුය.

- වෙනස්කම් නොකිරිමට එරෙහි අයිතිය.
- සුදුසුකම් ලැබු ස්වාධින අපක්ෂපාති මන්ඩලයක් විසින් පවත්වන සාධාරණ හා ප්‍රසිද්ධ විභාගයක් පිළිබඳ අයිතිය.
- තමාට එරෙහිව තමා ගේ ම සාක්ෂි ලබා ගැනිමට හෝ තමාට වරද පිළි ගන්නට බල නොකර සිටිමේ අයිතිය.
- වධහිංසාවන් ට වෙනත් කෲර අමානුෂික අවමන් සහගත සැලකිලි වලට හෝ දඩුවම් වලට ඕනෑම ආකාරයක බල කිරිමකට තැති ගැන්විමකට හෝ තර්ජනයකට භාජනය නොවි සිටිමේ අයිතිය.
- කොමිසන් සභා වැඩ කටයුතු වලදි පාවිච්චි කරනු ලබන භාෂාව වටහා ගැනිමට නොහැකි නම් ගාස්තුවකින් තොරව භාෂා පරිවර්තකයෙකු ගේ සාහය ලබා ගැනිමේ අයිතිය.
- තමන්ට එරෙහිව ඉදිරිපත් කරනු ලබන චෝදනා පිළිබඳ විස්තර කල් තබා දැන ගැනිමේ අයිතිය.
- තමන් වෙනුවෙන් පෙනි සිටිමට තිබෙන අයිතිය හා අදළ වන අවස්ථාවන් හි දි තමන් වෙනුවෙන් නිතිඥ සහාය ලබා ගැනිමට තිබෙන අයිතිය

- නීතිය මගින් වැරදිකරුවකු යැයි ඔප්පු කරන තෙක් තමා නිවරදිකරුවෙක් ලෙස පිළි ගැනිමට තිබෙන අයිතිය.
- කොමිසන් සභාවේ තීරණ තමා කෙරෙහි බරපතළ අන්දමින් බලපවත්වන්නේ නම් අධිකරණ විමර්ශනයක් ලබා ගැනිමට තිබෙන අයිතිය.
- වයස අවුරුදු 18 අඩු  බාල වයස්කාරයින් සම්බන්ධයෙන් වන සිද්ධින් හි දි ක්‍රියා පටිපාටින් ඔවුන් ගේ වයස සැලකිල්ලට ගත යුතු අතර හැකි සෑම අවස්ථාවක දිම ඔවුන් පුනරුත්ථාපනය කිරිම කෙරෙහි අවධානය යොමු කළ යුතුය.

*ඊ. සාක්ෂි එකතු කිරිම හා ප්‍රකාශ ලබා ගැනිම*

- කොමිසන් සභාව විසින් ලබා ගැනිමට හැකි සෑම ආකාරයකම තොරතුරු එනම් විධිමත් අවිධිමත් බිම් මට්මමේ ජාතික හා ජාත්‍යයන්තර සහ වාචික හා ලිඛිත සහ සමාජයේ ඉතාමත් පුළුල් පිරිසක ගේ සාහය ලබා ගැනිම වින්දිතයින් හා ඔවුන් ගේ පවුලේ උදවිය විසින් දෙනු ලබන ( රට තුළ මෙන් ම විදේශ ගත ව ) ප්‍රකාශ හා තොරතුරු ජාතික හා අන්තර් ජාතික මානව හිමිකම් සංවිධාන හා ඒ වන විට නිම කොට ඇති පර්යේෂණ වාර්තා ලබා ගත යුතුය.
- උනන්දුවක් දක්වන සෑම පාර්ශවයකටම සාක්ෂි ඉදිරිපත් කිරිමට අවස්ථාවක් ලබා දිය යුතුය.
- කොමිසන් සභාව විසින් යම්කිසි සාක්ෂිකරුවෙකු විදේශ ගත විම නිසා පළි ගැනිමකට ලක් වේයැයි තිබෙන බිය නිසා හෝ වෙනත් සාධාරණ හේතුවක් මත ඉල්ලා සිටි විටක විශේෂ සාකච්ඡාවක් සංවිධානය කිරිම හා ලිඛිත ප්‍රකාශ ඉදිරිපත් කිරිමට ඉඩ දිම සලකා බැලිය යුතුය. සාක්ෂිකරුවන් ගෙන් ප්‍රශ්න කිරිම ඉතාමත් නම්‍යශිලි විය යුතු අතර උපරිම සාක්ෂි ප්‍රමාණයක් ලබා ගැනිම පිණිස සාක්ෂිකරුවන්ට අවස්ථානුකුලව ඔබින ක්‍රමවේදයන් හැඩ ගසා ගත යුතුය.
- කොමිසන් සභාව ඉතාමත් සැලකිල්ලේන් ලැබුන සියළු තොරතුරු ඇගයිමකට ලක් කළ යුතු අතර විශේෂයෙන් ම යම්කිසි තැනැත්තෙක් විසින් කොමිසන් සභාව සිය පෞද්ගලික උවමනා එපාකම් පිණිස කොමිසන් සභාව පාවිච්චි කරනු ලබන්නේ ද යන්න සොයා බැලිය යුතුය.

*ඉ. තොරතුරු ප්‍රසිධ කිරිම හා අධ්‍යාපනික වැඩ සටහන්*

- කොමිසන් සභාව විසින් රාජ්‍ය නොවන සංවිධාන නියෝජිතයින් අනෙකුත් අදළ රාජ්‍ය නොවන ආයතන සහ ජන මාධ්‍ය සමග අවශ්‍ය සම්බන්ධතා ගොඩ නගා ගත යුතු අතර සිය තොරතුරු එමගින් ප්‍රසිද්ධ කිරිම හා තොරතුරු ලබා ගැනිමටත් ක්‍රියා කළ යුතුය.
- කොමිසන් සභාව පිහිටුවිම සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කළ යුතු අතර අදළ ජන මාධ්‍යයන් හරහා සිය විෂය පථය ප්‍රකාශයට පත්

කළ යුතුය. එබඳු ප්‍රකාශයක මහජනතාවට තොරතුරු ලබා දීමට ආරාධනය කළ යුතු අතර තොරතුරු සැපයීම පිණිස අවශ්‍ය මග පෙන්වීම ද කළ යුතුය.

- කොමිසන් සභාවේ සැසිවාර සජීවී ලෙස විකාශනය කිරීම සලකා බැලිය යුතු අතර වින්දිතයින් සාක්ෂිකරුවන් හා අපරාධකරුවන් විෂයෙහි එය බලපෑ හැකි ආකාරය නිතරම විමර්ශනය කළ යුතුය.

**5. වාර්තාකරණය වන්දි ගෙවීම හා අධිචෝදනා ඉදිරිපත් කිරීම**

*අ. අවසාන වාර්තාව නිර්දේශ හා තොරතුරු බෙදා හැරීම*

- කොමසාරිස්වරුන් ගේ අවසාන වාර්තාව සියළු විමර්ශනයන් සැසිවාර හෙළිදරව් කර ගැනීම් සහ අධිචෝදනා ඉදිරිපත් කිරීම පිණිස නිර්දේශ ඉදිරිපත් කිරීම ඇතුළු කොමිසන් සභාවේ සියළු කටයුතු ආවරණය කොට තිබිය යුතුය. අවසාන වාර්තාවේ හි
  - o කොමිසන් සභාවේ මැන්ඩේටය හා කාර්ය සාධනය
  - o සාක්ෂි ඇගයීම පිණිස අනුගමනය කළ ක්‍රියා පටිපාටිය හා ක්‍රම වේදය සහ ඒ සඳහා පදනම් කොට ගත් නිතී
  - o අදළ සමාජ දේශපාලන හා ආර්ථික තත්වය සහ රජය ඇතුළු අනෙකුත් ආයතනයන් මගින් අවශ්‍ය නිසි සහයෝගය කළට වේළාවට ලැබුනේ ද යන්න ඇතුළු ව විමර්ශනයන් පිළිබඳ පසුබිම
  - o සිය හෙළිදරව් කිරීම් සඳහා පදනම් කොට ගත් දත්ත හා තොරතුරු ලිපි ලේඛන ලැයිස්තුවක් වෙනත් සාක්ෂි ඉදිරිපත් කිරීම
  - o උල්ලංඝනයන් සිදුවීමට තුඩු දුන් නිති පිළිබඳව විවේචනාත්මක විශ්ලේෂණයක් ආයතන ව්‍යුහය ප්‍රතිපත්ති හා භාවිතයන් වෙනත් සාධක ඇතුළුව අදළ නිති පිළිබඳව
  - o වින්දිතයින් ගේ නාම ලේඛනයක් ( අනන්‍යතාවය වසන් කළ යුතු තැනැත්තන් ගෙ හැර) සහ
  - o සිය නිර්දේශ

  අඩංගු කළ යුතුය.

- සිය වාර්තාව ප්‍රසිද්ධ කළ යුතු අතර මහජනයාට පහසුවෙන් ලබා ගැනිමට ද ඉඩකඩ තිබිය යුතුය.

- පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමට කොමිසන් සභාවට බලය තිබිය යුතුය.
  - o වින්දිතයින් ට හා ඔවුන් ගේ පවුල් වල සාමාජිකයින් ට වන්දි ගෙවීමට
  - o සැකකාර අපරාධකරුවන්ට එරෙහිව අධිචෝදනා ඉදිරිපත් කිරීමට

- o පෙර උල්ලංඝනයන් නැවත සිදුවීම වැළැක්වීම පිණිස විශේෂ නිතී සංකල්ප යෝජනා කිරිම ආයතනික හා වෙනත් ප්‍රතිසංස්කරණ යෝජනා කිරිමට
- o මානව අයිතිවාසිකම් අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරිම පොලිසිය හා ත්‍රිවිධ හමුදවට පුහුණු වැඩ සටහන් සංවිධානය කිරිම හෝ යම්කිසි කාරණා සමුහයක් පිළිබඳව තවදුරටත් විමර්ශනය කිරිම ඇතුළු රජය විසින් තවදුරටත් ඉදිරියට ගෙන යා යුතු ක්‍රියාමාර්ග නිර්දේශ කිරිමට

*ආ. වින්දිතයින්ට හා ඔවුන් ගේ පවුලේ උදවියට වන්දි ගෙවීම*

- විමර්ශනය පවත්වා ගෙන යන කාලය මුළුල්ලේම කොමිසන් සභාව විසින් වින්දිතයින්ට හානි පුරණය පිණිස අවශ්‍ය කවර ආකාරයක වන්දි ගෙවීමක් ද යන්න පිළිබඳ විමසිල්ලෙන් සිටිම
- කොමිසන් සභාව විසින් ප්‍රතිෂ්ඨාපනය වන්දි ගෙවීම පුනරුත්ථාපනය යන කාරණා ඇතුලත් ව වින්දිතයින් හා ඔවුන් ගේ පවුලේ සාමාජිකයින් ට වන්දි ගෙවීමට අදල නිර්දේශ පුනරුක්තියක් ඇති නොවන පරිදි ඉදිරිපත් කළ යුතුය.
- වන්දි ගෙවීම සිදු වු හානියේ බරපතළ කමට අත්විදින ලද දුක් පිඩා වන්ට සාපේක්ෂ විය යුතුය. මෙම වන්දි ගෙවීම කිසියම් අවස්ථාවක අපරාධකරු හදුනාගත් ද නොගත්තද සිදු කළ යුතුය.
- කොමිසන් සභාව විසින් අනෙකුත් වින්දිතයින් සඳහා ඔවුන් ගේ සුවිශේෂ තත්වයන්ට ගැලපෙන පරිදි සකස් කළ වන්දි ගෙවීමේ වැඩ සටහනක් ඉදිරිපත් කළ යුතුය.
- වන්දි ගෙවීම පිණිස කරනු ලබන කිසිදු නිර්දේශයක් වගකිව යුත්තන් අධිකරණය ඉදිරියට ගෙන ඒම වෙනුවෙන් ඉදිරිපත් කරන ආදේශකයක් සේ නොසැලකිය යුතු අතර වන්දි ලබා ගැනිමට බලාපොරොත්තු වන තැනැත්තන් තව දුරටත් ඉදිරිපත් විම වළක්වන්නක් ද නොවිය යුතුය.

*ඇ. අනාගත නඩු විභාග සඳහා සාක්ෂි සංරක්ෂණය කිරිම*

- පරීක්ෂණ කොමිසන් සභාව විසින් ජාත්‍යයන්තර නිතීයට අනුව අපරාධයක් වන කාරණා සම්බන්ධයෙන් අණ දීමෙන් ධෛර්ය දිමෙන් හෝ අවසර දිමෙන් සහභාගි වු පුද්ගලයින් හඳුනා ගත් කල්හි ඔවුන් පිළිබඳ තොරතුරු අදළ අධිකරණ හා නිති ක්‍රියාත්මක කිරිමේ බලධාරින් වෙත අප්‍රමාදව අධිකරණයට ඉදිරිපත් කිරිමේ අභිප්‍රාය සහිතව යොමු කළ යුතුය.
- කොමිසන් සභාව විසින් අපරාධකරුවන් අධිකරණයට ඉදිරිපත් කිරිම පිණිස සියළු අංශ ආවරණය වන පරිදි අවශ්‍ය අනෙකුත් කාරණා ඉදිරිපත් කිරිම.
- රජය කොමිසන් සභාව සිය පරීක්ෂ ඔස්සේ ඉහත කි ආකාරයේ උල්ලංඝනයන් සිදු කළේ යැයි හඳුනා ගන්නා ලද තැනැත්තන් සම්බන්ධයෙන් තවදුරටත් විමර්ශනය කිරිම හා අධිකරණ ක්‍රියා මාර්ග ගැනිම.

*ඊ. සංරක්ෂණය*

- ආරම්භයේ දිම කොමිසන් සභාව විසින් රහස්‍ය ලේඛන යැයි වර්ග කරන ලද ලියවිලි කෙරෙහි බලපාන කොන්දේසි ද ඇතුළුව කොමිසන් සභාවේ සියළුම සංරක්ෂණය කරන ලද තොරතුරු මහජනයාට පරිශීලනය කිරිමට ඉඩ සලසන වැඩ පිළිවෙළක් හඳුන්වා දිය යුතුය.

නිමි

..

# සෑම දෙනාටම යුක්තිය, නිදහස හා අභිමානය සහිත ජනතා සහයෝගයෙන් ගොඩ නැගෙන ලොවක් සඳහා මෙම මිහි තලයේ අධි ත්‍රිවතාවයකින් යුක්ත ගැටුම් වල සිට හුදකලාතැන් හි කෙරෙන අරගල දක්වා ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් පෙනි සිටියි.



## මම දයක විමට කැමැත්තෙමි

### අපගේ දායකත්වය කුමක් ද

ලොව පුරා මානව හිමිකම් ක්‍රියාධරයන් විසින් මානව අයිතීන් පාගා දමන අනතුරුදායක බලවේග වළක්වා ලිය හැකි බව සනාථ කොට තිබේ. මෙම ව්‍යාපාරයේ කොටස්කරුවෙක් වන්න. භීෂණය හා වෛරය වපුරන්නන් පළවා හරින්න.

- මානව හිමිකම් උල්ලංඝණයන් අවසන් කිරීම පිණිස ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සමග අත්වැල් බැඳ ගෙන, ලොව පුරා ගොඩ නැගෙන උද්ඝෝෂණ ව්‍යාපාරයෙහි කොටස් කරුවෙකු වන්න. වෙනසක් සඳහා අපට අත දෙන්න.
- ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් වෙත ඔබ ගේ පරිත්‍යාග යොමු කරන්න.

### එක්ව නැගී සිටීමෙන් අප ගේ හඬට සවන් යොමුවනු නිසැකය.

☐ ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් සාමාජිකත්වය ලබා ගැනීම පිණිස වැඩි විස්තර දැන ගැනීමට කැමැත්තෙමි.

නම

ලිපිනය

රට

විද්‍යුත් තැපෑල

☐ ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් මා දයක විමට කැමැත්තෙමි

මුදල

මගේ ක්‍රෙඩිට් කාඩ් පත බැර කරන්න    විසා ☐    මාස්ටර් කාඩ් ☐

අංකය

අවලංගු වන දිනය

අත්සන

මෙම අයදුම් පත ඔබ ගේ රටෙහි ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් කාර්යාලයට යොමු කරන්න. විස්තර ලබා ගැනීම පිණිස මෙම වෙබ් අඩවියට පිවිසෙන්න:
www.amnesty.org/en/worldwide-sites

ඔබ පදිංචි රටෙහි ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් කාර්යාලයක් නොමැති නම් ඔබ ගේ අයදුම් පත පහත සඳහන් ලිපිනයට එවන්න:
Amnesty International, International Secretariat, Peter Benenson House,
1 Easton Street, London WC1X 0DW, United Kingdom

www.amnesty.org

# විසි වසරක මායාව

## ශ්‍රී ලංකාවේ පරීක්ෂණ කොමිසන් සභා

පසු ගිය දශක දෙක තුල ශ්‍රී ලංකාවේ සිදු වූ බරපතළ මානව හිමිකම් උල්ලංඝණයන් පිළිබඳව දේශිය හා විදේශිය බලපෑම් උත්සන්න වූ සෑම අවස්ථාවකම එරට ආන්ඩු විසින් පත් කරන ලද පරීක්ෂණ කොමිසන් සභා විශ්වාස කිරීමට අප පොළඹවනු ලැබින. එබඳු අවස්ථාවන් හිදි දඩුවමින් නිදහස් කිරීම පිළිබඳව සුදුසු ක්‍රියා මාර්ග ගන්නා බවක් හැගී ගිය ද ඇත්ත වශයෙන් ම ඒ සම්බන්ධයෙන් කිසි කළෙක යුක්තිය ඉෂ්ට නොවිය.

තවද ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය ද කිසි කළෙක බලහත්කාරයෙන් පැහැර ගෙන යාම, ඝාතන හා වධහිංසා පැමිණ වීම ඇතුළු බහුලව පැතිරෙන මානව හිමිකම් උල්ලංඝනයන් සංවරණය හා තුලනය කිරීමට අසමත් විය. ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය මානව සම්පත් ඌනතාවයන් ගෙන් සහ අකාර්යක්ෂමතාවයෙන් පිඩා විදින අතර බහුතරයක් මානව හිමිකම් උල්ලංඝනයන් කිසි කළෙක විභාග කිරීමක් හෝ අධිකරණයට ඉදිරිපත් කිරීමක් සිදු නොවීය. එබඳු සිද්ධින් දේශපාලන බලපෑම් වලට යටත් වු අතර වැදගත් සාක්ෂිකරුවන් ආරක්‍ෂා කිරීමේ වැඩ පිළිවෙළක් ද කිසි කළෙක නොවිය. රාජ්‍ය නියෝජිතයින් විසින් අල්ලස් දිම, බලපෑම් කිරීම හා ප්‍රචන්ඩත්වය මගින් සාක්ෂිකරුවන් ඉවත් කරන ලද්දේය. රාජ්‍ය විසින් පොලිස් පරීක්ෂණ අධෛර්යය කළ අතර මහජනයා නොමඟ යවනු ලැබින.

නිලධාරින් මෙන් ම බලපෑම් සහිත පුද්ගලයන් විසින් නඩු වාර කඩාකප්පල් කිරීම හෝ නඩු පැවරීම වළක්වා ලන ලදි. බලයට පත් වු සෑම රජයක් ම දූමරිකකම් අවසන් කිරීමටත් අපරාධකරුවන් නිතීය ඉදිරියට ගෙන ඒමටත් පොරොන්දු වන නමුත් එය කිසි කළෙක එය ඉටු නොකෙරිණ. ශ්‍රී ලංකාව තූළ මෙන් ම ජාත්‍යයන්තර ප්‍රජාව තූළත් මේ සම්බන්ධයෙන් වන සංවාදය, මෑත කාලින දූමරික ක්‍රියා හෝ පත් කිරීමට නියමිත පරීක්ෂණ කොමිසන් සභාවන් ගෙන් ඔබ්බට තවත් ඉදිරියට ගෙන යමින්, දැනට සිදුවෙමින් පවතින මානව හිමිකම් උල්ලංඝනයන් වැළැක්වීම හා පසුගිය මානව හිමිකම් කඩ කිරිම් සම්බන්ධයෙන් වගවීම යන කාරණා පිළිබඳව අවධානය යොමු කිරිම් කළ යුතුය. ඇම්නස්ටි ඉන්ටර්නැෂනල් විධිමත් හා තිරසාර අන්තර් ජාතික මානව හිමිකම් නියාමනයක් සහ ඊට අවශ්‍ය තාක්ෂණික සාහය ජාත්‍යයන්තර ප්‍රජාව ගෙන් ඉල්ලා සිටියි. ශ්‍රී ලංකාවට තනිවම මෙය ඉටු කළ නොහැකිය.


Amnesty International
International Secretariat
Peter Benenson House
1 Easton Street
London WC1X 0DW
United Kingdom

www.amnesty.org



සංකේත අංකය: ASA 37/005/2009
ජුනි 2009


**AMNESTY INTERNATIONAL**